

# ලෝක නිෂ්ඵරණය

හෙවත්

## හේතු-ඵල වාදය

## (පටිච්ච සමුප්පාදය)

මුදලකට විකිණීම තහනම්. "ලොකවිජය" ග්‍රන්ථමාලා අංක 3.

# ලොක නිර්මාණය

හෙවත්

## හෙතු - ඵල වාදය

(පටිච්ච සමුප්පාදය)





සම්පාදක: ආචාර්ය මුනිදාස වීරකෝන් මහතා.



ප්‍රකාශක - පිටකොටුවේ ශ්‍රී සද්ධර්මදාන සමිතිය

2499 (ධර්මදානය පිණිසයි.) 1955

මුදලකට විකිණීම තහනම්

'ලෝකවිජය' ග්‍රන්ථමාලා
අංක 1

# ලෝක නිර්මාණය

හෙවත්

## හේතු - ඵල වාදය

(පටිච්ච සමුප්පාදය)

卐 卐 卐

හෝමාගම විද්‍යාවර්ධන පිරිවෙණේ
ආචාර්ය විද්‍යාවිශාරද පණ්ඩිත
ගරු වෙඩරුවේ අනෝමදස්සී
ස්වාමිපාදයන් වහන්සේ විසින්
සංශෝධනය කරණලදී.

卐 卐

ආචාර්ය මුනිදාස වීරකෝන් මහතා විසින්
සම්පාදනය කරණලදී.

卐

කොළඹ පිටකොටුවේ
ශ්‍රී සද්ධර්මදාන සමිතිය මගින්
සැදැහැවතුන්ගේ ආධාර ඇසිව ධර්මදානය පිණිසත්,
කරුණාධාර මුද්‍රණාලයේ අච්චුගස්වා ප්‍රචාරය කරණලදී.

ශ්‍රී බුද්ධ වර්ෂ 2499
වෙසක් පුරපසළොස්වක් දිනදිය.

# සම්පාදකයන්ගේ හැඳින්වීම

**සම්පාදනය** ලෝක නිස්සරණය හෙවත් හේතු-ඵල වාදය නම්වූ මේ ධර්ම ග්‍රන්ථය අප විසින් සම්පාදනය කරගෙණ යනු ලබන "ලෝකවිජය" ග්‍රන්ථමාලාවේ සිවුවැන්නය. පාලි අර්ථ කථා හා ටීකාද විසුද්ධිමාර්ගයද මූල් තැන්හි තබා සම්පාදනය කරණලද මෙය යම්කිසි ධර්ම ග්‍රන්ථයක පරිවර්තනයක්ද නොවේ. "බුද්ධශාසන මහාසුර සේනාපති" ඇම්. ධර්මරත්න පඬිතුමන්ගේ සත්වොත්පත්තිවිනිශ්චය නම් ධර්ම ග්‍රන්ථය විශේෂයෙන් ආශ්‍රය කල බවද, මෙහි 145–162 යන පිටු අතර පවත්නා චිත්තවීථි සටහණ එම ග්‍රන්ථයෙන් උපුටා ගත් බවද සඳහන් කරමු. මෙහි ඇති සමයාන්තර විවේචන බලන්ගොඩ ආනන්ද මෛත්‍රෙය හිමියන්ගේ කෘතීන් අනුව සකස් කරණලදී. මෙසේම රේරුකානේ චන්ද්‍රවිමල මහාස්ථවිරපාදයන් වහන්සේගේ "විදර්ශනා භාවනාවද" දෙවිනුවර ඤාණාවාස හිමියන්ගේ "අභිධර්මය" හා මාතර ධර්මවංශ හිමියන්ගේ "අභිධර්ම චන්ද්‍රිකාව" ද ඇසුරු කළ බව ගෞරවයෙන් සඳහන් කරමු.

**අනුග්‍රහය** මේ ග්‍රන්ථය සංශෝධනය කරණ ලද්දේ හෝමාගම විද්‍යාවර්ධන පිරිවෙණේ ආචාර්ය විද්‍යාවිශාරද පණ්ඩිත වෙඩරුවේ අනෝමදස්සි ස්වාමිපාදයන් වහන්සේ විසිනි. බලවත් අවිවේකී තාවයක් මධ්‍යයේ අප වෙත අනුකම්පාවෙන් එම ගෞරවණීය ස්වාමිපාදයන් වහන්සේ විසින් අපට කරණලද අනුග්‍රහය ආශිර්වාද පූර්වකව සිහිපත් කරමු. එසේම මේ ධර්ම පුස්තකය පිළිගෙණ ස්වකීය අදහස් ප්‍රකාශකර වදාළ විද්‍යාලඞ්කාර පරිවෙණාධිපති මාහිමියන් වහන්සේද මහාවිසුද්ධාරාම ත්‍රිපිටක විද්‍යාලයාධිපතින් වහන්සේද ගෞරවා-දරාභිවාදන පූර්වකව මතක් කරමු. උන්වහන්සේලාගේ සානු-කම්පිත අනුග්‍රහය මේ ධර්ම ග්‍රන්ථයේ ගෞරවය වර්ධනයවීමට හේතුවී ඇත.

**ස්තූතිය** පිටකොට්ටේ ශ්‍රී සද්ධර්මදූත සමිතියේ ආරාධනය පරිදි මෙය සම්පාදනය කරණලදී. සමිතිය පිළිබඳ විස්තර මෙහි අවසානයේ සඳහන්ව ඇත. වටිනා ධර්ම ග්‍රන්ථයක් වළියක්ම වරක් නොමිලයේ ප්‍රචාරය කරවීම සමිතියේ පරමාධ්‍යාශය හෙයින් මෙය මෙසේ සම්පාදනය කර දුනිමු. මේ සමිතියේ උදාර අධ්‍යාශය පිළිබඳව බෞද්ධ ලෝකයාගේ ප්‍රශංසාව

ලැබියයුතු වෙයි. මේ සමිතියේ භාණ්ඩාගාරික ධුරය දරණ පන්නිපිටියේ පී. ඩී. ඇස්. රාජපක්ෂ මහත්මයා පිළිබඳව විශේෂයෙන් සඳහන් කළයුතුය. ප්‍රතිපත්ති ගරුක අවංක බෞද්ධයෙකු වශයෙන්ද ගුණවතෙකු වශයෙන්ද සඳහන් කළ යුතු මේ මහතාගේ විශේෂ පරිශ්‍රමය සමිතියේ චිරජීවනයට හේතුවී ඇති බව කිවයුතුය. තවද ගොල්ජේස් හෝටලයේ ඇල් බාලසුන්දරම් මහතා පසුගිය වර්ෂයේ ප්‍රචාරය කරණලද "ලොකවිජය" ග්‍රන්ථය සඳහා රුපියල් 172/- ක්ද මේ ග්‍රන්ථය සඳහා රුපියල් 277/– ක්ද සපයාදීමෙන් සමිතියට කරණලද ආධාරය බලවත් රුකුලක් විය. ශ්‍රද්ධාසම්පන්නවූද පුණ්‍යකාමී වූද මේ තරුණ මහතා පිළිබඳව අපගේ අවංක ප්‍රසාදය සඳහන් කරමු. මෙසේම සමිතියේ සභාපති තැන්පත් සැදැහැවත් සී. ඩී. චර්ලිස් වෛද්‍යාචාර්ය මහතාද සභාරක්ෂක ඇල්. ජී. එච්. පී. ජෝන් මහතාද ලේකම් තැන්පත් වී. ජී. පුංචිබණ්ඩා මහතාද සමිතියේ කටයුතු පිළිබඳව දියුණුවට හිතවත්ව ක්‍රියා කරන බව මතක් කරමු. තවද 1955 ජනවාරි සිට අපට මාස්පතා "සිසත්" විකට් පත පරිත්‍යාග කරණ "ලේක් හවුස්" එකේ මහතුන්ද අපට ධර්ම පුස්තක පරිත්‍යාග කරණ සැදැහැවත් මහතුන්ද ඉතා සතුටින් මතක් කරමු.

තවද අප විසින් 1954 වර්ෂයේ ප්‍රචාරය කරවනලද ලොකවිජය ධර්ම ග්‍රන්ථය පිළිබඳව 1954 මැයි 15 දින රාත්‍රී 8.15 ට ගුවන් විදුලියේ විවිධ විචාර අංශය යටතේ විවේචනයක් කළ ප්‍රවෘත්තිපත්‍ර කලාවේදී සසිරස ඩබ්ලිව්, සුරෙන්ද්‍ර මහතාටද පොතක් පිළිගෙණ වැදගත් විවේචනයක් පළකළ ලංකාදීප පත්‍රයෙහි ගරු කර්තෘ මහතාටද අපගේ අවංක ස්තුතිය හිමිවෙයි.

මෙහි මුද්‍රණ කටයුතු මැනවින් කරදුන් කරුණාධාර මුද්‍රණාලයේ කාර්ය මණ්ඩලයටද අඛෙඩාපමාවේ සිතුවම් පහසුවෙන් සම්පාදනය කරදුන් ඇල්බට් මහතාටද ස්තුති කරමු.

මෙවර මේ ධර්ම ග්‍රන්ථයේ පිටපත් 2500 ක් පිළිබඳ වගකීම පිටකොටුවේ ශ්‍රී සද්ධර්මදූත සමිතිය සතුය. සමිතියේ සිල් එකද අපගේ අත්සනද නොමැති පොතක් ලඟ තබා ගැණීම තහනම්ය. නැවත මෙය මුද්‍රණය කිරීමේ අයිතිය සම්පාදක වන මා වෙත තබා ගනිමි.

මෙබ,

කැලණිය

ආචාර්ය මුනිදාස වීරකෝන්

පැලියගොඩ විද්‍යාලඞ්කාර පරිවෙණාධිපති
ත්‍රිපිටක වාගීශ්වරාචාර්ය උපාධ්‍යාය ධුරන්ධර
පණ්ඩිතාචාර්ය කොළඹ-හලාවත දෙදිශාවේ
ප්‍රධාන සඞ්ඝනායක ස්වාමිපාදයන් වහන්සේගේ හැඳින්වීම

——( ෦ )——

# ලෝකනිස්සරණය හෙවත් හේතු-ඵලවාදය

මෙනමින් නොමිලයේ ධර්මදානය සඳහා පිළියෙළ කර තිබෙන මේ ධර්ම ග්‍රන්ථයෙන් ලෝකයෙහි සියලු ආගම් අතුරෙන් බුද්ධාගම ශ්‍රේෂ්ඨ වූයේ මක්නිසාද යන ප්‍රශ්නය පහසුවෙන් විසඳගත හැකිවෙයි.

බුද්ධ චරිතය ඇසුරු කොට ලිය නට පටන්ගත් මේ ධර්ම ග්‍රන්ථයෙහි ඉතා සැකෙවින් බුද්ධචරිතයද, බුදුරජාණන් වහන්සේගේ දින චර්යාවද, බෝසත් ගුණ මහිමයද; මැනවින් ප්‍රකාශ වෙයි.

මෙසේ මෙහින් මේ ධර්ම ග්‍රන්ථය සැපයූ ආචාර්ය මුනිදාස චිරකෝන් මහතාගේ ධර්මඥානය ගැනත්, නිඃශරණාධ්‍යාශය ගැනත්; මෙය මුද්‍රණය කරවීමට ධෛර්ය දුන් පරිත්‍යාගශීලි පින්වතුන්ගේ ධර්මප්‍රචාරය සඳහා ඇති උද්‍යෝගය ගැනත්; බෞද්ධ ලෝකයාගේ නොමසුරු ප්‍රශංසාවහිමිවෙයි.

මේබවම--සාසනෝදයකාමී
කිරිවත්තුඩුවේ ශ්‍රී ප්‍රඥාසාර
විද්‍යාලඞ්කාර පරිවෙණාධිපති කාර්යාධිපති

කොළඹ දෙමටගොඩ මහාවිසුද්ධාරාම ත්‍රිපිටක විද්‍යාලයාධිපති
ආචාර්ය දෙව්නුවර ඤාණාවාස ස්වාමිපාදයන් වහන්සේගේ
හැඳින්වීම

---

# ලෝකනිස්සරණය හෙවත් හේතු-ඵලවාදය.

නමැති ධර්මප්‍රඥාතයට අවකාශ ඇති පරිදි තරමක් දුරට කියවා බැලුවෙමු.

මේ පොතෙහි බුද්ධ චරිතය හා පටිච්ච සමුප්පාදය ආදී වැදගත් කරුණු රැසක් ලිහිල් බසින් විස්තර කොට තිබේ.

සම්පූර්ණ පොත කියවන්ට අවකාශ නොලැබුන නමුත් අපට කියවන්ට ලැබුනු කොටස්වල ඇතැම් බණපද පැහැදිලි කොට තිබෙන අයුරු සැලකීමේදී ග්‍රන්ථය නිෂ්පාදනය කළ ආචාර්ය මුනිදාස වීරකෝන් මහතාගේ ධර්ම ඥානය බොහෝ දුරට දියුණුව ඇති බව විශ්වාස කළහැක.

විශේෂයෙන්ම මෙහි අභිධර්මය පිළිබඳ සියුම් බණපද විස්තර කර තිබෙන අයුරු ඉතා මනහරය. තවද මෙහි අනිත් ආගම්වල අසාරත්වයද, බුද්ධාගමේ සාරත්වයද පැහැදිලිකොට තිබේ. එම නිසා සැම බෞද්ධයෙකු විසින්ම මේ පොත සාදරයෙන් කියවා ඉගෙණගත යුතුය. බෞද්ධයාගේ අත්පොත හැටියට පරිහරණය කිරීමටද මෙය ඉතා සුදුසුය.

මේ පොත සම්පාදනය කිරීමෙන් වීරකෝන් මහත්මයාට හා එය මුද්‍රණය කිරීමෙන් මුදල් වැය කළ භවතුන්ටත් ඥාණ සම්භාර කුසල් රැස්කරගත හැකි වූ බැවින් ඒ පින්වතුන්ගේ උත්සාහය ඉතා සාර්ථකවූ බව කිවයුතුය.

ඕව-වැඩ් කැම්පි,

දෙව්නුවර ඤාණාවාස (ස්ථවිර)

මේ ග්‍රන්ථය පරිශීලනයට පෙර ශුද්ධි පත්‍රය බලා වැරදි වචන නිවැරදි කරගත යුතුයි.

# ශුද්ධි පත්‍රය

| පිට | පෙළ | අශුද්ධ | ශුද්ධ |
|---|---|---|---|
| 1 | 1-4 | නිත්තරණං | නිස්සරණං |
| 16 | 4 | රබ්බදුස්සාජිතාය | සබ්බදුස්සාජිතාය |
| 16 | 8 | බුද්ධො | බුද්ධො |
| 21 | 8 | පතුරුවා | පතුරුවා |
| 21 | 15 | භික්ෂුන්හුද | භික්ෂුහුද |
| 21 | 23 | අවිතත්‍යවූ | අවිනත්‍යවු |
| 22 | 27 | ලප | පල |
| 24 | 28 | ඉදින්-නම් | ඉදින් කැමතිසේක් නම් |
| 32 | 28 | නිර්වාණය බවද | නිර්වාණය බවද |
| 42 | 12 | කොතරම් | නොතරම් |
| 49 | 20 | ලැබිය | ලබයි. |
| 50 | 18 | කවරේ | කළුවරේ |
| 51 | 1 | අජාකාශ | අජටාකාශ |
| 52 | 14 | මීවියක | මීවියක් |
| 52 | 19 | අපො | ආපො |
| 55 | 20 | කිම්ට | කිළිට |
| 59 | 8 | පාපිවියෙහි | පෘථිවියෙහි |
| 61 | 19 | සංමයොජනානං | සංයොජිතානං |
| 64 | 14 | මැච්වේ | මැව්වේ |
| 65 | 21 | සවලා | අසවලා |
| 75 | 15 | ගෙඩියෙන් | ගෙඩියෙන් |
| 83 | 21 | ඇකිලීම | ඇකිළීම |
| 90 | 10 | යයි. | යයි. |
| 95 | 16 | නිසයි | නිසයි |
| 117 | 14 | සහගත | සහගත |
| 118 | අවසානපේළිය | ඡාගාරූප | ඡායාරූප |

| පිට | පෙළ | අසුද්ධ | සුද්ධ |
|---|---|---|---|
| 131 | 22 | ගින්නනේ | ගින්නෙන් |
| 134 | 29 | අනුප්පාද | අනුපාද |
| 135 | 1 | එකාතතවූ | ඒකාන්තවූ |
| 136 | 17 | සංසංරං | සංසරං |
| 139 | 20 | සඛකාර | සංඛාරා |
| 144 | 17 | සිට්යදීද | සිටියදීද |
| 144 | 19 | පහලවිමි විනා | පහළවනු විනා |
| 144 | 26 | භාවයෙනි | භාවයෙන් |
| 158 | 14 | ටෙයින් | මෙයින් |
| 160 | අවසාන පේලිය | යත්හු | යක්හු |

47 වෙනි පිටුවේ "අත්තදීපා භික්ඛවෙ විහරථ අත්තසරණා අනඤ්ඤ සරණා" යයි සුද්ධ විය යුතුයි.

# ශ්‍රීඃ

# බුදුරජාණන් වහන්සේ.

ලොකං ලොක සමුප්පාදං - ලොකනිත්තරණම්පිච
සම්බුද්ධො යො'භි සම්බුජ්ඣි - වන්දෙ තං ලොකනායකං

සද්ධම්මං චා'භි වන්දිත්වා - කත්වාසඞ්ඝස්සචඤ්ජලිං
ලොකනිත්තරණං නාම - කාරිස්සං ධම්මසඞ්ගහං.

''එකපුග්ගලො භික්ඛවෙ ලොකෙ උප්පජ්ජමානො උප්පජ්ජති අදුතියො අසහායො අප්පටිමො අප්පටිසමො අප්පටිභාගො අප්පටිපුග්ගලො අසමො අසමසමො දිපදානං අග්ගො, කතමො එකපුග්ගලො තථාගතො අරහං සම්මාසම්බුද්ධො, අයං ඛො භික්ඛවෙ එකපුග්ගලො ලොකෙ උප්පජ්ජමානො උප්පජ්ජති අදුතියො -පෙ- දිපදානං අග්ගොති''

මහණෙනි! මේ ලෝකයෙහි උපදින්නේ (එබඳු තවත් උතුමෙකු නොමැති හෙයින්) අදුතියවූ, (ආත්මභාවයෙන් හෝ ප්‍රතිවේධ කළ ධර්මයෙන් තමන් වහන්සේට සමාන කෙනෙකු නැති හෙයින්) අසහායවූ; (තමන් වහන්සේගේ ආත්මභාවයට සමාන අනිකකු නැති හෙයින්) අප්පටිමවූ; (අප්පටිම සංඛ්‍යාත බුද්ධවරයන් හා සමවූ හෙයින්ම) අප්පටිසමවූ; (සතර සතිපට්ඨානාදී වශයෙන් ධර්මය බෙදා ප්‍රකාශ කිරීමෙහි සමත් අනිකෙකු නැති හෙයින්) අප්පටිභාගවූ; (මම බුදුන් වෙමියි ප්‍රතිඥා කටහැකි අන්‍යයෙකු නැති හෙයින්) අප්පටිපුග්ගලවූ; සියලුම සත්වයන් අතුරෙන් තමන්වහන්සේට සමවූවෙකු නැති හෙයින්) අසමවූ;(අතීතානාගත සියලු බුද්ධවරයන් වහන්සේලාට පමණක් සමවූ හෙයින්) අසමසමවූ; දෙපා ඇති අයගෙන් අග්‍රවූ; එක පුද්ගලයෙක් උපදී. ඒ කවර නම් පුද්ගලයෙක්ද යත්? තථාගත, අර්හත්, සම්‍යක් සම්බුද්ධ තෙමේයි.

(අංගුත්තර නිකාය එකක නිපාත)

ස්වභාව ධර්මයේ විශිෂ්ට නිෂ්පාදනයක් වන මනුෂ්‍යයා අන්‍ය සත්වයන්ට වඩා උසස්වනුයේ ඔහු කෙරෙහි පිහිටි අද්භූත 'චෛතසික බලය'' නිසාය. සත්ව, සංස්කාර, අවකාශ යන

ලෝකත්‍රයෙහිම සජීවී, සියලු සත්වයන්ගේ බලය අභිභවනය කරමින් දිව්‍ය බ්‍රහ්මාදීන්ගේද ගෞරවාභිවාදන ලබමින් ක්‍රියා කිරීමේ ඒ ශක්තිය- ඒ බලමහිමය- හැම මිනිසෙකු තුළම පවත්නා පොදු බලයකි. කිසිම දෙවියෙකුගේ හෝ බ්‍රහ්මයෙකුගේ- ඊශ්වරයෙකුගේ රටතට නොපමුණුවා තමන්ගේද අනුන්ගේද යහපත පිණිස යෙදවිය හැකි එම බලය නිසි ලෙස යොදන්නහුට ලොව නොකටහැකි දෙයක් නැත. දෙවාතිදෙව, බ්‍රහ්මාතිබ්‍රහ්ම; බවටද පත්කරගතහැකි, සෙසු සත්වයින්ට වඩා උසස් ලෙස නිදහස්ව සිතිය හැකි- වීසිය හැකි- "මනස"ක් ඇති මිනිසා ඔවු- නොවුන්ට එරෙහිව- සැහැසිව= තමන් පමණක් "හොඳින්" ජීවත්වීමේ චේතනාවෙන් අන්‍යයින්ට හිංසාකරමින් ධන බලයෙන් හෝ- නිල බලයෙන්- අවි බලයෙන්- අනුන් අභිභවනයකොට "අමතර බලයක්" ලැබීමට යත්න දරන්නේද; දේපල වස්තු රට රාජ්‍යයන් ලබාගෙණ "තත්වයක් ඇතිව" කල් යැවීමට යත්න දරන්නේද; උදුරවූ ඒ "අසීමිත බලය" නිසිමග නොයෙදීම නිසාය. ඇතැමෙක් ජීවත්වීමේ ආශාවෙන් හා වස්තු තණ්හාවෙන් මිරිකී ලෝකය එකම පොරපිටියක්- යුදබිමක් කරගෙණ සැහැසිව ක්‍රියා කරන අතර තව කෙනෙක් ලොව එකම රඟමඩලක්-විනෝද ගාරයක්- කොට සිතා මිරිඟුව පසුපස දුවන මුවපොල්ලන්සේ කාමවස්තූන්ම සොයමින් අවිද්‍යාහරිතව කල්යවති.

වර්තමාන මිනිසාට එක්තරා චින්තන මාත්‍රයක ආධාරයෙන් වායු - ජල - අග්නි යන මේ ස්වාභාවික වස්තූන්ගේ සංයෝග බලයෙන් "පරමාණු බෝම්බය" වැනි අති සූක්ෂම නිෂ්පාදනයන් ඇතිකර ගැණීමේ ශක්තිය ඇතද; හුදෙක් ඉන් ආත්මඝාතන- යක්ම- පරහිංසාවක්ම- ලෝක විනාසයක්ම සැලසෙනු විනා නියම ජීවිත සටනෙහිදී එබඳු නිෂ්පාදනයන්ගෙන් අංශුමාත්‍රවූද පිහිටක් නැත. අසීමිත මානුෂික බලය නිසිලෙස යොදවා ජීවිත සටනින් "නියම ජය" ලබා සදෙවකලෝකයාගේද හිතසුව සලසා මානුෂික බලය යෙදිය යුතු නියම පිළිවෙත ලෝවට පහදා දුන් එකම උත්තමයා නම් ලොව්තුරා භාග්‍යවත් බුදුරජාණන් වහන්සේය.

ලොව උතුම්ම බලය චිත්ත බලයයි

ලොව රැකීමෙහි හෝ මැකීමෙහි බලය ඇත්තේ සිතෙහිය.

卐

## 2 පරිච්ඡේදය.

# සුමේධ තාපස කාලය

සැපවත් පරිසරයක හැදුනු, වැඩුණු, කාම සැපයෙන් අනූනවූ කුලයක උපන්; යෞවන මදයෙන් මත්වන තරුණ ජීවිතයක් ගතකරන; මහත් ධනබලයක් ඇති; කුල පුත්‍රයෙක් ලෝකය කරදර සහිත තැනක් වශයෙන්ද; ජීවිත භවය දුක් සහිත වශයෙන්ද සිතයි නම් ඔහු උදාරතර චෛතසික බලයක් ඇත්තකු විය යුතුය. එබඳු විශේෂයෙක්වූ සුමේධ තරුණ බමුණු කුමර තෙමේ දැනට සාරාසංඛ්‍ය කල්ප ලක්ෂයකින් පෙර "ජීවිත සමනේ" මුල් පියවර තැබිය. මවුපිය දෙපසින්ම පිරිසුදුවූ බමුණු කුලයක උපන් සුමේධ කුමර තෙමේ දෙමාපියන්ගේ අභාවයෙන් පසු සත්මුතු පරපුරකින් පැවතෙන කෝටි අසූවක් පමණවූ ධනයක එකම හිමියා විය. නැති වස්තුව ලබා ගැණීම මත් ඇති වස්තුව ප්‍රවේසම් කිරීමට හා දියුණු කිරීමටත් දිවා රාත්‍රි වෙහෙසෙන සමාජයක උපන් මේ උතුමා තමාට හිමිවූ වස්තුව දැක කුමක් සිතුවේද? මෙන්න සිතූ දේ

සත්මුතු පරම්පරාවක වස්තුවක් මා සතුව දැන් ඇත්තේය. මගේ මවුපියෝ මේ වස්තුව බොහෝ දුකසේ සපයා ප්‍රවේසම් කොට තබා මිය ගියහ. කිසි දෙයක් ඔව්හු ගෙණ නො ගියහ. මගේ දිවි පැවැත්ම සඳහා– ඉන්ද්‍රියයන් පිණවීම සඳහා - අන් කිසි වස්තුවක් මා නොසැපයුවත් මේ වස්තුව මට පමණටත් වැඩිසි. මගේ දෙමාපියන් මේ ධනය හැර දමා පරලොව ගියාක් මෙන් මටද කවදා හෝ මේවා හැර දමා මියයන්ට සිදුවෙසි. කල්පනා කල යුත්තේ මේ දුක් සහිත මරණය පිළිබඳවයි. කොතරම් දේපල හා පිරිස් බලය ඇතිව සිටියත් කෙබඳු වේලාවකදී වුවද බලාපොරොත්තු රහිතව සිදුවන මේ මරණයටද යම් කිසි හේතුවක් ඇතිවිය යුතුය. මේ ධනය සියල්ලම යොදවා හෝ මරණින් ගැලවෙන උපායක් සෙවිය යුතුයි. එහෙයින් මම ධනය හැරදමා හුදකලාම පැවිදිව මරණයෙන් නිදහස්වීමේ මාර්ගය සොයමි, මරණයේ හේතුව උපත විය යුතුයි. උපතේ හේතුව සොයා එයට ප්‍රතිකම් කලයුතුය. එවිට උපතක් නැත. උපත නැතිවූ කල මරණයද නැති වෙසි.

තවද සිතන්ට වනි,

මම ජාතිය සවභාව කොට ඇත්තෙක්මි. ජරාව හා මරණයද සවභාව කොට ඇත්තෙක්මි. උෂ්ණය නසන සිසිල් ජලයක් ඇත්තාසේ, අන්ධකාරය දුරුකරන ආලෝකයක් ඇත්තාසේ, රෝග පීඩා නසන බෙහෙත් ඇත්තාසේ; ජාති—ජරා=මරණ යන දුක් ගති නැති තත්වයක්ද විය යුතුයි. එය මා විසින් සෙවිය යුතුය.

මේ සිතුවිල්ලෙහි අවසාන ප්‍රතිඵලයවූයේ පරම්පරා සතක් තුළ එකතුවූ කොටි අසූවකටත් අධික ඒ සා මහත් ධනසකන්ධය දුගී මගී යාචකාදීන් විෂයෙහි පරිත්‍යාග කොට තවුස් පැවිද්දෙන් පැවිදිවීමයි.

(පාලන බලය—මිලමුදල් බලය—පිරිස් බලය යනාදී බලතල නොලැබුවන් එබඳු බලතල ලැබීමටද, බලය ඇතියවුන් එම බලය තහවුරු කර ගැනීමටද දිවා රෑ දෙකෙහි වෙහෙසෙන; ඒ සඳහා කෙබඳු `නිච වුවද දුෂ්චරිත වුවද ක්‍රියාවක් කිරීමට පසුබට නොවන; බිම් අඟලක්- තඹදොයිතුවක්- පමණ වුවද වස්තුවක් අතහැරීමට නොමැලිවන; සමාජයක උපන් උතුමෙකුට සත්මුතු පරපුරක ධනයක් අලුයම දමූ කෙළ පිඩක් තරමටවත් අගය නොවීම ආශ්චර්යය නොවේද? එබඳු උදාර චිත්ත බලයක් ඇති උතුමෙකු පැවිදිවී සතියක් තුළ අහසින් යන තරම් ගුණ නුවණකින් යුක්තවීම සිතිය නොහැකි තරම්- අචින්ත්‍ය- කරුණක්ද? නොවේමැයි.)

මෙබඳු උදාර චරිතයකින් යුත් සුමෙධ තවුස් තෙමේ වන ගතව පවත්තඵලභොජිව- සවයංපතිත ඵල භොජීව; නිරහංකාර දුහැමි දිවිපෙවෙතක් ගත කරනුයේ; සතියක් ඉකුත්වූ පසු පඤ්චාභිඥාද අෂ්ටසමාපත්තිද උපදවා කාමාශාව, ක්‍රොධය, නොසන්සුන් ගතිය, සැකය, උඩඟුකම ආදී පහත් සිතුවිලි මැඩ පැවැත්විය. ශරීරයද ගෙණ අහසින් යන තරම් චිත්තබලය දියුණු කරගත්තේය.

මරණින් මිදීමේ උපාය මාර්ගය සොයමින් එක්තරා තත්වයක අධ්‍යාත්ම බලයක් උපදවා ගෙණ හුදකලා විවේකී ජීවිතයක් ගත කරමින් කල්යවන සුමේධ තාපස තුමා දිනක් අහසින් යනුයේ

ගම්පිරිසක විශාල සෙනඟක් රැස්ව මහමඟ පිරිසිදු කරමින් සිටිනු දිටී. මෙබඳු මහා ජනකායක් එකතුවී කුමක් කෙරෙත්දැයි විමසනු රිසිවූ සුමේධ තාපස තුමා ඔවුන් වෙත එළඹ කරුණු විමසී.

"හා: තාපස තුමනි! ඔබ නොදන්නාසේක්ද? සසර කතරින් එතෙරවූ දීපංකර නම් තථාගතයන් වහන්සේ රම්‍යවතී නුවර සුදර්ශන මහා විහාරයෙහි වැඩවසනසේක. විසිලක්ෂයක් පමණ වූ ශ්‍රාවක පිරිස් සහිත එම තථාගතයන් වහන්සේ දන් පිරිනමනු පිණිස රම්‍යගම් නුවරට මේ මඟින් වැඩමකරවා ගෙණ යන්නෙමු. උන්වහන්සේලා වඩනා මඟ අපි මේ සකස් කරමු" යයි පිරිසේ කෙ නෙක් පැවසූහ.

"බුද්ධ" යන වචනය ඇසූ කෙණෙහිම ප්‍රීතියෙන් ඉපිලුණු මහසත්තුමෝ "අහෝ! කප්කෙළ සුවහසකිනුදු ඇසිය නොහෙන වදනක් ඇසීමි. ඒ වචනාර්ථය දරණ උතුමාද නොබෝ වේලාව කින් මට දක්න හැකිය. ලොක ගැටලුව විසඳ ගැණීමට ඒ උතුමා ගෙන් මම උපදෙස් ගණිමි. මේ මිනිසුන් මෙන් මමද කායික ව්‍යායාමයකින් උතුමාට උපචාර- වතාවත් කොට පින්පලද ලබමි"යි සිතා උදැල්ලක් හා පැසක් (කූඩයක්) ඉල්වා ගෙණ; ඉතා අපහසුවෙන් ගොඩකළ යුතු මඩවලක් සහිත බිම් කැබෙල් ලක් සකස් කරමින් සිටියහ.

මඩවගුර ගොඩකිරීම අවසන්වන්ට පෙර විසිලක්ෂයක් රහතුන් වහන්සේ විසින් පිරිවරණ ලද අසමවූ අසමසමවූ ත්‍රෛ- ලොක්‍යනාථවූ දීපංකර තථාගතයන් වහන්සේ අනුපමවූ බුදු සිරියෙන් හොබමින් ඒ මඟ වඩනාසේක. ජීවිත ගැටලුව විසඳ ගැණීමේ චෙතනාව සිත තුළ බල පැවැත්වූ නමුත් තථාගතයන් වහන්සේ දැකීමෙන් මහසත් තුමාගේ අදහස වෙන අතක යොමු විය, ',මා පමණක් තනිව ජීවිත ගැටලුව විසඳගෙණ දුකින් එතෙරවීම නොව අනන්තවූ සත්ව සමූහයක්ද සසර දුකින් මුදවාලන්ට හැකිනම් එය වඩා මැනවි. එහෙයින් මමද බුදුබවට පත්වෙමි." යන උදාර අදහස සුමෙධ තාපස තුමන් වහන්සේට ඇතිවිය.

කිංමෙ අඤ්ඤාත වෙසෙන - ධම්මං සච්ඡිකතෙනිධ

සබ්බඤ්ඤුතං පාපුණිත්වා - සන්තාරෙස්සං සදෙවකෙ.

(බුඩවංස පාලි)

(මා පමණක් සත්‍යය දැනගෙණ හුදකලාව සසරින් එතෙර වීම සුදුසු නොවෙයි. සියල්ල දත් බවට පැමිණ දෙවියන් සහිත සෙසු ලොකයාද සසරින් එතර කරවන්නෙමි.)

මෙසේ සිතා දෘඪතර අධිෂ්ඨානයකින් හා උද්‍යෝගි- බලාපොරොත්තු සහිත- තාපසකින්ද යුක්තව "මේ උතුම් තථාගතයන් වහන්සේ සහිත මහසඟනට මගේ ජීවිතය පුදමි. මේ බුදුපාමොක් මහසඟන මඩ සහිත මහපොළොව නොමඩීවා! මා සිරුර මැඩ ගෙණ වඩීවා!" යනුවෙන් ප්‍රාර්ථනා කොට බුදුපාමොක් මහසඟන දෙසට මුහුනලා අවිකුරුව නමස්කාර පූර්වකව වැදහොත්තේය.

අඳුන් දිවිසම් හා ජටාමඬුලු සහිතවූ මඩගොඩ මත වැතිර සිටින සුමේධ තාපසයන් දුටු දීපංකර බුදුරජාණන් වහන්සේ දහස් ගණනක් ජනිජනයා අතර සිටි මේ උදාර පුද්ගලයාගේ අධ්‍යාශය දිවසින් දුටුසේක් පෙරත් මනොප්‍රණිධාන- වාග්ප්‍රණිධාන පුරා ආ වීරයෙකු බවද දැන වදාරා භික් සඟන අමතා සුමේධ තාපස තුමන් වෙත ශ්‍රී හස්තය දිගු කොට :- "මහණෙනි! මේ බලව්! දිවි නොතකා ආත්ම පරිත්‍යාගයෙන් යෙදී බිම වැතිර සිටින උග්‍රවූ තපොගුණයක් හා බලවත් චිත්තාධිෂ්ඨානයක් ඇති මේ උදාර පුද්ගලයා මෙතැන් පටන් සාරාසංඛ්‍ය කල්පලක්ෂයක් ගිය තැන ගොතම නමින් මා සේම ලොව්තුරා සම්‍යක් සම්බොධියට පත්වන්නේයයි" නියත වශයෙන් බුදුවන බව ප්‍රකාශ කළසේක.

වදාළේමැයි.— පස්සථ ඉමං තාපසං – ජටිලං උග්ගතාපනං
අපරිමෙය්‍යෙ ඉතො කප්පෙ – බුද්ධො ලොකෙ භවිස්සති

(බුද්ධවංස)

ඉක්බිති දීපංකර බුදුරජාණෝ සුමේධ තාපසතුමන්ට ගරු කිරීම් වශයෙන් මල් මිටක් තබා පැදකුණු කොට වැඩියහ. විසි ලක්‍ෂයක් රහතුන් වහන්සේලාද එක එක මල් මිට බැගින් තබා පැදකුණු කොට වැඩියාහුය. ඉන්පසු එහි රැස්ව සිටි දහස්ගණන් ජනයාද මල් මිට මිට බැගින් පුදා පැදකුණු කොට බෝසත් තුමන්ට දීගාසිරි පතා ගියාහුය.

卐

## 3 පරිච්ඡේදය

# බුද්ධ කාරක ධර්ම සෙවීම හා සම්පූර්ණ කිරීම

සියලු පිරිස ඉවතට ගිය පසු බඹ ගණනක් උස්වූ මල්ගොඩ මතුයෙහි පලක් බැඳ වැඩ සිටි මහතාණෝ තමන් නිශ්චයෙන් බුදුවන බව සලකා එහෙත් කලකින් පසු සිද්ධවන බුද්ධත්ව ප්‍රතිලාභය සඳහා අවශ්‍ය ප්‍රතිපත්ති- බුද්ධ කාරක ධර්ම- තමන් විසින්ම නොඅඩුව සම්පූර්ණ කළ යුතු බව මෙනෙහි කළහ.

“මම බුදුවෙමි එහෙත් දීපංකර බුදුරජාණන් වහන්සේ වදාළ පමණින්ම මට බුදුවිය නොහැක්ක. බුදුබව සඳහා මා විසින් කෙබඳු ප්‍රතිපත්තියක් සම්පූර්ණ කළ යුතුද? බුදුවන උත්තමයෝ කිනම් කිනම් ගුණ ධර්ම සම්පූර්ණ කරන්නාහුද?” යනාදී වශයෙන් විමසන්නාවූ සුමෙධ තාපසයන් වහන්සේ දාන, ශීල, නෛෂ්ක්‍රම්‍ය, ප්‍රඥා, වීර්‍ය්‍ය, ක්ෂාන්ති, සත්‍ය, අධිෂ්ඨාන, මෛත්‍රී උපෙක්ෂා හෙවත් පරිත්‍යාගය, ශීලය, පැවිදිබව, නුවණ, උත්සාහය, ඉවසීම, සත්‍ය වචනය, චිත්තාධිෂ්ඨාන බලය, මෙත්වැඩීම, මැදිහත්බව යන ගුණධර්ම දශය බුද්ධත්වය සිදුකර දීමට සමත් - බුද්ධ කාරක ධර්ම වශයෙන් නිශ්චය කළසේක.

(පරම භාවයට- උත්තම භාවයට පත් කරනු ලබන හෙයින් මේ බුද්ධකාරක ධර්ම දශය පාරමී නම්ද වෙයි.) එතැන් පටන් සංසාර සාගරයට වැදුනු මහා පුරුෂයාණෝ ජීවිත ගැටලුව විසඳීම සඳහා කරුණාව හා මෛත්‍රියද පෙරදැරි කරගෙණ ප්‍රඥාව අනුව ගිය වීර්‍ය්‍යයෙන් යුක්තව බුද්ධකාරක ධර්ම සම්පූර්ණ කරන්නට පටන් ගත්සේක. දේපල:වස්තුවද. අඹුදරුවන් හා රට රාජ්‍ය යන්ද අඞ්ගප්‍රත්‍යඞ්ග හා ජීවිතයද නොතකා පාරමී ධර්ම සම්පූර්ණ කළසේක.

මහාසුදස්සන, අකිත්ති, සස ආදී ජාතක කාලවල දාන පාරමිතාවද, ශඞ්ඛපාල - සීලවනාගරාජ - චම්පෙය්‍ය - භූරිදත්ත ආදී කාලවල ශීල පාරමිතාවද, චුල්ලසුතසෝම, හත්ථිපාල, අයෝඝර යනාදී කාලවල නෛෂ්ක්‍රම්‍ය පාරමිතාවද, කුද්දාල, රාජෝවාද, තුණ්ඩිල, සරභඞ්ග, සේනක, උම්මග්ග ආදී ජාතක කාලවල ප්‍රඥා පාරමිතාවද, මහාසීලව, පඤ්චාවුධ, මහාජනක

යනාදී ජාතක කාලවල වීර්‍ය පාරමිතාවද; චූලධම්මපාල, මහාකපි, ඛන්තිවාද ආදී ජාතක කාලවල ක්ෂාන්ති පාරමිතාවද; වට්ටක, වානරින්ද, හාරිත, මහාසුතසෝම යනාදී ජාතක කාලවල සත්‍ය පාරමිතාවද, ඛදිරඞ්ගාර, තෙලපත්ත ආදී ජාතක කාලවල අධිෂ්ඨාන පාරමිතාවද, නිග්‍රෝධමිග, සරභමිග, සාමපණ්ඩිත ආදී කාලවල මෛත්‍රී පාරමිතාවද; ලෝමහංස, උරග, කණ්හදීපායන ආදී කාලවල උපේක්ෂා පාරමිතාවද සම්පූර්ණ කළසේක.

තවද ජාතියක් පාසා තමන් වහන්සේගේ මුළු ජීවිත කාලයම ස්වහිතට හෝ ලෝකාර්ථ හෝ වැඩ පිණිස යොදවා බුද්ධත්වය පිණිස ස්ථිර අධිෂ්ඨානයෙන් ක්‍රියාකළ බෝසත්තුමා කෙබඳු කරදරයක් වුවද සිනාමුසු මුහුණින් ඉවසමින්; බලාපොරොත්තුව ඉටුවනතුරු උත්සාහවීර්‍යයෙන් හා සම්‍යග් ඥානයෙන්ද යුක්තව කිසිදු පසුතැවිල්ලකට නොපැමිණ කල් යැවූයේ ලෝකයාටද ආදර්ශවත් කෙනෙක්විය.

උනුමෝ ලොවට වැඩ - කොරෙති නොලැබ කිසි ලැබ
නොයෙක් පලබර තුරු - සඳ පලදී සත රකින එව්

(රණස්ගල්ලේ)

卐

4 පරිච්ඡේදය

# ආදර්ශවත් බෝධිසත්ව චරිත

**සස ජාතකයෙහි;** බෝසත් සාවා අහරක් සොයා ආ බමුණුට සිය ඇඟ මස් දෙනු පිණිස ගින්නට පැනී මෙන් උදාර පරිත්‍යාගශීලී භාවය දක්වීය

**ඛදිරඞ්ගාර ජාතකයෙහි:** බරණැස් සිටුව උපන් බෝසත් තුමා සිය නිවස ඉදිරිපිට පිඬු පිණිස වැඩ සිටි පසේ බුදුන් වහන්සේ නමකට දන් පිළිගැන්වීම සඳහා ආහාර පාත්‍ර යක් සූදානම් කොට ගෙණෙනුයේ නිවස ඉදිරිපිට ආලිඳේ කිහිරඟුරු

වළක් හිබෙනු දිටී, පුදන්ට ගෙණා ආහාර පාත්‍රය ආපසු ගෙණ නොගොස් අසුරියනක් පමණවූ එම ගිණිඅඟුරුවළට පැන, එහි මතුවූ පියුම මතුපිට සිට පසේබුදුන් වහන්සේට දන් පිළිගැන්වීය. බෝසත් බලය නිසා අඟුරුවල මත පියුම් පිපීමද, පිළිණැමීමට ගෙණා ආහාර පාත්‍රය ආපසු නොගෙණයාමද දිවිගියත් ආහාර පාත්‍රය පිළිගන්වමි යන උදාර චෛතසික බලයද එහිදී ප්‍රකටව දක්විය. (මෙහි ගිනිඅඟුරු වළ මාරයා විසින් මවන ලද්දකි.)

සාක ජාතකයෙහි: බරණැස් රජු පුරෝහිත බමුණු විසින් දෙනලද උපදෙසක් අනුව කපුටු තෙල් ගණු සඳහා රාජපුරුෂයින් ලවා කපුටන් මරවද්දී කාක යොනියෙහි ඉපද සිටි බෝසත්තුමාව මේබව දැන ගන්ට ලැබී එතුමා ආත්ම පරිත්‍යාග කොට සිය නෑයන් වෙනුවෙන් ඉදිරිපත්වී බරණැස් නුවරට ගොස් රජු සමග කථා කොට අභයදානය ලබාගත්තේය.

කුක්කුර ජාතකයෙහිදද: සුනඛයොනියෙහි උපන් මහසත්වෝ කුක්කුර ඝාතනය පණවනලද බරණැස් රජ කරා ගොස් එම නියම වෙනස් කරවා අභයදානය ලබාගත්හ. ආත්මපරිත්‍යාගීව ඥතින්ට හිත පිණිස ක්‍රියා කිරීමෙන් මනදෙල ඉටුකරගත්හ.

මහා කපි ජාතකයෙහි: වඳුරුව උපන් බෝසත්හට දිනක් අහර සොයමින් යනුයේ විපතට පත්වූ මිනිසෙකුගේ විලාප හඬක් මහවන මැදදී ඇසුනි. කුමන ශබ්දයක්දැයි විමසිලි සහිතව බලන එතුමාට දකින්ට ලැබුණේ ගැඹුරු නරාවළෙක වැටී නොඩ එනු නොහැකිව දුකට පත් මිනිසෙකි. ඔහු ගොඩලන උපායක් සැලකූ වඳුරු තෙමේ වැල්වලින් කූඩයක් සාදා එහි ආධාරයෙන් බලවත් පරිශ්‍රමයකින් මිනිසා ගොඩනත්තේය. මහත් වෙහෙස නිසා වානර තෙමේ මිනිසාගේ උකුල මත හිස තබා නිදාගත්තේය. වඳුරා නිදද්දී සෙමින් උගේ හිස උකුලෙන් මෑත්කොට බිම තුබූ මිනිසාවඳුරා මරා කන්නට අදහස් කොට ගලකින් හිසට ගැසී. පහර වැරදී යාමෙන් පණ බේරී ගියත් වඳුරාගේ අංශයක තම් මුලක් තුවාලවිය. වහාගසකට පැනගත් වඳුරා තමාගේ දිවිගියත්

පරෝපකාරයෙහි වැදගත්කම සලකා අධම ගති ඇති මිනිසා වනයෙහි අතර මං විය තොදී තුවාලවූ කම්මුල අතකින් අල්වා ගෙණ අත්තෙන් අත්තට පනිමින් මිනිසා කැඳවා ගෙණ මනුෂ්‍යපථයකට පමුණුවා තිරිසනෙකුවූ නමුදු තමන් තුළ පවත්නා උදාර ගුණය ලොවට දැක්විය.

සරභමිග ජාතකයෙහි: බෝසතාණෝ සරභමෘග යෝනියෙහි ඉපිද වනයක වෙසෙසි. දිනක් මුවදඩ පිණිස වනයට ගිය බරණැස් රජ මුවා පසු පස එලවා ගියේය. යොදුන් තුනක් පමණ දුර දුවද්දී රජු මහා නරාවළක් තුළට වැටුනි. මේ බව දත් සරභමුවා ආපසු අවුත් බලවත් පරිශ්‍රමයකින් රජු වළින් ගොඩනගා නිරුපද්‍රැත කරලීමෙන් විපතට පත්වූ සතුරාට නමුදු දිවිපුදා විපතින් මුදා හැරීමේ උදාර ගුණය ලොවට දැක්විය.

තවද ගවයෝනියක උපන් බෝසත්තුමා තමාට කුඩා පූ පමණකින් සංග්‍රහ කළ ස්ත්‍රියකට දහසක් වස්තු ලබාදීමෙන් කෘතඥ කෘතවේදී ගුණය දැක්විය.

ස්වර්ණ මයුරව උපන් බෝසත් තෙමේ වැද්දාගේ මල පුඩුවෙහි බැඳී සිටිමින්ම මුගුරක් ගත් අත් ඇතිව තමන් වෙතට වැද්දාට බණ දෙසා ඔහුගෙන් ජීවිතදානය ලැබී.

මහිංසාස කුමර නමින් සිටි බෝසත් තෙමේ බියකරු දිය රකුසා දැක බිය නොවී ඔහුට දහම් දෙසා තමන්ගේ මල් බෑ කුමරු දෙදෙනා ලබාගත්තේය.

බෝසත් අලිනචිත්ත කුමාර තෙමේ තමාගේ පියාණන් වෙනුවෙන් දිවිපුදා පෝරිසාද නම් නරයකු වෙත බිලියමට ගොස් ඔහුට බණ දෙසා ඔහු සුමඟට හරවා දඹදිව පැවති ලොකු භයක් දුරු කෙළේය.

විදුර පඬිකල නමින් මැරීමට දෙයටුක් අහසට වීසි කළ පුණ්ණක යක්ෂයාට තෙවනිවර කුළුණින් කථාකොට බණ දෙසා අභයදානය ලැබී.

දිවකුරු මුනිඳු පාමුලදී ලද නියතවිවරණයෙන් පසු සසරට වැදුනු මහා බෝධිසත්වයන් වහන්සේ මෙසේ නොයෙක් ජාතිවලදී සෙස්සන් තුළ නොපිහිටි උදාර චෛතසික බලයක්

ඇතිව කුරුණින් හා නැණින් සතුරන් අභිභවනය කොට නොපසුබට වීර්‍යයෙන් පැරුම්දම් සපුරා වෙසතුරු අත් බැවින් පාරමී අවසන් කොට ඉන් චුතව තුසිත දෙව්ලොව "සන්තුසිත" නමින් දෙවරාජත්ව උපන්හ.

කුරුණින්-මෙතින් යුත් උතුමෝ කිසිදු වැටුපක්
නොතකා පරහට හිත වැඩ කෙරෙති

卐

5 පරිච්ඡේදය

# මනුලොව ඉපදීම හා සම්බුද්ධත්වය ලැබීම

"බොධි" වුච්චති චතූසු මග්ගෙසු ඤාණං යනු නිර්වචන හෙයින් ශ්‍රොතාපත්‍යාදි චතුර්මාර්ග සිත්වල ඇතිවන ප්‍රඥව බොධි නම්. එකී ප්‍රඥව ලබාගණු පිණිස වීර්‍ය වඩන, උත්තමයෝ බොධිසත්ව නම් වෙති. (බොධියෙහි ඇලෙන තැනැත්තා "බොධිශක්ත" යනු කිවයුක්ත සුඛොච්චාරණය සඳහා 'බොධිසත්ව' වියසිද මතයි.) මේ "බොධිසත්වයා" වූකලි සර් අසාධාරණඥාන දසබලඥාන චතුර්වෛශාරද්‍යඥානාදි ඥාන කොට්ඨාස සංඛ්‍යාතවූ පුෂ්ප පල්ලවයන් ගෙන්ද සම්බුද්ධත්වය නැමති ඵලයෙන්ද සැදුම් ලබන මහා වෘක්ෂ රාජයයි. බීජය නම් මූල ප්‍රණිධියයි. ඵලගන්වනු සඳහා වෘක්ෂයට ගනු ලබන පඨවි-අපො ආදී ධාතු රස නම් දස පාරමිහුය.

දීපඞ්කර පාදමූලයෙහි රොපණය කරවනලද මූල ප්‍රණිධි සංඛ්‍යාත සම්බුද්ධ බීජය ඇති මහා කාරුණිකයාණෝ සාරම් වැද සාරාසංඛ්‍ය කල්පලක්ෂයක් කල් බුද්ධකාරක ධර්ම සම්පූර්ණ කොට බුද්ධත්වයට සුදුසු කල් බලමින් තුසිත් දෙව්ලොව වැඩ වසන සේක්.

කාලො තේ මහාවීර - උප්පජ්ජ මාතු කුච්ඡියං
සදෙවකං තාරයන්තො . බුජ්ඣස්සු අමතං පදං (බුද්ධවංශ)

ආදීන් තුසී හි ගයා මිනිස්ලොව ඉපිද බුදුබව ලැබ සංසාර සසර සයුරෙන් නොඑතගතු මැනවැ''යි දෙවියන් විසින් කරණ ලද ආරාධනය පිළිගෙණ දඹදිව මධ්‍යදෙශයෙහිවූ හිමාලය කඳු වැටිය බද දක්ෂිණ පාර්ශවයෙහිවූ ශාක්‍ය ජනපදයෙහි අධිපතිවූ සූර්‍ය්‍යවංශෝද්භූත සුද්ධෝදන නම් මහරජුට දූව මහා මායා නම් අගමෙහෙසියගේ කුස උත්පල නැගත යෙදුණු ඇසළ පුර පසළොස්වක්දා පිළිසිඳ දසමසක් ඇවෑමෙන් වෙසක් පුරපසළොස්වක්දා ලුම්බිනි නම් ශාලවනොද්‍යානයෙහිදී දස දහසක් සක්වල දෙවියන් පෙර නිමිති පහළ කරවමින් දෙව් බඹුන් විසින් පිරිවරණ ලදුව මවටද කිසි පීඩාවක් නොමැතිව; සිහි නුවණින් යුක්තව මිනිස්ලොව ජන්මලාභය ලැබූසේක.

පුරණලද පාරමී ගුණ ඇති රුවින් සහ නැණින් අගපත් ශ්‍රීමත් බුද්ධාංකුරයාණන් වහන්සේ සිද්ධාර්ථ යන නමද ලැබූසේක්, සුසැට කලා ශිල්පයද වේදවෙදාංගද, සර්වමිත්‍ර නම් බමුණු ඇදුරෙකු වෙතින් උගත්සේක.

ගිහිගෙය හැර පැවිදිව බුදුවන බව නිමිත්ත පාඨකයන්ගෙන් දැනගත් සුද්ධෝදන නරපති තෙමේ පුතු ගිහි සැපතෙහි ඇලුම් කරවනු පිණිස ඉතා උසස් මානුෂික සැප සලසා දුනි. සොළ සැවිරිදි කල යශෝධරා නම් රුවින් අගපත් මෙහෙසිය සහිත පුරඟනන්ද සලසා දුනි. රජසියන්ද පැවරී.

එහෙත් පැලවීමේ ශක්තිය හොඳින් පිහිටි බීජයකට පෝෂණ ගුණයෙන් යුත් ධාතු රසය ලැබීමෙන් වෘක්ෂයක් ඇතිවූ කල එහි පල මල් හටගැණීම කවුරුන් විසින් වැළැක්විය හැකිද?- නොහැක්කේමය;

වරඟනන් සදිසි පුරඟනුන් විසින් පිරිවරණු ලැබ, රම්‍ය, සුරම්‍ය, ශුභ යන ප්‍රසාදත්‍රය ඇසුරුකොට දෙලොස් වසරක්ම රජසැප සහිතවූ උසස් කම්සැප විඳි මහසත්තුමාගේ ජන්ම වෘසින් විසිනව වැන්න උදාවිය. දිනක් උයන් කෙළියට යන බෝසත්තුමාට ජරාජීර්ණයෙකු-රෝගියෙකු-හා මළකුණක්ද දක්නට ලැබිණ. ජීවිත ප්‍රශ්නය පිළිබඳ ගැටලුව කෙරෙහි සිත බලපවත්වන්ට විය. දිරියට යන අතර හමුවූ පැවිදි රූපය කෙරෙහි පැහැදී සියලු ගිහිසැප හරනට සිත්වී.

උයන් කෙළි කෙළෑ ආපසු රජ මැදුරට පිවිසි බෝසතුන් වහන්සේ රාත්‍රී භෝජනය වළඳා නින්දට ගොස් මැදියම් රෑ පිබිදි නාටිකාඞ්ගනාවන්ගේ විප්‍රකාරය දැක විඩාත් කළකිරුණු සේක් අසල කාමරයක නිදාහුන ඡන්න ඇමතිට කථාකොට "කන්ථක අසු සරසා ගෙණව"යි නියම කොට එම්දා උපන් රාහුල දූතු සහිත යශෝධරාවද දැක මාලිගාවෙන් බැස කන්ථක අසුපිට නැඟී ඡන්න ඇමති වලගෙහි ඇතිව නුවරින් නික්ම අලුයමැ අනෝමා නදී තීරයට පැමිණ; අසු ගඟින් එතෙර පන්වා තන් පලන් සළු පිළි ගලවා අහසට දමා මහබඹහු දුන් අටපිරිකර පැලඳ පැවිදි බව ලබා ඡන්න ඇමතිට අසු සමග ආපසු එනලෙස නියම කොට ඉන් නික්ම රජගහ පුර වැඩිසේකි. එහිදී හමුවූ බිම්සර රජ රජයෙන් පැවරූ කල්හි බුදුවීමට යන බව වදාරා ඉන් නික්ම ගමන් කරණුවෝ ආලාර කාලාම - උද්දකරාම පුත්‍ර ආදී තවුසන් ඇසුරු කොට ද ඔවුන් තුළ පවත්නා තපොගුණයෙහි හෝ ඔවුන් දන්නා ධර්මයෙහි හරයක් නැති බව සලකා උරුවෙලා දනව්වට වැද සේනානි ගම ආශ්‍රය කෙරෙමින් වනලැහැබෙක්හි තවුස්දම් රකින්ට වන්සේක.

එකල තමන් වහන්සේ වෙනුවෙන් පැවිදිව සිටි කොණ්ඩඤ්ඤ ඈ පස්වග තවුසන්ගේද උවටැන් ලබමින් අහස පොළොව එක් කරන්නාසේ-සමුද්‍රයෙහි එතෙර මෙතෙර ලංකරන්නාසේ-බලවත් පරිශ්‍රමයෙන්-දැඩි උත්සාහයෙන්-මන දෙළ ඉටුකරගැනීමේ නො පසුබට වීර්‍ය්‍යයෙන් නානාප්‍රකාර තපො ක්‍රමයන් - ක්ලේශතාපන ව්‍රතයන් අනූනමනත් කරමින් සාවුරුද්දක් මුළුල්ලෙහි අනිකෙකු විසින් කරණු තබා සිතනුවත් නොහැකිතරම් දුක් සමූහයක් විඳිමින් අවසානයෙහි සත්‍යානුසාරි විඤ්ඤාණය නිසා නියමසම්‍යග් ඥානය පහළවී ලබනලද චිත්තබලය ඇතිව; සාවුරුද්ද අවසානයේ වෙසක් පුර තුදුස්වක්දා සේනානි නමේ අධිපති සුජාතා සිටු දේවිය විසින් අජපල් නුගරුක මුලදී පිළිගන්වනලද ක්ෂීර පායාසය වළඳා හඳුවනයෙහි දිවා විහරණය කොට එතැනින් නික්ම බෝ රුක වෙත වඩනාසේක් සොත්ථිය නම් බමුණා විසින් පිළිගන්වන ලද කුසතණ අට මිටද රැගෙණ අශ්වත්ථ බොධි වෘක්ෂය කරා එළඹ එහි නැගෙණහිර පාර්ශවයෙහි කුසතණ බහා ඒ තණ ඇතිරිය මතුයෙහි චතුරාඞ්ග සමන්නාගත වීර්‍ය්‍යාධිෂ්ඨානයෙන් යුක්තව වැඩහිඳ; හිරු බැස යන්නටත් පළමු වසවත්මරු පරදවා ක්ලේශ මාර යුද්ධය ආරම්භකොට ප්‍රථමයෙන්ම ආනාපාන සති කම්මට්ඨාන බලයෙන් චිත්තවිසුද්ධියට පැමිණ; ඉන් නැගී පෙර විසූ කඳ පිළිවෙළ අතට සිත මෙහෙයවා ප්‍රථම යාමාවසානයේ

පූර්වේ නිවාසානුස්මෘති ඥාන යද්; මද්‍යම යාමාවසානයෙහි චුතූපපාත ඥාණයද උපදවා අනතුරුව විදර්ශනා භාවනාව ආරම්භ කොට සම්මසන-උදයබ්බය-භඞ්ගානුපස්සනා-භයතුපට්ඨාන-ආදී නවානුපස්සනා-නිබ්බිදානුපස්සනා-මුඤ්චිතු කම්‍යතා-පටිසඞ්ඛානුපස්සනා සඞ්ඛාරුපෙක්ඛා-අනුලෝම යන දසවිධ විදර්ශනා ඥාණයන්ගෙන් ඉක්බිති ගෝත්‍රභූ ඥානයෙන් පෘථග්ජන ගෝත්‍රය ඉක්මවා ඉන්පසු ආශ්‍රවක්ෂය කාර ඥානයෙන් ක්‍රමයෙන් කෙලෙසුන් මුල්සිඳ නසා සෝතාපත්ති- සකෘදාගාමි - අනාගාමි - අරහත්ත යන සිවුමගපල නුවණින් අවිද්‍යා තෘෂ්ණාවන් ප්‍රහීණ කරත්ම සාරාසඞ්ඛ්‍ය කල්ප ලක්‍ෂයක් කල් මුළුල්ලෙහි පුරණ ලද බුද්ධ කාරක-පාරමී ධර්ම බලයෙන් ෂට් අසාධාරණ ඥාන දශබලඥාන ආදී සකලඥාන කොට්ඨාසයකින්ම පරිපූර්ණව කලියුග වර්ෂ 2478 වැන්නෙහි වෙසක් මස පුර පසළොස්වක්දා අලුයම දස දහසක් සක්වල එකලු කෙරෙමින් දෙතිස්පෙර නිමිති පහළ කරවමින් සවාසන සකල ක්ලේශයන් විහත විධ්වංසනය කරමින් සම්‍යක් සම්බුද්ධත්වයට පැමිණ වදාළ සේක.

卐

## 6 පරිච්ඡේදය.

# "සම්බුද්ධත්වය" යනු කුමක්ද?

ලොව කිසිම දෙවියෙකු-මාරයෙකු-බ්‍රාහ්මයෙකු විසින් නොලැබිය හැකි; මනුෂ්‍යයෙකු විසින්ම ලැබිය හැකි; එහෙත් දෙවියන්ට-බ්‍රහ්මයන්ට-මාරයින්ට හෝ වෙනත් කිසිවෙකුට නැති; අසීමිත චිත්තබලයක් හා; සුපරිසුද්ධ චිත්ත සන්තානයක් ඇති; අතුලයවූ ප්‍රඥාවෙන් යුක්තවූ උත්තමයෝ බුදුවරයෝ වෙති. බ්‍රහ්ම - විෂ්ණු-මහේශ්වරාදී කිසිම දෙවියෙකුගේ අවතාරයක් හෝ මායා රූපයක් නොව ඉතා දීර්ඝ කාලයක් නොපසුබට වීර්යයෙන් හා සත්‍යානුකම්පා කුශලච්ඡන්දයෙන් යුක්තව ගුණදම් සපුරමින් වූත් අන්‍ය කිසිවෙකුගේ උපදේශයක් නොමැතිව දියුණුබවට පත් ස්වකීය බුද්ධියෙන්ම කෙලෙසුන් නසා චතුස්සත්‍යාවබෝධය කළ උතුමෝම "බුද්ධ" පදවියෙන් හඳුන්වනු ලැබේ.

සෙසු සමය යන්හි ඉෂ්ට දෙවතා වශයෙන් සලකනු ලබන්නේ අදෘශ්‍යමානවූ - මනඃකල්පිතවූ- දෙවියෙකි. ඒ දෙවියාගේම

අවතාරයක් ලෙස සලකන; මනුෂ්‍යත්වයට බැසගත්; දේව විත්‍රයිතවූ හෝ දේව වරප්‍රසාද ලද්දවූ; දේවදූත ශාස්තෘවර යෝද ඇතැම් ආගම්වල අදහනු ලබත්. එහෙත් බුදු සමයෙහි දක්වෙන ශාස්තෘන් වහන්සේ අදෘශ්‍යමාන දෙවියෙක් හෝ; මනඃ කල්පිත සර්වබලධාරි මහෙශ්වරයෙක් හෝ නොවෙති. දෘශ්‍යමානවූ මනුෂ්‍ය ශ්‍රෙෂ්ඨයෙකි. ආගම් කතුවරයෙක් නොවෙති. ලොක සත්ත්වයාගේ යහපත - අයහපත දෙක පිණිස ප්‍රත්‍යක්ෂ කළ සත්‍යය අනුව උපදෙස් දෙන අනුශාසකයන් වහන්සේය. අනුන් කළ පව් භාරගෙණ ඔවුන් ගලවන්නෙක් හෝ ගවරළු ගාලට දක්කන එඬේරයෙකු මෙන් සත්ත්වයා ඉටුදෙවියා කරා මෙහෙයවන්නෙක් හෝ ලෝකය නැමති සිරගෙහි සිටින සිරකරුවන් නැවතියසත්ත්වයන් රකින දොරටු පාලයෙක්- මුරකරුවෙක් හෝ නොව සත්ත්වයා දුකින් මිදවීම පිණිස නියම පිළිසරණය දක්වන මාර්ග දෙශකයාණ කෙනෙකි.

ආශ්‍රවක්ෂයින් කායබලයකින්ද අසීමිත ඥාණ බලයකින්ද යුක්ත බුදුවරයෝ අතීත-වර්තමාන-අනාගත යන කාලත්‍රයවර්තතිවූද; ඓහලෞකික-පාර ලෞකිකවූද; ස්වාර්ථ-පරාර්ථයන් නිසිසේ දතගත්තාහු; ලොවට ආදශීමත්ව සෙසු සියලු ශාස්තෘවරයන්ගේ මස්තකාවතංසව අනන්‍ය සාධාරණ ගුණයෙන් යුක්තවූවෝ වෙති.

එසේම මනුෂ්‍යලෝකයෙහිම මිනිසුන් අතරම ඉපදී; මිනිසුන් අතර වැඩී; !ගුණයෙන් හා නුවණින් ආශ්‍රවක්ෂයට පැමිණි ආශ්‍රවක්ෂ මනුෂ්‍යත්වයකින් යුක්ත සම්බුදුවරයෝ (බොධිසත්ව කාලයෙහි ලොකස්වභාවය හෝ දුහුදුන් ගතිය නිසා යම් යම් වැරදි සිදුවුවත්) නිදෙරින්ම සිදුවන වැරදි වලින් වෙන්වූ ශ්‍රෙෂ්ඨයෝ වෙති.

පිරිසිදු ස්කන්ධ පරම්පරාවකින් යුත් ස්කන්ධ පරම්පරාවේ කෙලෙස් පහළවීමේ ශක්තිය නැතිකළ; ශුද්ධ ගුණධර්මාවලියක් ඇති උතුමෝ "බුද්ධ" නම්වෙති.

විසුද්ධඛන්ධ සන්තානො - බුද්ධොති නියමො කතො
ඛන්ධ සන්තාන සුද්ධිතු - ගුණොති නියමො කතො

(ජිනාලඞ්කාරය)

(පිරිසිදු ස්කන්ධ පරම්පරාව බුද්ධ නම්වේ. ස්කන්ධ පරම්පරාවගේ ශුද්ධිය බුද්ධ ගුණය නම් වේ)

මෙසේද දක්වා ඇත:- බුජ්ඣිතා සච්චානීති බුද්ධෝ බෝධෙතා පජායාති බුද්ධෝ තමින් චතුසත්‍යාව බොධකල හෙයින්ද අන්‍ය යන්ට අවබොධ කරවන හෙයින්ද “බුද්ධ” නම්වේ.

සබ්බඤ්ඤුතාය බුද්ධෝ සබ්බදස්සාවිතාය බුද්ධෝ සියල්ල දත් හෙයින් බුද්ධ නම්වේ. සියල්ල දක්නා හෙයින් බුද්ධ නම්වේ. (පටිසම්භිදා)

යම්පන කිඤ්චි අත්ථි ඤෙය්‍යං නාම සබ්බස්ස බුද්ධත්තා විමොක්ඛන්තිකඤාණවසෙන බුද්ධෝ (විසුද්ධිමග්ග)

යමක් දතයුතුද ඒ සියල්ල දත් හෙයින් විමොක්ෂාන්තික ඥාන වශයෙන් බුද්ධ නම්වේ. (මෙහි විමොක්ෂාන්තික ඥාන යනු සබ්බඤ්ඤුත ඤාණයට නමකි)

යං කිඤ්චි ඤෙය්‍යං නාම අත්ථි ධම්මං ජානිතබ්බං අත්තත්ථො වා පරත්ථො වා උභයත්ථො වා; දිට්ඨධම්මිකො වා අත්ථො සම්පරායිකො වා අත්ථො උත්තානො වා අත්ථො ගම්භීරො වා අත්ථො; ගුළ්හො වා අත්ථො පටිච්ඡන්නො වා අත්ථො; නෙය්‍යො වා අත්ථො නීතො වා අත්ථො; අනවජ්ජො වා අත්ථො නික්කිලෙසො වා අත්ථො වොදානො වා අත්ථො පරමත්ථො වා අත්ථො; සබ්බං තං අන්තො බුද්ධඤාණෙ පරිවත්තති (පටිසම්භිදා)

දතයුතු යම්කිසි ඥෙයාර්ථයක් වේනම්:- එනම් ආත්මාර්ථ පරාර්ථ - උභයාර්ථ යන අර්ථයන්ද; දෘෂ්ට ධාර්මික - සාම්පරායික අර්ථයන්ද; ප්‍රකට-අප්‍රකට අර්ථයන්ද; ගූඪවූ හෝ ප්‍රතිච්ඡන්නවූ අර්ථයන්ද; පැමිණවිය යුතු හෝ පමුණුවන ලද අර්ථයන්ද; නිරවද්‍ය නික්ලේශ - පරිශුද්ධ - අවිපරීත - ආදී අර්ථයන්ද යන මේ සියලු අර්ථයන් බුද්ධ ඥානය ඇතුළත පවතී. එහෙයින් බුදුවරයෝ මෙකී සියලු අර්ථයන් ස්වයම්භූඥානයෙන් දැන වදාළාහුය.

අත්ථං හි නාථො සරණං අවොච
න බ්‍යඤ්ජනං ලොකහිතො මහෙසි
තස්මිං අකත්වා රති මක්ඛරෙසු
අත්ථෙ නිවෙසෙය්‍ය මතිං මුතිමා

සත්ව ලෝකයට ප්‍රඥා ලෝකයෙන් ආලෝකවත් කළ තථාගතයන් වහන්සේ තමන් වහන්සේ විසින් අවබෝධ කරණ ලද ධර්මයෙහි දක්වෙන පද පිළිබඳ අර්ථයම සරණ වේයයි වදාළ සේක. ඥාණවන්තයා අක්ෂර - පද - ව්‍යඤ්ජනයන්හි ආශා

නො කොට අඣීයම දැන ගත්තේය. මෙසේ දැක්වූ පරිදි අවබෝධඥානයේ ප්‍රතිවේධඥානයේ-ප්‍රත්‍යක්ෂඥානයේ අන්තඃස්ථිති-පත්ලටම පැමිණි උත්තමයා "බුද්ධ" නම ලැබීමට සුදුසු වේ.

බුද්ධොති පනෙතං නාමං න මාතරා කතං න පිතරා කතං න භාතරා කතං -පෙ- සච්ඡිකා පඤ්ඤත්ති යදිදං බුද්ධො.

බුද්ධ යන මේ නාමය මවුපියන් විසින් හෝ සහෝදරයන් විසින් හෝ වෙන යම්කිසි දිව්‍යබ්‍රහ්මාදීන් විසින් තබනලද නාමයක් නොව ජයශ්‍රී මහා බෝධිද්‍රුම, මූලයෙහිදී ප්‍රත්‍යක්ෂ කරණලද ශ්‍රේෂ්ඨ ගුණය හා ඥානය නිසා ලබනලද අන්වර්ථ නාමයක් බව දක්වයි.

සාරාසඞ්ඛ්‍ය කල්පලක්ෂයක් මුළුල්ලෙහි පූරණලද බුද්ධකාරක ධර්මයන්ගේ මේරීම නිසා ලබන මේ සම්බුද්ධත්වය ලෝකයේ සෙසු තත්වයන්ට වඩා උසස්ය. එසේ බුදු වුවත් රහත් වුවත් ප්‍රතිවේධ කරණ චතුස්සත්‍යය එකක්මය. ලබන නිවන් රසයත් එකමය. එහෙත් බුදුවරසින්ගේ ඥානය හා ගුණය මහසයුර මෙන්ද සෙස්සන්ගේ ඥානය හා ගුණය කුඩා පොකුණක් මෙන්ද දතයුතුයි.

තවද කිවයුත්තෙක් ඇත. තථාගත බුදුවරයෝ වනාහි දෙව්ලොව හෝ බඹලොව හෝ අන්‍ය කිසිම සත්ව නිකායක හෝ නො උපදනාහුය. මිනිස්ලොව-උසස්ම කුලයක ඉපිද උසස්ලෙසට සැප විඳිමින් සිට පසුව ගිහිගෙය හැර යාමද ධර්මතාවක්ය. දුගී කුලයක ඉපිද ගිහිගෙය හැරයාම ලෝකයාගේ නින්දා ලැබීමට හේතුවෙයි. එසේම පහත් කුලයක උපන් කෙනෙකුගේ ධර්මය ලෝකයා උසස් ලෙස නොපිළිගනියි. මව්පිය පරපුරද -(උභයකුල) පවිත්‍රවූ නො කැළැල් පරපුරක් වියයුතුය, ධනය කුලය-ගෝත්‍ර-ඥානය යන මෙකී කරුණු.වලින් සම්පූර්ණ උතුමෙකුගේ සම්බුද්ධත්වය ලෝකයාගේ ගෞරවාදරය නො අඩුව ලැබීමට හේතුයි.

බුදුවරයෝ ලොවට ජාති-ජරා-මරණ යන ස්වභාව ධර්මතාණ පිළිබඳ දුඃඛස්වභාවය නිසිසේ පහදා අනිත්‍ය-දුඃඛ-අනාත්ම යන ලක්ෂණත්‍රය ප්‍රකට කරවයි.

දිව්‍ය-බ්‍රහ්ම-සිද්ධ-විද්‍යාධර ආදි භව්‍යයන සිටි කෙනෙකු විසින් ලොවට පහළ දෙන යටකී ධර්ම ලෝකයා නොපිළිගන්නේ එබඳු අය කෙරෙහි ද ජරා මරණාදි ස්වභාවධර්ම ප්‍රකටව නොපෙනෙන හෙයිනි. මනුෂ්‍යභවයෙක සිටි උතුමෙකුගේ විනා දිව්‍ය බ්‍රහ්මාදීන්ගේ ශාරීරිකබල ප්‍රාතිහාර්ය්‍ය ආදිය පිළිබඳවද ලෝකයා උසස් කොට නොතකයි. මේ ආදී කාරණා නිසා මිනිස්ලොව උසස්ම කුලයක ඉපිද සසර සතු මනාසේ දැන දුකින් මිදීමේ උපාය මාර්ග ලොවට පහළ දෙන බුදුවරයන්ගේ ධර්ම ලෝකයා පිළිගැණීමට පසුබට නොවන්නාහ. එසේම ඔව්හු නිවන් මග අප්‍රමාදව එළි කරන්නාහුය.

එකවර බුදුවරු දෙනමකගේ පහළ නොවීමද ධර්මතාවයකි.

---

මුනිඳුට සරි කෙනෙක් තුන්ලොවම නැත් මුනිතුමෙක් මුත්
අපමණ තරු රැසින් -සඳට සරි තරුවෙක් නොමැති මෙන්
(රණස්නල්ලේ)

## 7 පරිච්ඡේදය.

# තථාගතයන් වහන්සේගේ ආදර්ශමත් චරිතය

සම්‍යක් සම්බොධිසමධිගමය කළ ශාක්‍යනායකයාණන් වහන්සේ අනෙකජාති සංසාරං ආදී ප්‍රීතිවාක්‍යයන් ප්‍රකාශ කොට වදාරා තමන් වහන්සේට ක්ලේශමාර-දෙවපුත්‍රමාර ආදී පඤ්චමාර විද්ධංසනය සඳහා ආධාරවූ අපරාජිත-ජයශ්‍රීමහා බොධිමණ්ඩලයෙහිම ප්‍රථම සප්තාහය ගත කළ සේක් ද්විතීය සප්තාහයෙහි මහබෝ මැඩට නුදුරුව ඊශාන දිශාවෙහි වැඩ සිටිමින් බොධිය දෙසබලා "මේ රුකට සිටදී නොවෙද මා සම්බොධියට පැමිණියේ" යනුවෙන් සිතා කෘතගුණ සැළකීම්වස් අනිමිසලොචන පූජාවද කළ සේක.

ක්‍රමයෙන් සත්සතිය ගතකොට අජපල් නුගරුක මුලදී ධර්මගම්භීරත්වය මෙනෙහි කළ සේක. අනතුරුව මහබඹුගේ ආරාධනය ලැබ ධර්මශ්‍රවණයට සුදුසු නැණැතියන් සොයන සේක් තමන් වහන්සේට බුදුවීමට කලින් ඇදුරන්ව සිටි-නුවණින්සුත්-ආලාරකාලාම උද්දකරාමපුත්‍ර-යන තවුසන් සිහි කළසේක. ඔවුන් මිය ගිය බව දැන එයට අනතුරුව මෙනෙහි කළේ පස්වග තවුසන් පිළිබඳවය. ප්‍රණීතවූ ගැඹුරුවූ සියුම් වූ ධර්මය ප්‍රතිවේධ කළ හැකි නැණවතුන් පිළිබඳව මිස කුලවතුන් ධනවතුන් පිළිබඳව මෙනෙහි නොකළසේක. දෙමාපියන්-ඤාතීන්-පිළිබඳව නොව මෙනෙහි කරණලද්දේ ධර්මාවබෝධයට තරම් නුවණ දියුණු වූවන් පිළිබඳවය.

ප්‍රථමයෙන් දෙශනා කරණලද ධර්මචක්‍ර දෙශනාවද සම්පූර්ණ ත්‍රිපිටකධර්මයම සුවාසූ දහසක් ධර්මස්කන්ධයම ඇතුළත් වන සේ වදාළ බව පෙනේ. ඉන්පසුවද නැණවතුන් සොයමින් නැණවත් එක සත්වයෙකු පිළිබඳව හෝ අනුකම්පා කෙරෙමින් යොදුන් ගණන් පියෙවි නමතින් ම වඩිමින් ලොවට "සත්‍යදර්ශනය" ඇති කරවීමට වෙහෙස දැරූසේක.

මුලින්ම තථාගත ධර්මය පිළිගත් කොණ්ඩඤ්ඤාදි පස්වග තවුසෝ ඉක්බිතිව ධර්මාවබෝධයකළ යසකුලපුත්‍ර-සුජාත සිටුවර සුජාත සිටුදේවි-ආදීහුද දඹදිව වැදගත් කුලවල උපන් නැණවත්හු වූහ. යසකුල පුත් තෙරුන්ගේ යහළු කුමරුවෝද නුව-නැත්තෝ වූවාහු තථාගත ශ්‍රාවක බවට පත්වූහ. භද්‍රවර්ගීය, උරුවෙල කාශ්‍යප ආදී කීර්තිමතුන් මුලදී මේ ශාසනයෙහි ධර්ම ප්‍රතිවේධය කළ හෙයින් තථාගත ධර්මය ශ්‍රවණයෙහිදීද ප්‍රති-පත්ති පිරීම සඳහා පැවිදිබව ලැබීමෙහිද උද්යෝගයක් ලෝකයා අතර ඇතිවිය. බිම්බිසාර-කොශල-ලිච්ඡවී-ආදී ශ්‍රේෂ්ඨ රජවරුන්ද තථාගතයන් වහන්සේගේ දායකයන් වීමෙන්-සරණ යාමෙන් ශාසනය කෙරෙහි සෙසු ලෝකයාගේද ගරුත්වයක් ඇතිවීමට එය හේතුවිය.

බුදුරජාණන් වහන්සේ විසින් එකල බමුණන් අතර පැවති බමුණුවාද, කුලවාද යාග හෝම ශාන්තිකර්ම-ආදී නිසරු ඉගැන්වීම් වලට පහත් සමාජ චාරිත්‍රවලට-විරුද්ධව ප්‍රසිද්ධියේ දෙශනාවන් පවත්වනලද නමුත් එයට එරෙහිව නො බියව තථාගතයන් වහන්සේට වධකිරීමට තරම් ශක්ති ඇතිව කිසි වෙකු ඉදිරිපත් නොවූයේ ලෝකයා පිළිගත් ශ්‍රේෂ්ඨ කුලයක

තථාගතයන් වහන්සේගේ උපත සිදුවීමද සර්වප්‍රකාරයෙන්ම ගුණ බල—ඥාණබල, චෛතසිකබල, පුණ්‍යබල, පිරිස්බල ආදී යෙන් තථාගතයන් වහන්සේ යුක්තවීම නිසයි.

තවද තථාගතයන් වහන්සේ අනුගමනය කළ උදාර ගුණයක් නම් තමන් වහන්සේ අවබෝධ කළ ධර්මය ලෝකයාට අවබෝධකරදීමේදී කිසිම බාහිර බලවේගයක හෝ උපක්‍රම ශක්තියක හෝ පිහිට බලාපොරොත්තු නොවීමයි. එසේ බලාපොරොත්තුවූසේක් නම් මුළු මහත් දඹදිවම රාජ නීති බලයෙන් බෞද්ධ කරවිය හැකිව තිබුනි. කොසොල බිම්බිසාරාදී රජවරුන් ලවා එකම නීතියක් ප්‍රචාරය කර වීම පමණකින්ම එසේ කරවිය හැකි හෙයිනි.

කෙනෙකුගේ නියමයක් නිසා හුදු විශ්වාස මාත්‍රයෙන් පමණක් ධර්මය නොපිළිගතයුතු බවද තම තමන් විසිනුත් එය කල්පනා කළ යුතු බවද වදාළ තථාගතයන් වහන්සේ තම තමන් කැමති ආගමක් ඇදහීමේ නිදහසටද බාධා නොකළ සේක. තමන් වහන්සේ අනුගමනය කරන්නවුන් සෙසු ලෝකයා ගෙන් වෙන්කොට නොතැබූසේක. එහෙයින්ම බෞද්ධයා අන්‍යාගම් පිළිබඳ ඉවසීම ලබත් ලබත්ම බුද්ධ ධර්මයෙහි වඩාත් භක්තිමත් වෙයි. සත්‍යය හා ප්‍රතිපදාව සර්වප්‍රකාරයෙන්ම සම්පූර්ණ වූ හෙයිනි.

තථාගතයන් වහන්සේ ලොව පහළවීමට පෙරද ඉන් පසුවද ලොව පවත්නා බොහෝ ආගම් (බුඩාගම හැර) "මැවුම් කරුවෙක් ඇත" යන විශ්වාසය පිට ගොඩ නගන ලද්දාහු වෙති. ඒ දේව ආගම්වල ප්‍රධාන අඞ්ගය විශ්වාසයයි. දෙවියන් වහන්සේ කෙරෙහි විශ්වාසය තැබීමෙන් ඒකාන්තයෙන්ම සත්වයාගේ ගැලවීම සිදුවේයයි යනු මනඃ කල්පිත දෙවත්වය පිළිබඳ ඉගැන්වීම් තුච්ඡ කොට හිස් ඉගැන්වීම් ලෙස තථාගතයන් වහන්සේ පෙන්වා වදාළසේක.

තමන් අනුව යන තමන්ගේ වචනය අදහන-තමන්ට අවනතවන මිනිසා රැකීමට දෙවියා නිතරම සූදානම්ලු. දෙවියා මිනිසාගේ ගැලවුම් කාරයාලු. අනුගාමිකයා මෝඩයෙක් වේවා, නැණවතෙක් වේවා උගතෙක් වේවා ධනවතෙක් හෝ නිර්ධනයෙක් වේවා දෙවියාට ඉන් කම් නැත.

දෙවියාට උවමනා කරන්නේ මිනිසා තමන්ට අවනතවීම තමා කෙරෙහි අචල විශ්වාසය තැබීම පමණයි. නුවණින් කල්පනා කිරීමේ සාමර්ථයට ඉදිරිපත්වීමේ ශක්තියට දේව ආගම්වල ඉඩ නැත මෙලෝකයේ අඥානයින් අධිකවීමද විශ්වාසයම ගරු කරන්නන් අධිකවීමද නිසා දේව ආගම්වල පරමාර්ථය වශයෙන් ලගන්වන සදාකාලික ස්වර්ගයේ වැඩි පුර වෙසෙන්නන් මෝඩයින් විය යුතුය.

දේව භක්තිකයෝ මෙබඳුවූ දෙවදෘෂ්ටින් ලොව පතුරුවා හැරීමේදී කඩුවේ බලය-ආයුධ බලය-නිලතල බලය-මිල මුදල් බලය ආදී බාහිර බලවේගයන්හි උපකාරය පතන්නාහුය. ඇතැම් දේව දෘෂ්ටික ඉගැන්වීමක් අනුව ඉතාම ලොකු පින්කම අන්‍ය භක්තියන් මැරීමයි. පෙනේද ලොව ඇති මුලාවක තරම. ?

මේ අද්භූත ආගම් අදහන්නවුන් දඹදිවට පැමිණි අවස්ථාවලදී ඔවුන්ගේ ආගම ප්‍රචාරය පිණිස දහස්ගණන් වෙහෙර විහාරද භික්ෂූන්හුද විනාශ කරණ ලදහ. ඔව්හු තමන්ගේ දෙවියා කෙරෙහි කළ විශ්වාසයෙන් එබඳු මනුෂ්‍ය ඝාතනයක් උසස් පින්කම ලෙසද සැලකූහ. අන්‍ය භක්තිකයින් මැරීමෙන් ඔවුන්ට සදාකාලික සුර ලොව හිමිවන බවද අමතක නොකළාහුය.

මේ මෙසේ නමුත් තථාගතයන් වහන්සේ කිසිදිනක අමතර බලවේගයකින් පරිශ්‍රමයකින් තමන් වහන්සේගේ ධර්ම ප්‍රචාරය කිරීමට හෝ ලෝකයා බලෙන් බෞද්ධයින් කිරීමට හෝ ප්‍රයත්න නොදැරූහ. එසේ ප්‍රයත්න දැරූසේක් නම් තමන් වහන්සේ කෙරෙහි පැවති අසීමිතවූ-අප්‍රමිතවූ-අචින්ත්‍යවූ බුද්ධ බලයෙන් හෝ ඍද්ධි බලයෙන් හෝ කොශල බිම්බිසාරාදීවූ බලසම්පන්න රජවරුන්ගේ රාජ බලයෙන් හෝ සමස්ත ලෝකධාතුවෙහිම බුද්ධ ධර්මය පැතිරවිය හැකිව තිබුනි, එහෙත් එබඳු බාහිර උපක්‍රමයකින් ධර්මය ප්‍රචාරය කරවීමට කිසිසේත් කල්පනා නොකළසේක

(ආයුධයේ හෝ ධනයේ බලයෙන් වෙන ආගම් ලෝකයා අතර ප්‍රචාරය කරවීමට වෙර වැඩුවත් වර්තමාන ලෝකයේ සෙසු සියලුම ආගම් අදහන්නවුන් පහෙන් සිවු කොටසක් අදහන අතර බුද්ධ සමය අදහන්නෝම පහෙන් එක කොටසක් වෙති. ඒ අනුව වුවද බෞද්ධාගම අදහන්නෝ අධික වෙති.)

දිනක් ඖදුම්බරිකා ආරාමයෙහි වැසි න්‍යග්‍රොධ නම් පරිබ්‍රාජකයෙකුට බොහෝ වේලා ධර්ම දේශනාවක් කළ තථාගතයන් වහන්සේ දේශනාව අවසානයේ ඔහුට මෙසේ වදාළසේක.

"සියා ඛො පන නිග්‍රොධ එවමස්ස, අන්තෙවාසිකම්‍යතා සමණො ගොතමො එවමාහ, නඛොපනෙතං නිග්‍රොධ එවං දට්ඨබ්බං යො එව තෙ ආචරියො සො එව තෙ ආචරියො හොතු තෙ - සන්තිඛො නිග්‍රොධ අකුසලා ධම්මා අප්පහීණා සඞ්කිලෙසා පොනොභවිකා සදරථා දුක්ඛ විපාකා ආයතිං ජාති ජරා මරණියා. යෙ සාහං පහානාය ධම්මං දෙසෙමි. යථා පටිපන්නානං වො සඞ්කිලෙසා ධම්මා පහීයිස්සන්ති. වොදනියා ධම්මා අභිවඩ්ඪිස්සන්ති පඤ්ඤා පාරිපූරිං වෙපුල්ලත්තඤ්ච දිට්ඨෙව 'ධම්මෙ සයං අභිඤ්ඤ සච්ඡිකත්වා' උපසම්පජ්ජ විහරිස්සථා ති.

(ඖදුම්බරික සීහනාද සූත්‍රය)

"නිග්‍රොධය! තොප මගේ අතවැසියෙකු කරගණු කැමැතිව තොපගේ ඉගැන්වීම් වලින් තොප ඉවත්කර මගේ අනුශාසනය තොපට උගන්වනු කැමතිව; තොපගේ ආජීවයෙන් වෙන් කරණු කැමතිව; තොපගේ ආචාර්ය පරම්පරාවෙහි අක්‍රශලයයි සම්මත දෙයෙහි තොප පිහිටුවනු කැමතිව; තොපගේ ශාසනයෙහි කුශලයයි සම්මත දෙයෙහි තොප ඉවත් කරණු කැමතිව; මෙය මා කිය සිසි තොපට හැඟීමක් ඇතිවන්ට පුළුවන, ඒ එසේ සිතීම නොවටී. දැන් තොපගේ ආචාර්ය තෙමේ මතුත් ආචාර්ය වේවා! තුම්මතුන්ගේ ඉගැන්වීම්ද පිළිගැනීම්ද යුෂ්මතුන් විසින් පණවා ගත් ප්‍රඥප්තිද එසේම ගණු ලැබේවා! ඒ තොප ගත් කිසිවකින් ඉවත් කරවන්ට මෙය මා කියනවා නොවේ,

එහෙත් පිවිසුන්තක් ඇත, භව දුක ඇතිකරන පුනර්භවය සිදුකරන, දුක්විපාක ලබාදෙන, අකුශල ධර්මයෝ යුෂ්මතුන්ගේ චිත්ත සන්තානයෙහි අප්‍රහීණව බර සහිතව පවත්නාහ. චිත්ත සන්තානය කිළුටු කරන ඒ අකුශල් දුරුවනු පිණිසත්; සිත පිරිසිදු කරන ශමථ විදර්ශනා ධර්මයන්ගේ වැඩීම පිණිසත්, මාර්ග ප්‍රඥ ලද ප්‍රඥවන්ගේ සම්පූර්ණත්වය හා විපුලත්වය පිණිසත්, මේ ජන්මයෙහිම තෙමේම විශිෂ්ට ඥානයෙන් දැන, තෙමේම ප්‍රත්‍යක්ෂ කොට දැන, දුකින් මිදීමේ මාර්ග ප්‍රතිපදාවට පමුණුවනු පිණිසත් මම ධර්ම දෙශනා කරමි."

තථාගතයන් වහන්සේ කෙබඳු ප්‍රතිපත්තියකින් යුක්තව කුමක් අරමුණුකොට ලොව ධර්මය දෙශනා කරන සේක්ද යනු මෙයින් මනාව නොවැටහේද?

තවද "තථාගතයන් වහන්සේ හෝ තථාගත ශ්‍රාවකයින් වහන්සේ කෙනෙකු හෝ දිනපතා එක සෘද්ධි ප්‍රාතිහාර්‍යයක් පාමින් ධර්මදෙශනා කරනසේක් නම් බොහෝ ජනයා බෞද්ධයින් වනු ඇතැයි" නාලන්ද පුර වැසි කෙවඩ්ඪ නම් ගෘහපතියෙකු විසින් කරණ ලද ඉල්ලීමක්ද ප්‍රතික්ෂෙප කළසේක.

එසේම "ධර්මය සඞ්ගීතයට හැරවීතම් ලොව ධර්ම ප්‍රචාරය ඉතාම උසස් ප්‍රතිඵලදායි වන හෙයින් දෙශනා පාඨ සඞ්ගීතයට හරවනු පිණිස අවසර දුන මැනවැ"යි තථාගතයන් වහන්සේ වෙත පැමිණි උගත් බමුණෙකු විසින් කරණලද ඉල්ලීමද තථාගතයන් වහන්සේ ඉතා තුච්ඡකොට ඉවතහළසේක. රුණ්ණමිදං භික්ඛවෙ අරියස්ස විනයෙ ගීතං (අංගුත්තර නිකාය. යනුවෙන් සංගීතය ආර්‍ය විනයෙහි ඇඬීමක් බවද දෙශනා කළසේක.

බෝසත් කල සිටම ලොව ආදශීවත් ජීවිතයක් ගත කළ උතුමා බුදුවීමෙන් පසුවද ගතකලේ අද්භූත ආදශීවත් ජීවිතයකි. 'අපදාන'යෙහි දක්වෙන පරිදි වරින්වර ඇතිවූ හිසරදය සහ බේලුව ගමෙහිදී ඇතිවූ ලොහිත පක්ඛන්දිකාබාධයද හැරෙන්ට අන් කිසි රෝගයකින් උන්වහන්සේට පීඩා නොවිය. ශරීරයේ දොස් පහකර ගැණීම සඳහා ජීවක වෛද්‍යවරයා ලවා කරවාගත් උදර විරේකය හා දෙව්දත්තෙර පෙරලූ ගල් පතුර වැදීම නිසා ශ්‍රී පාදයෙහි ඇඟිල්ලක ඇතිවූ ලේ කැටි ගැස්මෙන්වූ වේදනාව දුරුකිරීම පිණිස ජීවක වෛද්‍යවරයා ලවා කරවාගත් "ශල්‍යකර්මයද" හැරෙන්ට අන්‍යවූ ප්‍රතිකාරයක්ද තථාගතයන් වහන්සේට අවශ්‍ය නොවිය.

එහෙයින් පිරිනිවන් පාන අවස්ථාව දක්වාම හොඳ නීරෝගි ජීවිතයක් ගතකළ සේක. වර්‍ෂයකට වරක් සිදුකරන චාරිකාගමන උන්වහන්සේගේ ශරීර සැපය තහවුරු වීමට හේතුවූ අතර දින චරියාවද උන්වහන්සේගේ නිරෝගිකම ඇතිවන පරිදි පිළියෙළවූ බවද පෙනේ.

## තථාගතයන් වහන්සේගේ ආදශීවත් දින චරියාව

**පෙරබත්කිස** කෙබඳු තැනක තථාගතයන් වහන්සේ රාත්‍රිය ගත කළත් අලුයම නැගිට වදාරණසේක. මුඛ ධොවන ආදී ශරීර කෘත්‍යයන්කොට පිඬු පිණිස

හැරිය යුතු කාලය එළඹෙන තෙක් විවේකීව වැඩ සිටින සේක. (කලින් ආරාධනාවක් පිළිගෙණ නම් ඒ ස්ථානයට වැඩම කරන බවද නැතහොත් පිඬු පිණිස හැසිරෙන බවද දතයුතුයි) ඇතැම් දිනක භික් සඟන පිරිවරකොට හෝ ඇතැම් දිනක හුදකලාව හෝ පිඬු සිඟා වඩිනාසේක. තනිව පිඬු සිඟා හැසිරෙන සේක්නම් වේලාව එනතෙක් ගඳකිළිදොර සම්පූර්ණයෙන්ම වසාගෙන වැඩ සිටිති. භික් සඟන පිරිවරා වඩිනාසේක් නම් ගඳකිළි දොර අඩක් වසා ඇතුලේ වැඩ සිටිති. ඇතැම් දිනයක ඍද්ධිප්‍රාතිහාර්‍ය්‍ය දක්වමින්ද ඇතැම් දිනයක අප්‍රකටවද පිඬු සිඟා වඩිති. ගෙපිළිවෙළින්ම වඩනාසේක.

සැදැහැවත් සත්පුරුෂාදීහු ගඳමල් ආදියෙන් මුනිඳු පුදා වැඳ පාත්‍රය ගෙණ අසුන්හි වඩා හිඳුවා සකසා දන් වළඳවති. අනතුරෙහි තථාගතයන් වහන්සේ පැමිණ සිටි පිරිසට චරිතානුකූල ලෙසින් දහම් දෙසනසේක. නුවණැතියෝ තිසරණයෙහිද පවනත් ශීලයන්හිද පිහිටති. මහපල නුවණ ලබති. පැවිදිබව හෝ අයදිති. ඒ ඒ අයට සුදුසු පරිදි හිතවැඩ සලසාලන සේක. ඉක්බිති තථාගතයන් වහන්සේ විහාරයට වැඩ ගඳකිළි දොර වැඩ සිටින සේක. ශ්‍රාවකගණයා පැමිණ උන්වහන්සේට වැඳ නමස්කාර කොට වත් දක්වන සේක.

එකල

“ භික්ඛවෙ අප්පමාදෙන සම්පාදෙථ දුල්ලභො බුද්ධුප්පාදො ලොකස්මිං දුල්ලභං මනුස්සත්තං දුල්ලභා ඛණ සම්පත්ති දුල්ලභා පබ්බජ්ජා දුල්ලභං සද්ධම්ම සවණං ”

ආදීන් අවවාදදී වදාරා භික්ෂූන් ප්‍රතිපත්තියෙහි උනන්දු කරවා එහිදී කර්මස්ථාන ගන්නවුන්ට කර්මස්ථානද දෙවා වදාරා ගඳකිළියට පිවිසෙන සේක.

**පසුබත්කිස:** ගඳකිළියට පිවිසි තථාගතයන් වහන්සේ ඉදින් නම් සිහිනුවණින් යෙදී මොහොතක් (සිංහල පැයක්) පමණ කල් සිංහශය්‍යාවෙන් ගතකරන සේක. අනතුරුව ඉන් නැගිට ධර්මාවබොධයට හෝ ශරණ ශීලයෙහි පමණක්වත් පිහිටුවීමට වාසනාව ඇති වෛනෙය ජනයන් නුවණින් බලනසේක. ඉන්පසු ගම් නියම්ගම් ,රාජධානියක් ඇසුරු කොට වසනසේක් නම් එහි මහජනයා ගඳ දුම් මල් පහන් ආදිය ගෙණ ධර්මශ්‍රවණය සඳහා තථාගතයන් වහන්සේ කරා පැමිණේ. තථාගතයන් වහන්සේ ඔවුනට සුදුසු පරිදි ධර්මදෙශනා කරණසේක. දෙව්රම් වෙහෙර ආදී ස්ථානයක වසනසේක් නම් දම්සභා මණ්ඩපයට වැඩ එහිදී ධර්මදෙශනා කරණසේක,

රාත්‍රිය යාම වශයෙන් කොටස් තුනකට බෙදා එහිදී පහත දක්වන අයුරින් ගතකරන සේක.

ප්‍රථම යාම කෘත්‍යය: සන්ධ්‍යා කාලයෙහි නාන කොටුවට වැඩමවා ශරීරය සංතූනන්වා ගඳකිළි පිරිවෙණෙහි පණවන ලද බුද්ධාසනයෙහි වැඩ වෙසෙමින් දෙපැයක් පමණ චිත්ත විවේකයෙන් කල්යවා ඉක්බිති ඒ ඒ දෙසින් පැමිණි භික්ෂූන් විසින් පිරිවරණ ලදුව උන්වහන්සේලාගේ ප්‍රශ්න විචාරණයට පිළිතුරු දෙමින් කර්මස්ථාන වදාරමින් චරිතාධිමුක්තීන්ට නිසිසේ දහම් දෙසමින්; ප්‍රථම යාමය සිව්වණක් පිරිසට හිතවැඩ සලසනසේක.

මධ්‍යම යාම කෘත්‍යය මධ්‍යම යාමයෙහිදී දිව්‍ය බ්‍රහ්මාදීන් විසින් අසනු ලබන ප්‍රශ්නයන්ට පිළිතුරු දෙමින්ද ඔවුනට දහම් දෙසමින්ද නැතහොත් භික්ෂූන්ගේ ප්‍රශ්න විචාරණයන්ට පිළිතුරු දෙමින්ද ලොවට වැඩ සලසනසේක.

පශ්චිමයාම කෘත්‍යය: පශ්චිමයාමය කොටස් තුනකට බෙදා ප්‍රථම කොටසෙහි පැයක් පමණ සක්මන් කරණසේක. (ඒ බොහෝ වේලා එකම ඉරියව්වකින් වැඩ සිටීමේ ශරීර පීඩා දුරු කිරීම පිණිසයි) ඉන්පසු සක්මනින් බැස (සක්මන නවතා) ගඳකිළියට පිවිස සිහි නුවණින් යෙදී (නැගිටින වේලාව සලකා) දකුණැලයෙන් 'සිංහ ශය්‍යා'' වෙන් සැතපෙන සේක. දෙවන කොටස මෙසේ ගත කොට ඉන්නැගිට අවසාන කොටසෙහිදී පෙර බුදුවරයින්ගේ සස්න පවත්නාකල දන් සිල් බැවුම් ආදී කුශලයන් කිරීමෙන් මේරූ පින් ඇති, චතුසත්‍යාවබෝධයට හෝ යටත් පිරිසෙයින් තෙරුවන් සරණ යාමට හෝ නුවණ ඇති වෛනෙය ජනයන් දක්නා පිණිස මහා කරුණා සමාපත්තිඥානයෙන් ලොව බලනසේක.

මෙසේ බලනකල තථාගතයන් වහන්සේගේ ජීවිත තජ්ජය පරාර්ථය සඳහා යොදනලද අයුරු නො පෙනෙන්නේද? තමන් වහන්සේගේ ශරීර සැපය සලකා දිනකට යොදන කාලය උඩත් පිරිසෙයින් තුන් පැයකට වඩා නැත. සම්පූර්ණ රාත්‍රියක නින්දට

ගතවුන කාලය පැයකට අධික නැති බවද පෙනේ. ලෝක සත්වයාගේ හිතසුව සලකා උන්වහන්සේ ගත කළ උදාරතරවූද දීප්තිමත්වූද, ආදර්ශවත්වූද චරිතය ලොව කෙබඳු කෙනෙක් ගත කරන්නේද? කරුණා සාගරයක්වූ-මෛත්‍රීමූර්තියක්වූ-ප්‍රඥා ප්‍රදීපයක්වූ, තථාගතයන් වහන්සේගේ චරිතය අනුගමනය කිරීමද, උන්වහන්සේගේ සරණ යාමද නැණැතියන්ගේ යුතුකම වෙයි.

රුවන් මිල නොදත් අනුවණ දන වෙල ද
ලොබින් කඳ මැවි මිණියසි රැගත් ලෙ ද
පසන් මුනි වරන් හැර අන් සුරන් වැ ද
නිවන් පතා රැවටෙති සත ගෙණ දුල ද

(අලගියවන්න)

**සසර දුකින් මිදීමට බුදු සරණ යන්න!**

卐

## 8 පරිච්ඡේදය

# 'ආගම' යනු කුමක්ද?
# මිනිසාට ආගමක් අවශ්‍යද?

"ආගමෙති එතාති ආගමො" ආ පූර්ව ගමු+ගතියං යන ධාතුවෙන් සිද්ධ ආගම ශබ්දයෙහි පැමිණීම යන අර්ථය මෙහි ප්‍රකටව යෙදෙයි. එහෙයින් "මේ අනුව හික්මෙතුයි" මෙය ඓහලෞකික පාරලෞකික අර්ථ සිද්ධියට උපකාරි වේතුයි" "මේ අනුව අවබොධ කළයුතු වේතුයි" ආගම නම් වෙයි.

සාමාන්‍යයෙන් ආගම යනු ඇදහීමයි. විශ්වාසයයි. විශේෂයෙන් ආගම යනුවෙන් හඳුන්වන්නේ ලොව කලින් කල ඇති වූ නැණවත් ශාස්තෘවරයින් විසින් ප්‍රකාශ කරණ ලද අවවාද රාශියයි.

ආගමක් ඇතිකලේද ආගම අදහන්නේද මිනිසාමයි. එයද මිනිස් ජීවිතය ප්‍රධාන කොට ඇයි සත්ව ජීවිතය පිළිබඳ පර්යේෂණාත්මක ඉගැන්වීමකි.

මානව සමාජයේ ආරම්භයේ සිටම මිනිසාට ආගමක් අවශ්‍යවිය. ආහාරපාන ගේදොර ඉඩකඩම් ආදිය සපයාගෙණ ජීවිතය පවත්වාගෙණ යන අතර මේ ජීවිත කාලයට කුමක් සිදුවේදැයි ඇතැම් අය කල්පනා කරන්ට වූහ. මරණින් මතු කුමක් සිදුවේද? ආර්ථික සංස්කෘතික හා අධ්‍යාත්මික තත්වය උසස් කරගැණීමට අනික් කෙනෙකුගේ පිහිටක් උවමනාද? එබඳු පිහිටක් ලැබියයුතු නම් ඒ කවර කෙනෙකු කෙරෙන්ද? ආදී සිතුවිලි පහළ කළ ආදි කල්පිකයා වාතය-ගින්න-ජලය හා අව්ව වැස්ස-කඳු පර්වත ආදී අචේතනික වස්තූන්ගේද, යක්ෂ දිව්‍ය බ්‍රහ්ම ආදී සචේතනික සත්වයන්ගේද තමන්ට පිහිටක් ලැබිය හැකි බව හා ඒය ලබා ගැණීමට ඒ ඒ වස්තූන්ට ද්‍රද පූජා කළ යුතු බවද, සැලකී එහෙයින්ම ගස් ගල්-කඳු-පර්වත ආදියටද, අදෘශ්‍යමාන යකුන් දෙවියන් බඹුන් ආදීන්ටද ද්‍රද පූජා කරමින් බැගෑපත්වූ නානාප්‍රකාර දීන-යාඥා කරමින් අන්ධ විශ්වාසයෙන් ක්‍රියා කරන්ට වූහ. කල් යත් යත් මෙකී ඇදහිම් ක්‍රම හා යාඥා ක්‍රම ආගම් නමින් හඳුන්වන්නටද වූහ. දේව ආගම්-බ්‍රහ්ම ආගම්-යක්ෂ ආගම් යනාදී නම් වලින් තමන්ගේ ඇදහිම් ක්‍රම ලෝවටද ප්‍රකාශ කරන්ට වූහ. එකී ඇදහිම් ක්‍රම ඇති කළ අය ආගමිකනුවරයින් ගැලවුම් කාරයින් ආදී නම්වලින්ද පිළිගණු ලැබූහ.

සමාජ පාලනය සඳහා නීති රීති හා පාලන ක්‍රමද සකස් කරගත්තානු එසින් නොනැවතී ආත්මවිමුක්තිය-මෝක්ෂය-ආත්ම ශුද්ධිය ආදි නම්වලින් හඳුන්වනු ලබන මනඃ කල්පිත නිඃසරණයක් සඳහා ආගමික නීති පද්ධතියක්ද ඇතිකර ගත්හ. රාජ නීතියට වඩා-පාලන නීතියට වඩා ආගමිකනීතිවලට ගරු කරමින් එයට අවනතව ඒ අනුව ක්‍රියා කිරීමෙන් සංවරයක් හා හික්මීමක්ද ඇතිකර ගත්හ. එහෙයින්ම රාජ නීතියටත් වඩා ආගමික නීතියට මුල්තැනම ලැබුනි. මෙසේ ක්‍රමයෙන් ආදි කල්පිකයින් අතර ඇතිවූ ඇදහිලි ක්‍රම-ආගම් ක්‍රම දියුණුවෙමින් විවිධ ආගමික විශ්වාසයන් ඇතිවෙමින් තථාගත ගෞතම සම්බුද්ධරජාණන් වහන්සේ පහළවනවිට ආගම් ප්‍රභේද දෙසැටක් (62) ලොව ඇතිව තිබුනි. අසත්වාද නාසත්වාද- හෙවත් ශාශ්වත-උච්ජේද නමින් ප්‍රධාන කොටස් දෙකක්වූ එකී ඇදහිම් ක්‍රම දෙකටම වෙනස්වූ අද්භූත ඉගැන්වීමක් ලොවට තථාගතයන් වහන්සේ විසින් ප්‍රකාශ කරණ ලදී; ගස්-ගල් පර්වතාදිය ඇදහීම හා දෙවියන්ට යකුන්ට යාඥා කිරීම නිෂ්ඵල බවත් එබඳු දීන යාඥා වලින් ආත්ම විමුක්තියක් නොලැබෙන බවත් වදළසේක. සත්‍ය දර්ශනයෙන් තොරවූ අන්ධ විශ්වාසය නිසරු

බවත් යාඥ කිරීම දීනකමක් බවත් ආත්මවිමුක්තිය සලසා ගැණීමට නම් තම තමන්ම ප්‍රයත්නවත්විය යුතුවා, වීර්‍යයද වඩා තමන් විසින්ම තමාගේ නිදහස සැපයා; ලබාගත යුතු බවත් වදාළ සේක. එමෙන්ම එයටපිළිවෙත්ද විමුක්ති මාර්ගයද පහදා දුන් සේක. බුද්ධාගම යනුවෙන් හඳුන් වන්නේ සත්වයාගේ විමුක්ති සුවය සඳහා තථාගතයන් වහන්සේ දෙශනා කර වදාරණ ලද් දම පර්‍යාප්ති (ඉගෙණීම) ප්‍රතිපත්ති (පිළිවෙත් පිරීම) ප්‍රතිවේධ (සත්‍යාවබෝධය) සංඛ්‍යාත ත්‍රිවිධ අනුශාසනාවයි.

බුදු දහම අනුව මිනිසාට පිළිසරණ ඔහුමය. ඔහුම වීර්‍ය කළ යුතු ය. ඔහුම පිළිවෙත් පිරිය යුතුය. ඔහුගේ විමුක්තිය ඔහු ලඟය. බුදුවරයෝ එයට නිසි පිළිවෙත වදාරන්නාහුය. අනුන් කළ පවට සමාව දීමෙහි බුදුවරයෝ සමත් නොවෙති. බුද්ධධර්මය විශ්වාස කළ පමණින් හෝ බුදුන්ට පූද පූජා කළ පමණින් ආත්ම විමොක්ෂය සිදු නොවෙයි. බුදුවරයන් වහන්සේලා වදාරණ පිළිවෙත අනුව හැසිරෙන තැනැත්තේම දුකින් මිදෙයි.

බුද්ධාගම යන්නෙහි බුද්ධියෙන් පැමිණීම, බුද්ධියට පැමිණීම, අවබෝධ කිරීම යන අර්ථ ඇතුලත්වන හෙයින් සහජ බුද්ධියක් නැති තැනැත්තාටද, බුදු දහමින් ප්‍රතිඵල නොලැබෙයි.

කිසිවිස්සයක් නොකර හැකි තරම් දුසිරිත් අපරාධ කරමින් කාලපම් සියල්ල අනිත්‍යතා,හිසමත පවරා. නිරුත්සාහයෙන්ම ගැලවීමේ නිදහසක් ලබා ගැනීමේ කැමැත්ත ලොව අඥානයින් අතර බලපවත්වන හෙයින් බුද්ධාගම අඥාන කුසීත සිත්වල රුචි නොවෙයි. කෙබඳු අපරාධයක් හෝ කරමින් මහ දෙවියාට-සර්වඥධාරියාට යාඥ කොට, තමාගේ පව්ගොඩ ඔහුට භාරදී සඳකාලික ස්වර්ගයට යාමට ඇති කැමැත්ත නිසා ලෝකයේ මිථ්‍යාදෘෂ්ටිවලට තවදත් අවකාශ ඇත්තේය.

එහෙත් නියම විමුක්තිය සත්‍යදර්ශනය ලැබියයුත්තේ බුද්ධාගමෙන්ය. ඒ බව නොදත් ඇතැම් අඥනයෝ කොයි ආගමත් එකයයි පවසත්. ඇතැම්විට එසේ කියන්නෝද සමහර බෞද්ධයෝය. ඔව්හු බුද්ධාගම කුමක්දැයි නොදත් බෞද්ධ නාමධාරීහුය. බුදු දහම පිළිබඳ නියම හැඟීමක්-වැටහීමක් ඇත්තොත් කිසිකලෙක කිසිවෙක් කොයි ආගමත් එක යයි නොකියන්නේය.

බුද්ධාගම ශ්‍රේෂ්ඨවන්නේ කිසිම ආගමකට ඇතුළත් නොවන කිසිම ශාස්තෘවරයෙකුට විෂය නොවන අබුද්ධෝත්පාද කාලවල නොමැති අද්භූත ඉගැන්වීමක් බුද්ධාගමෙහි ඇති නිසාමයි. එහෙයින් නැණැතියෝ බුදු සමය උසස් ලෙස වර්ණනා කරති. බුදු සමය වැළඳ ගණිති. ප්‍රතිපත්තියෙහි පිහිටති. සසරින් එතර වෙති.

තිරිසනාට ආගමකින් වැඩක් නැත.
ආගමක් අවශ්‍ය මිනිසාටය.
ආගමකට නැති මිනිසා මහපොළොවට බරකි.
බුද්ධාගම අනුව පිළිවෙත් පුරන්නා දෙලොවම
දිනයි. සසර දුකින් නිදහස්වෙයි.

卐

## 9 පරිච්ඡේදය

# ලෝකයේ ආගම්

තථාගතයන් වහන්සේ සම්බුද්ධත්වයට පැමිණි අවදියෙහි දඹදිව ප්‍රචලිතව පැවතියේ බ්‍රහ්මාගමයයි නිර්මාණ වාදය (මැවීම) මූලික කොට ඇති බ්‍රහ්මාගම ලෝකයේ මුලින්ම ඇතිවූ ආගම බව සිතීමට හේතු බොහෝයි. ආදි කල්පික මනුෂ්‍යයෝ ස්වභාව ධර්මයාගේ නානාප්‍රකාර විපර්යාසයන් නිසා සිදුවන වර්ෂා පතන-ජලගැලීම්-වසංගතරෝග-දුර්භික්ෂය ආදි කරදර විපත්ති පිළිබඳ හේතුවද ඉන් වැළකීමේ උපක්‍රමද නොදත් කාහු ඒ විපත් කරදර සියල්ල අදෘශ්‍යමාන කිසියම් දේවබලයක් දේවභාස්කමක් අනුව සිදුවේයයි සිතූහ. එබඳු උවදුරු වලින් නිදහස් වීමට නම් ඒ දෙවියන් සතුටු කළ යුතු යයිද සැළකූහ. එපමණක්ද නැත. දෙවියන්ගේ ප්‍රසාදය ලැබීමේ උපාය මාර්ග වශයෙන් තම තමන්ට අභිමත පරිදි ආහාරපාන වස්ත්‍රාභරණ ආදියෙන් දෙවියන්ට 'බලි' දීමටද දෙවියන් වෙනුවට ඇතැම් අය දහස් ගණන් එළු බැටළු ආදි සතුන්මරා 'බිලි' දීමටද පෙළඹුනාහ. මේ දෙවියන්ට "බලි බිලි" දීමේ තත්වය කොතරම් උග්‍රවීද, යතහොත් ඇතැම් අය සිය අඹු දරුවන් පවා මරා ඒ මස් වලින් දෙවියන් පිදීම උසස්ම පූජාව ලෙස

සලකා එබඳු දේව පූජාද සිදු කළහ. තථාගතයන් වහන්සේ දඹදිව පහළවන කාලයෙහි අශ්වමේධ-පුරුෂමේධාදි නම් වලින් බිලි පූජා ක්‍රමය බොහෝ ප්‍රචලිතව පැවති බවද අශ්වමේධ-පුරුෂමේධ ආදී යාග ක්‍රම වලින් දේව පූජා පැවති බවද තථාගත ධර්මයෙහි දක්නට ඇත්තේය.

මුලදී අග්නි-වායු-ජල ආදී ස්වභාවික වස්තූන්ම දෙවියයෙන් සැලකූ ආදි කල්පිකයා පසුව එයට අධිපති "දෙවිවරුන් සිටිති" යිද සිතන්නට වන, මුලදී කීප දෙනෙකු වශයෙන් පරිකල්පිත (කල්පනා කරණලද) දෙවිවරු පසුව, ක්‍රමයෙන් වැඩිවූහ. එපමණකින් නොනැවති සත්වජීවිතය කෙරෙහිද දෙවියන්ගේ බලපැවැත්වීමක්-වනකිමක් ඇති බව විශ්වාස කළහ. සම්කිසි දෙවියකු විසින් සත්වයා මවනුලබන බවත් ඔහුගේ කැමැත්තට අනුව සත්වයා ජීවත්වන බවත් විශ්වාස කළහ. එහෙයින් මැවීම මුල්කොට ඇති "බ්‍රහ්මාගමය" ප්‍රථමයෙන්ම ඇතිවූ ආගමය ලෙස කිය යුතුය.

ලෝකය හා තදාශ්‍රිත සත්වයා මහාබ්‍රහ්මයා විසින්
බ්‍රහ්මාගමය මවනලදැයි බ්‍රහ්මාගමිකයන්ගේ ප්‍රකාශය විය.
ඔවුන්ගේ ශාස්තෘවරයාත් ගැලවුම් කාරයාත්
බ්‍රහ්මයාය. ධ්‍යානය දියුණුකරගත් ඇතැම් අය රූපාවචර-අරූපාවචර ධ්‍යානද වඩමින් අෂ්ටසමාපත්තිද ඉපදවීමෙහි සමත් වූහ. තාවකාලිකව කෙලෙසුන්ගේ යටපත් කිරීමක් විනා එයට වැඩි භාවණක් ඉපදවිය නොහැකිවූහ. නෙක්ඛම්ම යන්හි යෙදී මෛත්‍රී කරුණා ආදී ධ්‍යාන වඩා චිත්තබලය දියුණුකොට ඔව්හු අනිත්‍යය දුක්ඛය යන කරුණු භාවනා වශයෙන් ගෙණ බඹ ලොව උපදින්ටද සමර්ථ වූහ. එහෙත් අනාත්ම ලක්ෂණයක් ගැණ දැනීමක් බ්‍රහ්ම භක්තිකයින්ට නොමැති හෙයින් ඔව්හු ආත්මය සහිත වූවන් ලෙසද මහාබ්‍රහ්මයා ඔවුන්ගේ ආත්මය මවන්නා ලෙසද, සලකන්ට වූහ. බ්‍රහ්මයාගේ මැවීම විශ්වාස කළ නුවණැති අය මනුෂ්‍යයාගේ ප්‍රයෝජනය පිණිස නොයෙක් ශාස්ත්‍රද ශිල්පයන්ද නිපදවා, ඒ සියලු ශාස්ත්‍රයම-ශිල්පයම, මහාබ්‍රහ්මයා විසින් පහළ කරනලදැයි ප්‍රකාශ කළහ. එපමණක්ද? නැත. ක්ෂත්‍රිය බ්‍රාහ්මණ-ශුද්‍ර යන ක්‍රමයෙන් ලෝකයේ මිනිසුන් ජාතිවශයෙන් වර්ණ වශයෙන් බෙදා ඔවුනතුරෙන් බ්‍රාහ්මණ වංශිකයෝ බඹුගේ මුඛයෙන්ද සෙස්සෝ බඹුගේ පාදයෙන්ද උපන්නාහ.''යි ඉගැන්වූහ. මේසේම ආදී කල්පිත මිනිසුන් අතුරෙන් ඇතැම්හු අපි "පවෙන් දුරුවම්හයි" කියා ප්‍රාණඝාතාදී

අපරාධයන්ගෙන් වෙන්වූහ. ඔව්හු බ්‍රාහ්මණ යන නම් ලැබූහ. ඇතැම් කෙනෙක් වනයෙහි පන්සල් කොට තෙණ එහි වෙසෙමින් උදේ සවස ගම් කරා පැමිණ පිඬු සිඟීමෙන් කල් යවමින් ධ්‍යාන කරන්නෝ වූහ. ඔව්හු ඣායක නම් ලැබූහ. නානාප්‍රකාර භාෂා ශාස්ත්‍ර නිපදවමින් ඒවා අනුන්ට උගන්වමින් ගම්බදව විසූ ඇතැම්හු ''අජ්ඣායක'' යන නම් ලැබූහ.

ඔව්හු සියල්ලෝම බ්‍රහ්මයාගේ පිහිට බලාපොරොත්තු වෙමින් නානාප්‍රකාර දෙවස්තොත්‍ර ගීතිකා ආදිය නිපදවා එයට 'ඍග්' යනුද පසුව ඒ ස්තොත්‍ර ගීතිකා ගායනා කළහැකි ලෙසින් සකස් කොට-පද්‍ය බන්ධනය කොට එයට 'සාම' යනුද නම් කළහ. පසුව ක්‍රමයෙන් දියුණුව, ඔව්හු යාගවෙන් පමණක් නොව බලයෙන්ද දෙවියන්ගෙන් වැඩගන්නා අයුරු සොයන්ට පටන් ගත්හ. එබඳු පයෝගණයන්ට 'අථර්වන්' යයි නම් තුබූහ. පසුව ඇතිවූවෝ පෙර පැවති යාග පූජා ක්‍රම මනාසේ ක්‍රමානුකූලව සකස්කොට එයට ''යජුර්'' යනු නම් කළහ. මෙසේ නැණැතියන් විසින් නිපදනා ලද 'චතුර්වේදය' මහබඹු විසින් පහළ කරවන ලදැයි පැවසූහ. මේකී චතුර්වේදය නිපදවන ලද්දේ අට්ටක-වාමක වාමදෙව-අංගිරස-භෘගු - යමතග්ගි - වාසෙට්ඨ-භාරද්වාජ වෙස්සාමිත්ත කස්සප-යන ශාස්ත්‍රඥයින් අටදෙනා විසිනි. එහෙත් ඔව්හු බ්‍රහ්මයා කෙරෙහි ඇති අනල්ප භක්තිය නිසා චතුර්වේදය නිපදවන ලද්දේද මහබඹු විසිනැයි සැලකූහ.

තවද වෛද්‍යශාස්ත්‍රය-ජොතිශ්ශාස්ත්‍රය-ශබ්දශාස්ත්‍රය=නීති විද්‍යාව ආදියද මහාබ්‍රහ්මයා විසින් ලොව බිහි කරවන ලදැයි බ්‍රහ්ම භක්තිකයෝ ස්වකීය ග්‍රන්ථයන්හි ලියා තුබූහ.

කල් යත් යත් බ්‍රහ්මයා මැවුම් කරු වශයෙන් සැලකුවන් අතුරෙන්ම ඇතැම් පක්ෂයක් විෂ්ණු නමින් දෙවි කෙනෙකුන් හා ඊශ්වර නමින් තවත් දෙවි කෙනෙකුන්ද යටකී නිර්මාණ ගණයට (මැවුම්කාර පඞ්ක්තියට) එකතු කොට ත්‍රිමූර්තිය ලොව ප්‍රචලිත කරන්ට විය. මේ ත්‍රිමූර්තියගේ ''ලෝක නිර්මාණය'' ඊට කෝටි ගණනකටත් පෙර සිදුවූවකැයිද සලකති.

සිදුහත් බෝසතුන් වහන්සේ බුද්ධත්වය ලබන කාලයේ මේ බ්‍රහ්මානමද බ්‍රහ්ම භක්තියන්ද බොහෝ සෙයින් දියුණුව පැවති බව පෙනේ. එහෙයින්ම තථාගතයන් වහන්සේ ස්වකීය ධර්මය ලොවට ප්‍රකාශ කිරීමට පෙර මහාබ්‍රහ්මයාගේ ආරාධනය ලැබී

මෙම අවකාශ ඇතිකර විදාළේද ශ්‍රී සද්ධර්මය සෙසු දර්ශන වාදයන්ට වඩා ශ්‍රේෂ්ඨ බව දක්වීමටය. බ්‍රහ්ම භක්තිකයින් කෙරෙහිද මේ ධර්ම ප්‍රචාරය කරවීමටය.

නිර්මාණවාදය ප්‍රධාන කොට ඇති ත්‍රිමූර්තියක් ඇතිකරනත් බ්‍රාහ්මණ ධර්මාචාර්යයෝ බලවත් "කුල වාදයෙන්" අනායසින් අභි-භවනය කොට බ්‍රාහ්මණ ජාතිය උසස් මහේශාක්‍ය ජාතිය බවද සෙසු සියලු ජාතීන් පහත් බවද, ප්‍රකාශ කළහ. මේ කුලවාදයේ විපාක වශයෙන් යටකී නිර්මාණ වාදයට විරුද්ධ මතද බමුණන් අතරම පහළ වීමෙන් සවකීය දර්ශනාත්මක හැඟීම් වේද ග්‍රන්ථයන්හි අගට 'උපනිෂද්' වශයෙන් ලියා තැබූහ. මේ නයින් බලනකල ජෛමිනිගේ මීමාංසාවද, ශංකරාචාර්යයන්ගේ වේදාන්තයද කණාද ඍෂිගේ වෛශේෂිකයද ගෞතම ඍෂිගේ න්‍යායද කපිල ඍෂිගේ සාංඛ්‍යයද යන මෙකී දර්ශන වාදයන් පසුව ඇතිවූ බව පෙනේ.

මෙසින් සාංඛ්‍ය දර්ශනය යටකී බ්‍රාහ්මණයන්ගේ ත්‍රිමූර්ති වාදයට වඩා වෙනස්විය. මැවුම් කරුවෙක් නැතැයිද සත්වයාගේ මුල්පටන්ගැන්මක් හෝ කෙළවර වීමක් නැතැයිද ආත්මයක් ඇතැයිද දෙවියකුගේ පිහිටකින් ආත්ම ශුද්ධය නොවේයයිද තමාගේම චිත්තදමනයෙන් ශුද්ධය වේයයිද සාංඛ්‍යදර්ශනයෙහි උගන්වයි.

**චාර්වාක දර්ශනය**

යටකී දර්ශන වාදයෝ ඊශ්වර නිර්මාණ වාදය මූලික කොට ඇතිවූහ. එහෙත් පසු කලක චාර්වාක නම් බමුණෙකු විසින් "නාස්තික දර්ශනයක්" ඇති කරණලදී. පින් පව් කියා දෙයක් නැත. පරලොවක් නැත. පුනරුත්පත්තියක් නැත. මොක්ෂයක් නැත. ආදී වශයෙන් මිථ්‍යා ඉගැන්වීම් වලින් යුක්තව උච්ඡේද වාදයක් ඇති කළ ඔහු "පස්කම් සැප විඳිමින් එහි ඇලී ගැලී ඉන්ද්‍රියයන් පිනවීමම නිර්වාණය ධ. ද විමොක්ෂය බවද ඊට අන්‍ය නිවණක් නැති බවද එබැවින් පොල්ගෙඩියක ලෙල්ල හා පිට කටුවද හැරදමා ඇතුලේ මදය ගන්නාසේ දහසක් දුක් නම් තමොලු සියල්ලක් හැරදමා කාමසැප විඳිය යුතු යයිද ඉන්ද්‍රියන්ම පිනවිය යුතුයයිද" වැඩිදුරටත් පහළ කොළේය. එහෙත් ලෝකයා මේ වාදය බොහෝ පිළිකුල් කොට සැලකූ බව පෙනේ.

**ෂට් ශාස්තෲදර්ශන** තථාගතයන් වහන්සේට සමකාලීන ශාස්තෘන් අතුරෙන් පූරණ කාශ්‍යපාදි සදෙනවූහ. දහස් ගණන් අනුගාමිකයින්ද ඇතිව සිටි මොවුන තුරෙන් සමහරු අචේලක (නග්න) ප්‍රතිපදාව සහිතවූ නිගණ්ඨයෝ වූහ.

**පූරණ කාශ්‍යප වාදය** එයින් පුරණ කාශ්‍යප අකිරියවාදියෙක්වී. “ප්‍රාණඝාතාදිය කරන-කරවන සත්‍වයාට ඉන් කිසිපවක් හෝ දන්දීම් ආදිය කරන-කරවන සත්‍වයාට ඉන් කිසිදු පිනක් හෝ නැත. දාන-ධර්ම-සංයම-සත්‍යවචන ආදියෙන් පින් ලැබීමකුත් නැත.” යනු ඔහුගේ ඉගැන්වීමයි. ඔහුටද අනුගාමිකයෝත් වැස්සෝත් බොහෝවූහ. එහෙත් මෙබඳු ඉගැන්වීම් ඇත්තනට පින්පල සලකා දන්දීමාදියෙන් සැලකූ අය සිටීම නොවේද පුදුමය?

**මක්ඛලිගෝසාල වාදය** මොහු නාස්තිකදෘෂ්ටියෙකි. සත්‍වයන්ගේ පිරිසිදු බව කිසිදු හේතුවකින් හෝ ප්‍රත්‍යයෙකින් නොවන බව ඔහුගේ දෘෂ්ටියයි. කර්මය හෝ කර්ම ඵලය ඔහු ප්‍රතික්ෂෙප කරයි. ස්වභාව ධර්මානුකූලව ඉබේට වැඩීමක් අඩුවීමක් විනා කුශලා කුශල හේතුවක් ඔහු නොපිළිගණියි සියලු සත්‍වයෝත් ව්‍යාකූලතාදිහුත් කල්ප අනුසාර දහසක් ලොව හැසිර ඉන්පසු ඉබේටම සංසිඳියන බවද පිනෙන් අර්ථයක් හෝ පවෙන් අනර්ථයක් හෝ නොසිදුවන බවද ඔහුගේ ඉගැන්වීමයි.

මොහු බලවත් මිථ්‍යාදෘෂ්ටියෙකි. ෂට් ශාස්තෘන් අතුරෙන් මොහු ඉතා පාපතරයෙකු බව තථාගතයන් වහන්සේ වදාරාතිබේ

> නාහං භික්ඛවෙ අඤ්ඤං එක පුග්ගලම්පි සමනුපස්සාමි යො එවං බහු ජනාහිතාය බහුජනා සුඛාය බහුනො ජනස්ස අනත්ථාය අහිතාය දුක්ඛාය දෙවමනුස්සානං – යථයිදං භික්ඛවෙ මක්ඛලි මොඝ පුරිසො. සෙය්‍යථාපි භික්ඛවෙ නදී මුඛෙ ඛිපං ඔඩ්ඩෙය්‍ය බහුන්නං මච්ඡානං අහිතාය දුක්ඛාය අනත්ථාය ව්‍යසනාය. එව මෙව ඛො භික්ඛවෙ මක්ඛලි මොඝපුරිසො මනුස්ස ඛිපං මඤ්ඤෙ ලොකෙ උප්පන්නො බහුන්නං සත්තානං අහිතාය දුක්ඛාය අනත්ථාය ව්‍යසනාය.
>
> (අංගුත්තර නිකාය එකක නිපාත)

(මහණෙනි මේ ලෝකයේ පුද්ගලයින් අතුරෙන් මක්ඛලී (ගොසාල) තරම් බොහෝ සත්ත්වයාට අහිත පිණිස - විපත්තිය පිණිස - හේතුවන කෙනෙකු මම නොදකිමි. මහණෙනි මසුන් ඇල්ලීම පිණිස ගඞ්ගාමුඛයක=මුවදොරක - දැමූ කෙමන යම්සේ මත්ස්‍යයින්ට අහිත පිණිස හේතුවේද? එසේම මේ මක්ඛලී (ගොසාල) තෙමේද බොහෝ සත්ත්වයන්ට විපත් පිණිස - දුගතිදුක් පිණිස - අනර්ථය පිණිස හේතුවන මිනිස් කෙමණකි.)

(මෙයින් නාස්තික දෘෂ්ටිකයා - අහේතු අප්‍රත්‍යය වාදියා - උච්ඡේද දෘෂ්ටිකයා - කෙතරම් දරුණු මිසදිටුවෙක් දැයි යන බව මේ බුදුවදනින් නොවැටහෙන්නේද? වර්තමාන ලඞ්කාවේද කලක සිට මෙබඳු නාස්තික දෘෂ්ටිවාදී අඥානයින් බෝවේගන එන බව පෙනේ. ප්‍රත්‍යක්ෂ ඇසට පෙනෙන දෙයක් විනා ආධ්‍යාත්මීය චෛතසික බලය හා මනස පිළිබඳ බලය නොසලකන එකී විපරීත දෘෂ්ටි ගතයින් අපායට ගිණිපෙනෙලි වන බව සැලකිය යුතුය.)

**අජිත කේශකම්බල වාදය** මොහුද උච්ඡේද වාදියෙකි. කර්මය හා විපාකය ඔහු නොපිළිගණියි. මෙලෝ නැත පරලෝ නැත කර්ම නැත කර්මඵල නැත ආදී වශයෙන් දශවස්තුක මිථ්‍යාදෘෂ්ටිය ලොවට ප්‍රකාශ කළ මොහු "සත්ත්වයාගේ මරණින් මතු ශරීරගත පෘථිවි - ආපෝ - තේජෝ - වායෝ යන ධාතු කොට්ඨාසයෙන් බාහිරවූ පස් ජලය ගින්න වාතය යන මේවාට එකතුවේයයිද ඉපදීම එයින්ම වළකියයිද විස්තර වශයෙන් දක්විය.

**පකුධ කච්චායන වාදය** උච්ඡේද වාදයේම විශේෂයක් ඇති කොට මිථ්‍යාදෘෂ්ටිය ප්‍රකාශ කළ පකුධයන්ගේ අදහසද අද්භූතයි. ඔහු සත්ත්වජීවිතය පිළිබඳ පඨවි - ආපෝ - තේජෝ - වායෝ - සැප - දුක් ආත්ම යන මූලික කොටස් 7 ක් දක්විය. මේ සත කිසිවෙකු විසින් නොමවන ලද්දවූද නිත්‍යවූද වෙනස් නොවන්නාවූද ධර්ම සතක් බව ඔහුගේ මතයයි. පඨවි ආදීන්ගේ සංයෝගවීමක් එකතුවීමක් විනා පරමාර්ථ වශයෙන් ප්‍රාණඝාතාදී පව් කරන කෙනෙකු හෝ දානාදී පින් කරන කෙනෙකු හෝ නැති බවද සත්ත්වයාගේ ජීවය කිසිවෙකුට කැඩිය නොහැකි බවද ඔහුගේ ඉගැන්වීමයි. තවද ඔහු මෙසේ කියයි: "යමෙකු කඩුවකින් හෝ ආයුධයකින් අනෙකෙකුගේ හිස සිරුරෙන් වෙන් කරන කල එහිදී සිදුවන්නේ පඨවි ආදී ධාතු අතරින් කඩුවේ ගමන පමණකි

කඳුවද ධාතුවෙකි. එහි ප්‍රාණඝාතයෙක් නැත. ප්‍රාණවධ කරන කෙනෙක් නැත. කෙනෙකුගේ ප්‍රාණය- ජීවය ආත්මය අනෙකෙකු විසින් නැසිය නොහැකි" මෙය පකුධගේ වාදයයි, (අහෝ ලොව මුලාවන මහත! මෙවැනි දෘෂ්ටි වාදීන්ට යහනින් ලොව ජීවත්වන්ට ඉඩ ලැබීමයි පුදුමය)

**සංජය බෙලට්ඨි පුත්‍ත වාදය** මොහු අමරා වික්ෂේප නම්වූ දෘෂ්ටි ඇත්තෙක්විය. සථිර විශයෙන් පින් පව් දෙකම නො පිළිගැණීම ඔහුගේ දෘෂ්ටියයි. "මේ කුසල් දෑ"යි යමෙකු ඇසුවිට එසේ මගේ පිළිගැණීමකුත් නැතැයි කීමද; එසේ නම් මේ අකුසල් දෑයි ප්‍රශ්න කළ විට එසේද මගේ පිළිගැණීමක් නැතැයි කීමද මොහුගේ දෘෂ්ටියයි. තමන් යම් අදහසක් ප්‍රකාශ කළහොත් ඒ සම්බන්ධව අනික් අය තමන්ගෙන් ප්‍රශ්න කරයිසිද, එයට පිළිතුරු දී තමාගේ වචනය ඔප්පු කළ නොහැකිවුනොත් එය තමාට නින්දා පිණිස පවතී යයිද බියෙන් දෙපැත්තටම අසුනොවනසේ පිළිතුරු දීමෙන් මඟහැරීම බෙලට්ඨි පුත්‍රගේ තත්වයයි.

**නිගණ්ඨනාථ පුත්‍ත වාදය (ජෛනාගම)** තථාගතයන් වහන්සේට සමකාලීනව විසූ පුරණකස්සපාදී නිගණ්ඨයන් අතුරෙන් මොහුගේ ඇතැම් දෘෂ්ටි වාදයෙන් පමණක් තථාගත ධර්මයට අනුකූලවූ බව දක්වෙයි, වර්තමාන ඉන්දියාවේ "ජෛනාගම" නමින් හඳුන්වන දෘෂ්ටි ධර්මයේ මූලිකයාවූ "නිගණ්ඨ නාථ පුත්‍ත" හට සැලකිය යුතු බොහෝ දායක පිරිසක්විය. "වෘක්ෂලතාදියෙහිත් ඇල්දියෙහිත් ප්‍රාණයක් ඇතැ"යි ඉගැන්වූ මොහු අතුරිකිලි කැඩීමත් ඇල් දිය පරිහරණයත් ප්‍රාණඝාතයයි සලකා ඉන් වැලකීමට අනුශාසනා කෙලේය. බුද්ධ ධර්මයේ කුශලා කුශල නම් "චේතනාව" යයි දක්වතත් මොහුගේ වාදයේ "කර්ම" යනු රූපයන් මෙන්ද රූප සංඛ්‍යාත කර්මයන් ආත්මය හා බැඳී සසර සැරිසරන බවද දක්විය. බුද්ධාගමේ කායකර්ම-වාග්කර්ම මනෝකර්ම වලට අනුකූලව ඔහු කාය දණ්ඩ-වාග්දණ්ඩ-මනෝදණ්ඩ යන ක්‍රම තුනක් පණවා කාය දණ්ඩය ප්‍රධාන බව උගැන්විය. චාතුර්යාම සංවරය ඔහුගේ ප්‍රධාන ප්‍රතිපදාවයි. එහෙත් මොහුද මිථ්‍යා වාදියෙකි. තථාගත ධර්මාලෝකයෙන් මොහුගේ දෘෂ්ටිධර්මාලෝකය වැසී ගියේය.(පූරණ කස්සපාදී "ෂට්ශාස්තෘවාද" පිළිබඳව විශේෂ විස්තර දික්සඟියේ සාමඤ්ඤඵල සූත්‍රයෙන් දතයුතු)

## 10 පරිච්ඡේදය

# දෙසැට මිථ්‍යාදෘෂ්ටි

යථොක්ත ක්‍රමයෙන් ආදි කල්පිකයින් විසින් ඇතිකරණ ලද මෙබඳු "මනඃ කල්පිත දෘෂ්ටි" විකාශනය වීමෙන් ඇත (අස්තිවාද) නැත (නාස්තිවාද) යන මූලික ඉගැන්වීම් දෙක අනුව ලොව දෙසැටක් මිථ්‍යා දෘෂ්ටි පහළවිය.

අස්තිවාද (ශාශ්වත දෘෂ්ටිය) "සත්ත්වයෙක් ඇත. පුද්ගලයෙක් ඇත. ආත්මයක් හෝ ජීවයක් ඇත. ඒ ආත්මය විසින් කරණු ලබන හොඳ නරක නම්වූ කර්මවලට විපාකදීමක්ද ඇත. මේ භවයෙන් චුතව සත්ත්වයාගේ පරලොව යාමක් ඇත. මෙයින් චුතව නොස් උපදින නැත සදාකාලිකයි" යනු අස්තිවාදීන්ගේ ඉගැන්වීමයි. මේ ජීවය ආත්මය යම් කිසි බ්‍රහ්ම ඊශ්වර ආදි දෙවියෙකු විසින් මවන ලදයිද; සර්වබලධාරියාගේ කැමැත්තට අනුව සැප දුක ඇතිවේයයිද; සත්ත්වයා මිය යන කළ සර්වබලධාරියා ඔහුට සදාකාලික සැපය හෝ දුක දෙන්නේ යයි ද අස්තිවාදීහු අටුවා වශයෙන්-විස්තර වශයෙන් ඉගැන්වූහ. ඒ අනුව ඔව්හු පරලොව සැප ලැබීමට හේතුවනු පරිද්දෙන් දාන සීලාදී වශයෙන් පුණ්‍යකම්ද; ගොව්‍රත - අජව්‍රත - ශ්වානව්‍රත ආදී කෙලෙශ තාපන ව්‍රතද අනුගමනය කළහ.

නාස්තිවාදය (උච්ඡේද දෘෂ්ටිය) "මෙලෝ නැත පරලෝ නැත කම්පල නැත පින් කරන්නා උපදින සුගතියක් හෝ පව් කරන්නා උපදින දුගතියක්ද නැත. කෙලෙසකින් හෝ හැකිතරම් ධනය සපයා එයින් පඤ්චේන්ද්‍රියයන් පිණවිය යුතුය. (නා ඛි ප්‍රීතිවෙයව්) කිසිදු හේතුවක් හෝ ප්‍රත්‍යයක් නැතිව මේ සත්ත්වයෝ ඇතිවූහ. එහෙයින්ම හේතු - ප්‍රත්‍ය රහිතව මියයයි. මෙයින් මතු කිසිත් නැත" යනු නාස්තිවාදීන්ගේ නිගමනයයි.

මෙකී දෘෂ්ටි දෙක අනුව ලොව ඇතිව තිබූ දෙසැට මිථ්‍යා දෘෂ්ටි පිළිබඳ විශේෂ විනිශ්චයක් තථාගතයන් වහන්සේ විසින් බ්‍රහ්මජාල සූත්‍රයෙහි වදාරා ඇත්තේය. ඒ අනුව මිථ්‍යාදෘෂ්ටි ඛණ්ඩනදය මෙසේය.

| | | | |
|---|---|---|---|
| අසනි වාදය | කෙවල ශාශ්වත වාද | 4 | පූර්වාන්ත කල්පික (අතීත භවය පිළිබඳ ඉගැන්වීම) |
| ශාශ්වත දෘෂ්ටිය | එකාත්‍ය ශාශ්වත වාද | 4 | |
| | අන්තානන්තික වාද | 4 | |
| ප්‍රභෙද 55 | අමරා වික්ෂෙප වාද | 4 | |
| | අධීත්‍ය සමුත්පන්න වාද | 2 | |
| | සඥී වාද | 16 | අපරාන්ත කල්පික (අනාගත භවය පිළිබඳවයි) |
| | අසඥී වාද | 8 | |
| | නෙව සඥී නාසඥී වාද | 8 | |
| | දෘෂ්ට ධර්ම නිර්වාණ වාද | 5 | |

මෙයින් "කෙවලශාශ්වත නම් ආත්මයත් ලොකයත් නොනැසී සදා කල් පවතී"යයි ඉගැන්වීමයි - කොටසක් නිත්‍යයයි ඉගැන්වීම එකාත්‍යශාශ්වත වාදයයි-ලෝකයේ කෙළවරක් ඇතැයි සැලකීම අනන්තානන්ත දෘෂ්ටියයි-පින්-පව්-කම්පල-යනාදිය පිළිබඳ ස්ථිර නිගමණයක් නොකිරීම අමරාවික්ෂෙප යයි- ආත්මයත් ලෝකයත් හේතු රහිතව ඉබේ හටගත් බව ඉගැන්වීම අධිත්‍ය සමුත්පන්න වාදයයි-ආත්මය රූපවත්ය සඥාවත්ය එය නිත්‍යය ආදී වශයෙන් ඉගැන්වීම සඥීවාදයයි- ආත්මය සඥාරහිතයයි ඉගැන්වීම අසඥී වාදයයි-ආත්මය නිත්‍යයයි සඥා ඇත්තේ නොවේ නැත්තේද නොවේයයි ඉගැන්වීම නෙව=පෙ-සඥී වාදයයි=පඤ්ච කාම් සැප විඳීමද ධ්‍යාන ඉපදවීමද හැර අනිත් නිර්වාණක් නැත. එය මෙහිදීම ලැබිය යුතුයයි ඉගැන්වීම දෘෂ්ට ධර්ම නිර්වාණ වාදයයි.

| | |
|---|---|
| නාසනි වාදය | 1 මේ ආත්මය මෙයින් උච්ඡෙදවෙයි. පුනරුත්පත්තියක් නැත |
| (උච්ඡෙදදෘෂ්ටිය) | 2 මේ ආත්මය කාමාවචර දෙව්ලොව ඉපදී එහිදී ආහාර ගැණීමෙන් පසු අන්‍ය දිව්‍යාත්මයක්ව සිට මැරී ඉන් අවසන්වෙයි. |
| ප්‍රභේද 7 යි | 3 මනොමය දිව්‍යාත්මයක්ව ඉපිද ඉන් මැරී අවසන්වෙයි. |
| | 4 ආකාසානඤ්චායතන= 5 විඤ්ඤාණඤ්චායතන |
| මෙයද අපරාන්ත කල්පික යි | 6 ආකිඤ්චඤ්ඤායතන 7 නෙවසඤ්ඤානාසඤ්ඤායතන |
| | යන අරූපතල සතරට පැමිණ එහිදී මරණයෙන් සුන්වේ. |

යනුවෙන් උච්ඡෙද දෘෂ්ටිය සත් ආකාරයකින් ලොව ඇතිවිය. (විස්තර දීඝ්සඟියේ බ්‍රහ්මජාල සූත්‍රයෙහි දක්වා ඇත්තේය.)

(නැණැසියෙනි, මිසදිටු නොවන්න! ලොව මැවූ දෙවියෙක් හෝ බ්‍රහ්මයෙක් හෝ එබඳු මැවීමේ ශක්තිය ඇති අන්‍ය සර්වබලධාරී යෙක් හෝ නැත. ලොව ඉබේ හටගත්තේද නොවේ, ලොව යනු හේතු ප්‍රත්‍යයෙන් ඇතිවූවකි. හේතු ප්‍රත්‍ය නැතිවූදාම ලෝකයක් නැත. ඊශ්වර නිර්මාණ වාදය හෝ අහේතු අප්‍රත්‍යය වාදය හෝ නාස්තික වාදය හෝ බුද්ධාගම නොවේ. බුද්ධාගම යනු හේතුඵල වාදයයි.)

卐

## 11 පරිච්ඡේදය

# සම්බුද්ධාගම i

යම් කිසි ශාස්තෘවරයෙකු – දර්ශනවාදියෙකු විසින් ප්‍රකාශ කරණ ලද අවවාද රාශිය එක්කොට එයට ආගමයයි කියනු ලැබේ. ඒ නීතිය අනුව සම්බුද්ධයන් වහන්සේ විසින් වදාරණ ලද ධර්ම විනය වශයෙන් දෙවදෑරුම්වූ; සූත්‍ර අභිධර්ම විනය වශයෙන් තෙවදෑරුම්වූ; සුත්ත ගෙය්‍ය - වෙය්‍යාකරණ - ගාථා - උදාන - ඉතිවුත්තක ජාතක අබ්භූතධම්ම - වෙදල්ලය යන නවාංග ශාස්තෘ ශාසන වශයෙන් නව වැදෑරුම්වූ; ශ්‍රී මුඛ දේශනා පාළිය සම්බුද්ධාගම (සම්බුද්ධයන් වහන්සේ විසින් වදාරණ ලද්ද, අවබෝධ කරණ ලද්ද යන අර්ථයෙන් යුක්තයි.) යයි හැඳින්වෙයි. ඒ ත්‍රිපිටක ධර්මය උග්ගහණ (ඉගෙණීම) ධාරණ (දැරීම) සවණ (ඇසීම) භාසන (කීම) පරිපුච්ඡා (ප්‍රශ්න කිරීම) විසජ්ජන (පිළිතුරු දීම) යන ක්‍රමයෙන් ප්‍රතිඵල ලැබිය යුතු හෙයින් පර්යාප්ති නම්වේ. පර්යාප්තිය අනුව ක්‍රියා කිරීම ප්‍රතිපත්තියයි. ප්‍රතිපත්තියෙහි පිහිටියනු විසින් ලබන ප්‍රතිඵලය ප්‍රතිවේධයයි. ප්‍රතිවේධය නම් සෝතාපත්ති මාර්ග ඥාණාදී ක්‍රමයෙන් ප්‍රඥාව දියුණුවීමෙන් ඉනාත් මසෙකිදීම නිර්වාණ ධාතුව ප්‍රත්‍යක්ෂ කිරීමය.

ලෝකයත් තදාශ්‍රිත සත්ව සන්තතියත් පිළිබඳවූ ගැටලුව නිරාකරණය කිරීම සඳහා දෙසැටක් මිථ්‍යාවාදයන් ලොව ප්‍රචාරවී පවතිද්දී එබඳු මිථ්‍යාන්ධකාරයෙන් ලොව අඳුරුව පවතිද්දී සම්බුද්ධ දිවාකරයාණ කෙනෙකුන්ගේ සද්ධර්මාලෝකය ලොවට ඉතා අවශ්‍යව පැවති කාලයක්දී ගෞතම තථාගතයන් වහන්සේගේ ප්‍රාදූර්භූතවීම සිදුවිය. නොපෙනෙන සර්වබලධාරියෙකු හා

මරණින් මතු ලැබෙන (අනුමානයෙන් හෝ ප්‍රත්‍යක්‍ෂයෙන් වටිනා ගත නොහැකි) සදාකාලික ස්වර්ගයක් සිහින් මවාගෙණ මනඃකල්පිත දීන ක්‍රියාමාර්ග අනුගමනය කරමින් ශිෂ්ට සම්මත මිනිසා දෙවියන්ට ගැතිකම් කරද්දී තවත් අය ඇත්, අස්, ගවා මහිෂාදී තිරිසන් සතුන් පුළුස්සා බිලිදීමෙන් යාග කිරීමෙන් ආත්ම විමොක්‍ෂය-ශුද්ධිය-බලාපොරොත්තුවෙන් හිංසනව ක්‍රියා කරද්දී, මිනිසෙකු මැරුවත්-සතෙකු මැරුවත්-ගසක් කැපූවත්-කොලයක් කැඩුවත් ඇල්දිය බින්දුවක් බිවත් එක සමාන පව් සිදුවේයයි කියමින් ලොවට අනුශාසනා කරද්දී; තවත් කෙනෙකු ආත්ම ශුද්ධිය පිණිස ගොව්‍රත-අජව්‍රත-ශුනකව්‍රත-වග්ගුලිව්‍රත ආදී අඥාන ක්‍රියා මාර්ගයන්හි යෙදෙමින් වෙසෙද්දී; තවත් කෙනෙක් පස්කම්හිද පස්පවෙහිද ඇලෙමින් පින් පව් කියා දෙයක් හෝ එයට විපාකයක් හෝ මරණින් මතු උපතක් හෝ 'නැතැයිද නිවණ නම් පස්කම් සැප විඳීම පමණක් යයි කියද්දී, මෙකී බහුල මොහාන්ධකාරයෙන් සත්වයා ගලවා නියම නිදහස පහදාදීම සඳහා සම්බුද්ධයන් වහන්සේගේ පහළවීම සමස්ත ලොකධාතුවටම ආශීර්වාදයක් විය.

මරණින් මතු ලැබෙන මනඃ කල්පිත සුගතියක් ගැණ නොව තථාගතයන් වහන්සේ විසින් වදාලේ මේ ජීවිතයේදීම ලැබිය හැකි චිත්ත ශාන්තියක් පිළිබඳ උපදෙශයයි. මිනිසා තුළ පවත්නා ආධ්‍යාත්ම බල මහිමය ලොව කිසිම දෙවියෙකුගේ හෝ බ්‍රහ්මයෙකු තුළ පිහිටා නැති බවද ඒ උසස් බලය දෙවියෙකු හෝ බ්‍රහ්මයෙකුගේ යටතට පත්නොකළ යුතු බවද වදාළසේක. මිනිසා විසින් ලබන ආත්මවිජයය කෙබඳු දෙවියෙකුගේ හෝ බ්‍රහ්මයෙකු විසින් නොලැබිය හැකි බවද පෙන්වූසේක.

> කිසිම දෙවියෙකුට – ඊශ්වරයෙකුට යැදීමකින් හෝ කෙබඳු පූජා විධියකින් හෝ ශාස්තෘවරයාට වැඳීම් මාත්‍රයකින් හෝ කුදු විශ්වාසයකින් හෝ වෙනත් බලයකින් හෝ ආත්මශුද්ධිය ලබාගත නොහැකි බවද වදාළහ.

"අත්තාහවෙ ජිතං සෙය්‍යො. පෙ තථාරූපස්ස ජන්තුනො" යනුවෙන් වදාලේ ආත්මදමනය කළ පුද්ගලයා දෙවියෙකු-මාරයෙකු විසින් නැවත දුබල නොකළහැකි බවයි.

**සද්ධර්ම ප්‍රචාරය කරවීම**

මෙබඳු ප්‍රණීතවූ ශ්‍රී සද්ධර්මය ලොව ප්‍රචාරය කිරීමෙහිලා උන්වහන්සේ ප්‍රථමයෙන්ම සිදුකලේකොණ්ඩඤ්ඤාදී

සැටනමක් ධර්මදූත මෙහෙය සඳහා පිටත්කර හැරීමයි. දෙවෙනිව භද්‍රවර්ගීය භික්ෂූන් පිටත්කර හැරිසේක, උන්වහන්සේ ධර්ම ප්‍රචාරය සඳහා පිටත්කළ භික්ෂූන්ට කළ අනුශාසනයෙන්ම තමන් වහන්සේ තුළ පැවති ආධ්‍යාත්මික-උදාර-කාරුණා ගුණය ප්‍රකට කරයි

> චරථ භික්ඛවෙ චාරිකං බහුජනහිතාය බහුජන සුඛාය ලොකානුකම්පාය අත්ථාය හිතාය සුඛාය සදෙවමනුස්සානං මා එකෙන දෙව අගමිත්ථ. දෙසෙථ භික්ඛවෙ ධම්මං ආදි කල්‍යාණං මජ්ඣෙ කල්‍යාණ පරියොසාන කල්‍යාණං සාත්ථං සව්‍යඤ්ජනං කෙවල පරිපුණ්ණං පරිසුද්ධං බ්‍රහ්මචරියං පකාසථ. සන්ති සත්තා අප්පරජක්ඛ ජාතිකා. තෙ අස්සවණතා ධම්මස්ස පරිහායන්ති අහම්පි භික්ඛවෙ යෙන උරුවෙලා සෙනානි නිගමො තෙනුපසඞ්කමිස්සාමි ධම්ම දෙසනාය. (මහාවග්ගපාලි)

(මහණෙනි! සදෙවක ලෝකයාට හිතවැඩ පිණිස ලෝකයෙහි සද්ධර්ම ප්‍රචාරය කරමින් හැසිරෙව්! දෙදෙනෙක් එක මඟින් නොයව්! මුල-මැද-අග යන තුන් තැන මොනවට යහපත්වූ සර්ව ප්‍රකාරයෙන්ම අර්ථවත්වූ ප්‍රතිඵලදායී මේ ධර්මය දෙශනා කරව්! පිරිසිදුවූ මාර්ග බ්‍රහ්මචර්යාව ප්‍රකාශ කරව්! මහණෙනි කෙලෙස් රජස් වලින් අඩු-නුවණින් වැඩි-ධර්මාවබොධයට සුදුසු අය ලොව ඇත. ඔවුන්ට මේ ධර්මය අසන්ට නොලැබුනොත් ඔව්හු මේ සද්ධර්ම ලාභයෙන් පිරිහෙති. එහෙයින් ධර්ම ප්‍රචාරය කරව්! මමද දහම් දෙසනු පිණිස උරුවෙල් දනව් කරා යමි.)

මේ නියමය ලැබූ ශ්‍රාවකයින් වහන්සේලා ගම්-නියම්ගම්-නගර-ජනපද ආදියෙහි සැරසරමින් සද්ධර්මාලොකය පැතිරවූ සේක.

තථාගතයන් වහන්සේද තමන් වහන්සේ ලඟට මිනිසුන් පැමිණෙනතුරු බලා නොසිට නැණවතුන්-විනේදනන්-සොය සොයා වඩිමින් ඔවුනට සත්‍යය පහදාදුන් සේක. ආලවක-අංගුලිමාල සුචිරොම - ඛර - ආදීන් සොයා ඔවුන් වෙත වැඩිසේක. පිප්ඵලි මානවක-මහා කප්පින රජ-ආදීන් සඳහා පෙරගමන් වැඩිසේක උත්තර මාණවක - ජතු මාණවක- ද්‍රෝණ බ්‍රාහ්මණ ආදීන් එන පෙර මග බලාපොරොත්තු සහිතව වැඩසිටිසේක. එසේවූ නිරහඞ්කාර දහැමි පිළිවෙතක් අනුගමනය කරමින් අචි බලයක් හෝ නිලබලයක් ඇසුරු නොකොට හුදු මෛත්‍රිචෙතනා පෙරදැරිවම සද්ධර්ම ප්‍රචාරය කිරීම ලොවට ආශීර්වාදයක්විය.

**සද්ධර්මය පිළිගත්තෝ**

නියම නිදහසත් = සැපතත් = ආත්ම විමුක්තියත් ලැබිය හැකි එකම ධර්මය තථාගත ධර්මය බව ලොවට ප්‍රත්‍යක්ෂ විය. ලේ බිඳකුදු නොසොල්වා අමතර බලවේගයක්ද උපයෝගී නොකොට ශාන්ත=සන්සුන්=අසුරින්ම තථාගත ධර්මය ප්‍රචාරය කිරීම ලෝකයාට ප්‍රියවිය. ප්‍රතිඵල වූයේ මොහාන්ධකාරය දුරුවීමයි. මිසදිටු බලය සුන්වීමයි. කිසිම විධියකින් හෝ නීති බලයෙන් හෝ අවනත නොවන පුද්ගලයින් තථාගත ධර්ම බලයෙන් අවනත කරවිය හැකි බව=සුමඟට හැරවිය හැකි බව=ලොවට ප්‍රත්‍යක්ෂ විය. එහෙයින්ම දුටුවන් බියෙන් වෙව්ලවූ නම ඇසූ පමණින් තැති ගැණීම් ඇතිකළ අංගුලිමාල වැනි මිනිස් රකුසෝද; සුරා මතින් මත් කරවූ=ආවුධ වලින් ඇන ප්‍රකෝපයට පත්කරවූ නාලාගිරි වැනි චණ්ඩ තිරිසන්හුද; මිනීමස් කමින් ගම් රට පාලුකරමින් ක්‍රියාකළ ආලවකාදි යක්ෂයෝද; එක විෂ ධූමයකින් රටක් පවා අලුකර දැමීමේ විෂවේගයකින් යුත් නන්දෝපනන්ද ආදී නාගයෝද; තථාගත ධර්මබලයෙන් ශාන්ත බවට පත්වූවාහු ධර්ම බලය ලොවට දක්වූවාහුය.

තථාගත ධර්මය පිළිගැණීමට පෙර දරුණු ලෙසින්=චණ්ඩ ගතියෙන් ක්‍රියාකළ චණ්ඩප්‍රද්‍යෝත, අශෝක ආදී රජවරු තථාගත ධර්මය පිළිගැණීමෙන් පසු සුමඟට පිළිපන්නාහු, ධර්මිෂ්ඨයන් බවට පත්වූවාහුය.

ලක්ෂ කෝටිගණන් ධනය ඇතත් දේපල මිලමුදල් පිරිස් බලය යාන වාහන ආදී උපභෝග පරිභෝග වස්තු කොතරම් තිබුනත් එයින් සන්සිඳුවාගත නොහැකිවූ බලවත් ශෝකයෙන් තැවුනු කිසාගෞතමී. පටාචාරා, සෝපාක මාතා, සන්තති ඇමති ආදීන්ගේ ශෝක ගින්න නිවුනේ තථාගත ධර්මය නැමති අමෘත ජලයෙනි.

එපමණක්ද? නැත! තථාගත ධර්මය පිළිගත්තෝද තෙරුවන් සරණ ගියෝද බුද්ධ ශ්‍රාවකයෝවූවාහුද එඬේරයින්=බැටලු පාලකයින් හා මස්මරන්නන් ආදීන් නොව සහම්පති, බකබ්‍රහ්ම, සනංකුමාර ආදී බ්‍රහ්මයෝය. ශක්‍ර දෙවෙන්ද්‍රාදි දෙවිවරුය. සොණදණ්ඩ, කූටදන්ත, පොක්ඛරසාදි ආදී කීර්තිමත් බුද්ධිමත් පණ්ඩිතයෝය. අනාථපිණ්ඩික, උපාලි ගෘහපති, ජෝතිය, ජටිල ආදී මහා ධන කුවේරයෝය. කොශල, බිම්බිසාර ආදී මහ රජවරුය. විශාඛා, සුජාතා, මල්ලිකා ආදී උසස් කුලකාන්තාවෝය. මොවුහු ගෞරවාදරයෙන් තථාගත ධර්මය පිළිගත්තාහුද අවබෝධ කළාහුද වෙත්.

(සිතවත! හොඳ අවබෝධයෙන් වන්න! පරම්පරාවෙන් ආ ශීලාචාර උසස් අය පිළිගත් නිසාවත් ලාභ ප්‍රයෝජන නම්බුනාම කීර්තිනාම ආදිය ලබාගැනීම පිණිසවත් නොව බුද්ධාගම ඇදහිය යුත්තේ අවබෝධ සිහිනි. සත්ත්වයාගේ දුක් නැසීම පිණිස ප්‍රත්‍යක්ෂ ලෙසම අතිශ සත්‍යය සාධු දත් උත්තමයා තථාගතයන් වහන්සේ බවද නියම විමුක්ති මාර්ගය තථාගත ධර්මය බවද නියම පූජ්‍ය පක්ෂය භික්ෂු සංඝරත්නය බවද සලකා තෙරුවන් අදහන්න. "ආගම් කුමක් වුවත් හොඳට කා-බී ඇඳ-පැළඳ සිටියොත් ඒ ඇතිදැයි" යන අඥානයෝ ජීවිතයක නියම තත්ත්වය නොදන්නාහ. ආගම් ධර්මයක් උවමනා නැතැයිද ආගම මිනිසාට කරදරයක්යයිද ආගම මිනිසා දීන බවට පත්කරවන්නකැයිද කියන්නෝ බුදුවරුන් දහස් ගණනක් උපන්නත් සත්‍යාවබෝධයට කෙතරම් නැණ හීනයෝය. පුනරුත්පත්තියක් නැතැයිද කෙසේ හෝ මෙලොව පමණක් හොඳින් ජීවත්විය යුතුයයි කියන්නෝ මහපොළොවට බරවූවෝය.)

卐

## 11 පරිච්ඡේදය.

# තථාගතයන් වහන්සේ ලොවට ඉගැන්වූ දේ.

මේ ශීර්ෂය යටතේ විස්තරයක් ලියතොත් සම්පූර්ණ ත්‍රිපිටක ධර්මයම ලිය යුතුය. එහෙත් මූලික ධර්ම වශයෙන් සලකන විට බුදුවරුන් ලොවට වදාරණ එකම දෙය නම් සත්‍යය යි. එය සම්මුති පරමාර්ථ වශයෙන් දෙවැදෑරුම්වද දුක්ඛ-සමුදය-නිරෝධ මග්ග වශයෙන් සිව්වැදෑරුම්වද වදාරණසේක. එකී චතුස්සත්‍යය අවබෝධ කරවීම පිණිස අනිත්‍ය=දුක්ඛ=අනාත්ම යන ක්‍රමයෙන් ලක්ෂණත්‍රයක් ප්‍රකට කරණසේක. ලක්ෂණත්‍රය ප්‍රකට කරවීමට ඛන්ධ=ධාතු=ආයතන=ඉන්ද්‍රිය යන මේවා වදාරණසේක. සියලුම බුදුවරයින් වහන්සේලා විසින් උගන්වනු ලබන මූලික ධර්ම නම්= ඛන්ධ=ධාතු=ආයතන=ඉන්ද්‍රිය=සච්ච=හේතුඵල යන මේවාය. මෙකී මූලික ධර්ම උගන්වනු පිණිස අවස්ථානුරූපසේ ධර්මදේශනා කරණසේක. සියලු බුදුවරයන්ම තුන්පිටකයක් නොවදාරති. ඇතැම්

මීට ගෞතම තථාගතයන් වහන්සේ වදාළ තුන්පිටකයට අනුගො වැඩිව ධර්ම වදාරණ නමුත් සියලුම බුදුවරයින් වහන්සේලාව නොවරදවාම ලොවට පහදාදෙන මූලික ධර්ම නම් ත්‍රිලක්ෂණ හා චතුස්සත්‍යද හේතුඵල වාදය යන මේවාය, මේව චරිතාදිම සඳහා චරිතානුකූලව=අවස්ථානුකූලව ධර්ම දේශනා කරණසේක.

ආයුබල=ගුණබල=ඥාණබල යන මේවායින් පිරිහීගෙණ යන කලියුගයෙහි ලොව පහළවූ ගෞතම තථාගතයන් වහන්සේට ලෝකස්වභාව වශයෙන් නානාප්‍රකාර විරුඬකාරයින් = සතුරන් ඇතිවීමද, උන්වහන්සේ ලොව වැඩිසිටි සුළු කාලයක් තුළවීමද පරිනිර්වාණයෙන් පසු කලක් පර්‍යාප්තිය පුහුණු කරන ප්‍රතිපත්ති යෙහි පිහිටන අයගේ යහපත පිණිසද නොයෙක් චරිතාධිමුක්තික යින්ට ධර්මදේශනා කරන්ට වීමද නිසා ත්‍රිපිටක ධර්මය බහුලවූ බව සලකා ගතහැකිය. මූලික වශයෙන් ගෞතම තථාගතයන් වහන් සේ වදාළ ධර්ම අදෙව වාදය=අහිංසා වාදය=විභජ්ජ වාදය=කර්ම වාදය=ඒකායන මාර්ගය=මධ්‍යම ප්‍රතිපදාව=හේතුඵල වාදය යන නම් වලින් හැඳින්වෙයි.

ඇතැම් කෙනෙක් තථාගතයන් වහන්සේ සමාජවාදියාණ කෙනෙකැයිද තථාගත ධර්මය සමාජ වාදයකැයිද කියති. ඔව්හු තථාගතයන් වහන්සේටද තථාගත ධර්මයටද බලවත් ලෙස නිගාකරන්නෝ වෙති. තථාගත ධර්මය කිසිම දේශපා ලනයකට අයත් වූවක් නොවේ. සෑම දේශපාලන වාදියෙකු ටම තථාගත ධර්මය අවශ්‍යයි. තථාගත ධර්මය චිත්තවිප්ලවයක් ඇතිකරන්නකි, ආර්ථිකත්වය සඳහා එහි කළයුතු සටනක් නැත. සෑම සමාජ වාදයක්ම ආර්ථිකත්වය මූලික කොට පවතින්නකි.

**භෞතික වාදය**

ලෝකයේ ඇති සෑම දෙයක්ම උපක්‍රම ශක්තියෙන්ද, සෑම කෙනෙකුම පරිසර යේ බලයෙන්ද වෙනස් කරවිය හැකි බව සලකන ඇතැම් භෞතික වාදීහු සිටිති. ඔව්හු කර්මය හා කර්ම පලය නොඅදහත්. කොටසක් දුප්පතුන් වීමටත් කොටසක් ධන වතුන් වීමටත් හේතුව පරිසරය හා උපක්‍රමය බව ඔව්හු කියත්. ඔව්හු ආත්මද විශ්වාස නොකරත්. ආත්ම යනු මිනිසා විසින්ම ඇතිකරගත් මතිමාත්‍රයකැයිද අධ්‍යාපනය හෝ ධනය හොඳින් ඇතහොත් මිනිසුන් අපරාධ නොකරතැයිද ඔව්හු කියත්.(එහෙත් ලෝකයේ සියුණු නුවණැත්තෝත් මහා ධනවත්තුත් රහසේ අසුනොවී අපරාධ කරන = කරවන බව ඔව්හු අමතක කරත්.

සිත්පිත් නැති ගස්, ගල්, පර්වතයන් හටගන්නාසේ විඥානය සහිත සත්ත්වයාගේ හටගැන්මත් සිදුවන බව ඔව්හු කියති.

කම්මං සත්තෙ විභජති යදිදං හීනප්පණීතතාය
(චූලකම්මවිභඞ්ග)

යන ශ්‍රී බුද්ධ දෙශනාව ඔව්හු නොපිළිගණිත්. මෙබඳු උච්ඡෙදවාදී මිථ්‍යාදෘෂ්ටික=භෞතික වාදීහුද තථාගතයන් වහන්සේ සමාජවාදියාණ කෙනෙකැයි කියති. විඤ්ඤාණ ධාතුව මූලික කොට=චිත්ත ධර්මිද්‍රව ප්‍රධාන කොට එය අත්සිවාරමී කරගෙණ තථාගතයන් වහන්සේ වදාල කුශලාකුශල කර්ම ශක්තිය නොඅදහන ඒ නියා භෞතික වාදීහු තථාගතයන් වහන්සේ හෝ තථාගත ධර්මය හෝ කෙසේ හඳුනාගණිද්ද? මේ භෞතික වාදයේ = මේ කල්පයේ මූලිකයා ' මක්ඛලිගොසාල'' නම් උච්ඡෙද වාදියාය ඔහු තථාගතයන් වහන්සේටද තථාගත ධර්මයටද විරුද්ධව තථාගතයන් වහන්සේ ධරමාණ කාලයේහිම නාස්තිවාදය ලොවට ප්‍රකාශකොට අපායෙහි ඉපදුනි. වර්තමාන භෞතික වාදීන්මද සිදුවන්නේ එයමයි.

**තථාගතයන් වහන්සේ සමාජ වාදියාණ කෙනෙක් නොවෙති. තථාගත ධර්මය හා භෞතික වාදය අහසට පොළොව මෙන් දුරවේ.**

**භෞතිකවාදයේ මුල** ලෝකයේ වරින්වර ඇතිකරනු ලබන භාෂා= ශාස්ත්‍ර= කලා = ශිල්ප = වේද = වේදාඞ්ග= සමය= සමයාන්තර= දර්ශණ වාද= විද්‍යා=ආදී සියල්ලම ලොව කවදා හෝ කෙබඳු තැනක හෝ ඇතිවූ දේවල්ය, කිසිම කෙනෙක් ලොව අමුතුවෙන් නිපදවන්නේ නැත. තථාගත බුදුවරයින් උපදා යටපත්ව පවත්නා අප්‍රකටව පවත්නා අබුද්ධොත්පාද කාලවලදී අනිකෙකු විසින් අප්‍රත්‍යක්ෂව පවත්නා නිර්වාණ මාර්ග ප්‍රතිපදාව=ආර්ය්‍ය මාර්ගය=මධ්‍යම; ප්‍රතිපදාව=මතුකර දෙනු විනා එය අමුතුවෙන් ඇති නොකරනබව ''අද්දසාඛො හම්භික්ඛවෙ පුරාණං මග්ගං අඤ්ජසං පුබ්බකෙහි සම්මා සම්බුද්ධෙහි අනුයාතං'' (බුද්ධවංස) යනාදී දෙශනාවලින් ප්‍රකාශවේ. ''මහණෙනි පුරාණ බුදුවරයින් වහන්සේලා විසින් අනුගමනය කළ මාර්ගය මම දුටුවෙමි'' යනු තේරුමයි.

මෙසේ බලත්ම වර්තමාන විද්‍යාඥයන් ඇතැම්; සමාජවාදීන් ඉතා උසස්කොට සලකන භෞතික වාදයද ආදි කල්පිතයින ඇති කරණ ලද්දුව අතීත කාලයෙහි විසූ "මක්ඛලී ගෝසාල" නම් තවුසා විසින් ප්‍රකට කරණලදබවද ක්‍රමයෙන් එය විකාශනය වීමෙන් වර්තමාන භෞතික වාදය ඇතිවූ බවද කිවයුතුය, තව කල්යාමේදී; මෙයද විකෘතියට නොපත්විය හැකිද?

කලින් කල මිනිසා විසින්ම ඇතිකරනු ලබන මතු කරනු ලබන දේවල් මිනිසා විසින්ම නැතිකරණු ලබන බවද කිසිම දෙයක් ලොව සදකල් නොපවත්නා බවද සැලකිය යුතුය.

**භෞතික වාදයේ නිස්සාර භාවය**

ලොව ඇතිතාක් ද්‍රව්‍යවූද චෛතන්‍යික (විඥානය සහිත) වූද සියල්ලට සංඛත යන නාමය ලැබෙයි. හේතු ප්‍රත්‍යය දෙකින් හටගත් නිසයි. ද්‍රව්‍ය සංයෝග යනුවෙන් භෞතිකයින් සලකන් නේද මේ සඞ්ඛත නමින් හඳුන්වනු ලබන දෙයයි. ලෝකයේ නව දත් පවත්නා පඨවි (තදගතිය) ආපො (වැගිරෙන ගතිය) තෙජෝ (උෂ්ණ ගතිය) වායො (චලන ගතිය) යන ප්‍රධාන ධාතු සතරක්; ගති සතරක්=ගුණ සතරක්; ඒගති සමගම එකට බැදී පවත්නා වර්ණ (පාට; ගන්ධ (ගඳ හෝ සුවඳ) රස=ඕජා යන ගති සතරත්, එක්වීමෙන් අවිනිර්භොග ශුද්ධාෂ්ටකය (වෙන් නොකළ හැකි සංයෝග අට) ලැබේ. ගස්-ගල්-පර්වත-වෘක්ෂ-ලතා ආදී අචේතනික සියල්ලම සෑදී ඇත්තේ මේ ශුද්ධාෂ්ටකයෙනි. වැඩි කොට කුමටද, සූර්ය-චන්ද්‍ර-ප්‍රදීප ආදී ආලොකයෙහි පවා මේ ශුද්ධාෂ්ටකය පවත්නා බව දක්වයි. ජලයෙහි පවා ශුද්ධාෂ්ටකය ඇත. චක්ෂුර් විඥානයට ගොචරවන ඇසින් දැකිය හැකි සැම දෙයකම මේ ශුද්ධාෂ්ටකය ඇත්තේය, යටත් පිරිසෙයින්; අද විද්‍යාඥයින්ගේ උසස්ම නිෂ්පාදනයක් ලෙස සලකන පරමාණු බෝම්බය සෑදීමට උපයෝගී කරගත් සියුම් පරමාණු වෙති පවා මේ ශුද්ධාෂ්ටකය ඇති බව දතයුතුයි. එපමණක්ද නොවේ, එබඳු සියුම් පරමාණු වෙහි ශුද්ධාෂ්ටක දහස් ගණනක් ඇත, සතරැස් අඟලක පරමාණු නවකෝටි හැටහත් ලක්ෂයක් පමණ ඇතිබව විද්‍යාඥයින් විසින් ප්‍රකාශකර තිබීමම මේ ශුද්ධාෂ්ටකයේ ඇති අද්භූතබලය පිළිබඳව සිතා ගැණීමට හැකිවෙයි. විද්‍යාඥයින් - පණ්ඩිතයින් නිපදවන සැම යන්ත්‍ර සූත්‍රාදී කර්ම මේ ශුද්ධාෂ්ටකය ඇසුරු කරගෙණ කරන බව සැලකිය යුතුය.

සංවේදනීකවූ සත්ත්වයාට ශුද්ධාෂ්ටකය සමඟම එකට ක්‍රියාකරන (සිතීමේ හා දැකීමේ ශක්තිය ඇති) විඥාන ධාතුවක් වෙයි. එහෙයින් සත්ත්වයා සචේතන නම් වේ. ඒ සිතද (විඥානයද) ගති 52 ක් සහිතව ක්‍රියාකරයි. ඒ ගති 52 චෛතසික නමින් දක්නා ලැබේ. අටකී ශුද්ධාෂ්ටකය රූපය නම්වේ. සිත නාමය නම්වේ. මේ නාමරූප දෙකේ එකිනෙක සම්බන්ධයෙන් සත්ව සඞ්ඛ්‍යාත සත්ත්ව සන්තානය (නාම රූප ගොඩ) අවිච්ඡින්නව පවත්නා බව දතයුතුයි. තනිකර ශුද්ධාෂ්ටකයෙහි ක්‍රියාකාරීත්වයක් නැත. එය ක්‍රියාත්මක වීමට විඥානයද අවශ්‍යයි. අහස් යාත්‍රා දුම් නැවු-දුම් රිය-විදුලිය ආදී ශුද්ධාෂ්ටක සමූහයන් එක්කොට කරණලද නිපදවීම් ඇති කරන්නේ මිනිසා තමා තුළ පවත්නා විඥාන ධාතුවේ බලයෙන්ය,

වර්තමාන විද්‍යාඥයින් විසින් ශුද්ධාෂ්ටකය ඇසුරුකොට කරණලද "යකඩ මිනිසා" වුවත් ක්‍රියාත්මකවී ඇත්තේ මිනිසාගේ "විඥාන" යෙන් නිපදවන ලද හෙයිනි.

එහෙත් විඥානයේ බලය නොසලකන එහි ඇති අචින්ත්‍ය බලය නොඅදහන "භෞතික වාදියා" ගස්-ගල් ආදියේ පැවැත්මද විඥානය සහිත මිනිසාගේ පැවැත්මද එකසේ සලකයි. ක්‍රමානුකූලව යෙදූ ද්‍රව්‍ය සංයෝග බලය නිසා නානාප්‍රකාර යන්ත්‍ර සූත්‍ර නිපදවන්නේ මිනිසාගේ සිතින් නම්; එකී ද්‍රව්‍යයන් නිසි ආකාරයෙන් යෙදීමේ ශක්තිය මිනිසාගේ විඥානය කෙරෙහි පවතී නම්; ඒ විඥානයේ බලය කෙබඳු වියයුතුද? විඥානයේ බලය නොදත් භෞතික වාදියා පින්පව් නොසැලකීමද ආගම ධර්මය නොපිළිගැණීමද පුනරුත්පත්තිය විශ්වාස නොකිරීමද ආශ්චර්යයක් නොවෙයි!

**උදකං හි නයන්ති නෙත්තිකා - උසුකාරා නමයන්ති තේජනං**
**දාරුං නමයන්ති තච්ඡකා - අත්තානං දමයන්ති පණ්ඩිතා**

(ධම්මපදය)

(ජලයෙන් වැඩ ගන්නා දියාලුවෝ සිත් පිත් නැති ජලය නානා ප්‍රකාර ජලමාර්ගවලින් තමන්ට අභිමතස්ථානයකරා අවතාත කරවා ගෙණයත්. යකඩ කර්මාන්ත කාරයෝ අවිඥානක යකඩය නිසි අයුරු තපා-කොටා තමා අභිමත භාණ්ඩවලට හරවාගණිත්. ලී වඩුවෝ ගස් කපා-ඉරා-කොටා-ඇඳ පුටු ආදී භාණ්ඩ ඉන් සාදාගණිත්, මේ සියල්ල කරන්නේ සිතින් කල්පනාකර බැලීමෙනි. ඒ මිනිස් සිත නිසි අයුරු මට හසුරුවා ගැණීමෙන් පණ්ඩිත තෙමේ ආත්ම විජය යෙහි යෙදෙන්නේය.)

## 13 පරිච්ඡේදය

# සම්බුද්ධාගම

## (අදේව වාදය)

අත්තදීපා භික්ඛවෙ විහරථ අනඤ්ඤ සරණා ධම්මදීපා භික්ඛවෙ විහරථ අනඤ්ඤ සරණා යනුවෙන් තථාගතයන් වහන්සේ දික්සඟියෙහි චක්‍රවර්ති සීහනාද සූත්‍රයෙහි වදාරා තිබේ. මහණෙනි තමන්ම පිහිට කොට වසව්! අනිකෙකුගේ පිහිටක් නැත. ධර්මයම පිහිට කොට වසව්! අනිකක පිහිටක් නැත යනු එහි අදහසයි. මෙයින් ආත්ම විමුක්තිය-නියම නිදහස-මෝක්ෂය තමන් විසින්ම සිදුකරගත යුතු-ප්‍රත්‍යක්ෂකර ගත යුතු බව; පරිකල්පිත දෙවියෙකුගේ හෝ බ්‍රහ්මයෙකුගේ හෝ අන්‍ය යම් කිසි සර්වබලධාරියෙකුගේ හෝ අනුකම්පාව නොසොයා; තමන් නාඳුනන අප්‍රත්‍යක්ෂ දෙවියෙකුගේ පිහිට නොපතා; තමන්ගේ නිදහස සඳහා තමන්ම කෙලෙස් සතුරන් සමඟ සටන් කළ යුතු බව තථාගතයන් වහන්සේ වදාළසේක. අනිකෙකු ප්‍රධානත්වයෙහි තබා ඔහුගේ යටතේ ජීවත්වීමෙන් නිදහස ලබාගැනීමට යාම දීනකමේ ප්‍රකට ලක්ෂණයෙකි.

සුද්ධි අසුද්ධි පච්චත්තං නාඤ්ඤො අඤ්ඤං විසොධයෙ යනුවෙන් සුද්ධිය හෝ අසුද්ධිය විමුක්තිය හෝ විපත්තිය තමන්ම පිළිබඳව බව හා අනිකෙකුට අනිකෙකු සුද්ධියට පත්කළ නොහැකි බව, මනුෂ්‍යයා කෙරෙහි පවත්නා අසීමිත බලයකින් යුත් සිතම දෙවියාබව උන්වහන්සේ වදාරා තිබේ. එපමණක් නොව සදෙවක ලෝකයේ අප්‍රතිහතවූ ඥාණ බලයෙන් හා කාල බලයෙන් යුත් තථාගතයන් වහන්සේද නියම විමුක්තිය පිණිස ප්‍රත්‍යක්ෂ ඥානය අනුව ලොවට අනුශාසනා කළ පමණක් විනා සත්වයා කළ පව්වලට සමාවදී තමන් වහන්සේගේ කරුණා මෛත්‍රියෙන්ම සත්වයා දුකින් නිදහස් නොකළ හැකිබව අවබෝධ කළසේක.

තුම්හෙහි කිච්චං ආතප්පං අක්ඛාතාරො තථාගතා

යනුවෙන් "මහණෙනි තුඹලා උත්සාහවන්ත වියයුතුය. තුඹලා ප්‍රතිපත්ති රැක්ක යුතුය. බුදුවරයෝ මාර්ග පමණක් ප්‍රකාශ කරන්නාහ"යි වදාළසේක,

ලෝකයේ සෙසු දර්ශන වාදයන් මගින්-ආගම් මගින්-ලෝකය මහදෙවියෙකු විසින් පරමේශ්වරයෙකු විසින් මවනලදැයි පවසමින් ලොව මුලාවට හෙලන අතර තථාගතයන් වහන්සේ පමණක් "ලෝකය නිපදවන ලද්දේ ස්වභාව ධර්මය විසින්"යයි වදාළසේක. මේ ස්වභාව ධර්මය අනිකක් නොව හේතුඵල සම්බන්ධයයි. ශත වර්ෂ 25 කට පෙර තථාගතයන් වහන්සේ ලොවට ප්‍රකාශකරවදාළ මේ ප්‍රකාශය නවීන ශාස්ත්‍ර මගින්ද-විද්‍යාමගින්ද-ස්ථිර කරණලැබේ

ලෝකය මහදෙවියා විසින්-පරමේශ්වරයා විසින් මවනු ලැබී නම් ඔහු මැව්වේ කවරෙකු විසින්ද? මැවුම්කාර දෙවියා ඉබේම ඇතිවීද? එසේ නම් ඔහු මෙන් සෙසුසන්ටද ඉබේ පහළවන්ට නොහැකි ඇයි?

දෙවියන්ට මෙන් සෙස්සන්ට බලයක් නැතැයිද දෙවියන්ගේ අසමාන බලය ගැන කිසිවෙකු ප්‍රශ්න නොකළ යුතු යයිද කීවොත් බුද්ධිමත් ලෝකයා අදහයිද? මෙසේ ලොව මැවූ දෙවියා අවිඥානක-සවිඥානක වස්තූන් පිළිබඳ සමාන නැති "විෂම" මැවිල්ලක් ඇති කලේ ඇයි? මේ ආදී ප්‍රශ්නවලට දෙවවාදීහු කුමන පිළිතුරු දෙන්නාහුද?

තවද ලෝකය මැවූ ඊනියා බලධාරියා උත්පත්තියෙන්ම අත් පා කන්නාසා ආදි අවයවයන්ගෙන් අඩුවූ අන්ධ බහිර;මූගාදීන් මැව්වේ ඇයි. දෙවියන්ට අකීකරුවූ හෙයින් එසේ ඔවුන් දුකට හෙලන ලදැයි කීවේනම් ඒ සත්වයෝ දෙවියන්ට කුමන වැරදි කළෝද? 'දෙවියන් වහන්සේ මුලින් ඇතිවීනම් ඔහු විසින්) මවනු ලැබූ මිනිසා මවන්ටත් පෙර දෙවියන්ට කළ වරද කුමක්ද? දෙවියන්ට අවනතවූ මිනිසාට සුගතියත් අකීකරුවූවහුට දුගතියත් දෙවියන් විසින්ම හිමි කරණලද බව සත්‍යනම් තමාගේ වචනය පමණක් පිළිගැණු ලබන තමාට කීකරුවූම සත්වයන් මවන්නේ නැතුව දෙවියන්ට අකීකරුවූවන් මැව්වේ ඇයි? ඔහුගේ ඉගැන්වීම් නොපිළිගන්නා අය මැව්වේ ඇයි?

තවද ලොව මැවූ සර්වබලධාරියා විසින් මිනිසාගේ ප්‍රයෝජනය සඳහා එලු, බැටලු, ගව, මහිෂ, බලු, බළල්, ඌරු ආදී සතුන් මවන ලදැයි කියති. ඒ එසේ නම් මිනිසාට කිසිම ප්‍රයෝජනයක් නැති-මිනිසාට කරදර කරන සිංහ, ව්‍යාඝ්‍ර, කොටි, වලස් ආදී සිවුපාවුන්ද, දර- පිඹුරු- නයි- පොලොන් ආදි දීර්ඝ ජාතීන්ද, උකුණු-මකුණු-ගැඩවිලි-පණු ආදී 'ක්ෂුද්‍ර ප්‍රාණීන්ද මැවුවේ ඇයි? මේවාට දෙවභක්තිකයෝ කුමන පිළිතුරු දෙත්ද?

තවද සත්ත්වයින් විසින් කරණලද පව්වලට දෙවියන් සමාව දෙයිසිද සලකත්. එසේ නම් මෙලොවට මහදෙවියන් "පවක්" ඇතිකලේ ඇයි? "පින" පමණක් ඇතිකොට "පින්ම" කරණ මිනිසුන් උපදවා ඔවුන් "ස්වර්ගයට" කැඳවා ගන්නේ නම් ඔහු කොතරම් බලසම්පන්න සාධාරණ දෙවියෙක් නොවන්නේද?

මේ ආදී කරුණු වලින් මැවුම්කාර දෙවියෙකු නැති බවද එබඳු විකාර මැවීමක් නොකළ හැකි බවද, සර්වබල තබා කිසිම බලයක් ඇති දෙවියෙකු නොමැති බවද නුවණැත්තෝ පිළිගණිති.

මෙයින් "දේව වාදය මනඃ කල්පිත මායාවක්" බව සැලකිය යුතුය. සිතිමේ ශක්තියක් නැති කරණ, චින්තන බලය දුබල කරන, මිනිසා කම්මැලි දිනයෙකු කරන, අන්ධභක්තියක් වන දේව වාදය දීන යාඥවලටත් නිසරු ප්‍රාර්ථනා වලටත් සීමා වූවක් බව පිළිගත යුතුය.

අත්තාහි අත්තනො නාථො - කොහි නාථො පරොසියා
අත්තනාව සුදන්තෙන - නාථං ලභති දුල්ලභං

(ධම්මපදය)

(තමහට පිහිට තෙමේමය. තමහට අන් කවරෙක් පිහිටවේද නොවේමැයි! මනා පිළිවෙතෙහි යෙදෙන තමා විසින්ම අර්හත්ඵල විමුක්තිය සඞ්ඛ්‍යාතවූ නියම පිහිට ලැබිය)

දේව භක්තිය; ආත්ම විශ්වාසය නැති කරන මායාවකි. නිර්මාණ වාදය බිඳී ගිය කල ඒ මත ගොඩනගාගත් සියලුම දේව ආගම් බිඳ වැටියයි. පදනම (අත්තිවාරම) බිඳී ගියකල ගොඩ නැගිල්ලද බිඳවැටෙන්නාක් මෙනි.

卐

## 14 පරිච්ඡේදය.

# හේතු-ඵල වාදය.

නයිදං අත්ත කතං බිම්බං - නයිදං පරකතං අඝං
හෙතුං පටිච්ච සම්භූතං - හෙතු භඞ්ගා නිරුජ්ඣති

(සංයුත්ත නිකාය)

(පඤ්චස්කන්ධ සඞ්ඛ්‍යාත මේ ප්‍රතිරූපය-බිම්බය-දුක් සමූහය-තමන් විසින්වත් අනුන් විසින්වත් කරණ ලද්දක් නොවෙයි මෙය හේතුවකින් හටගත්තේය. හේතුව නිදීමෙන් මෙයද නිරුද්ධවෙයි. අභාවයටයයි.)

ලෝකය විවිධය! විෂමය! අවිඥාණක සවිඥාණක වශයෙන් දක්වන දෙවැදෑරුම් ද්‍රව්‍ය සන්තතීන්ගේද සත්ව සන්තතියේද සම්භවය-ව්‍යාප්තිය-පරිණාමය-යන කරුණු පිළිබඳව ලෝකයේ කිසිම ලෞකික පණ්ඩිතයෙක් මේ දක්වාම නිශ්චයට බැසගෙණ නැත. ලෝකයේ ආරම්භය යම්දාකද එදා සිටම ලෝකය පවත්නා තාක්ම මේ ලොක ගැටලුව පවතින බව දතයුතුය. මේසත්වයා උපන්නේ කෙසේද කොහි සිට ආවේද? සත්වයාට ලෙඩදුක් විපත් කරදර සිදුවන්නේ ඇයි? මැරෙන්නේ ඇයි? මරණින් මතු ඉපදීම කුත් ඇද්ද? එසේනම් මෙහිදී රැස්කරගත් දේපල වස්තුව හා හිතවතුන් සමගම පරලොව උපදින්ට හැකිද? නැතිනම් මේ ජීවිතය මෙයින් අවසන්වේද? ආදී ප්‍රශ්නයෝ මේ ලෝක ගැටලු වේම ප්‍රභේදයෝ වෙති. එකිනෙකට ප්‍රතිවිරුද්ධවූ ද්‍රව්‍ය සන්තතියද සත්ව සන්තතියද පිළිබඳවූ මේ ලෝකගැටලුව නිරවුල් කරන්ට ගිය ඇතැමෙක් අවුල්වී ගිය නූල් පන්දුවක් කවරේ ලිහන්ට නැත් කරන්නාක් මෙන් මොහඳුරේ ගැලී අතපත ගාන්ට වූහ. ඇතැමෙක් මේ ලෝක ගැටලුව දේව භාස්කමකින් සිදුවූවකැයිද; ඇතැමෙක් නිතම් ඉබේම සිදුවූවකැයිද පවසා එය නිරවුල් කිරීමද දෙවියන් විසින් කරණු ලබන බව හා ඉබේට නිරවුල් වන බවද පවසා හිත සනසා ගත්හ.

**බාහිර ලෝකය** ලොව කිසි කලක නැති නොවන; එහෙත් ද්‍රව්‍යයක් හෝ 'වස්තුවක් හෝ නොවන; ආකාශ ධාතුව පුදුම දෙයකි. සකල වස්තුන්ම රඳා පවත්නේ මේ ආකාශ ධාතුවෙහිය. මහ මෙර - මහ සයුර සහිත පෘථිවි තෝලයත් චන්ද්‍ර-සූර්යාද වෙනත් ග්‍රහ වස්තූන්ද එක්කොටගෙණ අවකාශ ලෝකයයි කියනු ලැබේ. සූර්යයාට විෂයවූ හෙවත් සූර්යයාගේ ආකර්ෂණ බලය පැතිර පවත්නා ආකාශ පරිච්ඡේදය එසේ චක්‍රවාටයෙකි, මෙබඳු චක්‍රවාට (සක්වල වල්) අනන්තා'පරිමාණ බව බුද්ධිමත්හු පිළිගණිති. සන්ධ්‍යා සමයක පැහැදිලි අහසෙහි දක්නට ලැබෙන තාරකාවන් එබඳු ලොකධාතු බව දක්වයි. මේ චක්‍රවාට යන්ගේ යටින් ජලපොළොවද; ජල පොළොවට යටින් වා පොළොවද වා පොළොවට යටින් අජටාකාශයද පවතී. (මහා පෘථිවිය පවතින්නේ ජල පොළොව මැදය)

යමින් පවත්නා "අජ ාකාශ" නම්වූ ආකාශ ලෝකය කෙළවරක් නැත. ආකාශයෙහි අගක් හෝ මුලක් නැත. එය උභයාන්ත රහිත වූවකි, මෙබඳු තත්වයේ ආකාශ ධාතුව යම් කිසි ඊශ්වර යෙකු හෝ වෙනයම් දෙවියෙකු හෝ මවනලදැයි කීම විහිළුවකි.

පටන් ගැන්මේදී දෙවියන් වහන්සේ අහසත් පොළොවත් මැවූ බවද පොළොව පිළිවෙළකට නැතිව තිබුණු බවද ඇතැම් දෙවදෘෂ්ටියක උගන්වන බව පෙනේ.

(මේ ද්‍රව්‍යයක් නොවන අහස මැව්වේ කෙසේද? ඊටත් පෙර පිළිවෙළකට නොතිබුණු පොළොව නැවත මැව්වේ කෙසේද? ආත්මය ජලය පිට පාවෙමින් තිබුණේ බැලුම් බෝලයක් වගේද)

"ස්වභාව ධර්ම නියාම"බලයෙන් අවකාශ කුහරයෙහි පවත්නා මේ විශාල පෘථිවි පර්වත ආදීහු කෙතරම් විශාල වුවත් විනාශනම ස්වභාවකොට ඇත්තාහ. ඇතිවන්නේ නැතිවීමත් අරගෙණමය

මේ විශාල වස්තූහු ක්‍රමයෙන් මුහුකුරා යාමෙන් කාලාන්තර යක් ඉක්මයාමෙන් ඔවුනොවුන් කෙරෙහිම පවත්නා ස්වභාව ශක්තිය අනුව ගිනිගන්නා ගතියකට පැමිණේ. ගින්න බොහෝ කල් පැවතී ඉන්පසු එයම වැස්සක් පහළ කිරීමට උපකාර වේ. ඒ ලෝකය නැවතත් විනාශය දක්වා මෝරමින් පවතී. මෙසේ සම්භවය-ව්‍යාප්තිය පරිහාණිය යන තත්වයන්ට පත්වන්නේ පඨවි ආපො-තෙජො-වායො යන ධාතු ගුණයෝය. එවැනි ලෝකයක් දෙවියෙකු විසින් මවනලදැයි හෝ ඉබේ හටගැණුනේයයි කීම හෝ විහිලු නොවන්නේද?

**යෙ කෙචි මහරාජ: සත්තා සචෙතනා සබ්බෙතෙ කම්මජා. අග්ගිච සබ්බානිච බිජාතාණි හෙතුජානි. පඨවිච පබ්බතාච උදකංච වාතොච සබ්බෙ තෙ උතුජා. ආකාසංච නිබ්බාණංච ඉමෙ ද්වෙ අකම්මජා අහෙතුජා අනුතුජා.**

**(මිලින්ද ප්‍රශ්නය)**

(මහරජ! චතුරපාය පර්‍ය්‍යාපන්නවූන් හා මිනුෂ්‍යයින්; දෙවියන්; බ්‍රහ්මයන් හා අරූපීන් හා ඇතුළුවූ යම්කිසි සත්ව කෙනෙක් ඇද්ද? ඒ සියලු සත්වයෝම කුශලාකුශල කර්ම සඞ්ඛ්‍යාත ප්‍රධාන හේතු වෙන් උපන් හෙයින් කර්මජයෝය. අග්නිය හා සියලුම බීජ ජාතීහු හේතුවෙන් උපන් හෙයින් හේතුජයෝය. (මෙහි හේතුනම් ආලොකාදී හේතු නොව ආධාර කාරණයෝය; පෘථිවිය හා පර්වතද ජලයද

වාතයද ඍතුවෙන් උපන් හෙයින් උතුජයෝය. ආකාශයද නිර්වාණයද කිසිම හේතුවකින් හෝ ප්‍රත්‍යයකින් නූපන් = අකර්මජ = අහේතුජ - අනුතුජයෝය.

(නාගසේන මහා ස්ථවිර)

ග්‍රීෂ්ම ඍතුවෙහි ග්‍රීෂ්මය අධිකවීමෙන් වර්ෂා ඍතුව ලබත්ම වැසි ඇතිවේ. වර්ෂා ඍතුව අවසන්වීමෙන් හේමන්ත ඍතුව ලබයි. හේමන්ත ඍතුව දියුණුවීමෙන් නැවත ග්‍රීෂ්ම කාලගුණය පහළවේ. ලෝක ධාතුවේ ඔවුනොවුන්ගේ පැවැත්මට ඔවුනොවුන්ම උපකාර වන බව හා ද්‍රව්‍ය සංයෝග බල -ආකර්ෂණ බල යන මෙයින් ලොක ධාතුව පවත්නා බව සලකා ගතයුතුය. තනි හුණ දණ්ඩක් පොළොවේ නොසිටුවා කෙළින් කර තැබිය නොහැකි. එහෙත් හුණ ගස් තුනක් මුලින් ඈත්කොට අග එක්කොට තැබූකල පොළොවේ නොසිටුවා කෙළින්කර තැබිය හැකිය. හුණගස් තුන එහි ඇති අන්‍යොන්‍ය උපකාරත්වය නිසා ඇද නොවැටේ, එසේම තණ හුණ මිටියක නොසිටුවා කෙළින් තැබිය නොහැකි බවද හුණ මිටි තුනක් එකට එක්කොටකෙළින් තැබිය හැකි බවද සලකා ගත්ම පිළිවන.

**ධාතු සංයෝග හා ආකර්ෂණ බලය**

යමෙක් පොළොවෙහි බීජයක් සිටුවයි නම්, එහි පැලවීමේ ශක්තිය තිබේනම් එයට පොළොවෙහි රස ධාතුවද අපො ධාතුවද ඇදීයාමෙන් ගසක් හටගෙණ එහි කෙඩිද ඇතිවේ. මෙහිදී තස සැදීමට බීජයද–ආපොරසයද, පඨවි ධාතු රසයද ඍතු ගුණයද ආධාරවෙයි. සංයෝගය හා ආකර්ෂණය ඔවුනොවුන් කෙරෙහි ලැබීමෙන් ඔවුනොවුන්ගේ පැවැත්ම සිදුවෙයි. මෙය දේවභාස්කමකින් සිදුවන්නේ නම් ඇතැම් බීජ පැලනොවී දිරාපත්වී යන්නේ ඇයිදැයි ප්‍රශ්නකළයුතුය

ගොවියෙක් කුඹුරක් සකස්කොට පැලවී ඉසියි. එයට වර්ෂා ජලය හෝ අන්කිසි ක්‍රමයකින් යෙදූ ජලය හෝ ලැබීමෙන් ගොයම් පැලවේ. බීජයද වර්ෂාජලයද පඨවි ධාතු රසයද ඍතු ගුණයද ඇතිවීමෙන් ගොයම පැලවෙයි. මේකරුණු සම්පූර්ණ නොවීනි නම් ගොයම පැලනොවේ.

නවීන විද්‍යාඥයින් හා පණ්ඩිතයින්ගේ නිගමණය අනුවද මේවා මෙසේ සිදුවන්නේ දේවභාස්කමකින් වත් ඉබේමවත් නොවන බව දතයුතුය.

මෙසේ බලනකල අවිඤ්ඤාණක වස්තූන්ගේ ඇතිවීම්වද ප්‍රත්‍යය කරුණු-උපකාරක කරුණු කීපයක් ඇති බවද ධාතු සංයෝජනයෙන්- ශුද්ධාත්මක සංයෝජනයෙන් සියල්ල හටගන්නා බවද පෙනේ. කිසිම හේතු ප්‍රත්‍ය සංයෝගයකින් අමිශ්‍රවූ දෙය නම් ආකාශ ධාතුව හා නිර්වාණ ධාතුවත්ය.

පඨවි ආපෝ-තේජෝ-වායෝ යන ධාතු ගුණවලින් සම්පන්න ලෝකය සෑදී තිබේ. ඒ ධාතුහුම ඔවුනොවුන්ගේ සම්භවයට හා ව්‍යාප්තියටද විනාශයටද හේතුවෙයි. බලන්න නිදසුනක්:

වතුර භාජනයක් ලිප තබා යටින් ගිනි ගැසුවහොත් මඳ වේලාවකදී ජලය රත්වෙයි. ගින්න තේජෝ ධාතුවයි. ජලය ආපෝ ධාතුවයි. ගින්න නිසා ජලය රත්වෙයි, එහෙත් ඒ ජලයෙන්ම ගින්න නිවිය හැකිය. ගිනි සැර වැඩිවීනම් දිය බඳුන උතුරා යාමෙන් ගින්න නිවෙයි. මේ කුමක්ද සිදුවූයේ? ඔහුනොවුන්ගේ පැවැත්මට හා සම්භවය හේතුවූ ස්වභාව ධර්මය ඔවුනොවුන්ගේ විනාශයට හේතුවන බවයි. විශාල දූව දඬු ගොඩක් ගින්නකින් දවනකල හදිසියෙන් මහා මේඝයක් ඇතිවී ඒ ගින්න නිවයි එයද නිදසුනක් ලෙස සලකන්න.

ශරීරයේ පවත්නා සෙම් - පිත් - වාත යන දොස් කිපීමෙන් නානාප්‍රකාර රෝගපීඩා සෑදුනු කල්හි අරලු - බුලු - නෙල්ලි ආදී භෛෂජ්‍යයන්ගෙන් සකස් කරගන්නා ලද ධාතුරසය ශරීරගත කිරීමෙන් නීරෝගී බව යෙදෙයි. ඔවුනොවුන්ගේ සම්භවයට මෙන්ම පැවැත්මටද ප්‍රත්‍යයවන පඨවි ආදී ධාතු ගුණයෝ ඔවුනොවුන්ගේ විනාශයටද ප්‍රත්‍යය වෙති.

**මේ ප්‍රත්‍යය ශක්තිය ඇතිකළේ කවර නම් දෙවියෙක්ද?**

ඔවුනොවුන්ගේ ආකර්ෂණ බලය සංයෝග බලය විනා අන් කුමන බලයකින් යමක් සිදුවීම් ලැබේද? මේ ප්‍රත්‍යය ශක්තිය නවීන විද්‍යාඥයින් විසින්ද පිළිගෙන තිබේ. එහෙත් මෙකී ප්‍රත්‍යය ශක්තීන්ගේ යථා ස්වභාවය හා එකී ඇති බලය මනාලෙස පැහැදිලි කළ එකම ශාස්තෘවරයානම් තථාගතයන් වහන්සේය.

**අහස පොළොව දේව නිර්මාණයක් නොවේ! ඍතු බලය බීජ බලය ස්වභාව ධර්ම බලය යනාදී ස්වාභාවික ධාතූන්ගේ බලයයි.**

**ආධ්‍යාත්මික බලය** අචේතනික වස්තූන්ගේ ධාතු බලය මෙසේ වන අතර සචේතනික සත්ත්වයන්ගේ විඥාන ධාතුවේ බලය මෙයට හාත්පසින්ම වෙනස් වූද ආශ්චර්යවත්වූද බලයක් බව දක්වෙයි, සත්ත්වයාට විඥාන ධාතුව ඇතිවූයේ කවදාද කෙසේද? විඥාන ධාතුව සහිත සත්ත්වයා ඇතිවූයේ කෙසේද ඔහු කවරෙකු විසින්වත් මැව්වේද ඉබේ හටගත්තේද යන මේ ප්‍රශ්නයන්ට නිසි පිළිතුරු තථාගත ධර්මයේ හේතුඵල වාදය නමින් යුත් ඉගැන්වීමෙහි ගැබ්ව ඇත. පඨවි ආපෝ තෙජෝ ආදී ද්‍රව්‍ය සන්තතියේ පැවැත්ම මෙන්ම අදෘශ්‍යමානවූ මේ විඥාන ධාතුවේ සම්භවය පැවැත්ම හා පරිහානියද නානාප්‍රකාරය. එක ධාතුවකින් තවත් ධාතුවක් නසින්නාසේම එක ධාතුවක් හටගැණීමට තවත් ධාතුවක් හෙතු වන්නාසේම විඥාන ධාතුව පිළිබඳවද තත්ත්වය එසේමයි. ඔවුනොවුනට හිතවත් වූද ප්‍රතිවිරුද්ධවූද විඥාන පරම්පරා ඇතිව නැතිව යන බවද එක ද්‍රව්‍යයක් තුළ පඨවි-ආපෝ - තෙජෝ ආදී ඔවුනොවුන්ට විරුද්ධ ධාතු කොටස් සංයෝජනව ඇත්තාසේම එක සත්ත්වයෙකු පිලිබඳ විඥාන පරම්පරාවද යහපත් අයහපත් විඥාන පරම්පරා සහිත බව සැලකිය යුතුය. එහෙත් රූප ධාතුන්ට .වඩා මේ විඥාන ධාතුවේ අසීමිත-අද්භූත-බලයක් රඳා පවත්නා බවද කිවයුතුය.

නයෙකු විසින් හෝ පොළඟෙකු විසින් දෂ්ට කරණු ලැබූ මෙන් ඇතෙක් පොළොවේ හෙයි. කුඩා සජීයාගේ ශරීරයේ පවත්නා විෂ ධාතුවට විඥාන ධාතුව සම්බන්ධවීමෙන් මේ තරම් දරුණු බවක් ඇතිකළ බව සැලකිය යුතුයි. ශරීරයේද එක්තරා තැවයක විෂ ධාතුවක් ඇතත් එය එතරම් දරුණු නොවේ. මැරුණු සජීවාගේ ශරීරයේ යමකී විෂවේගය නැත්තේ එයට විඥාන ධාතුවේ සහයෝගය නොමැති නිසයි. විෂ සහිත විඥාන ධාතුන්ද ඇතිබව එයින් පෙනේ. නයි- පොළොං- ගෝනුසු-පත්තෑ ආදී සතුන්ගේද බලල්-සුනඛ-මූෂික ආදී සතුන්ගේද "විෂ" නොයෙක් ආකාර ප්‍රභේද සහිතව පිහිටියේ කුමක් නිසා දැයි සොයා බැලිය යුතුය. එය දේව භාස්කර්මක්ද?

පඨවි ආදී ධාතුන්ගේ නානා ප්‍රකාර ධාතුගුණ ඇති හෙයින් නානා ප්‍රකාර අවිඥානක වස්තූන් ලොව ඇත්තාසේ විඥාණ ධාතුවේද පවත්නා ප්‍රභේද නිසා නානාප්‍රකාර සත්ත්ව ජීවීන් ලොව ඇති බව දක්වයි.

පඨවි-ආපො-තෙජෝ ආදී ධාතු ගුණ ලෝකයේ කවදා නොනැනකදී කෙසේ ඇතිවීදැයි මේතාක් ලොව කිසිම විද්‍යාඥයෙකුට සොයාගන්ට නොහැකිවී ඇත. විඥාන ධාතුවේ මූලද එසේම විය යුතුයි. මෙසේ ලවත් අවිඥාණක ද්‍රව්‍යයකට වඩා විඥාන ධාතුවේ ඇති බලය සීමාරහිතය.

ඒ බව තථාගතයන් වහන්සේ මෙසේ වදාරා ඇත.

**චිත්තෙන නියති ලොකො - චිත්තෙන පරිකස්සති**
**චිත්තස්ස ඒක ධම්මස්ස - සබ්බෙව වස මන්වගූ**

**චිත්තයාගේ අසීමිත බලය** (ලෝවැසි තෙමේ සිතින් සැප දුක දෙකට පමුණුවයි. සිතින් සුගති දුගති වලට අදිනු ලබයි. සියලුම ලෝකයා සිත නැමති මේ එකම ධර්මයාගේ වසයට ගියාහුය)

නාරද ජාතකයෙහි නාරද තාපසයන් වහන්සේ දේවල තාපසයන් විසින් තමන් වහන්සේට කරණ ලද සාපයක් වැළැක්වීම පිණිස හිරු උදාවීම වැලැක්වූ බව පෙන්වා ඇත.

සැවැත්පුර දෙව්රම විසූ සුඛ සාමණේර = පණ්ඩිත සාමණේර යන දෙදෙනා වහන්සේ ආචාර්‍යයාණන් වහන්සේ වන සාරිපුත්‍ර රහතුන් වහන්සේ සමග පිඬු පිණිස වඩනා කල්හි ඇලක් හා වඩු මඩුවක්ද කම්මලක්ද දැකීමෙන් චිත්ත බලය දියුණු කරගණු වස් ඇදුරු හිමිට පාත්‍රයදී ආපසු අරමට වැඩ ආවාස තුළටවී මහණ-දම් වඩන අතර උන්වහන්සේලාගේ චිත්ත බලය නිසා (දිවා භොජනය වළකින හෙයින්) හිරුගේ ගමන වැළකී පැවති බවද රහත්ව අහර ගැණීමෙන් පසුව හිරුගමන සිදුවූ බවද ධම්මපදට්ඨ කථාවෙහි දැක්වෙයි. වර්තමාන බොහෝ දෙනා සැක උපදවන තැනකි මෙය. හිරුගේ ගමන වැළකිය හැකිද? ස්වභාව ධර්ම වෙනස් කළ හැක්කේ කාටද? ආදි ප්‍රශ්න නඟති. නමුත් ''චිත්තස්ස ඒක ධම්මස්ස සබ්බෙව වසමන්වගූ'' (සිත නැමති එකම ධර්මයට සියලුම ලොව වසිවේයයි) යන බුද්ධ වචනය සපිරවූ තැන් මෙය බව සැලකිය යුතුයි. හිරු යනු තෙජෝ ධාතුව අධික කොට ඇති වස්තුවකි. එහි ඇති බලය විඥාන ධාතුව විසින් යටපත් කළ ආකාරය තථාගත ධර්ම-චිත්ත ධර්ම ශාස්ත්‍රය දන්න වුන්ට ආශ්චර්යයක් නොවේ.

එහෙත් අද මේ චිත්ත බලය පිළිබඳ ලෝකයා නොඅදහයි. වර්තමාන ලෝකය රූප ධර්මයට විනා නාම ධර්මයට (සිතට) ගරු නොකරයි,

එහෙත් වර්තමාන ලෝකයේ රූප ධර්මයන් පඨවි ආදී ධාතු ගුණයන් සංයෝග කොට පරමාණු බෝම්බය වැනි සියුම් නිපදවීම් පවා ඇති කරන්නේ මිනිසා පිළිබඳව පවත්නා අසීමිත බලයෙන් යුත් විඤ්ඤාණ ධාතුව නිසාම බව නොඅදහති.

දනට ශත වර්ෂ 25 කට පෙර සිටි උතුමෝ මිනිසා තුළ පවත්නා ඒ ශ්‍රේෂ්ඨ විඥාන ධාතු බලය නිසිමඟ යොදා ලොවටද වැඩ සිද්ධ කළහ. ලෞකික හැඟීම් බලපවත්වමින්; පවත්නා චිත්ත බලය යටපත් කොට තමන්ටද ලොවටද විපත් සිදුකරමින් අන්ධවූවන් හෝ උමතුවූවන් ලෙසින් ක්‍රියාකරන වර්තමාන ලෝකය අවිද්‍යාවෙන් හරිතව කල්යවන බව පෙනේ.

විඤ්ඤාණ ධාතුව නිසිමග යොදන්නාහට නොවූ - නොකට හැකි දෙයක් නැත.

**සවිඤ්ඤාණක සත්ත්වයාගේ සම්භවය කෙසේද?**

දැන් අපි විඤ්ඤාන ධාතුවේ උපත දෙස බලමු. ඒ පිළිබඳව බලන කල සත්ත්වයාගේ උපතම සෙවිය යුතුය මේ සත්ත්වයා කෙසේ ඇතිවීද කවදා ඇතිවීද? මෙකී ප්‍රශ්නයට පිළිතුරු සැපයීම අචින්ත්‍යවූ ලෝකයේ නානා ප්‍රකාර විඤ්ඤාණ පරම්පරාසහිතවූ අණ්ඩජ-ජලාබුජ සංසෙදජ-ඕපපාතික සඞ්ඛ්‍යාතවූ; සත්ත්වයන්ගේ ජීවින්ගේ සම්භවය හා ව්‍යාප්තියද පරිහානියද දකීමේ ශක්තිය ඇති අද්භූත ඥාන ශක්තියකින් යුක්ත උතුමෙකු විසින්ම කළයුතුය.

නවීන ශාස්ත්‍ර මාර්ගයන් කරණු ලබන පරීක්ෂණයන් ඉදිරියෙහි ස්ථිරව නොසෙල්වී සිටිය හැකි පරිදි ජීවිතය පිළිබඳ අවුල විසඳනු ලබන එකම පිළිතුර නම් තථාගතයන් වහන්සේවදාළහේතුඵල වාදයයි.

**ඩාවින්ගේ පරිණාම වාදය**

අපරදිග විසූ ඩාවින් නම් පණ්ඩිතයාගේ පරිණාම වාදය අනුව මුලින්ම විඤ්ඤාණ ධාතුව (ඔහුගේ නිගමණය පරිදි ජීවය) ඇතිවූයේ මුහුදේ විසූ කුඩා පාශියකය. "එක කොෂිය කුඩා සතා" වශයෙන් සලකනු ලබන ඇසට නොපෙනෙන තරම් සියුම්වූ ජීවය සහිත මේ ප්‍රාණියා ක්‍රමයෙන් විකාශනය වීමෙන් කලකදී කොඳුඇටය සහිත මාලුවෙකුවූ බව කියයි. මුලින් ජලචරවූ ඒ ප්‍රාණියා පසුව ගොඩබිම හා දියෙහිද

ජීවත්විය හැකි උභය ජීවී සතෙකුට පරිවර්තනය වූ බවද; ඉන්පසු ඉදිබු-තල්ෂනායි- කටුසු ආදී සර්පයින්ද; උරගයින්ද; ඉන්පසු පක්ෂීන්ද; සිවුපාවුන්ද අවසානයේ ඇතිවූ වඳුරාගෙන් මිනිසාද විකාශනයවූ බව ඔහුගේ නිගමණයයි. එයට හේතුද දක්වා ඇත. යම් යම් සත්වයින්ගේ ඇටකටු හා ලේද සංසන්දනයකර බැලීමෙන් තමාවුන්ගේ මතය තවත් තහවුරුකර ගත්හ. ඔවුන්ගේ නිගමණය අනුව වඳුරාගෙන් පරිවර්තනයවූ ආදිම මිනිසා ඇතිවී දැනට වර්ෂ දශලක්ෂයක් පමණ බව දක්වයි. වර්ෂ දශ ලක්ෂයකට පෙර විසූ මිනිසෙකුගේ හිස්කබලක් සොයා ගැනීමෙන් ඔහු මේ නිගමන යට පැමිණියේය.

එහෙත් මූදේ පාශියට-එනම් කොශිය කුඩා සතාට-ජීවය ආවේ කොහෙන්ද? කෙසේද? ඒ ජීවය කොබඳුද? යන ප්‍රශ්නයන්ට පිළිතුරු සොයා නැත.

තවද ඇසිය යුත්තකි. වානරයාගේ විපරිනාමය වන මිනිසා දැනට ඇතිවී වර්ෂ දශ ලක්ෂයටත් අධික කලක් ගතවී තිබියදීත් මිනිසා තවම විකෘතිය කටපත් නොවූයේ ඇයි? පරිණාම වාදීන්ගේ නිගමණය අනුව මිනිසාද පරිණාමයට පත්විය යුතුය. වර්ෂ දශ ලක්ෂයක් ඉක්ම ගියත් තවම මිනිසාගේ පරිණාමයක් නොවීම යුක්ති ගරුකද? වඳුරාගෙන් වලිගය නැති මිනිසා විකාශනය විනම් මිනිසාගෙන් අනිකෙකු විකාශණය වීමේදී "අත්පා නැති හුණදක් ගුවනෙහි හැසිරෙන පුදුම සතෙක්" පහළ විය යුතුය.

(වර්ෂ දශ ලක්ෂයක් ඉක්ම ගිය නමුත් තවම මිනිසාගේ විකාශනයවූ බවක් දැනගන්ට නැත. නමුත් මිනිසාගේ ගති ගුණ වලින් නම් මිනිසා නැවතත් වනචාරී වානර යොනියටම යන බව නම් පෙනේ.

තවත් මතාන්තර ජ්‍යොතිශ්ශාස්ත්‍රයෙහි දක්වන ක්‍රමයට මේ කල්පය ඇතිවී වර්ෂ එකසිය අනූහත්කෝටි විසිනවලක්ෂ හතලිස් නවදහස් පණස් පහක් 'යයි වරාහ කල්ප සංඛ්‍යාවෙහි දක්වයි. සූර්යසිද්ධාන්තය නම් වේද ග්‍රන්ථය ලියූ දැනට වර්ෂ විසිතුන් ලක්ෂ නවදහසකට අධික බවද පෙනේ.

තවද 'මැවීම' මූලික ඉගැන්වීම කොට ඇති මහමත් ආගමේ 'අල්ලා' නම් දෙවියන් විසින් ලෝකය මවා දැනට වර්ෂ 6000 ක් පමණ වේයයිද; ක්‍රිස්තු ධර්මයේ දක්වන "යොහෝවා" නම් දෙවියන් විසින් ලෝකය මවා දැනට වර්ෂ 4000 ක් පමණ යයිද ඒ ධර්මවල උගන්වා ඇත.

මෙසේ බලනකල එකම ලෝකය බ්‍රහ්ම-විෂ්ණු-මහේශ්වර-අල්ලා-යොහෝවා යන දෙවිවරු කීප දෙනෙකු විසින් මවනලද බවද ඔවුන් විසින්ම මිනිසා මවනලද බවද උගන්වති. මේ මැවුම්කාර දෙවිවරු එකවරටම ලෝකය මැව්වාහුද? වරින්වර මැව්වාහුද? නො එසේ:නම් මේ නම් වලින් හඳුන්වන්නේ එකම දෙවි කෙනෙක්ද? (නමුත් මේ අයගේ ගතිගුණ මැවූ කාල සීමා හා මේ අයගේ ධර්ම ක්‍රම ආදිය එකිනෙකට පරස්පර නිසා එකම දෙවියෙකු ලෙසද සැලකීමටද ඉඩ නැත.)

මේ ආදි කරුණු අනුව තථාගතයන් වහන්සේට හැර වෙන කිසිම පඬිවරයෙකුට හෝ දර්ශන වාදියෙකුට මේ ලෝක ගැටලුව නිරාකරණය කිරීමට නොහැකි වූ බවද වර්තමාන විද්‍යාඥයින් අතර පවා මිනිසාගේ මුල් උපත කොතැනකද්දැයි ස්ථිර නිගමණයක් නොමැති බවද දතයුතුයි. විද්‍යාඥයින් අතර මේ දක්වාම පවත්නේ පර්යේෂණයක් මිස ස්ථිර නිගමනයන් නොවන බවද කිසිකලක ලෞකික ප්‍රඥාවෙන් කිසිම කෙනෙකු විසින් මේ ලෝක ගැටලුව නිරාකරණය නොකරණු ලබන බවද දත යුතුයි.

卐

## -15 පරිච්ඡේදය

# හේතු-ඵල වාදය 2

ලෝකයේ දතයුතුතාක් සියල්ල මනාසේ දැන වදාළ තථාගතයන් වහන්සේ ලෝකය හා තදාශ්‍රිත සත්ව සන්තතිය කිසිවෙකු විසින් නොමවනලද බවද ඉබේ ඇති නොවූ බවද වදාළ සේක. ශීතෝෂ්ණාදි සෘතු ගුණත් ස්වභාව ධර්මානුකූලව සංයෝග වීමෙන් අවිඥානක වස්තු ඇතිවූ බවද අවිද්‍යා තෘෂ්ණාදි හේතූන් සමග යෙදුනු පෘථිව්‍යාදී ධාතු ගුණ සංයෝගවීමෙන් සවිඥානක සත්වයා ඇතිවූ බවද දේශනා කළ සේක.

ශීතොෂ්ණාදිවූද පෘථිව්‍යාදිවූද ස්වභාව ධර්ම ප්‍රත්‍යය කොට වෘක්ෂ ලතාදීන් ඇතිව නැතිවී යන්නාසේ අවිද්‍යා=තෘෂ්ණා නම් වූ මූලික හේතු නිසා විඤ්ඤාණ පරම්පරා ඇතිවෙවී නැතිවෙවී. සත්ත්ව සඞ්ඛ්‍යාත මේ ස්කන්ධ පරිපාටිය පවත්නා බවද අවිද්‍යා තෘෂ්ණා දෙකේ නිරවශෙෂ නිරුද්ධියෙන් ස්කන්ධ පරිපාටියත් නිරුද්ධවන බවද දතයුතුයි. හේතු ඵල වාදය යනු මේ තත්ත්ව නිසිසේ උගන්වන තථාගත ධර්මයේ අන්‍යතර නාමයක්ය.

මහා පෘථිවියෙහි බීජයක් සිටවූ කල එයට ආපෝ රසයද පෘථිව්‍යාදි ධාතුද ශීතොෂ්ණාදි ගුණද එක්වීමෙන් ප්‍රත්‍යය ධර්ම කීපයක සමවායෙන් (එක්වීමෙන්) වැලක් හෝ ගසක් ඇතිවෙයි, එය මේරීමෙන් මල් හෝ ගෙඩි හටගණියි.

එසේම සත්ත්වයෙකුගේ පහළවීමද අවිද්‍යා–තෘෂ්ණා දෙක ප්‍රධාන හේතුවීමෙන් තවත් උපකාරක ධර්ම ඇති වීමෙන්–හේතුකීපයක් එක්වීමෙන්-සිදුවන බව දතයුතුයි. මේ නිසා තථාගත ධර්මයට නානා හේතුක වාදය කියාද නමක් වෙයි.

අන්‍යතීර්ථකයෝ–මිථ්‍යාදෘෂ්ටිහු-සත්ත්වයාගේ හා ලෝකයේ හට ගැනීම එකම හේතුවක් නිසා සිදුවේයයි කීහු. නමුත් තථාගතයන් වහන්සේ එය ප්‍රතික්ෂේප කළ සේක. ඒ බව තිකඞ්ගුත්තරයෙහි මහාවග්ගයට අයත් ප්‍රථම සූත්‍රයෙහි මෙසේ දක්වා ඇත.

සන්ති භික්ඛවෙ එකෙ සමණ බ්‍රාහ්මණා එවං වාදිනො, එවං දිට්ඨිනො යංකිඤ්චායං පුරිසපුග්ගලො පටිස වෙදෙති සුඛං වා දුක්ඛං වා අදුක්ඛමසුඛං වා සබ්බං තං පුබ්බෙකත හෙතූති.

සන්ති භික්ඛවෙ එකෙ -පෙ- සබ්බං තං ඉස්සරනිම්මාණ හෙතූති.

සන්ති භික්ඛවෙ එකෙ -පෙ- සබ්බං තං අහෙතු අප්පච්චයාති.

“මහණෙනි! මේ ලෝකයේ ඇතැම් මහණ පැවිද්දෝ සත්ත්වයා පිළිබඳ සැපදුක් සියල්ල “පෙර කර්මයෙන්ම” සිදුවේතැයි කියත් ඇතැම්හු මේ සැප දුක් සියල්ල “දෙවියන් විසින්” සිදුකරණු ලැබේතැයි කියත්. ඇතැමෙක් මේ සැප දුක් සියල්ල “ඉබේටම” සිදුවන බව කියයි. මහණෙනි! මම ඔවුන් කරා ගොස් මෙසේ

විචාරමි. හැබැද දුෂ්මන්තු මෙබඳු දුෂ්ටචාරීහු දැයි? ඔව්හු එසේ යයි පිළිතුරු දෙත්. ඉක්බිති මම ඔවුන්ගෙන් මෙසේ විචාරමි. හොඳයි! දුෂ්මතුන්ගේ පිළිගැනීම අනුව මෙලොව සියල්ල සිදුවන්නේ පෙර කර්මයෙන්ම නම් පස් පව් දස අකුසල් කරන සියලුම සත්‍වයන් පෙරත් එබඳු පව් කළ අය බව පිළිගන්නාහුද? එසේම මේ පව් සිදු කරන්නෝ දෙවියෙකුගේ නියමයක් පිට ඒවා කරන්නාහුද? නැතහොත් හේතු ප්‍රත්‍ය දෙකින් තොරව ඉබේටම පව් කරන්නාහුද? එසේ නම් උට්ඨාන වීර්‍ය-කල්‍යාණමිත්‍ර සේවනය-ඥානය ආදී දෙයින් වැඩක් නැ නොවේද? සැප දුක් සියල්ල පෙර කර්මයෙන්ම හෝ දේවහාස්තකමකින් හෝ-ඉබේම හෝ සිදුවන බව සලකා කිසිවක් නොකර නිකම් සිටිය යුතු නොවේද?

මහණෙනි! මගේ ප්‍රශ්නයන්ට පිළිතුරු දීමෙහි අපොහොසත් ඔව්හු අධොමුඛව (බිම බලාගෙණ) කල්පනා කරත්.

මෙසින් තථාගත ධර්මය නානා හේතුක වාදයක් බව සපිර වෙයි.

**සත්‍වයගේ මුල කොතැනද?**

තථාගත ධර්මය අනුව සත්‍වයාගේ මුල කොතැනද? සත්‍වයා කවදා-කෙසේ ඇතිවීද? මෙයට පිළිතුරු සපයන කල "මුලක් නොසෙවිය හැකිදේ අතුරෙන් සත්‍වයාද එකෙකි." යන කරුණ සිතා ගතයුතුය. ලොව පවත්නා සියලුම දේ සතරාකාරයකට බෙදිය හැකියි.

අග මුල නැති දෙය. අග මුල දෙකම ඇති දෙය. අගක් ඇති මුලක් නැති දෙය මුලක් ඇති අගක් නැති දෙය යනුවෙනි.

1 අකාශ ධාතුව හා නිර්වාණය පටන් ගැන්මක් හෝ අවසානයක් නොදත හැකි ධර්මයෝය. අග මුල දෙකම නැත.

2. සත්‍ව විෂය, බුද්ධ විෂය, ලොකවිෂය, යන මේවායේ අවසානයක් නැත. සිතා මතා අවසන් තීරණයකට එලඹෙන්ම නොහැකිය. මුල ඇති අග නැති දේය.

3 අවිද්‍යාව-තෘෂ්ණාව-සංසාරය යන මේ ධර්මයන්ගේ උපායෙන් ඇතිකරගත හැකි අවසානයක් ඇත. එනෙත්

ආරම්භයක් නැත. මුල සෙවිය නොහැකිය. එහෙයින් මුලක් නැති අගක් ඇති ධර්මයෝය.

(සංසාරය යනු අවිද්‍යා-තෘෂ්ණා දෙකින් හටගත් සම්මුති වශයෙන් සත්ව සඞ්ඛ්‍යාතවූ ස්කන්ධ පරිපාටියේ නොසිඳී පැවැත්මයි.)

4. මෙයින් පිටත්දේ අග මුල දෙකම ඇති ධර්මයෝය.

මේ අනුව බලනකල ඉන්ද්‍රිය ප්‍රතිබද්ධ-විඤ්ඤාණ ධාතුව සහිත මේ සත්වයාගේ මූලාරම්භය කවදාදැයි තීරණය කිරීම දුෂ්කර බව සිතානත යුතුය. එය තබා තොස්-පොල් ආදී ගසක හෝ ගෙඩියක හෝ මුල කවදා කොතැනදී සිදුවූවක්දැයි කිවහැකිද අවිද්‍යා තෘෂ්ණා දෙකින් යුක්තවූ මේ සත්වයාගේ මුල සෙවීම ඉතාම දුෂ්කර කරුණක් වෙයි. (එහෙත් මේ සත්වයාගේ අවසානයක් නම් ඇත. කවදා හෝ අවිද්‍යා තෘෂ්ණා දෙක නිරවශෙෂයෙන් නිරුද්ධවීද මේ සත්ව සඞ්ඛ්‍යාත ස්කන්ධ පරම්පරාවගේ පැවැත්මද එයින්ම නවතී.)

සංයුත්ත නිකායෙහි අනමතග්ග සූත්‍රයෙහි මෙසේ වදාරාඇත "අනමතග්ගොයං භික්ඛවෙ සංසාරො පුබ්බාකොටි න පඤ්ඤායති අවිජ්ජානීවරණානං සත්තානං තණ්හා සං යොජනානං සන්ධාවතං සංසරතං"

"මහණෙනි! අවිද්‍යා තෘෂ්ණාවෙන් බැඳුණු සත්වයන්ගේ ඉපදෙමින් මැරෙමින් පවත්නා ස්කන්ධ පරම්පරා සඞ්ඛ්‍යාත සංසාරය නොදන්නාලද අග මුල ඇත්තේය" යනු එහි භාවාර්ථයයි. මෙයින් තථාගතයන් වහන්සේ වදාලේ වර්ෂ සිය දහස් ගණන් කෝටි ගණන් අතීත භවයන් පසු පස නුවණින් මෙහෙයව බැලුවත් සත්වයාගේ මුල සෙවීම නොකළ හැකි බවය.

**සත්වයාගේ ආදිය සෙවීමේ ශක්තිය තථාගතවරයන් කෙරෙහිම පවත්නා බව.**

දිනක් මහාකාශ්‍යප රහතුන් වහන්සේ විදර්ශනා ලොකය වඩා දිවැසින් සත්වයන්ගේ ගති උත්පත්තිය (චුතිපටිසන්ධිය) සුගති දුගතිවල සත්වයින් උපදින ආකාරය බලන සේක්; අණ්ඩජ-ජලාබුජ-සංසෙදජ-ඕපපාතික යනචතුර්විධ යෝනි යට අයත් සත්වයන්ගේ ස්කන්ධ පරිපාටිය පරීක්ෂා කරන්ට වූ

සේක. එවේලෙහි තථාගතයන් වහන්සේද මහා කාශ්‍යප රහතුන් වහන්සේ චුතූපපාත ඥානය මෙහෙයවා සිටින බව දැක "මහා කාශ්‍යපය සත්ත්වයන්ගේ චුති උත්පත්තිය වනාහි බුද්ධ ඥානයෙන් තමුදු බලා නිශ්චය නොකොට හැකි තරම් සීමා රහිතය. කාශ්‍යපය! මව් කුස පිළිසිඳ ගෙණ මවට හෝ පියාටද නොදනී චුතවන සත්ත්වයින්ගේ ප්‍රමාණයද සීමා රහිතය. එකී ජලාබුජ සත්වයින් පිළිබඳ සත්වයන් මෙසේ නම් චතුර්විධ යෝනියක සත්වයින් පිළිබඳ තොප වැනි අය කෙසේ පිරිසිඳ දනිද්ද"යි වදාරා සියලුම සත්වයන්ගේ චුතිප්‍රතිසන්ධිය දැනීමේ ශක්තිය ඇත්තේ තථාගත බුදුවරයින් වහන්සේලා කෙරෙහි පමණක්ය"යි ද විස්තර කළසේක.

මහා කාශ්‍යප රහතුන් වහන්සේට ඒ අදහස ඇයි මේ ගාථාවද වදාළ සේක.

පමාදං අප්පමාදෙන-යද නුදති පණ්ඩිතො
පඤ්ඤා පාසාද මාරුයහ-අසොකො සොකිනිං පජං
පබ්බතට්ඨොව භූම්මට්ඨෙ-ධීරො බාලෙ අවෙක්ඛති
(ධම්මපදය)

(යම්සේ පොකුණකට ඇතුල්වන්නාවූ අලුත් ජලය එහි ඇති පුරාණ ජලය ඇත්කොට පුරාණ ජලය යටකොට මතු වෙත් මතුවෙව් යන්නේද, එසේම අප්‍රමාදය දියුණු කරන පණ්ඩිත තෙමේ ප්‍රමාදය අභිභවනය කරයි. ප්‍රමාදය දුරු කරයි. එබඳු "අප්‍රමාදී පුද්ගලයා" දිවැස සඞ්ඛ්‍යාතවූ ප්‍රඥා ප්‍රාසාදයෙහි මස්තකයට නගිනු පිණිස එයට අනුරූප පිළිවෙතෙහි යෙදෙනුයේ එම ප්‍රසාදයට නැග නිශ්ශෝකීව ප්‍රහීණවූ කෙලෙස් නැමැති හුල් ඇතිව ශෝකීවූ සෙසු ලෝකයා චුතවන අයුරු හා උපදින අයුරු මනාසේ දකියි. කුමක් මෙන්දයත්? මහා පර්වතයක් මුදුනේ සිටි තැනැත්තේ පර්වතය පාමුල සිටියවුන් මනාසේ දක්නාක් මෙනි.

මෙයින් තථාගතයන් වහන්සේ සත්වයාගේ ආදි මුල හා චුති ප්‍රතිසන්ධි පිළිවෙල සියල්ල දත් සර්වඥවරයින් වහන්සේලාට මිස සෙසු සත්වයින්ට අවිෂය බව=නොවැටහෙන බව ප්‍රකාශ කළ සේක.

ප්‍රඥා ප්‍රාසාදයෙහි මස්තකයට සිටි සියෝ බුදුවරයින් වහන්සේලාමය. සෙස්සෝ පහය පාමුලහැසිරෙන්නෝය.

## 16 පරිච්ඡේදය

# දේවදත්ත–බුද්ධදත්ත දෙදෙනා අතර සංවාදයක්

දේවදත්ත මේ මෙසේ නම් සත්වයාට "මූලක්" නැද්ද?

බුඩදත්ත තිබේ. එය නම් අවිද්‍යා–තෘෂ්ණා දෙකයි.

දේවදත්ත අවිද්‍යා තෘෂ්ණා දෙකට මූලක් නැද්ද?

බුඩදත්ත මෙයට පිළිතුරු මුලින් ප්‍රකාශ කොට ඇත.

දේ: මට එය අවුල් සහිතයි. මා අසන්නේ අවිද්‍යා තෘෂ්ණා දෙක කවදා ඇතිවී සත්වයෙකු බිහි කළාද යන්නයි

බු: මෙයටද පිළිතුරු "අනමතග්ගොයං" ආදී දේශනා පාඨ වලින් ඔප්පුකර ඇත

දේ: කිවයුත්තක් ඇත. මුලින් ඇතිවූයේ අවිද්‍යා තෘෂ්ණා දෙකද නැත්නම් සත්වයාද?

බු: අවිද්‍යා තෘෂ්ණා දෙකයි.

දේ: අවිද්‍යා තෘෂ්ණා ඇතිවන්නේ සත්වයෙකු තුළ නො වේද?

බු: ඔව්, නමුත් අවිද්‍යා තෘෂ්ණා නොමැතිව සත්වයෙකුදු ඇති නොවන හෙයින් මුලින් ඇතිවුනේ අවිද්‍යා තෘෂ්ණා දෙක බව සිතා ගත යුතුයි.

දේ: කරුණු සහිතව ඔප්පු කරන්ට බැරිද?

බු: ඇයි බැරි, නවීන විද්‍යාඥයින් පිළිගෙණ ඇති හැටියටද මුලින් ඇතිවූයේ විඥ්ඥාණයයි. ඩාවින් පණ්ඩිතයා කීවෙව් මූදේ පාශියකාට මුලින් ජීවය ඇතිවී එය විකාශණයවී

ආ බවයි, එසේම ගසට මුලින් බීජයද කිකිළියට මුලින් බිත්තරයද ඇතිවූ බව විද්‍යාඥයින්ගේ පිළිගැණීමයි. අවිද්‍යා තෘෂ්ණා යනු විස්තෘණයෙහිම කොටස් දෙකකි.

දේ: මේ අවිද්‍යා තෘෂ්ණා දෙකට මුලක් නැද්ද?

බු: එසේ මුල සොයන්ට ගියොත් කවදාවත් මුලක් සෙවිය නොහැක.

දේ: දේව වාදයෙහි උක්තවන සැටියට සත්වයා යම්කිසි දෙවි යෙකු විසින් මවනලද බව විශ්වාස කළ නොහැකිද? මේසයක් සෑදීමට වඩුවෙකු සිටිය යුතුය. එසේම සත්ව යාද දෙවියෙකු විසින් මවනු ලැබිය නොහැකිද?

බු: එසේ නම් මැවුම් කරුටත් මුලක් ඇතිවිය යුතුය. ඔහුට පමණක් ඉබේ පහළවීම යුක්තියක් නැත, මිත්‍රය! තවද කිවයුත්තකි. වඩුවා මේසය සාදන්නේ තිබෙන ද්‍රව්‍ය යකිනි. මැවුම්කාරයා ලෝකය මැව්වේ කිසිවක් නැතිවය දෙවියා ඉබේ පහළවී කිසිවක් නොමැතිව ලෝකයත් සත්ව යාත් මැවීම වඩුවා මේසය සාදනවාට හාත්පසින් වෙනස්ය,

දේ: එසේ නොකියන්න. මහදෙවියා සර්වබලධාරියෙකි. ඔහුට ලොව නොකළ හැකි දෙයක් නැත. ඔහුගේ බලය සීමා රහිතය. බුද්ධ විෂය අචින්ත්‍යසේ දේව විෂයද අචින්ත්‍යය. එහෙයින් අචින්ත්‍ය බල දරණ දෙවියන් විසින් මේ ලොව මැවීමද අචින්ත්‍යයි.

බු: හොඳයි, එසේ යයි මොහොතකට පිළිගනිමු. එසේ බල දරණ දෙවියා මේ ලෝකයේ භූමිකම්පා=ජලගැල්ම-වසංගත රෝග-චණ්ඩමාරුත-නියංභය ආදී දේවල් ලෝකයේ මැව්වේ ඇයි? ලොව මවන කල මේවා නැතිව මවන්ට තිබුනා නොවේද? සත්වයාට දුක මැව්වේ ඇයි.? රෝග පීඩා මැව්වේ ඇයි.? දූර පිඹුරු-නයි-පොළොන් ආදී සතුන් මැව්වේ ඇයි.? දෙවියන්ට අකීකරු පාපීන් මැව්වේ ඇයි. මෙයින් දෙවියා කිසිම බලයක් නැති අකාරුණිකයෙකු බව සැලකිය යුතුය. තවද මැවුම්කාර දෙවියා මේ ලොව දුප්පත්, පොහොසත්, උගත්, නූගත් ආදී

පඬසාති ඡේද ඇති කිරීම අකාරුණිකය. ඇතැමුන් අද ගොලු බිහිරි කොර ආදි අඞ්ගහීන පුද්ගලයන් කොට මැව් වේ ඇයි? ලොව මුලින්ම දෙවියා සතුන් මැව්වේ නම් ලෝකයේ නොසිටි ඔව්හු දෙවියාට කුමන වරදක් ඉලදී කළාහුද? (අචින්ත්‍යවූ බලයක් ඇති බුදුහු කිසිකලෙකත් සත්වයින් නොමැවූහ.)

ස්වර්ගය ඉරනමේ ස්වාමියා මිනිසාමය. මැවුම්කාරයින් පිළිබඳ හැඟීම් මිනිසාගේ චින්තන ශක්තිය මෙහෙයවීමට නොහැකිවීම නිසා ඇතිකරගත් මායාවෝය. මිනිසා විසින් මැවුම්කාරයින් මවන ලදී. නිරයත් සුගතියත් අද ගොලු බිහිරනුත් මැව් දෙවියා කොතරම් දරුණු කෙනෙක්ද?

වර්තමාන ලෝකයාට ආගම් එපාවී ඇත්තේද මෙබඳු දේව භක්තිකයින් විසින් කරණු ලබන හිස් ප්‍රලාපයන් නිසාමය ඇතැම් ආගම්වල උගන්වන හැටියට මිනිසා ඇතිවී අවුරුදු 6000 කට වැඩි නොවේ. නමුත් නවීන විද්‍යාඥයින්ගේ නිගමණය අනුව අවුරුදු දශලක්ෂයකටත් පෙර ලොව "මිනිසා" විසූ බව දක්වයි. ආගම් ගරු නොකරන නිදහස් මතධාරීන් අද ලෝකයේ වැඩිවන්නේ (බෞද්ධාගම හැර) දුබල පුද්ගලයින් විසින් ඇති කරන ලද ඒ ඒ ආගම්වල ඇති දුබලකම් හා දූෂිත නිසාය. යම් කිසි ආගමක ලෝකයේ පටන්ගැන්ම හෝ මැවීම අසවල් කාලයේ සවලා විසින් සිදුකරන ලදැයියන ඉගැන්වීමක් වේනම් "අනන්තා පරිමාණවූ – අචින්ත්‍යවූ" මේ ලොක විෂය පිළිබඳ "ඉතා සුළු වශයෙන" සිතා පැවසූ හිස් ප්‍රලාප බව ඇතැම් විද්‍යාඥයින් කියන් නේද ඒනිසාය.එහෙත් බුඩාගම අන්ධවිස්වාසයට හෝ භක්තියට ඉඩනොදෙයි සිතා මතා කල්පනාකොට යමක් වටහා ගැණීමේ ශක්තියට මුල්තැන දෙන එකම ආගම "බුද්ධාගමය"යි එහෙයින් බුද්ධාගම නවීන විද්‍යාවටද අනුකූලවෙයි.

තමන්ද නොදන්නා– තමන්ට නොපෙනෙන – මනඃ කල්පිත දෙවියෙකු විසින් මවන ලද ලෝකය – සදාකාලික අපාය – සදාකාලික ස්වර්ගය – කිසි දිනක වෙනස් නොවන ශුද්ධාත්මය යනාදී අප්‍රත්‍යක්ෂ–අද්භූත ඉගැන්වීම් පිළිබඳව අද වර්තමාන ලෝකයා මුළානොකල හැකිය.

ආ බවයි, එසේම ගසට මුලින් බීජයද කිකිළියට මුලින් බිත්තරයද ඇතිවූ බව විද්‍යාඥයින්ගේ පිළිගැණීමයි. අවිද්‍යා තෘෂ්ණා යනු විසඳුණයෙහිම කොටස් දෙකකි.

දේ: මේ අවිද්‍යා තෘෂ්ණා දෙකට මුලක් නැද්ද?

බු: එසේ මුල සොයන්ට ගියොත් කවදාවත් මුලක් සෙවිය නොහැක.

දේ: දේව වාදයෙහි උක්තවන සැටියට සත්වයා යම්කිසි දෙවියෙකු විසින් මවනලද බව විශ්වාස කළ නොහැකිද? මේසයක් සෑදීමට වඩුවෙකු සිටිය යුතුය. එසේම සත්වයාද දෙවියෙකු විසින් මවනු ලැබිය නොහැකිද?

බු: එසේ නම් මැවුම් කරුටත් මුලක් ඇතිවිය යුතුය. ඔහුට පමණක් ඉබේ පහළවීම යුක්තියක් නැත, මිත්‍රය! තවද කිවයුත්තකි. වඩුවා මේසස සාදන්නේ තිබෙන ද්‍රව්‍යයකිනි. මැවුම්කාරයා ලෝකය මැව්වේ කිසිවක් නැතිවය දෙවියා ඉබේ පහළවී කිසිවක් නොමැතිව ලෝකයත් සත්වයාත් මැවීම වඩුවා මේසය සාදනවාට හාත්පසින් වෙනස්ය,

දේ: එසේ නොකියන්න. මහදෙවියා සර්වබලධාරියෙකි. ඔහුට ලොව නොකළ හැකි දෙයක් නැත. ඔහුගේ බලය සීමා රහිතය. බුද්ධ විෂය අචින්ත්‍යසේ දේව විෂයද අචින්ත්‍යය. එහෙයින් අචින්ත්‍ය බල දරණ දෙවියන් විසින් මේ ලොව මැවීමද අචින්ත්‍යයයි.

බු: හොඳයි, එසේ යයි මොහොතකට පිළිගනිමු. එසේ බල දරණ දෙවියා මේ ලෝකයේ භූමිකම්පා-ජලගැල්ම-වසංගත රෝග-චණ්ඩමාරුත-නියඟය ආදී දේවල් ලෝකයේ මැව්වේ ඇයි? ලොව මවන කල මේවා නැතිව මවන්ට තිබුනා නොවේද? සත්වයාට දුක මැව්වේ ඇයි.? රෝග පීඩා මැව්වේ ඇයි.? දූර පිඹුරු-නයි-පොළොන් ආදී සතුන් මැව්වේ ඇයි.? දෙවියන්ට අකීකරු පාපින් මැව්වේ ඇයි. මෙයින් දෙවියා කිසිම බලයක් නැති අකාරුණිකයෙකු බව සැලකිය යුතුය. තවද මැවුම්කාර දෙවියා මේ ලොව දුප්පත්, පොහොසත්, උගත්, නූගත් ආදී

පඩසාති භේද ඇති කිරීම අකාරුණිකය. ඇතැමුන් අද ගොලු බිහිරි කොර ආදි අඞ්ගහීන පුද්ගලයන් කොට මැව්වේ ඇයි? ලොව මුලින්ම දෙවියා සතුන් මැව්වේ නම් ලෝකයේ නොසිටි ඔව්හු දෙවියාට කුමන වරදක් ඉලදී කළාහුද? (අවිනාශවූ බලයක් ඇති බුදුහු කිසිකලෙකත් සත්වයින් නොමැවූහ.)

ස්වර්ගය ඉරනමේ ස්වාමියා මිනිසාමය. මැවුම්කාරයින් පිළිබඳ හැඟීම් මිනිසාගේ චින්තන ශක්තිය මෙහෙයවීමට නොහැකිවීම නිසා ඇතිකරනත් මායාවෝය. මිනිසා විසින් මැවුම්කාරයින් මවන ලදි. නිරයත් සුගතියත් අද ගොලු බිහිරනුත් මැව් දෙවියා කොතරම් දරුණු කෙනෙක්ද?

වර්තමාන ලෝකයාට ආගම් එපාවී ඇත්තේද මෙබඳු දේව භක්තිකයින් විසින් කරණු ලබන හිස් ප්‍රලාපයන් නිසාමය ඇතැම් ආගම්වල උගන්වන හැටියට මිනිසා ඇතිවී අවුරුදු 6000 කට වැඩි නොවේ. නමුත් නවීන විද්‍යාඥයින්ගේ නිගමණය අනුව අවුරුදු දශලක්ෂයකටත් පෙර ලොව "මිනිසා" විසූ බව දක්වයි. ආගම් ගරු නොකරන නිදහස් මතධාරීන් අද ලෝකයේ වැඩිවන්නේ (බෞද්ධාගම හැර) දුබල පුද්ගලයින් විසින් ඇති කරන ලද ඒ ඒ ආගම්වල ඇති දුබලකම් හා දූෂිත නිසාය. යම් කිසි ආනමක ලෝකයේ පටන්ගැන්ම හෝ මැවීම අසවල් කාලයේ සවලා විසින් සිදුකරන ලදයියන ඉනැන්වීමක් වේනම් "අනනතා පරිමාණවූ - අවිනාශවූ" මේ ලොක විෂය පිළිබඳ "ඉතා සුළු වශයෙන" සිතා පැවසූ හිස් ප්‍රලාප බව ඇතැම් විද්‍යාඥයින් කියන්නේද ඒනිසාය.එහෙත් බුධාගම අන්ධවිස්වාසයට හෝ භක්තියට ඉඩනොදෙයි සිතා මතා කල්පනාකොට යමක් වටහා ගැණිමේ ශක්තියට මුල්තැන දෙන එකම ආගම "බුද්ධානමය"යි එහෙයින් බුද්ධානම නවීන විද්‍යාවටද අනුකූලවෙයි.

තමන්ද නොදන්නා- තමන්ට නොපෙනෙන - මනඃ කල්පිත දෙවියෙකු විසින් මවන ලද ලෝකය - සදාකාලික අපාය - සදාකාලික ස්වර්ගය - කිසි දිනක වෙනස් නොවන ශුද්ධාත්මය යනාදී අප්‍රත්‍යක්ෂ-අද්භූත ඉගැන්වීම් පිළිබඳව අද වර්තමාන ලෝකයා මුළානොකළ හැකිය.

අහසත් පොළොවත් මැවූ දෙවියා සමුද්‍රයත් මවා; ගස් ගල් පර්වත දියත් සත්ත්වයාත් දුක සැප දෙකත් මවා; මෙලොව බිහි කරවා, දුක සැප දෙවා නැවත ඔවුන් සුගතියට හා දුගතියට පත්කරයි. මෙබඳු "කරදර කාරි විෂම ලොවක්" මවන්නේ නැතුව "නිකම් සිටියා"නම් කොපමණ හොඳද? තමුන් දෙවියා කෙරෙහි ඉතාම භක්තිමත්වූ දේවභක්තිකයන්ට පවා නොයෙක් රෝගපීඩා වදබන්ධන විපත් ආදිය කොට මරණය සෙදෙයි. දේව භක්තිය ලොව ප්‍රකට කරවීමට මෙලොවට පැමිණි "ජේසු ක්‍රිස්තුයාට" පවා අන්තිමට කෙදුනු මරණය කෙතරම් දරුණුද?

ස්වභාව ධර්මයට අනුව සිදුවන ස්වභාවික දේ පිළිබඳ පමණක් උගන්වන එකම ආගම බුද්ධාගමයි. ඒ ස්වභාව ධර්මය අනිකක් නොව තථාගතයන් වහන්සේ විසින් වදාළ හේතුඵල වාදය යි.

අවිද්‍යා-තෘෂ්ණා සඞ්ඛ්‍යාත හේතුව නිසා ඵල සඞ්ඛ්‍යාතවූ මේ සත්ත්වයා ඇතිවේ. කවර කාලක අවිද්‍යා-තෘෂ්ණා දෙකින් මේ සත්ත්වයා වැළඳ ගන්නා ලදද යන්න කිව නොහැකිය. එහෙයින් සත්ත්වයාගේ මුල් කෙළවර නැත. යම්තාක් අවිද්‍යා-තෘෂ්ණා දෙකින් සත්ත්වයා වැළඳගන්නේද ඒතාක් සත්ත්වයා ඉපද ඉපදී මැරි මැරී යයි. ගසෙන් ගෙඩියත් ගෙඩියෙන් ගසත් හටගන්නාසේ අවිද්‍යා-තෘෂ්ණා දෙකින් සත්ත්වයාත් සත්ත්වයා නිසා අවිද්‍යා-තෘෂ්ණා දෙකත් ඇතිවෙමින් අනන්ත කාලයක් පවතී. යම් කලෙක අවිද්‍යා-තෘෂ්ණා දෙක සහමුලින් නැති කළේද එදාම සත්ත්වයාත් අභාවයටම යයි. ඒතාක් අපට දක්නට ලැබෙන්නේ සත්ත්වයාගේ මැද පමණක් බව දතයුතුය.

දේ: මිත්‍රය! ලෝකයේ මුල සොයන්ට බැරිද?

බු: මිත්‍රය! ඉන් ඇති ඵලය කිම? ලෝකයේ මුල දැනගත්තත් ඉන් ඇති ඵලය කිම? සෙව්ය යුත්තේ මේ ලෝකයේ ඉපදීම හා ජරාමරණයන්ට හේතුවය.

ග්‍රහ නක්ෂත්‍ර චන්ද්‍ර සූර්‍ය්‍යාදින්ගේ දිග පළල උස මහත ආදිය පිළිබඳ කරණ පර්‍ය්‍යේෂණයන්ගෙන් ලෞකික ජීවිතයට-ජීවිතයේ තාවකාලික පැවැත්මට උපදෙස් ලබනු හැකිය. එහෙත් එබඳු පර්‍ය්‍යේෂණයකින් ජරා මරණ - දුක් විපත් ආදී කරදර නැති නොවේ. දුකින් පිරුණු ලෝකයේ දුකට හේතුව සොයා එයට ප්‍රතිකර්ම නොකර ලෝකයේ දිග පළල ආදිය සොයමින් කල්යැවීම වනයේ මං මුළාවූවෙක් ඉන් පිටවීමට උපාය මාර්ගය නොසොයා

වානයේ දිග පලල ආදිය සොයන්නාසේද; සිරදුක් විඳින සිරකරුවෙකු ඉන් මිදීමේ උපාය නොසොයා සිරකුටුවේ දිග පළල සොයන්නාසේද; අඥාන කමක් බව දතයුතුයි.

ලෝකය දුක් බව සියලු පණ්ඩිතයෝම එකහෙලා පිළිගණිති එහෙත් එයට හේතුව හා ප්‍රතිකර්ම නිසිසේ නොදනිති. ජාත්‍යාදි දුකින් පවත්නා ලෝකය දුක් සහිත බවද එයට හේතුව අවිද්‍යා-තෘෂ්ණා දෙක බව තථාගතයන් වහන්සේ වදාළසේක. හේතුඵල වාදයෙන් උගන්වන්නේ එයයි.

ඒ බව සලකන ඥාණවන්තයා දුකත් දුකට හේතුවත් දැන ගෙණ දුකින් එතරවීමේ උපාය මාර්ගය අනුගමනය කරයි. දුකින් එතරවීමේ උපාය මාර්ග නම් ආර්ය අෂ්ටාංගික මාර්ගයයි.

දේ: ලෝකයේ දර්ශණ වාද අතුරෙන් තර්කයට හා විමංසන බුද්ධියට ගොචරවන නියම ඉගැන්වීම ඇත්තේ බුද්ධාගමෙහි පමණක් බව මම සපිරව පිළිගනිමි. ඔබට ස්තූතියි!

බු: එසේ නම් මිත්‍රය ඉදිරියට ඇති විස්තරයද බලා ඔබ නියම බෞද්ධයෙකු වන්න!

**හේතුව රහිතව ඵලයක් නැත. ඵලය ඇත්තේ හේතුව මතය: හේතුව විනාශවීමෙන් ඵලයද විනාශවෙයි.**

卐

## 17 පරිච්ඡේදය

# හේතු-ඵල වාදය 3

1. තෙන සමයෙන බුද්ධො භගවා උරුවෙලායං විහරති නජ්ජා නෙරඤ්ජරාය තීරෙ බොධිරුක්ඛමූලෙ පඨමාභිසම්බුද්ධො. අථඛො භගවා බොධිරුක්ඛමූලෙ සත්තාහං එකපල්ලඞ්කෙන නිසීදි විමුත්තිසුඛපටිසංවෙදී. අථඛො භගවා තස්සාරත්තියා පඨමං යාමං පටිච්චසමුප්පාදං අනුලොම පටිලොමං මනසාකාසි. අවිජ්ජා පච්චයා සංඛාරා; සඞ්ඛාර පච්චයා විඤ්ඤාණං; විඤ්ඤාණ පච්චයා

නාමරූපං; නාමරූපපච්චයා සළායතනං, සළායතන පච්චයා ඵස්සො; ඵස්ස පච්චයා වෙදනා; වෙදනා පච්චයා තණ්හා; තණ්හා පච්චයා උපාදානං; උපාදාන පච්චයා භවො; භව පච්චයා ජාති; ජාති පච්චයා ජරාමරණං සොක පරිදෙව දුක්ඛ දෙමනස්සුපායාසා සම්භවන්ති. එවමෙතස්ස කෙවලස්ස දුක්ඛක්ඛන්ධස්ස සමුදයො හොති.

2. අවිජ්ජායත්වෙව අසෙසවිරාග නිරොධා සඞ්ඛාර නිරොධො, සඞ්ඛාර නිරොධා විඤ්ඤාණ නිරොධො; විඤ්ඤාණ නිරොධා නාමරූප නිරොධො; නාමරූප නිරොධා සළායතන නිරොධො; සළායතන නිරොධා ඵස්ස නිරොධො; ඵස්ස නිරොධා වෙදනා නිරොධො; වෙදනා නිරොධා තණ්හා නිරොධො; තණ්හා නිරොධා උපාදාන නිරොධො; උපාදාන නිරොධා භව නිරොධො; භව නිරොධා ජාති නිරොධො, ජාති නිරොධා ජරාමරණං සොක පරිදෙව දුක්ඛ දෙමනස්සුපායාසා නිරුජ්ඣන්ති. එව මෙතස්ස කෙවලස්ස දුක්ඛක්ඛන්ධස්ස නිරොධො හොතී ති.

3. අථඛො භගවා එතමත්ථං විදිත්වා තායං වෙලායං ඉමං උදානං උදානෙසි

යදා හවෙ පාතුභවන්ති ධම්මා
ආතාපිනො ඣායතො බ්‍රාහ්මණස්ස
අථස්ස කඞ්ඛා වපයන්ති සබ්බා
යතො පජානාති සහෙතු ධම්මං.

4. අථඛො භගවා රත්තියා මජ්ඣිමං යාමං පටිච්ච සමුප්පාදං අනුලොම පටිලොමං මනසාකාසි. අවිජ්ජා පච්චයා සඞ්ඛාරා; සඞ්ඛාර පච්චයා විඤ්ඤාණං; විඤ්ඤාණ පච්චයා නාමරූපං; නාමරූප පච්චයා සළායතනං– පෙ–එවමෙතස්ස කෙවලස්ස දුක්ඛක්ඛන්ධස්ස සමුදයො හොති.–පෙ–නිරොධො හොතීති. අථඛො භගවා එතමත්ථං විදිත්වා තායං වෙලාය. ඉමං උදානං උදානෙසි.

යදා හවෙ පාතු භවන්ති ධම්මා
ආතාපිනො ඣායතො බ්‍රාහ්මණස්ස
අථස්ස කඞ්ඛා වපයන්ති සබ්බා
යතො ඛයං පච්චයානං අවෙදි ති

5. අථඛො භගවා රත්තියා පච්ඡිමං යාමං පටිච්චසමුප්පාදං අනුලොම පටිලොමං මනසාකාසි – අවිජ්ජා පච්චයා සඞ්ඛාරා; සඞ්ඛාර පච්චයා විඤ්ඤාණං–පෙ – එවමෙතස්ස කෙවලස්ස දුක්ඛක්ඛන්ධස්ස සමුදයොහොති–පෙ–නිරොධො හොතීති. අථඛො භගවා එතමත්ථං විදිත්වා තායං වෙලායං ඉමං උදානං උදානෙසි.

යදා හවෙ පාතුභවන්ති ධම්මා
ආතාපිනො ඣායතො බ්‍රාහ්මණස්ස
විධූපයං තිට්ඨති මාරසෙනං
සූරියොව ඔභාසයමන්තලික්ඛං

(මහාවග්ගපාළි)

---

1. එසමයෙහි සම්බුද්ධත්වයට පත්වූ භාග්‍යවතුන් වහන්සේ උරුවෙල් දනව්වෙහි නෙරඤ්ජරා නදී තීරයෙහිවූ අශ්වත්ථ බොධි වෘක්ෂමූලයෙහි විහරණය කළසේක. ඉක්බිති තථාගතයන් වහන්සේ සත්දිනක් අර්හත්ඵල සමාපත්ති සුවයෙන් කල්යැවූසේක් සති අවසන්හි සත්වනදා රාත්‍රි ප්‍රථම යාමයෙහි ප්‍රතීත්‍ය සමුත්පාදය අනුලොම=ප්‍රතිලොම වශයෙන් මෙනෙහි කළසේක.

අවිද්‍යා ප්‍රත්‍යයෙන් සංස්කාරය:
සංස්කාර ප්‍රත්‍යයෙන් විඥානය;
විඥාන ප්‍රත්‍යයෙන් නාමරූපය;
නාමරූප ප්‍රත්‍යයෙන් ෂඩායතනය;
ෂඩායතන ප්‍රත්‍යයෙන් ස්පර්ශය;
ස්පර්ශ ප්‍රත්‍යයෙන් වෙදනාව;
වෙදනා ප්‍රත්‍යයෙන් තෘෂ්ණාව;
තෘෂ්ණා ප්‍රත්‍යයෙන් උපාදානය;
උපාදාන ප්‍රත්‍යයෙන් භවය;
භව ප්‍රත්‍යයෙන් ජාතිය;

ජාති ප්‍රත්‍යයෙන් ජරා – මරණ – ශොක – පරිදෙව දුඃඛ–දෞර්මනස්‍ය–උපායාශ යෝ පහළ වෙත්. මෙසේ මේ දුක් කඳෙහි–දුක් සමූහයාගේ–හටගැන්මවේ.

2 අවිද්‍යාවගේම නිරවශෙෂ නිරොධයෙන් සංස්කාර නිරොධය;
සංස්කාර නිරොධයෙන් විඥාන නිරොධය;
විඥාන නිරොධයෙන් නාමරූප නිරොධය;
නාමරූප නිරොධයෙන් ෂඩායතන නිරොධය;
ෂඩායතන නිරොධයෙන් ස්පර්ශ නිරොධය;
ස්පර්ශ නිරොධයෙන් වෙදනා නිරොධය;
වෙදනා නිරොධයෙන් තෘෂ්ණා නිරොධය;
තෘෂ්ණා නිරොධයෙන් උපාදාන නිරොධය;
උපාදාන නිරොධයෙන් භව නිරොධය;
භව නිරොධයෙන් ජාති නිරොධය;

ජාති නිරෝධයෙන් ජරා මරණ-පරිදේව-දුඃඛ-දෞර්මනස්‍ය-උපායාසයෝ නිරෝධ වෙත්. මෙසේ මේ හුදු දුක් සමූහයාගේ නිරෝධය (සංසිඳීම) වේ. (මේ දුක් සමූහය නම් පඤ්චෝපාදානස්කන්ධයයි.)

3. ඉක්බිති තථාගතයන් වහන්සේ ප්‍රතීත්‍ය සමුත්පාදය මෙසේ සලකා දැන වදාරා ප්‍රථම යාමාවසානයෙහි මේ උදානයද පහළ කළසේක.

> කෙලෙස් තවන වීර්‍ය්‍ය ඇති; විදර්ශනා ධ්‍යානයෙන් ධ්‍යාන කරන; දුරු කළ පව් ඇති; යොගාවචරයාහට යම් වේලාවක සත්තිස් බොධිපාක්ෂික ධර්මයෝ පහළ වෙද්ද? එකෙණෙහි අවිද්‍යාදී හේතුවෙන් හටගන්නා පඤ්චෝපාදානස්කන්ධ සඞ්ඛ්‍යාත වූ මේ කෙවල දුක්සමූහයා ප්‍රභේද වශයෙන් දැනගන්නා හෙයින් ඔහුගේ සියලු සැකයෝ දුරුවෙත්.

4. නැවත තථාගතයන් වහන්සේ රාත්‍රී මධ්‍යම යාමයෙහි ප්‍රතීත්‍ය සමුත්පාදය අනුලොම ප්‍රතිලොම වශයෙන් මෙනෙහි කළසේක් මධ්‍යම යාමාවසානයෙහි ප්‍රීතිවාක්‍ය වශයෙන් මේ අදහස ඇති ගාථාවද වදාළසේක.

> කෙලෙස් තවන වීර්‍ය්‍ය ඇති; ධ්‍යාන කරණ; පව් දුරුකළ යොගාවචරයාහට සත්තිස් බොධිපාක්ෂික ධර්මයෝ පහළවෙද්ද? එකල අවිද්‍යාදී ප්‍රත්‍යයන්ගේ ක්ෂයවීමට හේතුවූ නිර්වාණ ප්‍රත්‍යක්ෂ වන හෙයින් පඤ්චෝපාදානස්කන්ධ සඞ්ඛ්‍යාත කෙවල දුක් සමූහයා පිළිබඳ සියලු සැකයෝ දුරුවෙත්.

5. නැවතද පශ්චිම යාමාරම්භයේ සිට ප්‍රතීත්‍ය සමුත්පාදය අනුලොම (හෙතු-ඵල පරම්පරාව සැදී සැදී යන සැටි) ප්‍රතිලොම (හෙතුඵල පරම්පරාව නිරුද්ධවන - සන්සිඳෙන සැටි) මෙනෙහි කළසේක් යාමාවසානයෙහි මතු සඳහන් අදහස සහිත ගාථාව ප්‍රීතිවාක්‍ය වශයෙන් වදාළ සේක.

> කෙලෙස් තවන වීර්‍ය්‍ය ඇති; දුරුකළ පව් ඇති; යොගාවචරයා තෙමේ තමහට සත්තිස් බොධිපාක්ෂික ධර්ම පහළවන කෙණෙහිම අඳුර දුරුකොට අහස බබලවන හිරුමෙන් සියලු මාරසේනාව සිඳහරිමින් සිටී.

**සම්බුදුවරයන්ගේ ඥාණ විශෙෂය**
**සිංහාව ලොකනය හා**
**සුනඛාව ලොකනය**

සිංහයෙකුට ගලක් ගැසූ කල ගලගැසූ දද්ගලයා සොයයි. සුනඛයෙකුට ගලක් ගැසූකල සුනඛයා ගල සපයි. එමෙන් සෙසු ශාස්තෘවරයෝ ලෝකයාත්-සත්වයාත් පිළිබඳ ඵලය සොයති. හේතුව සෙවීමෙහි අපොහොසත් වෙති. බුදුවරයෝ සර්වධර්මයන් පිළිබඳ හේතුව සොයති දක්ෂ වෛද්‍යවරයා රෝගනිදානය සොයන්නාසේ; මහමඟ හුද-කලාව සිටින කුඩා ළදරුවෙකුගේ මව්පියන් සොයන්නාසේ; සම්බුදුවරයෝ දුක්ඛ ප්‍රඥජයක්වූ මේ සත්වයාගේ හටගැණීමේ හේතුව සොයති.

**දුකට හේතුව**

ලොව උපන් සියලු සත්වයෝ ජරාවට පත්වෙති මරණයට පත්වෙති. එය දුකකි. උපන් සත්වයා මහලු නොවී - නොමැරී සදාකල් ජීවත්වන්නේ නම් එය කෙතරම් උසස් සැපයක්ද?

1 සත්වයාගේ ජරාවට හා මරණයට හේතුව කුමක්ද? ඉපදීමයි. ඉපදීමක් නොවීනම් ජරා-මරණද නැත.

2 ඉපදීමේ හේතුව කුමක්ද? කර්ම භවයයි. එනම් චෙතනා සඞ්ඛ්‍යාත කුශලා කුශල කර්මයි.

3 කුශලාකුශල කර්මයන් රැස්කරන්නේ ඇයි? පඤ්චස්කන්ධය පිළිබඳ දැඩිකොට අල්වා ගැණීම නිසයි.

4 පඤ්චස්කන්ධය දැඩිකොට අල්වා ගැණීමට හේතුව කුමක්ද? තෘෂ්ණාවයි.

5 තෘෂ්ණාවට හේතුව කුමක්ද? වෙදනාවයි.

6 වෙදනාවට හේතුව කුමක්ද? ස්පර්ශය හෙවත් අරමුණු සමග හැපීම නිසයි.

7 ස්පර්ශයට හේතුව කුමක්ද? ඇස-කණ-දිවආදී ආයතනයෝය

8 ආයතන ඇතිවීමට හේතුව කිම? නාමරූප දෙකයි.

9 නාමරූපයට හේතුව කිම? ප්‍රතිසන්ධි විඥානයයි.

10 ප්‍රතිසන්ධි විඥානයට හේතුව පෙර ජාතිවල කළ කුශලාකුශල කර්මයි= සංස්කාරයෝයි.

11 කුශලාකුශල සඞ්ඛ්‍යාතවූ සංස්කාරයන්ට හේතුව කුමක්ද?

12 අවිද්‍යාව හෙවත් චතුසත්‍යාවබොධය නොකිරීමයි.

අනිත් - මාර්ගඥානයෙන් අවිද්‍යාව ප්‍රහීන කරනතුරු නැවත නැවතත් මේ සංස්කාර-විඥාන ආදී කරුණු සිද්ධවෙවී හෙතුඵල වශයෙන් ජාතියක් පාසා පෙරළෙමින් පවතී.

### පටිච්ච සමුප්පාදය ඉගෙනගන්නවුන් විසින් පහත සඳහන් කරුණුද විශෙෂයෙන් දතයුතුයි.

මේ දෙශනාවෙහි අඞ්ග දොළසක්වේ. එනම් අවිජ්ජා, සඞ්ඛාර, විඤ්ඤාණ, නාමරූප, සළායතන, ඵස්ස, වෙදනා, තණ්හා, උපාදාන, භව, ජාති, ජරාමරණ යනුවෙනි. මෙයට සංසාර චක්‍රය යනුද භවචක්‍රය යනුද පර්‍යාය නාමයෝ වෙති. මෙහි

**කාල වශයෙන්**

අවිද්‍යා-සංස්කාර යන පළමුවන අඞ්ග දෙක පෙර ජාතියට අයත්ය. ජාතිය හා ජරාමරණ දෙක මතු ජාතිය පිළිබඳවය. ඉතිරි අඞ්ග අට වර්තමාන ජාතිය පිළිබඳවෙයි. මෙසේ අඞ්ග දොළොස කාල වශයෙන් තුනකට බෙදේ.

**වට්ට වශයෙන්**

මෙසේම සඞ්ඛාර හා භව කම්මවට්ට නම්වෙයි. අවිජ්ජා - තණ්හා උපාදාන තුණ කිලෙසවට්ට නම් වෙයි. ඉතිරි සත විපාකවට්ට නම්වේ. මෙසේ අඞ්ග දොළස වට්ට (වෘත්ත) තුනකට බෙදේ.

**හෙතුඵල අතීත-වර්තමාන**

අතීතයෙහි අවිජ්ජා-සඞ්ඛාර දෙක හෙතුය. එයට තණ්හා = උපාදාන භව යන තුනද ඇතුළත් කළවිට අතීතහෙතු පසක්වේ. මේ හෙතුපස කරණ කොටගෙණ වර්තමාන ඵල වශයෙන් විඤ්ඤාණ, නාමරූප, සළායතන, ඵස්ස, වෙදනා යන පස හටගණිති.

**වර්තමාන හෙතු අනාගත ඵල**

මේ ජාතියේ තණ්හා-උපාදාන-කම්මභව භව යන තුන හේතු වෙයි. එයට අවිජ්ජා-සඞ්ඛාරද ගණු ලැබේ. එවිට වර්තමාන හෙතු පසක් යෙදෙයි. එයට ඵල වශයෙන් අනාගත භවයෙහි විඤ්ඤාණ-නාමරූප-සළායතන ඵස්ස වෙදනා යන ඵල පස පහළ වෙයි. මෙසේ අතීත හේතු පසක් නිසා වර්තමාන ඵල පසක්ද වර්තමාන හේතු පසක් නිසා අනාගතඵල පසක්ද ලැබෙන බව දත යුතුයි.

**සන්ධිතුන**

සඞ්ඛාර - විඤ්ඤාණ දෙදෙනා අතර සන්ධියෙකි, වෙදනා - තණ්හා දෙක අතර සන්ධියකි. භව-ජාති දෙක අතර සන්ධියකි මෙසේ සන්ධි තුනකින් යුක්තය.

**විසි ආකාර**

අතීත හේතු පහ; වර්තමාන ඵල පහ; වර්තමාන හේතු පහ; අනාගත ඵල පහ යන නයින් ආකාර විස්සෙක් වේ.

**සතර සංග්‍රහ**

අවිජ්ජා-සඞ්ඛාර දෙක ප්‍රථම සංග්‍රහයයි. විඤ්ඤාණ-නාමරූප සළායතන ඵස්ස-වෙදනා ද්විතීය සංග්‍රහයයි. තණ්හා-උපාදාන භව තෘතීය සංග්‍රහයයි. ජාති-ජරා මරණ චතුර්ථ සංග්‍රහයයි

අවිද්‍යාව යම්තාක් කල් පවතීද ඒතාක් මේ සංසාර චක්‍රය හෙතුඵල වශයෙන් පෙරළෙමින් පවතී. අර්හත් මාර්ගඥානයෙන් අවිද්‍යාව ප්‍රහීන කිරීමෙන් සංස්කාරද ප්‍රහීනවෙයි. සංස්කාර නිරුද්ධියෙන් විඥානයාගේද නිරුද්ධිය වෙයි. මෙසේ ක්‍රමයෙන් නාම රූපාදිය නිරුද්ධවීමෙන් සියලු දුක් සමූහයාගේ ප්‍රහාණය වනබව සැලකිය යුතුයි. අවිද්‍යාව ප්‍රත්‍යය කොට සංස්කාරාදිය ඇතිවීමද නැවත සංස්කාරාදිය නිසා අවිද්‍යාව ඇතිවීමද මේ ප්‍රත්‍යය ධර්ම ඔවුනොවුන්ටමත් ප්‍රත්‍යයවීමද නිසා මේ හෙතු ඵල පරම්පරාවේ අවසානයක් නැත. මේ නිසා මේ අවිද්‍යාදි අඞ්ගදොළස භව චක්‍රය නමින්ද හඳුන්වනු ලැබේ. පහත සඳහන් චිත්‍රය බලන්න.



මේ පටිච්ච සමුප්පාද දෙශනාවෙන් සත්ත්වයාගේ මුල් පටන් ගැන්මක් නොදක්වයි. "අවිද්‍යාව ප්‍රත්‍යය කොට සංස්කාරයෝ වෙත්" යන්නෙන් අවිද්‍යාව ලෝකයේ මුලවිය යුතු හෙයිනි. නමුත් අවිද්‍යාවද ආශ්‍රවයන් ප්‍රත්‍යය කොට ඇතිවෙයි. ඒබව ආසවසමුදයා අවිජ්ජා සමුදයො; අවිජ්ජා පච්චයා සඞ්ඛාරා; සඞ්ඛාර පච්චයාපි අවිජ්ජා ආදී දෙශනාපාඨයන්ගෙන් ප්‍රකටව ඇත්තේය.

සංසාර වෘත්තය වදුරන්නාවූ තථාගතයන් වහන්සේ අවිද්‍යා-තෘෂ්ණා-දෙක ප්‍රධානකොට දෙශනා කළසේක. ඒ මෙසේයි:- පුරිමා භික්ඛවෙ කොටි නපඤ්ඤායති අවිජ්ජාය ඉතො, අවිජ්ජා නාහොසි අථ පච්ඡා සම්භවිති-පෙ-

පුරිමා භික්ඛවෙ කොටි න පඤ්ඤායති භව තණ්හාය ඉතො පුබ්බෙ භව තණ්හා නාහොසි අථ පච්ඡා සම්භවිති-පෙ-

"මහණෙනි මෙයින් පෙරටුව අවිද්‍යාව නොවීය. අසුවල් තැන සිට වියයි කීමට හෝ

මෙයින් පෙරටුව භවතෘෂ්ණාව නොවීය. අසුවල් තැන සිට වියයි කීමට හෝ තැනක් නොපෙනේ. එහෙත් මෙනම් ප්‍රත්‍යයෙන් අවිද්‍යාව හා තෘෂ්ණාව ඇතිවියයි පෙනේ" යනු එහි භාවයි.

එසේනම් "සංස්කාරවෘත්ත දෙශනාවෙහිදී මේ අවිද්‍යා-තෘෂ්ණා දෙක ප්‍රධාන කොට වදාළේ ඇයි?" යනු ප්‍රශ්නයෙහි. "සුගති-දුගති ගාමී කර්මයන්ට විශෙෂ හේතුවන නිසාය" යනු එයට කෙටි පිළිතුරයි. දුගතිගාමී කර්මයන්ට අවිද්‍යාවද සුගතිගාමි කර්මයන්ට තෘෂ්ණාවද විශෙෂයෙන් ප්‍රත්‍යය වෙයි.

තවද අතීත භවයෙහි අවිද්‍යාව ප්‍රධාන කොට වර්තමාන විපාකයද අනාගත භවයෙහි තෘෂ්ණාව ප්‍රධාන කොට විපාකයද ලැබෙන හෙයින් අවිද්‍යා තෘෂ්ණා දෙක භව චක්‍රයෙහි ප්‍රධාන ලෙස වදාරා ඇත්තේය. එපමණක්ද නොවේ. දෘෂ්ටි චරිතයා අවිද්‍යාව මුල් කොටද තෘෂ්ණා චරිතයා තෘෂ්ණාව මුල්කොටද කර්ම රැස්කරන හෙයින් චරිතයන්ගේ වශයෙන් අවිද්‍යා-තෘෂ්ණා දෙක මුල්කොට දෙශනාකර ඇතිබව දතයුතුයි.

සැලකිය යුත්තක් ඇත. මේ පටිච්ච සමුප්පාද දෙශනාවෙහි පූර්වාර්ධය අවිද්‍යාව මුල්කොටද අපරාර්ධය තෘෂ්ණාව මුල්කොටද දෙශනාකර ඇතත් මෙයද "එක හේතුක" වාදයක් වශයෙන්

නොවදාරණලදී. ඒබව විභඞ්ගයෙහි පහදදී ඇති බව දතයුතුය. අවිජ්ජා පච්චයා සඞ්ඛාරා සඞ්ඛාර පච්චයාපි අවිජ්ජා (අවිද්‍යා ප්‍රත්‍යයෙන් සංස්කාරයෝද සංස්කාර ප්‍රත්‍යයෙන් අවිද්‍යාවදවේ.)

සඞ්ඛාරා පච්චයා අවිජ්ජා පෙ-විඤ්ඤාණ පච්චයා අවිජ්ජා-පෙ-
සළායතන පච්චයා අවිජ්ජා පෙ-ඵස්ස පච්චයා අවිජ්ජා-පෙ-
වේදනා පච්චයා අවිජ්ජා-පෙ-තණ්හා පච්චයා අවිජ්ජා-පෙ-
උපාදාන පච්චයා අවිජ්ජා-පෙ-

මේ ආදී දෙශනා පාඨවලින් විභඞ්ගයෙහි විස්තර කර ඇත්තේද සඞ්ඛාර-විඤ්ඤාණ-ආයතන-ඵස්ස ආදීන්ගෙන්ද අවිද්‍යාව ඇති වන බවයි.

එහෙත් පටිච්ච සමුප්පාදයෙහි එක හේතුවක් පමණක් වදුරා ඇත්තේ සුඛාවබොධය පිණිස බවද අති විස්තාර ප්‍රත්‍යය ධර්ම විස්තරය පට්ඨානයෙහි වදාරා ඇති බවද සැලකිය යුතුයි.

තවද මේ අවිද්‍යාදී අඞ්ග දොළස චක්‍රයකි. ඒනිසා සංසාර චක්‍රය යනු අන්වර්ථ නාමයයි. ගෙඩියෙන් ගසත් ගසෙන් ගෙඩියත් ඇතිවන්නාසේ අවිද්‍යා-තෘෂ්ණා නිසා කර්මත් කර්මයන් නිසා ඉපදීමත් ඉපදීමෙන් පසු නැවතත් අවිද්‍යා-තෘෂ්ණා හා කර්මත් ඇතිවන බව සැලකිය යුතුයි. මෙසේම ප්‍රතීත්‍ය සමුත්පාද දෙශනාවද රවුමකි. චක්‍රයක මුල සෙවීම දුෂ්කරයි. එහෙත් තමන්ට අභිමත තැනක් මුල වශයෙන් ගත හැකියි. එයද යුක්තියක් අනුව විය යුතුයි. මේ අනුව බලනකල චක්‍රයක් විලසින් පවත්නා අවිද්‍යාදී අඞ්ග දොළසින් අවිද්‍යා-තෘෂ්ණා දෙක නැතිකළ කල්හි සංසාර චක්‍රයද බිඳී යන හෙයින් ඒ ධර්මදෙක ප්‍රධාන වශයෙන් ගෙණ පටිච්ච සමුප්පාද දෙශනාව සිදුකළ බව දතයුතුය.

**"පටිච්ච සමුප්පාද" යනු හෙතු-ඵල වාදයටම යෙදෙන පර්යාය නාමයකි.**

## 18 පරිච්ඡේදය

# හෙතු-ඵල වාදය 4

ලොව ඇතිතාක් සියලු සවිඤ්ඤාණක අවිඤ්ඤාණක වස්තුවක්ම ඇතිවීමට හා පැවතීමට යම්කිසි අභ්‍යන්තර උපකාරක ධර්මයක්ද පැවතිය යුතු බව තථාගත ධර්මයෙහි උගන්වයි. හේතු=ඵල වාද

යෙන් ඊශ්වර නිර්මාණවාදයද (දෙවියෙකු විසින් මවනලදැයි යන ඉගැන්වීමද) අහේතු අප්‍රත්‍යය වාදයද(කිසිම හේතුවක් කරුණක් නැතිව හටගත්බව ඉගැන්වීමද) ප්‍රතික්ෂෙප කරණලදී.

**පටිච්ච සමුප්පාද** යමක ඇතිවීම හෝ පැවැත්ම තවත් දෑයක උපකාරයෙන් සිදුවන බව හේතු-ඵල වාද යෙන් ප්‍රකට ලෙස වදූරා ඇත, එහෙත් එක දෙයක හටගැණීමට හෝ පැවතීමට උපකාරක ධර්ම කීපයක් ඇතිවෙයි. පටිච්ච සමුප්පාද ක්‍රමයෙන් වදූරා ඇත්තේ එබඳු උප කාරක ධර්ම එක එක බැගිනි. තනි හේතුවකින්-උපකාර ධර්මය කින් හටගන්නා එකද දෙයක්වත් ලොව නැත. කොබඳු දෙයක් වුවද ඇතිවීමට උපකාරක ධර්ම බොහොමයක් ඇතිවෙයි. ඒ පිළිබඳ අති විස්තාර ක්‍රමය පට්ඨාන ක්‍රමයෙන් දෙශනාකර ඇති බවද පටිච්ච සමුප්පාද ක්‍රමය ඒකා හෙතුඵල දෙශනාවක් වශයෙන් වදූරා ඇති බවද මුලින් දක්වා ඇත. ගොවියා පොළොව සකස් කොට බීජ වර්ගයක් රොපනය කරයි. අව්ව-වැසි ජලය-සුලඟ යන ධර්මයන්ගේද ආධාරයෙන්ද පෝරවල ආධාරයෙන්ද අස්වැන්න හොඳින් ලබයි. මෙසේ බලන කල අස්වැන්න ලැබීමට-ඵලය ලැබීමට ගොවියා-පොළොව-ජලය-පෝර-අව්ව ආදී ධර්ම කීපයක් ආධාරවෙයි. එහෙත් අව්-වැසි-පෝර ආදී වස්තූන්ගේද ගොවියා ගේද උපකාරය අස්වැන්නට ලැබෙනුයේ එකිනෙකට වෙනස් වශයෙනි,

එසේම ආහාරයක් අනුභව කිරීමෙන් ආයු- වර්ණ- සැප= බල ආදී කරුණුද ශරීරයේ පුෂ්ටිමත් කමද ඇතිකරයි. එකම ආහා රය කීප ආකාරයකින් උපකාරවෙයි. එසේම "සත්ව" සඞ්ඛ්‍යාත මේ "නාම රූප" ධර්ම පරම්පරාවේ සම්භවයට හා සංවර්ධනයට උපකාරක ධර්ම සමූහයක් ඇත. මෙකී උපකාරක ධර්මයෝ ප්‍රත්‍යය-හේතු-කාරක-නිදාන ආදී නම් වලින් හඳුන්වනු ලබත්. ඇතැම් ප්‍රත්‍යය ධර්ම සත්වයාගේ සම්භවයද ඇතැම් ධර්ම සංවර්ධනය වද මුල්වෙති. මිනිසාගේ සම්භවයට අවිද්‍යාදී හේතු ධර්ම ආධාර වන අතර සංවර්ධනයට ආහාර හා ජලය වාතය ආදී උපකාරක ධර්මද වෙයි.

ඉමස්මිං සති ඉදං හොති ඉමස්ස උප්පාදා ඉදං උප්පජ්ජති. මේ ඇති කල්හි මේ වන්නේය. මේ ඉපදීමෙන් මේ උපදින් නේයයි යන ඉගැන්වීම් ක්‍රමය පටිච්ච සමුප්පාද නමි.

පටිච්ච ඵලං සමුප්පජ්ජති එතස්මාති පටිච්ච සමුප්පාදො යම් හේතුව කින් යම් ඵලයක් ඇතිවේද ඒ හේතුව පටිච්ච සමුප්පාද නමැයිද; හේතුවෙන් උපන් ඵලය පටිච්ච සමුප්පන්න නමැයිද දතයුතු, ප්‍රත්‍යය, ප්‍රත්‍යයොත්පන්න යනුද හේතුඵල වාදයට නමකි. සඞ්ඛත-සංඛාර යනුද ප්‍රත්‍යයොත් පන්නධර්මයන්ට ඵල ධර්මයන්ට පර්‍යාය නම්ය

පච්චෙතු මරහන්ති නං පණ්ඩිතාති පටිච්චො
සහ සම්මාච උප්පජ්ජතීති සමුප්පාදො
පටිච්චො ච සො සමුප්පාදො ච පටිච්ච සමුප්පාදො
(විසුද්ධිමග්ග)

මේ පටිච්ච සමුප්පාදය උද්ඝට්ටිතඥදී පණ්ඩිතයෝම දැනගන්නට අවබොධ කරන්නට සුදුසු වෙත්නුයි පටිච්ච නම්. එකවිට හේතු සහිතවම උපදීනුයි සමුප්පාද නම්. පටිච්චවූයේත් සමුප්පාදවූයේත් එයමනුයි පටිච්ච සමුප්පාද නම්වේ.

පුරිමෙන සස්සතාදීන-මභාවො පච්ඡිමෙනච පදෙන
උච්ඡෙදාදි විඝාතො - ද්වයෙන පරිදීපිතො ඤායො
(විසුද්ධිමග්ග)

පටිච්ච සමුප්පාද යන මෙහි මුල් වචනයෙන් එනම් "පටිච්ච" යන වචනයෙන් ශාශ්වත දෘෂ්ටි – අහෙතුක දෘෂ්ටි – විෂම දෘෂ්ටි – ඊශ්වර නිර්මාණ දෘෂ්ටි යන මිථ්‍යා දෘෂ්ටි දුරුකරයි. සමුප්පාද යන වචනයෙන් ප්‍රත්‍යය සමවාය ඇතිකල්හි ධර්මයන් උපදින බැවින් නාස්තික වාද – අහෙතුක වාද– අක්‍රියවාද යන වාදයන් දුරුකරයි එසේම මධ්‍යම ප්‍රතිපදා සඞ්ඛ්‍යාත න්‍යාය යද පටිච්ච සමුප්පාද වචනයට ඇතුළත්වෙයි.

**එහෙයින් මේ සත්වයා ඉබේ ඇතිවූයේත් නොවේ කිසිවෙකු විසින් මවන ලද්දේත් නොවේ. අවිද්‍යාදී ඒ ඒ ප්‍රත්‍යය ධර්මයන්ගේ එක්වීමෙන් සඞ්ඛාරාදී ඵල ධර්ම ඇතිවීමෙන් අවිච්ඡින්න නාම රූප ධර්ම පරම්පරාවක් පවත්නා බව සැලකිය යුතුය.**

පටිච්ච සමුප්පාද යනු හෙතු–ඵල වාදයයි. පටිච්ච සමුප්පාදයෙන් පිටත් බුද්ධාගමක් හෝ බුද්ධාගමෙන් පිටත් පටිච්ච සමුප්පාදයක් හෝ නැති බවද දතයුතුය.

හේතු-ඵල වාද සඞ්ඛ්‍යාතවූ මේ ප්‍රතීත්‍ය සමුප්පාද විස්තරය ඉතාම දුෂ්කර වූවකි. කලක් ධර්මධරයන් ආශ්‍රය කරමින් ගුරු මුෂ්ටිය සහිත ආචාර්ය්‍ය වාදයකින්ම උගතයුතු මේ ධර්මය පිළිබඳව මෙබඳු කුඩා දහම් පොතකින් කිසිසේත් නිශ්චය දැනීමක් ලබනු නොහැකිය. නවීන භාෂා ශාස්ත්‍ර කලාශිල්ප පිළිබඳ උගත් කමක් ලැබූනු පමණින් මේ ගැඹුරුවූ සියුම් ධර්මය වටහාගණු නොහැකිසි. සෝවාන් මග ඵල නුවණ ලබනතුරු නිශ්චය දැනීමක් ඇති නොවේ. එහෙත් නිසිසේ ඉගෙණීමද බැලීම හා ධාරණය කර ගැණීමද නිශ්චය දැනීමක් ලබනුවට ඉවහල්වේ, නවීන විද්‍යාව දියුණුවූ බොහෝ අපරදිග රටවල උසස් විද්‍යාඥයින් විසින්ද මේ හේතුඵල වාදය "විද්‍යානුකූල" බව දක්වා ඇත.

තවද අවබෝධ කිරීමටද ඉතාම දුෂ්කරවූ කරුණු වලින් ප්‍රතීත්‍ය සමුප්පාදය එකකි. චතුරාර්‍ය්‍ය සත්‍යය සත්ත්වයා-ප්‍රතිසන්ධිය යන තුන අනිත් කරුණු වෙයි.

සච්චං සත්තො පටිසන්ධි - පච්චයාකාර මෙව ච
දුද්දසා චතුරො ධම්මා - දෙසෙතුංච සුදුක්කරං

චතුස්සත්‍යය-සත්ත්වයා-ප්‍රතිසන්ධිය-ප්‍රතීත්‍ය සමුත්පාද යන ධර්මසතර දැනගැණීමට අමාරුය. ප්‍රකාශ කිරීමද ඉතා දුෂ්කරයවේ. යනුවෙන් පුරාණ ආචාර්‍ය්‍ය වරයෝද ප්‍රකාශ කළහ.

මෙසේම වේද-වේදාඞ්ග-සමය-සමයාන්තර භාෂාන්තර ආදී යෙහි නිපුණවූ විශාරද බුද්ධි ප්‍රභාවයකින් යුක්තවූ "භදන්තාචරිය බුද්ධඝොස" මහා ස්ථවිර පාදයන් වහන්සේ පවා "පටිච්ච සමුප්පාද" යෙහි අටුවා ලිවීම ආරම්භ කරමින්

වත්තුකාමො අහං අජ්ජ - පච්චයාකාර වණ්ණනං
පතිට්ඨං නාධිගච්ඡාමි - අජ්ඣොගාළ්හොව සාගරං

(ප්‍රත්‍යයාකාර වර්ණනාව කියනු කැමති මම සාගරයට බැසගත් කෙනෙකු සෙයින් පිහිටක් නොලබමි) යනුවෙන් මදක් පැකිළි ගියසේක.

එබඳු අතිසූක්ෂමවූ මේ පටිච්ච සමුප්පාදය" උග්ගහණ-ධාරණ සවණ - භාසන - පරිපුච්ඡා - විසජ්ජන ආදී ක්‍රමවලින් වටහා ගන්නේ නම් ඔහු "පූර්වාපර විශෙෂඥතය" ලබයි. (මේ ධර්මය ඉගෙණීමාදියෙන් ලැබෙන අනුබොධඥතාවෙන් හා එයින් මත්තෙහි අවබොධඥතයෙන්ද ලබන මාර්ග-ඵල විශෙෂයන්ම පූර්වාපර විශේෂඥතය යයි දක්වයි.)

මාර්ග-ඵල-නිර්වාණ යන ප්‍රතිවෙධ කොට සකස් පරිනිර්වාණයෙන් ජාති-ජරා-ව්‍යාධි-මරණ-ශෝක-පරිදෙවාදී අප්‍රමාණ දුක්ඛස්කන්ධය දුරුකොට අවෙදයිත සුඛ ලක්ෂණ නිර්වාණ ධාතුවට පැමිණෙන බව සැලකිය යුතුයි.

19 පරිච්ඡේදය.

# හේතු-ඵල වාදය. (5)

## අවිජ්ජා පච්චයා සඞ්ඛාරා.

## අවිද්‍යා ප්‍රත්‍යයෙන් සංස්කාරයෝ වෙත්.

**අවිද්‍යා යනු කුමක්ද? සංස්කාරයෝ නම් කවරහුද අවිද්‍යා ප්‍රත්‍යයෙන් කෙසේ සංස්කාරයෝ වෙත්ද? යනු ප්‍රථමයෙන් විනිශ්චය කටයුතුයි.**

විද්‍යාව නොවන්නේ යමක්ද ඒ අවිද්‍යාවයි. විද්‍යාව නම් ඥානයයි. අවිද්‍යාව නම් අඥානකමයි. බුදුවරයින් ලොව පහළ වන්නේ මේ අවිද්‍යාව `අඥානකම මන හරවා දුරුකරවා සත්වයාට ශාන්ත සැපය-නිර්වාණ සැපය ලබන පිළිවෙත ප්‍රකට කරවා සත්වයා දුකින් එතර කර වීමටයි. අබුද්ධොත්පාද කාලවල නොපවත්නා; අන්‍ය තීර්ථකයින්ට විෂය නොවන ප්‍රණීතවූ ධර්මයකි. ලොවට බුදුවරයෙකු විසින් ප්‍රකාශ කරණු ලබන්නේ. අවිද්‍යාවෙන් නුවණැස වැසී ගියාහු තථාගත ධර්මයේ පිහිට නොලබා සතර අපා දුකට පැමිණෙති. අවිඤ්ඤාණක-සවිඤ්ඤාණක සියලුම ධර්මයන්ගේ අනිත්‍ය බව, දුක්ඛ බව, අනාත්ම බව, ලොවට පහදාදී ලෝකය දුක් බවත්, එයට හේතුව තෘෂ්ණාව බවත්, තෘෂ්ණාව නිරුද්ධ කිරීම සැපය බවත්, ආර්‍ය අෂ්ටාංගික මාර්ග සඞ්ඛ්‍යාත සම්‍යක් ප්‍රතිපදාවෙන් තෘෂ්ණාව නිරුද්ධ කළ යුතු බවත්, බුදුවරයෝ ලොවට ප්‍රකාශ කරති.

ලෝකය නිත්‍ය බව හෝ සදාකාලික බව සලකන්නේ අවිද්‍යාව නිසයි. අවිද්‍යාව දුරුකරන තුරු නියම සැපයක් නොලැබෙයි. අවිද්‍යාව දුරුකර විද්‍යාව උපදවා සත්‍යය අවබොධ කරනතෙක් දුකින් මිදීමක් නැත. ඒ සඳහා සර්වඥවරයෝ අවිද්‍යාවෙන් යුක්ත ලොකයාට අනුකම්පාවෙන් නියම ලොක තත්වය පහදාදී සත්‍ය සැපය කරා යොමුකරවන සේක.

**අවිද්‍යාව දුරුවීමට පරමාර්ථය උගත යුතුය.**

තථාගත බුදුවරයන් වහන්සේලා ලෝකයාට සම්මුති-පරමාර්ථ යන දෙයාකාරයෙන් ධර්මදෙශනා කරන සේක. සත්ව, පුද්ගල, දිව්‍ය, බ්‍රහ්ම

ආදී ලෝක ව්‍යවහාරය සම්මුති නම්ද; ඛන්ධ, ධාතු, ආයතන සතිපට්ඨාන ආදී ව්‍යවහාරය පරමත්ථ නම්ද වෙයි. සත්ව පුද්ගලාදි සම්මුති කථාව ශ්‍රවණය කොට යමෙක් අර්ථාවබෝධය කරයිද; අවිද්‍යාව දුරුකර ගණීද; ඔහුට සම්මුති කථාවෙන් සත්ව පුද්ගලාදි ව්‍යවහාරයෙන් ධර්මදේශනා කරයි. ඛන්ධ, ධාතු; ආයතනාදී පරමාර්ථ කථාව ශ්‍රවණය කොට අවිද්‍යාව දුරුවේද ඔහුට පරමාර්ථ ව්‍යවහාරයෙන් ධර්මදේශනා කරති.

පරමාර්ථය ඇත්තේ සම්මුතිය තුළය. සම්මුතියක් නැතිනම් පරමාර්ථයක්ද නැත. එහෙයින් තියුණු නුවණ ඇති දියුණුවූ බුද්ධීන්ද්‍රියන් ඇති අයට මුලින් සම්මුති කථාව නොවදුරා පරමාර්ථයෙන් අවබෝධය ලබාදී පසුව සම්මුති ව්‍යවහාරයෙන් කථා කරයි. සම්මුතියෙන් අවබෝධය ලැබිය යුතු තියුණු බුද්ධිබලයක් නැති අයට මුලින් සම්මුති ව්‍යවහාරයෙන් අවබෝධයක් ලබාදී චිත්ත දමනයක් ඇති කරවා අවසානයේ පරමාර්ථය දේශනා කරයි. සම්මුතියෙන්වුවද පරමාර්ථයෙන්වුවද සත්‍යයක්ම දේශනා කරති.

– සම්මුතිය–ලෝක ව්‍යවහාරය කලින් කල වෙනස් වෙයි. පරමාර්ථයාගේ එබඳු පෙරලීමක් නැත. පඨවි–ආපෝ–තේජෝ–වායු වර්ණ–ගන්ධ–රස–ඕජා යන ශුද්ධාෂ්ටකයෙන් යුත් ධාතු පුඤ්ජයකට–ධාතු රැසකට–ධාතු සංයෝගයකට රත්රන් යයි ලෝක ව්‍යවහාරයක් ඇත. එයින් කළ ආභරණයකට 'මාලය' යයි කියති. එයින් මුදුවක් කළහොත් "රන් මුද්ද" යයි කියති. ඉන් වළල්ලක් කළ හොත් 'රන්වළල්ල' යයි කියති. එහෙත් එහි මූලික ධර්මයවූ ශුද්ධෝෂ්ටකය වෙනස් නොවේ. (වෙනස් නොවේ යන්නෙන් නිත්‍ය බවක් නොපැවසේ.) සත්‍යවශයෙන් බලතොත් රත්රන් කියා හෝ වළල්ල–මුදුව=මාලය කියා හෝ ගතයුතු වස්තුවක් නැත. රත්රන් යනුද මුදුව; වලල්ල, යනුද සම්මුතියකි. පරමාර්ථ වශයෙන් එහි ඇත්තේ පෘථිව්‍යාදි ධාතු කලාප රාශියකි.

එසේ නම් පෘථිව්‍යාදී ධාතු කලාපයෝ පරමාර්ථ වන්නාහුද? නැත. සත්‍ය වශයෙන් විද්‍යමාන වූවක් පිළිබඳ අර්ථය පරමාර්ථය යනු දතයුතුයි. මේසය–පුටුව–ඇඳ ආදිය සම්මුති ව්‍යවහාරයෝය. එහෙත් එහි පරමාර්ථ වශයෙන් ඇත්තේ පෘථිව්‍යාදී ධාතු සමූහයකි ලී කෑබලි සතරක් මත ලෑල්ලක් ගසා ගත් භාණ්ඩය මේසය යයි සම්මතයි, එහෙත් පරමාර්ථ වශයෙන් මේසය කියා

දෙයක් නැත. මේසය වෙන්කර ගත් විට ලැබෙනුයේ හැලි කීපයකි. නමුත් එහි සත්‍ය වශයෙන් ඇත්තේ සුද්ධාෂ්ටක සමූහයක්ය.

යථෝක්ත පඨවි ආදී සුද්ධාෂ්ටක රූපයන් සමග චිත්ත චෛතසිකාදීන් මිශ්‍රවූ කල සත්ව යන සම්මුති ව්‍යවහාරය ලබයි. පරමාර්ථ වශයෙන් සත්වයා ගේ ඇත්තේද ශුද්ධාෂ්ටක රූප හා නාම ධර්ම පමණක්ය. මේ සත්ව ප්‍රඥප්තියෙහි පරමාර්ථය දැන ගැණීම අවිද්‍යාව දුරුවීමටද විද්‍යාව දියුණු වීමටද හේතුයි.

★

'සත්ව' නම්වූ මෙම සම්මුතියෙහි ඇත්තේ පරමාර්ථ නාම රූප වශයෙන් නාම–රූප සන්තතියකි. (පරම්පරාවකි)

නාම යන්නෙන් සිත හා සිතිවිලිද රූප යන්නෙන් ශරීරයද ගැනේ. ක්ෂණයක් නිසා ඉපදී ඉපදී නැසී නැසී යන චිත්ත චෛතසික පරම්පරාවක්ද එයට අනුරූපව උපදනා රූප පරම්පරාවක්ද හැර ඉන් පිටත් සත්වයෙක් පුද්ගලයෙක් නැත. උත්පාද–ස්ථිති–භඞ්ග යන ප්‍රභේද තුනක් සහිත කුඩා චිත්තක්ෂණ තුනක් මහා චිත්තක්ෂණයකි. එබඳු මහා චිත්තක්ෂණ 17 ක් රූප ධර්මයක ආයු වෙයි. (කුඩා චිත්තක්ෂණ 51 ක් පිළිබඳ කාලයයි) චිත්තක්ෂණ 17 කින් පසු රූප කලාපයද නිරුද්ධ වෙයි. උපදින නාම ධර්ම–රූප ධර්ම–බිඳී බිඳී යනු විනා ස්ථිර වශයෙන් නොපවතී. බිඳී බිඳී ගිය නාම රූප ධර්ම නැවත කිසි කලෙක ඇති නොවේ. (පසුව ඇතිවන නාම ධර්ම–රූප ධර්ම ඇතැම්විට මුලින් ඇතිවූ නාම රූප ධර්මයන්ට සමාන වෙතත් මුලින් ඇතිවී බිඳී බිඳී ගිය නාම ධර්ම හා රූප ධර්ම කිසිකලෙක නූපදිත්,)

ලොව ඇතිතාක් සියල්ල නැසේ. කිසිවක් නිත්‍ය නොවේ. ඉපද–ඉපදී, නැසී–නැසී, යාමද නැසී–නැසී, ඉපද–ඉපදී යාමද ලෝකයේ ස්වභාව ධර්මතාවයයි. උපන්නෝ නැසෙති. නැවත නූපදියි. එහෙත් පසුව උපදින්නෝ මුලින් උපන් දෙයට අනුව උපදියි. අන්‍යොන්‍ය සම්බන්ධය ඇත්තාහු වෙයි.

දැල්වෙන පහනක් දෙස බලන්නහුට සාමාන්‍යයෙන් පෙනෙන්නේ පහන දැල්වූ වේලේ පටන් නිවෙන තෙක්ම දැල්වෙන්නේ එකම පහන් දැල්ලක් මෙනි. එහෙත් එබඳු තත්වයක් නැත. එකක්

ලෙව එකක් බැගින් හැදී-හැදී, දැවී-දැවී,-නිවී නිවී යන ගිනිරූප පහන්දලි සමූහයකි. පහන් දල්ල කියා ගතයුත්තක් නැත. නාමරූප ධර්ම සන්තතියද එමෙනි.

> එසේම ඉපදී-ඉපදී; නැසී-නැසී යන නාමරූප ධර්මසන්තතියේ පැවැත්ම පහළට ගලා බස්නා; එහෙත් එකාබද්ධවූ; දිය පහරක් මෙනි.

දල්වෙන පහනේ පහන් දලිවල හා ගලායන ජලයේද එකාබද්ධ භාවය නිසා එකම පහන් දල්ලක් මෙන්ද; එකම දිය පහරක් මෙන්ද පෙනේ. එබඳුවූ නාමරූප ධර්ම සන්තතියද සත්වයෙකු හෝ පුද්ගලයෙකු වශයෙන් ලෝකයා සලකයි. මේ සැලකීම අවිද්‍යාව නිසා සිදුවේ.

සිතක් ලඟම නව සිතක්ද රූප කලාපයක් ලඟට නව රූප කලාපයක් දැයි යන ක්‍රමයෙන් පහළවන නාම රූප ධර්ම සන්තතියේ යථා ස්වභාවය නොදත් මිථ්‍යාවාදීහු චිත්ත පරම්පරාව ආත්මයක් ලෙස සලකන්ට පටන් ගත්හ. තථාගතයන් වහන්සේ වදාළේ එබඳු ආත්මයක් නැති බවයි.

එසේ වුවද හුදු නාමයට හෝ රූපයට ක්‍රියා කළ නොහැකිය. ඉරියව් නොපැවැත්විය හැකිය. අඳ-කොර දෙදෙනා එකිනෙකාගේ ජීවනෝපාය සඳහා එක්විමක් මෙන් නාම රූප දෙකද එක්වී ඉරියව් පවත්වයි. එසේ විනා හුදු සත්වයෙක් පුද්ගලයෙක් නැත. ඒ බව:-

> යමකං නාම රූපඤ්ච - උභො අඤ්ඤොඤ්ඤ නිස්සිතා
> එකස්මිං භිජ්ජමානස්මිං - උභො භිජ්ජන්ති පච්චයා.

(නාමරූප දෙක ඔවුනොවුන්ගේ පැවැත්ම පිණිස ඔවුනොවුන් ඇසුරු කරයි එකක් !බිඳුනුකල අනිකද බිඳෙයි.) යනුවෙන් දක්වා ඇත්තේය.

> නාමඤ්ච රූපඤ්ච ඉධත්ථි සච්චතො
> නහෙත්ථ සත්තො මනුජොච විජ්ජති
> සුඤ්ඤං ඉදං යන්ත මිවාභි සංඛතං
> දුක්ඛස්ස පුඤ්ජො තිණකට්ඨ සාදිසො.

"යන්ත්‍ර රූපයක් මෙන් ක්‍රියාකරන දුක්ඛ පුඤ්ජයක් (දුක් ගොඩක්) වන මේ නාමරූප දෙක්හි සත්‍ය වශයෙන් සත්ත්වයෙක් හෝ පුද්ගලයෙක් නැත" යනු එහි භාවයි.

**මෙබඳු නාම ධර්ම සන්තතිය සත්ත්වයෙකු-පුද්ගලයෙකු වශයෙන් සලකන්නේ අවිද්‍යාව නිසයි.**

★

ආත්ම දෘෂ්ටිය ඇතිවන්නේද අවිද්‍යාව නිසයි.

පූර්වෝක්ත නාම රූප සන්තතිය පිළිබඳ උත්පාදය හා භඞ්ගය නොදත් අන්‍යතීර්ථකයෝ සත්ත්වයා තුළ ක්‍රියා කිරීමේ ශක්තිය ඇති ආත්මසඞ්ඛ්‍යාතවූ එක්තරා අද්භූත බල විශේෂයක් අදෘශ්‍යමානව ඇතැයි පැවසූහ. දුර දිග නොදක්නා අඥානයෝ එය පිළිගත්හ. ආත්මවාදය මූලික කොට ඇති දේව ආගම්ද නිපදවූහ. එහෙත් ශාස්ත්‍රානුකූලව බලනකල සත්වයා තුළ එබඳු සථිර-ආත්මසාරයක් නැති බව නැණැතියෝ පිළිගණිති. නවීන විද්‍යාඥයෝද සත්වයාට සිත්වැලක් ඇති බව දක්වති. ආත්මවාදි ආගම් කෙරෙහි විද්‍යාඥයින් අප්‍රසාදය දක්වන්නේද ඒ නිසයි. එහෙත් අනාත්මවාදි බුද්ධාගම විද්‍යානුකූලද වෙයි.

නාමරූපයෝ කුමක් නිසා අනාත්මද? දුක් සහිත නිසයි.

දුක් සහිත වන්නේ ඇයි? අනිත්‍ය නිසයි.

ඉපද-ඉපදී, නැසී-නැසී යන හෙයින් නාම-රූපයෝ අනිත්‍ය යහ. කැඩීම, බිඳීම, ලොකුවීම, කුඩාවීම, පිම්බීම, ඇකිලීම යන මේවා අනිත්‍ය ලක්ෂණ වෙයි. යමක් අනිත්‍යනම්=නිතර වෙනස් වෙයි නම් එය දුකකි සැපයක් නම් නිත්‍ය වියයුතුයි. එහෙයින් නාමරූපයෝ දුක්යහ. නාමරූපයන්ගේ විකෘතිය දුක් බව ප්‍රකට කරයි, මෙ නාම-රූප ධර්මයන්ගේ විකෘතිය දුක් බව ප්‍රකාශ කරයි. මේ නාම-රූප ධර්මයන් ඇතුළත්හි හෝ පිටත ඔවුන් පාලනය කරන හෝ කරවන, අධිපති බව දරන, ක්‍රියාකාරීබලයක් ඇති 'ආත්ම' නම්වූ කිසිවක් නැති බව තථාගතයන් වහන්සේ ලොවට පහදා දුන්සේක

**සැඟවී තිබුණු මේ සත්‍යය ලොවට ඉගැන්වීම තථාගතයන් වහන්සේගේ පරමාර්ථාශය වූ බව සැලකිය යුතුයි.**

**ආත්මවාදී සච්චක** විසල්පුර විසූ සච්චක තෙමේ වූකලී ත්‍රී වේදයෙහි ප්‍රවීණවූ භාෂාන්තර, ශාස්ත්‍රාන්තරයෙහි විශාරදවූ බුද්ධිමතෙකි. ශ්‍රේෂ්ඨ තාර්කිකයෙක් මෙන්ම වාදියෙක්ද වූ හෙතෙමේ එකල දඹදිව විසූ කීර්තිමත් පණ්ඩිතයෙක් විය. තමා සමාන උගතෙක් හෝ තාර්කිකයෙක් මුළු මහත් දඹදිව නැතැයි මහත් ගර්වයෙන් පැවසූ සච්චකහට තථාගතයන් වහන්සේ පිළිබඳ ආරංචිය ලැබුනි. බුදුරජාණන් වහන්සේ සමග වාද කරණු පිණිස ඔහුට සිතිවිල්ලක් උපනි. එහෙත් තථාගතයන් වහන්සේගේ මූලික ඉගැන්වීම් පිළිබඳ දැනීමක් නැතිව වාද කිරීම නුනුවණ බව පලකරන්නක් හෙයින් තථාගත ධර්මය පිළිබඳව විමසිලිමත්ව සිටියේය. ඒ අතර දිනක් මහමග පිඬු පිණිස හැසිරෙන අස්සජි රහතන් වහන්සේ දැක බුද්ධ ධර්මයේ මූලික ඉගැන්වීම කුමක්දැයි උන්වහන්සේගෙන් පිළිවිස දැන පසුව තථාගතයන් වහන්සේට වාදාරොපණය කරණ අටියෙන් මහතෙරුන් වෙත එළඹ දන් වළඳ අවසන්වූ තෙරුන් හා පිළිසඳර කථා බස් කොට තථාගතයන් වහන්සේගේ මූලික ඉගැන්වීම කෙසේදැයි පිළිවිසී.

**සච්චක:** භවත් අස්සජී! ඔබගේ ඇදුරු මහණ භවත් ගොයුම්හු කෙසේ සව්වන් හික්මවද්ද? ඔහුගේ අනුශාසනාව බහුලව පවත්නේ කෙබඳු ධර්ම පිළිබඳවද? ඔහුගේ මූලික ඉගැන්වීම කුමක්ද?

**අස්සජි මහතෙර:** සච්චක! අපගේ ශාස්තෘවරයන් වහන්සේ රූප=වේදනා-සඤ්ඤා-සංඛාරා-විඤ්ඤාණ යන පඤ්ච ස්කන්ධය අනිත්‍යයයිද-අනාත්ම යයිද වදාරණසේක. (මාර්ගඵල එක චිත්තක්ෂණික හෙයින්ද මාර්ග-ඵල දුකෙහිද ඇතුළත් කළහැකි නිසා අප්‍රධානවූ දුඃඛ ලක්ෂණය ප්‍රකාශ නොකරණලදී.) තථාගතයන් වහන්සේගේ මූලික ඉගැන්වීමද මේ අනිත්‍ය-අනාත්මයන් පිළිබඳවය, උන්වහන්සේගේ අනුශාසනාව බහුලව පවත්නේද අනිත්‍ය-අනාත්ම පිළිබඳවය.

**සච්චක:** භවත් අස්සජි! නොඇසියයුත්තක් ඇසූම්හ. ඉදින් අපි යම් දිනෙක ගෞතමයන් හමුවී ඔහු සමග කථා සල්ලාපයක් ඇති කොට ඔහු මේ ලාමක දෘෂ්ටියෙන් මුදවා ලන්නෙමු නම් ඉතා මැනව.

අස්සජි තෙරුන් හා මෙබඳු සංවාදයක යෙදුණු සච්චක තෙමේ ඉක්බිති ලිච්ඡවි රජවරුන් රැස්ව හුන් සන්ථාගාර ශාලාව වෙත ගොස් මෙසේ උදන් ඇනීය. භවත් ලිච්ඡවීහු එත්වා! අද ශ්‍රමණ භවත් ගෞතමයන් සමග මගේ වාදයෙක් වෙයි. අනාත්ම වාදී ගෞතමයෝ ලොව මුළාවෙහි හෙළති. ඔහුගේ අතවැසි යෙකුගෙන් ඔහු අනාත්මවාදී බව දැනිමි. ඔහුගේ වාදයෙහි ඔහු සපිරව පිහිටියේ නම් මම ඔහු සමග වාදකොට ඔහුගේ ඉනැත් විමේ තුච්ඡකම පෙන්වා බලවත් පුරුෂයෙකු දික්ලොම් ඇති එළුවෙකු ලොම් අල්වා ගෙණ ඔබ මොබ අදින්නාක් මෙන් ඔහු වාද-යෙන් ඔබ මොබ අදිමි. භවත් ලිච්ඡවීහු මා සමග එත්වා!

සච්චකගේ කථාව ඇසූ ලිච්ඡවීහු ඔහු සමග තථාගතයන් වහන්සේ කරා පැමිණියාහුය. තථාගතයන් වහන්සේද ඔහු තමන් වහන්සේ කරා එන බව අලුයම්හිම දැන වදාළසේක් පස් වරුයෙහි විශාලාපුර මහාවනයෙහි රුකක් මුල වැඩ සිටිසේක.

සච්චක තථාගතයන් වහන්සේ සමග වාදයට යෙතැයි ආරංචිය ලැබූ මහජනයාද ලිච්ඡවි රජ පිරිස සමග පැමිණි හෙයින් මහාවනය ජනයාගෙන් පිරුනි.

මහපිරිස් හා ගර්වයෙන් පැමිණි සච්චක තෙමේ බුදුරජාණන් වහන්සේ කරා එළඹ එකත්පසෙක සිට සතුටු සාමීචි කථාකොට මෙසේ පැවසී.

හවත් ගෞතමයෙනි; අවකාශ ඇත්නම් ඔබගෙන් යමක් විචාරමි.

අග්ගිවෙස්සන; තට කැමති දෙයක් විචාරව. සියල්ලටම පිළිතුරු දෙමි''යි තථාගතයන් වහන්සේද සර්වඥ පවාරණයෙන්ම වදාළසේක.

සච්චක: හවත් ගෞතමයෙනි; ඔබ කෙසේ සව්වන් හික්මවද්ද? ඔබගේ අනුශාසනාව බහුල කොට ඇත්තේ කුමන දෑයක් පිළිබඳවද? ඔබ උගන්වන මූලික ධර්මයෝ කවරහුද?

තථාගතයන් වහන්සේද: රූපං භික්ඛවෙ අනිච්චං, වෙදනා අනිච්චා සඤ්ඤා අනිච්චා; සඞ්ඛාරා අනිච්චා විඤ්ඤාණං අනිච්චං රූපං භික්ඛවෙ අනත්තා; වේදනා අනත්තා; සඤ්ඤා අනත්තා; සඞ්ඛාරා අනත්තා; විඤ්ඤාණං අනත්තං;

මහණෙනි; රූප-වෙදනා-සඤ්ඤා-සඞ්ඛාර-විඤ්ඤාණ යන මොව්හු අනිත්‍යයහ. අනාත්මයහ. සච්චකය මම මෙසේ සව්

එන් භික්ෂුවනි මගේ අනුශාසනාව මෙසේ ශ්‍රාවකයන් කෙරෙහි බහුල වශයෙන් පවතී. මගේ මූලික ඉගැන්වීම මෙයයි යනු වෙන් වදාළ සේක.

සච්චක: භවත් ගෞතමයෙනි; මට උපමාවක් වැටහෙයි.

බුදුහු: කියව, අග්ගිවෙස්සනය;

සච්චක: භවත් ගෞතමයෙනි; බීජුවට වපුරණ ගොවියෝ මහපොළොවෙහි එය වපුරන්නාහු නොවෙද්ද? ඒ බීජුවට වැඩෙන්නේ නොවේද? එයට පොළොව ආධාර නොවේද? අනාථපිණ්ඩද වෙළඳුම් ආදී කර්මාන්ත කෙනෙක් වේනම් ඒ සියලු කර්මාන්ත මහපොළොවෙහි පිහිටා සිට කරන්නාහු නොවෙද්ද? එසේම රූපය ආත්ම යයි සලකාගත් පුද්ගලයා රූප සඞ්ඛ්‍යාත පෘථිවියෙහි සිට බීජ සඞ්ඛ්‍යාතවූ පින් හෝ පව් වපුරයි (සිදුකරයි,) වේදනා=සඤ්ඤා–සඞ්ඛාර–විඤ්ඤාණ යන ස්කන්ධයන් ආත්මය කොට ගත් තැනැත්තේ වේදනා–සඤ්ඤා–සඞ්ඛාර විඤ්ඤාණ යන ආත්ම සඞ්ඛ්‍යාත පොළොවෙහි පිහිටා පින් පව් සිදුකරයි. මෙසේ පඤ්චස්කන්ධ සඞ්ඛ්‍යාත පොළොවෙහි පිහිටා සත්වයෝ පින් පව් සිදුකරන්නෝ නොවෙද්ද? මෙයින් ආත්මයක් ඇති බව නොදනේද? ඇත්නාවුම ආත්මය නැතැයි කුමක් හෙයින් ඔබ පවසද්ද?

බුදුහු: හොඳයි සච්චක; රූපාදි පඤ්චස්කන්ධය ආත්මයයි තෙපි කියන්නහුද?

සච්චක: එසේය, භවත් ගෞතමයාණෙනි; මා පමණක් නොව මෙහි පැමිණ සිටින මහජනයාද පඤ්චස්කන්ධය ආත්ම සහිත යයි කියයි,

බුදුහු: සච්චක; මහජන තෙමේ සිටිවා, ඔව්හු මා සමග වාදයට නොපැමිණියාහු වෙති. වාදයට ආයේ තෙපි ම්ය එහෙයින්ම තොපම මෙයට පිළිතුරු දිය යුතුය.

සච්චක: ගෞතමයාණෙනි; රූප–වේදනා– සඤ්ඤා – සඞ්ඛාර– විඤ්ඤාණ යන පඤ්චස්කන්ධය මගේය. මේ | රූපාදිය මගේ ආත්ම යයි මම කියමි.

බුදුහු: අග්ගිවෙස්සන; මේ කාරණයෙහිලා මම තොප විචාරමි. මනාසේ පිළිතුරු දෙව; අග්ගිවෙස්සන; යම්කිසි රටක අධිපති රජෙකුට තමාගේ රටෙහි මැරිය යුත්තන් මැරවීමට හෝ ධනහානියට පැමිණවිය යුත්තන්ගේ වස්තුව පැහැරගෙණ දිළිඳු කරන්නට හෝ රටින් නෙරපීමට හෝ බලයක් ඇද්ද?

සච්චක: එසේය ගෞතමයන් වහන්ස; රජෙකුට එබඳු බලයක් ඇත. පුර වැසියන් රජුට යටත් හෙයිනි.

බුදුහු: අග්ගිවෙස්සන; 'රූපය මගෙ ආත්මය" යි තෝ කියෙහි එහෙත් මගේ රූපය මෙසේ ලක්ෂණ වේවා! අවලක්ෂණ නොවේවා! නිරෝගී වේව! රෝගී නොවේවා! යනාදී වශයෙන් තොපගේ අධිපති කමක් රූපයෙහි පවතීද එබඳු නියමයකින් තොපට අභිමත පරදි රූපය පිහිටාද?

මෙයට සච්චක පිළිතුරු නොදුන්නේය. තමා බුදුරජාණන් වහන්සේගේ ප්‍රශ්නයෙන් පැරදුනු බව දැන පිළිතුරු නොදී බිම බලා හුන්නේය.

තෙවෙනිව බුදුරජාණන් වහන්සේ ඔහු කෙරෙහි අනුකම්පා වෙන් "බමුණ! දැන් කියව, මේ තට නිශ්ශබ්ද වන්ට කල් නොවෙයි. තථාගතයන් විසින් කරුණු සහිතව ප්‍රකාශ කළ දෙයට තෙවෙනිවර දක්වා පිළිතුරු නුදුන්නහුගේ හිස සත් කඩක්ව පැලෙන්නේ යයි වදාළසේක.

බිය පත්වූ සච්චක තෙමේ "භවත් ගෞතමයන් වහන්ස! නැවතත් ප්‍රශ්න කරණු මැනවි. මනාසේ පිළිතුරු දෙමි"යි කීය.

බුදුහු: සච්චකය! තෝ "රූපය මගේ ආත්ම යයි කීයෙහි එහෙත් මෙසේ වේවා! මෙසේ නොවේවායි අධිපති බවක් ඒ රූපයෙහි පවතීදැයි බුදුහුවිචාළසේක.

සච්චක: නැත; ගෞතමයන් වහන්ස, රූපයෙහි මගේ අධිපති කමක් නොපවත්නේය,

බුදුහු: අග්ගිවෙස්සන; සිහි ඇතිව පිළිතුරු දෙව, තා පළමු කී කථාවට පසුව කරන කථාව නොගැළපෙයි. කිම

එසේ නම් වේදනා-සඤ්ඤා-සඞ්ඛාර විඤ්ඤාණ යන ස්කන්ධයන් කෙරෙහි තගේ අධිපති කමක් පවතීද? තා නියම කරන අයුරින් වේදනාදීහු ක්‍රියාකරද්ද?

**සච්චක:** නැත, ගෞතමයන් වහන්ස; පඤ්චස්කන්ධයෙහිම මගේ අධිපති බවක් නොවෙයි.

**බුදුහු:** එසේනම්, අග්ගිවෙස්සන; කිම රූපය නිත්‍යද? අනිත්‍යද?

**සච්චක:** භවත් ගෞතමයාණෙනි; රූපය අනිත්‍යයි.

**බුදුහු:** යමක් අනිත්‍ය නම් වෙනස්වන සවභාව ඇත්තේ නම් මෙය මගේය·යි දෘෂ්ටි වශයෙන් හෝ තෘෂ්ණා වශයෙන් හෝ දකිමට සුදුසුද?

**සච්චක:** භවත් ගෞතමයාණෙනි; මේ මමය· මේ මගේය ආදී වශයෙන් දැක්වීමට නුසුදුසුයි.

මෙසේ ආත්මවාදී සච්චක බමුණු පරදවා 'ආත්මයක්' කැලම නියතයෙන්ම නොමැති බව වදාරා ඔහුට ධර්මදේශනා කළසේක.

**පඤ්චස්කන්ධයෙහි ආත්මයක් ඇතැයි සලකන්නේ අවිද්‍යාව නිසයි.**

★

**පඤ්චස්කන්ධය**

"සත්ව" සඞ්ඛ්‍යාතවූ මේ සම්මුතියෙහි 'පරමාර්ථ' වශයෙන් ඇත්තේ පඤ්චස්කන්ධයකි. 'ස්කන්ධ' යනු 'රාශිය' යන අර්ථයෙහි වැටේ. 'උදකස්කන්ධය යනු(උදකරාශිය-වතුර සමූහය) යන ආදියෙහි මෙන් කාලත්‍රයෙහි ඇතිව-නැතිවෙමින් පවත්නා ධර්ම සමූහයකට ස්කන්ධයයි දක්වා ඇත. එබඳුවූ රූප-වෙදනා-සඤ්ඤා-සඞ්ඛාර-විඤ්ඤාණ යන ස්කන්ධ (රාශි-මිටි) පසක් එකතුවීමෙන් සත්ව සඞ්ඛ්‍යාතවූ මේ සංස්කාරපුඤ්ජය සැදී ඇදී ඇත.

යථාහි අඞ්ග සම්භාරා – හොති සද්දො රථො ඉති
එවං ඛන්ධෙසු සන්තෙසු – සත්තො ඉති පවුච්චති

අවයවයන් සමූහයක් එක්වීමෙන් රථ නම්වූ ශබ්ද ප්‍රඥප්තියක්වේද (නියතයෙන් ගතයුතු රථයක් නැත්තේද) එමෙන් ස්කන්ධයන් ඇති කල්හි 'සත්ව' යයි කියනු ලැබේ, (පරමාර්ථ වශයෙන් සත්වයෙක් නැත.)

මැටි–හුණු–ගඩොල් ඇදී ද්‍රව්‍ය සමූහයක් යොදා ක්‍රමානුකූලව තනනු ලැබූ ගොඩනැගිල්ලකට 'ප්‍රාසාදය' යි කියන්නාසේ රූප රාශිය–වේදනා රාශිය – සංඥා රාශිය – සංස්කාර රාශිය විඥාණ රාශිය යන රාශීන්ගේ එක්වීමෙන් 'සත්ව' යන සම්මූතිය වෙයි. පරමාර්ථ වශයෙන් සත්වයෙක් නැත.

**රූපස්කන්ධය** මේ ගොඩවල් පසෙන් රූපගොඩ-රූප පිඩිය ගෙණ බලමු. පඨවි-(තදගතිය) ආපො (බැඳගන්නාගතිය) තෙජො- කුණුවිය නොදී රැක ගන්නා සිතොෂ්ණ ගති) වායො (සෙලවෙන පුරවන ගතිය) යන ප්‍රධාන ගති සතරත් වණ්ණ (පාට) ගන්ධ (ගඳ සුවඳ) රස ඕජා (ඕජස) යන ගති සතරත් යන මෙකී අටදෙනාගෙන් යුක්ත වූ වෙන්කොට නොහැකි පිඩිය "රූපස්කන්ධය"වෙයි. සම්පූර්ණ ශරීරයම මෙබඳු පිඩි රාශියකින් යුක්තවේ. මෙය කිසිවකු විසින් වෙන් නොකළ හැකිය. එහෙයින් 'අවිනිර්භොග ශුද්ධාෂ්ටකය' යයිද මේ රූප පිඩියට නමක් වෙයි. භූත රූප–උපාදාය රූප නමින් හඳුන්වනු ලබන්නේද මේ රූපස්කන්ධයේ ප්‍රභෙදමය. (මේ පිළිබඳ විශෙෂ විස්තර මතු සඳහන් වෙයි.)

ශරීරයයි කියනු ලබන මේ රූප පිඩිය ප්‍රතිසන්ධිචිත්තයාගේ උත්පාදක්ෂණයෙහි පටන් කර්ම–චිත්ත–ඍතු–ආහාර යන ප්‍රත්‍යය සතරින්–උපකාරක ධර්ම සතරින් හැදෙමින්–පවතිමින්–බිඳෙමින් භවයේ අන්තිම චුති සිතෙන් මතු 17 වෙනි සිතේ සම්පූර්ණ අවස්ථාව තෙක් නිරතුරුව ලියල ලියලා දිගින් දිගට පරම්පරාවශයෙන් පවත්නා බව දත යුතුයි, මේ එකම රූප කලාපයක් (කොටසක්) වත් නිත්‍යනොවේ. මහා චිත්තක්ෂණ 17 කට වරක් උපදින රූප කලාපය–තවත් එබඳු චිත්තක්ෂණ 17 ක් ඉපදී නිරුද්ධවීමත් සමගම බිඳීමට යයි මෙසේ බලනකල මුළු රූප රාශියම–සම්පූර්ණ රූපස්කන්ධයම අනිත්‍යයි. අනිත්‍යවූ දෙය සැප නොවේ. අනිත්‍ය නම් දුක් නම් එහි මමය-මගේ යයි කිව යුතු තත්වයක්ද නැත. එහෙයින් අනාත්මයි.

**රූපය නිත්‍ය–සුඛ–ආත්ම වශයෙන් සලකන්නේ අවිද්‍යාව නිසයි.**

**වේදනා ස්කන්ධය**

"වේදනා" යනු ශරීරයට සම්බන්ධව පවත්නා සිතේ ඇතිවන එක්තරා චෛතසිකයකි. අදහසකි එනම් සිතුවිල්ලකි. පරමාර්ථ වශයෙන් බලනකල සැම සිතක් පාසාම යෙදෙන චෛතසිකයකි. සිත සමග එක්ව ඉපදී සිත හා එකම අරමුණක යෙදී සිත සමග නිරුද්ධවේ. සිතින් ගණු ලබන අරමුණෙහි නියම තත්වය දැන ගන්නේ වේදනා චෛතසිකය නිසයි, එයට අරමුණේ රස විඳීම යයි කියනු ලැබේ. සිත හා සමග යෙදෙන 'වේදනා' වද ක්ෂණයක් පාසා බිඳෙයි. ක්ෂණයක් පාසා හැදෙමින් පවතිමින් බිඳෙන සිතේ වේදනාවද ක්ෂණයක් පාසාම බිඳී බිඳී යයි. මේ නිසා වේදනාවද නිත්‍ය නොවේ. අනිත්‍ය හෙයින් සැපද නොවේ. ඇසට රූපයක් හමුවෙයි. රූපයේ ඡායාව ඇසෙහි චක්ෂුප්‍රසාදයෙහි වදී. මේ ගැටීමෙන් වේදනාව පහළවේ. ඉෂ්ට-අනිෂ්ට-මධ්‍යස්ථ වශයෙන් අරමුණෙහි රස විඳිනුයේ මේ වේදනාව විසිනි. එහෙයින් වේදනාව විනා අරමුණෙහි රස විඳින අන්‍ය ආත්මයක් නැත.

**වේදනාස්කන්ධය නිත්‍ය-සුඛ-ආත්ම වශයෙන් සලකන්නේ අවිද්‍යාව නිසයි.**

**සංඥා ස්කන්ධය**

ඇස්-කන්=නාසා ආදි වූ ඉන්ද්‍රියන්ට හමුවූ රූප-ශබ්ද-ගන්ධාදිය හැඳිනීමේ ශක්තිය සංඥා නම්වේ. එය සිතේ ඇතිවන හැඟීමකි. හෙවත් චෛතසිකයකි. අරමුණ හැඳින්වීම ලක්ෂණ කොට ඇති මෙයද යට කී වෙදිනාව මෙන්ම සැම සිතකම ඇතිවේ සිත සමග ඉපදී සිත සමගම සිත අරමුණු කරණ දෙයම අරමුණු කොට සිත සමගම නිරුද්ධවන මේ චෛතසිකයද සිතේ ආයුකාලයම දරන්නේ වේ. යම් පමණ සිත් ඇත්නම් එපමණම සංඥාද වේ. එහෙයින් ඒ සංඥා සියල්ලම එක්කොට සංඥා ස්කන්ධයයි කියනු ලැබේ. ක්ෂණයක් පාසා බිඳීබිඳී යන සංඥා චෛතසිකයද අනිත්‍යයි අනිත්‍ය හෙයින්ම දුකයි. එහෙයින්ම අනාත්මයි.

**සංඥාව ආත්මය කොට සලකන්නේ අවිද්‍යාව නිසයි.**

**සංස්කාරස්කන්ධය**

සිතේ ඇතිවන සියලුම අදහස් හෙවත් චෛතසික දෙපණසකි! ඉන් පිටත් කිසිත් චෛතසික නැත. එයින් වේදනා-සඤ්ඤා යන චෛතසික දෙකහැර සෙසු චෛතසික 50 "සංස්කාරස්කන්ධ" යයි ප්‍රකාශිතයි. (මතු විස්තරයක් යයි) සංස්කාරයෝද සිත සමග සුදුසු පරිදි යෙදෙමින් සිත සමගම නිරුද්ධ වෙයි. සිතේ ආයුකාලයම සංස්කාරයන්ගේද ආයුකාලය වෙයි.

“සඞ්ඛාරා බණ භඞ්ගුරා” යනුවෙන් වදාරා ඇත්තේද සංස්කාරයෙන් මහා චිත්ත ක්ෂණයක් පාසා බිඳෙන බවයි.

මේ පාඨයෙහි සඞ්ඛාර නමින් හඳුන්වනු ලබන්නේ හෙතු වකින් හටගන්නා සියලුම නාම රූප ධර්මයෝ ය.

එහෙයින් සංස්කාරයෝද අනිත්‍ය දුක්ඛ අනාත්මයෝ ය. ඔවුන් නිත්‍ය-සුඛ-ආත්ම වශයෙන් සලකන්නේ අවිද්‍යාව නිසයි.

**විඥානස්කන්ධය**

‘විඥාන’ යනු සිතයි. ප්‍රභෙද වශයෙන් විඥානය 89 ආකාරයි. චක්ෂුරාදි ඉන්ද්‍රියනට හමුවන රූපාදි අරමුණු විජානනය (දැනගැණීම) කරන හෙයින් සිත විඥාන නම්වේ “ආරම්මණං විජානාතීති විඤ්ඤාණං” යනු නිර්වචනයි. අරමුණු දැනීමේ අර්ථයෙන් එකක්ම වියයුතු සිත එකුන් අනූ (89) ආකාරයකට ප්‍රභේදවූයේ චෛතසික සංයෝගය නිසාය. සිතද ක්ෂණයකින් ඉපිද-ක්ෂණයක් පැවති-ක්ෂණයකින් බිඳෙයි. කුඩා චිත්තක්ෂණ තුනකින් හෙවත් මහා චිත්තක්ෂණ කින් පසු විඥානයද නැසෙයි. එහෙත් එකක් ලඟට එකක් ඊලඟට අනිකක් ආදී වශයෙන් ඉපදිමින්-පවතිමින්-නැසෙමින් යන චිත්ත පරම්පරාවක්- සිත්වැලක් විනා නිරතුරුව පවත්නා එක සිතක් නැත එහෙයින් විඥානයද (සිතද) අනිත්‍ය-දුඃඛ-අනාත්ම ලක්ෂණ වලින් යුක්තය.චිත්ත- චෛතසික යන්ගේ බිඳි බිඳී පවත්නා පරම්පරා සම්බන්ධය අවබොධ නොකළ මිථ්‍යාදෘෂ්ටිහු “නිත්‍යවූ ආත්මයක්” ඇති බවද ඒ ආත් මය සැප දුක් දෙක විඳින බවද මරණින් මතුත් ආත්මය යන බවද සුද්ධාත්මය සදාකාලික බවද ආදී ඉගැන්වීම් ඇතිකළහ.

මෙතී දැක්වූ පඤ්චස්කන්ධය නාම රූප දෙකට වෙන් කළොත් මෙසේ දැක්ක හැකිය.




අවිද්‍යාවෙන් යුක්ත වූවෝ විඥානය ආත්මයයි සලකති.

**ධාතු** "සත්ත්වයා" යනු ධාතූන්ගේ සංයෝගයකි. සත්ත්ව සඞ්ඛ්‍යාත මේ සම්මුතියෙහි ඇත්තේ ධාතු සමූහයකි. අභිධර්ම ක්‍රමයට චක්ඛුධාතු රූපධාතු චක්ඛු විඤ්ඤාණ ධාතු ආදි වශයෙන් "සත්ත්ව ප්‍රඥප්ති" යෙහි "ධාතු පරමාර්ථ" අටළොසක්ද (18) සූත්‍රාන්ත ක්‍රමයට "පඨවි" ආදි ධාතු සයක්ද ඇති බව වදාරණලදී. සත්ත්වයෙකු නොවන පුද්ගලයෙකු නොවන "නයි" සමූහයකට ධාතුයයි කියනු ලැබේ. (ශාරීරික ධාතු පාරිභෝගික ධාතු ආදි තැන්හි "ධාතු" ශබ්දය ද්‍රව්‍ය වාචකයි. ආභා ධාතු-සුභා ධාතු-පෙ- සඞ්ඛතා ධාතු-අසඞ්ඛතා ධාතු-අනේක ධාතු-නානා ධාතු-ආදි වශයෙන් ධාතු ශබ්දය නොයෙක් තන්හි යෙදෙන බව පෙනේ.)

මෙහි ධාතු යනුවෙන් ජීවයක් ආත්මයක් නොවූ ස්වභාව ගති සමූහයක් අදහස් කරණු ලැබේ.

"ඡධාතුරොයං භික්ඛු පුරිසො" ආදි ධාතු විභඞ්ගදෙශනා නයින් බලනකල සත්ත්වයා යනු සයවැදෑරුම් ධාතු සමූහයකි. ඒ ධාතු සය නම්- පඨවි ධාතු-ආපො ධාතු-තෙජො ධාතු-වායොධාතු ආකාශ ධාතු-විඤ්ඤාණ ධාතු යන මොහුයි, මෙයින් පඨවි-ආපො තෙජො-වායො යන ධාතු සතර රූපධාතු ලෙසද විඤ්ඤාණ ධාතුව නාම ධාතුව ලෙසද සැලකිය යුතුයි. පඨවි ආදි ධාතූන් ඔවුනොවුන්ගෙන් වෙන්කරන්නේ ආකාස ධාතුව විසිනි. නාම ධාතු- රූප ධාතු දෙකේ සංයෝගයෙන් "සත්ත්ව" සඞ්ඛ්‍යාතවූ සම්මුතියක් ඇති වනු විනා පරමාර්ථ වශයෙන් සත්ත්වයෙක්-ආත්මයක්-ජීවයක් නැත

**පඨවි ධාතු** ථද්ධ ලක්ඛණ පඨවි ධාතු යනුවෙන් තද ගතිය පඨවි ධාතු නමැයි දක්වේ. සත්ත්ව ශරීරයෙහි එබඳු පඨවි ධාතු කොටස් 20 ක් ඇත. කෙසා-ලොමා-නඛා-දන්තා-තචො-මංසං-නහාරු-අට්ඨි-අට්ඨි මිඤ්ජා-වක්කං-හදයං-යකනං- කිලොමකං- පිහකං- පප්ඵාසං- අන්තං-අන්තගුණං-උදරියං-කරීසං-මත්ථලුඞ්ගං-යන විසිවැදෑරුම් කුණප කොට්ඨාසයෝ "පඨවි ධාතු" නම්වෙත්.

**ආපො ධාතු** පිත්තං-සෙම්හං - පුබ්බො - ලොහිතං - සෙදො-මෙදො-අස්සු-වසා-ඛෙළො-සිඞ්ඝාණිකා-ලසිකා මුත්තං-යන දොළොස් කුණප කොට්ඨාසයෝ "ආපො ධාතු" නම් වෙත්. ආබන්ධන ලක්ඛණ ආපො ධාතු යනුවෙන් බැඳෙන වැගිරෙන ස්වභාවය ඇති කොටස් 12 ක් සත්ත්ව ශරීරයෙහි ඇත්තේය.

**තේජෝ ධාතු (4)** — උෂ්ණලක්ඛණා තෙජො ධාතු යනුවෙන් දවන ගතිය දිරවන ගතිය තෙජෝ ධාතු නම්. එබඳු ගති සතරක් ශරීරය පිළිබඳව පවතී. සන්තාපන-ජීරාපන-පරිඩය්හන-පාචක යයි ශරීරගත තෙජෝ ධාතුව සිවු වැදෑරුම් වේ.

1. ශරීරයේ උෂ්ණය සන්තාපන තෙජෝ ධාතුවයි. ශරීරයේ උණ ගැණීම සිදුවන්නෙ මේ ධාතුව නිසයි.

2. ශරීරය වෘද්ධියට පමුණුවන දිරවීමට පත්කරන උෂ්ණය ජීරාපන තෙජෝ ධාතුවයි. ඇඟ රැලිවැටීම, කෙස් පැසීම මේ තෙජෝ ධාතුව නිසා සිදුවෙයි.

3. ශරීරය දවන උෂ්ණය පරිඩය්හන තෙජෝ ධාතුව නම් වේ. අත් පා දැවිලි ඇස් දැවිලි ආදිය ඇතිවන්නේ මේ උෂ්ණය නිසයි,

4. අනුභව කළ ආහාර පැසවන උෂ්ණය පාචක තෙජෝ ධාතුව නම්වේ. මෙයට "ජඨරාග්නිය" යනුද නමකි. මෙසේ සිවුවැදෑරුම් තෙජෝ ධාතුවකින් මේ ශරීරය යුක්තවෙයි.

**වායෝ ධාතු** — ශරීරය පිළිබඳව පවත්නා වායෝ ධාතුව සය වැදෑරුම් වෙයි. විත්ථම්භන ලක්ඛණා වායො ධාතු යනුවෙන් පුම්බවන - සොලවන - ගතිය වායෝ ධාතුවේ ලක්ෂණයි. එබඳු වාතගති සයක් මේ ශරීරය පිළිබඳව ඇත. උද්ධඞ්ගම වාතය - අධොගම වාතය - කුච්ඡිසය වාතය - කොට්ඨසය වාතය - අඞ්ගමඞ්ගානුසාරි වාතය - අස්සාස පස්සාස වාතය යනුවෙනි.

ශරීරයේ උඩ ප්‍රදෙශ බලා ගමන් කරන වමනය ඉක්කා කිඹිසීම් ආදිය සිදුකරන වාතය උද්ධඞ්ගම නම්වේ. ශරීරයේ යට ප්‍රදෙශය බලා ගමන් කරන මලමූත්‍ර පහකරන වාතය අධොගම නම්වේ. බඩවැලින් පිටත උදරය තුළ පවත්නා වාතය කුච්ඡිසය නම්. බඩවැල් ඇතුලේ හැසිරෙන වාතය කොට්ඨාසය නම්. ශරීරයේ සෑම තැන්හිම හැසිරෙමින් ශරීරාවයවයන් ක්‍රියාකරවන වාතය අඞ්ගමඞ්ගානුසාරි නම් වෙයි. ජීවිතෙන්ද්‍රියයේ පැවැත්මට විශෙෂයෙන් උපකාරවන ආශ්වාස ප්‍රශ්වාස වාතය සයවැන්න වෙයි.

ආකාශ ධාතු — දෙකන් සිදුරු-දෙනාසා සිදුරු-මුඛ සිදුර ආදී තැන්වල ඇති අවකාශය; මෙහි ආකාශ ධාතු යන්නෙන් ගැණේ. එසේම මස් ලේ වලින් වෙන්වූ තැන්වලද අනුභව කළ අහර රැස්වන තැන ඇති සිදුරු දිරූ අහර පිට කරන සිදුර ආදී තැන්වල පවත්නා අවකාශය මෙහි අභිමතයි. මෙසේම

> **උදර පටලතො යාව කරීසමග්ගා විදත්ථි චතුරඞ්ගුල මත්තං ඡිද්දං මංසලොහිතෙහි අසම්ඵුට්ඨං නිස්සටං ආකාසධාතූති වෙදිතබ්බං**
>
> (විභඞ්ගට්ඨකථා)

ආදීන් දක්වන ලද පරිදි උදරපටලයෙහි පටන් වර්චස් මාර්ගය දක්වා එක්වියත් සතර අඟල් පමණවූද; මස් අතර-නහර අතර-ඇට අතර-ලොම් අතර ආදීවූද අවකාශය මෙහි ආකාශ ධාතු නමින් දක්වනු ලැබේ.

මේ ආකාශ ධාතුව රූපාදි ධාතු කලාපයන් මෙන් ප්‍රකටව නැත. එහෙත් ලොව ඇතිනාක් සියලු අවිඤ්ඤාණක - සවිඤ්ඤාණක වස්තු පිහිටා තිබෙන්නේ අවකාශ ධාතුව තුළය. තවද මේ ශරීරය තුළ පෘථිව්‍යාදී ධාතු අතරින් වායො ධාතුව පවත්නා බවද එහෙයින් ශරීරය වේසුම්බක අපුරු සිදුරු සහිත බවද පණ්ඩිතයෝ කියත්.

පඨවි ආදී ධාතූහු වනාහි ඉතා සියුම් ද්‍රව්‍යයෝය. වැඩි වශයෙන් තද ගතිය ඇති දෙය පඨවි ධාතු නමින්ද උණුසුම හා සමන ගතිය අධික ඇතිදෙය තෙජො-වායො ධාතු නමින්ද ව්‍යවහාර කරන නමුත් එක ධාතුවක් තුළ අනිත් ධාතු තුනම ඇති බව දක්වයි. පඨවි ධාතුව බහුල කොට ඇති කෙස්ගසක ආපො තෙජො-වායො යන ධාතු තුනම පවතින බව දතයුතුය. සමත් පිරිසෙයින් ඉතා සියුම් පරමාණුවෙහි පවා මේ ධාතු සතරම ඇති බව සැලකිය යුතුයි.

අනුපාදින්න සඞ්ඛ්‍යාතවූ බාහිර රන්-රිදී-මුතු-මැණික්-ගල් පර්වත ආදියෙහි වැඩිපුර පඨවි ධාතුව ඇත. තුම්බසළුවූ අකාශසළුවූ ඇළ දොළ ගඞ්ගා ආදීන්හි ආපො ධාතුවද; කාෂ්ඨයෙන් නැඟුණු ගිනි, කපල ගොඩේ ඇතිවන ගින්න, කල්ප විනාශක ගින්න, නිරාගින්න ආදී තන්හි තෙජො ධාතුවද, ශරීරයෙන් පිටත් සැම තන්හි පවත්නා වායො ධාතුවද, අනුපාදින්න වශයෙන් සලකනු ලැබේ.

අපිඤ්ඤාණකවූ සියලුම වස්තුවල පඨවි - ආපො - තෙජො - වායො යන මේ ධාතු සතර සමග එකට බැඳී පවත්නා වර්ණ - ගන්ධ - රස - ඕජා යන ගති සතරක්ද ඇත්තේය. ශරීරයේද මේ ගති සතර ඇත. එහෙයින් මෙකී ගති අට එක්වූ තැන ශුද්ධාෂ්ටකාය යන නමින් හඳුන්වනු ලැබේ. මෙයින් පඨවි-ආපො-තෙජො වායො යන ධාතු සතර භූත නම්ද වර්ණ-ගන්ධ-රස-ඕජා යන ධාතු සතර උපාදාය නම්ද වෙයි. භූතෝපාදාය සඞ්ඛ්‍යාතවූ මේ රූපය දෙවියෙකු බඹෙකු විසින් මවනලද්දක් හෝ; ඉබේ ඇතිවූවක් හෝ; නොව හෙතු ප්‍රත්‍යයන්ගෙන් ඇතිවූ බව දතයුතුයි.

**රූපධාතූන් ආත්මය ලෙස සලකන්නේ අවිද්‍යාව නිසයි.**

විඤ්ඤාණ ධාතු

පඨවි- ආපො- තෙජො- වායො යන ප්‍රධාන ගති සතරට සම්බන්ධවූ "විඥාන ධාතු" නම් එක්තරා ස්වභාවයක් සත්ව ශරීරයෙහි ඇත්තේය. ඇසෙන්නේද දකින්නේද විඥාන ධාතුව නිසයි. තවද කෑම් බීම් යාම් ඊම් ආදි ඉරියව් පවත්නේද විඥාන ධාතුව නිසයි. "විජානන ලක්ඛණං විඤ්ඤාණං" යන නිරුක්තිය අනුව දැනීම ලක්ෂණ කොට ඇත්තේ විඤ්ඤාණයයි. ආරම්මණං විජානාතීති විඤ්ඤාණං යනුවෙන් රූපාදී අරමුණු දැනගන්නේ විඥානයයි දක්වයි. බාහිරවූ ගස්-ගල් පර්වත ආදියෙහි විඥාන ධාතුව නොමැතිහෙයින් එහි ක්‍රියා කාරිත්වයක් යාම් ඊම් ආදි ඉරියව්වක්නැත දැනීමක් නැත. එහෙයින් විඥාන ධාතුවේ ඇති බලය අසීමිතය. මෘත ශරීරයෙහි ක්‍රියාකාරී බලය නැත්තේ එහි විඥාන ධාතුව නිසාය. එහෙත් විඥාන ධාතුවට තමුදු තනිව-හුදකලාව-ක්‍රියා කරන්ට නොහැකිය. රූප ධාතුවක ආධාරයෙන්ම ඉරියව් පවත්වයි.

සත්වයා පුද්ගලයා ආදී වශයෙන් සත්ව සඥාව පවත්නේද මේ විඥාන ධාතුව නිසයි. පඨවි- ආපො - තෙජො වායො- යන ධාතු සතරට විඥාන ධාතුව එක්වීමෙන් සත්ව-පුද්ගල සඞ්ඛ්‍යාතවූ සම්මුතියක් ඇතිවනු විනා හුදු සත්වයෙකු හෝ පුද්ගලයෙකු හෝ ආත්මයක් හෝ නැති බව දතයුතුයි. මිථ්‍යාදෘෂ්ටියා ආත්මය යනුවෙන් උගන්වන්නේ විඥානයයි. එහෙත් විඥානයද ඉපදී ඉපිදී නැසී නැසී යන හෙයින් එහිද ගතයුතු ආත්ම සාරයක් ස්ථිර බවක් නොමැතියි. විඤ්ඤාණ යනුද-චිත්ත යනුද-මන යනුද පර්යාය-(සමාන) අර්ථ ඇති නාමයෝය.

විශේෂයෙන් දතයුත්තකි. "විජානාතීති ඛො ආවුසො තස්මා විඤ්ඤාණන්ති වුච්චති" යනුවෙන් "යම් ධර්මයක් තෙමේ අරමුණු විශේෂයෙන් දැනගණීද ඒ ධර්මය විඥානය"යි කියනලදී. එහෙත් ප්‍රත්‍යය සංයෝජනයෙන් ඉපිද ඉපිදී නැසී නැසී යන විඥාන පරම්පරාවක් විනා අරමුණු දැණීමෙහි සමත්වූ; රූප ධර්මයක් ආශ්‍රය කරගෙණ නොනැසෙමින් පවත්නාවූ;ධර්මස්වභාවයක් නැත ප්‍රත්‍යය සංඝට්ටනයෙන් සිදුවන දැනිමක් විනා දැනගන්නා කෙ- නෙක් හෝ දැනිමට අනුබල දෙන කෙනෙක් හෝ නැත.

අනාදිමත් කාලයක සිට මේ සත්වයාගේ රූපකායයට සම්බන්ධව පැවත එන මේ විඥාන පරම්පරාව භවයක් භවයක් පාසා ගඟක දිය දහරක් මෙන් ඉපිද ඉපිදී නැසී නැසීයයි. එක එක පුද්ගලයෙකු පිළිබඳව එක එක විඥාන පරම්පරාවක් වෙයි. එය වනාහි ජාති වශයෙන් කුශල් අකුශල් අව්‍යාකෘත (කුශලුත් නොවූ අකුශලුත් නොවූ) යයි තෙවදෑරුම් වෙයි. කාමාවචර – රූපා වචර–අරූපාවචර–ලොකොත්තර යයි භූමි වශයෙන් විඥා නය සිවුවැදෑරුම්වේ.

ජාති වශයෙන් තෙවදෑරුම්වූද භූමි වශයෙන් සිවුවැදෑරුම්වූද මේ විඥාන ධාතුවේ ප්‍රභේද නිසා එක එක සත්වයෙකු පිළිබඳ නානාප්‍රකාරයෙන් විඥාන පරම්පරා ඉපිද ඉපිද නැසී නැසී යයි. "චක්ඛු විඤ්ඤාණ – සොත විඤ්ඤාණ – ඝාණ විඤ්ඤාණ – ජිව්හා විඤ්ඤාණ – කාය විඤ්ඤාණ – මනො විඤ්ඤාණ" යයි ස්ථාන වශයෙන් විඤ්ඤාණ ධාතුව සවැදෑරුම් වේ. මේ සියල්ල එක්කොට ගත්කල චක්ඛු – සොත – ඝාණ – ජිව්හා- කාය යන ස්ථානයන්හි උපදනා විඤ්ඤාණ එක් එක් ස්ථානයක දෙක බැගින් දස යෙකි. මනො විඤ්ඤාණ හැත්තෑ නවයෙකි. එවිට සියලුම විඤ්ඤාණ අසූනවයක් වේ.

කිවයුත්තකි! විඥාන යන්නෙහි දැනීම යන තේරුම ඇත. "සිත" යනුද විඥානයට නමකි. ඒ අනුව සිත ඇතිවන්නේද චෛතසික සහිතවය. එක සිතක චෛතසික බොහොමයක් ඇතිවෙයි. චෛතසික නොමැති සිතක් හෝ සිත නොමැති චෛතසිකයක් හෝ නූපදී. චෛතසික යනු සිත්හි උපදනා අදහස්ය.

මේ චෛතසික ප්‍රභෙද වශයෙන් දෙපණසෙකි. අසූනව වැදෑරුම් සිත්වල සුදුසු පරිදි මෙකී දෙපණස් චෛතසික යෙදෙන බව සැලකිය යුතුය.

පඨවි – ආපො – තෙජො – වායො– යන ධාතු සංඛ්‍යාත භූත සතරින් යුක්තවූ ශරීරයෙහි එකී භූත සතර ආශ්‍රය කොට ඇති “උපාදාය” නම්වූ රූප විසිහතරක්ද ඇත. ඒ උපාදාය රූප අතරෙහි විඥාන ධාතුව ඉපදීමට හේතුවන රූපධාතු සයක්ඇත්තේය චක්ඛු ධාතු–සොත ධාතු–ඝාණ ධාතු – ජිව්හා ධාතු – කාය ධාතු – හදය ධාතු සයයි. මේ ධාතු සය ආශ්‍රය කොට චක්ඛු විඤ්ඤාණ – සොත විඤ්ඤාණ–ඝාණ විඤ්ඤාණ–ජිව්හා විඤ්ඤාණ–කාය විඤ්ඤාණ–මනො විඤ්ඤාණ යන විඤ්ඤාණ පරම්පරාවෝ සුදුසු පරිදි උපදිත්.

මතු දක්වනු ලබන ධර්ම විස්තරය නිරවුල් ලෙස වටහා ගැණීමටද අභිඥයින්ගේ පරමාර්ථයන් දැනගැණීමටද පහසුවන ලෙසින් මෙහි රූපයන්ගේද චිත්ත–චෛතසික යන්ගේද ප්‍රභේද දක්වනු ලැබේ.

**රූප ධාතු** “සත්ව” සංඛ්‍යාත ප්‍රඥප්තියෙහි ප්‍රභෙද වශයෙන් රූපකලාප 28ක් පවතී. කලාප යන්නෙහි තේරුම “සමූහය” “මිටිය” යනුයි. එබඳු මිටි එකින් රූපස්කන්ධය යුක්තවේ. ඒ මෙසේයි.

**භූතප්පසාද විසයා – භාවො හදයමිච්චපි**
**ජීවිතාහාර රූපෙහි = අට්ඨාරස විධං තථා**
**පරිච්ඡෙදොච විඤ්ඤත්ති – විකාරො ලක්ඛණං තිච**
**අනිප්ඵන්නා දස චෙති – අට්ඨවීස විධං භවෙ**
(අභිධම්මත්ථ සංගහ)

**භූතරූප 4**

භූතරූප 4= (පඨවි–ආපො–තෙජො–වායු)

**උපාදාය රූප 24**

ප්‍රසාද රූප 5 (චක්ඛු–සොත–ඝාණ–ජිව්හා–කාය)
විෂය රූප 4 (රූප–ශබ්ද–ගන්ධ–රස)
භාව රූප 2 (ස්ත්‍රී භාව–පුරුෂභාව)
හෘදය රූප 1 (හෘදය වස්තු)
ජීවිත රූප 1 (ජීවිතින්ද්‍රිය)
ආහාර රූප 1 (කබලීකාරාහාරය)

නිෂ්පන්න රූප 18 (ස්වභාව රූප)

පරිච්ඡෙද රූප 1 (ආකාශ ධාතුව)
විඤ්ඤත්ති රූප 2 (කායවිඤ්ඤත්ති–වචීවිඤ්ඤත්ති)
විකාර රූප 3 (රූපස්ස ලහුතා–මුදුතා–කම්මඤ්ඤතා)
ලක්ෂණ රූප 4 (උපචය–සන්තති ජරතා–අනිච්චතා)

අනිෂ්පන්න රූප 10

විඤ්ඤාණ ධාතු කුශල-අකුශල-අව්‍යාකෘත-යන ජාති වශයෙන් තෙවැදෑරුම්වද, කාමාවචර-රූපාවචර-අරූපාවචර ලොකුත්තර යයි භූමිවශයෙන් සිවුවැදෑරුම්වද සිත් ඇතිබව සටදක්වනු ලදි. මෙහි එය විස්තර වශයෙන් දක්වනු ලැබේ සම්පූර්ණයෙන් සියලුම සිත් 89 කි. නෛරයික-තිරශ්චානික-ප්‍රේත-අසුරකායික-මනුෂ්‍ය-දිව්‍ය බ්‍රහ්මයනසත්වයින් පිළිබඳවත්; පෘථග්ජන-ආර්‍ය යන දෙවැදෑරුම් පුද්ගලයින් පිළිබඳවත් මේ සිත් 89 සුදුසු පරිදි යෙදේ. යථෝක්ත සත්වසන්තාන යෙහි උපදනා මෙයින් පිටත් අන්‍යවූ සිතෙක් නම් නැත.

## කුසල් සිත් 21.

**කාමාවචර 8**

| | | | | |
|---|---|---|---|---|
| සොමනස්ස | සහගත | ඤාණ සම්පයුත්ත | අසඞ්ඛාරික | චිත්තං |
| ,, | ,, | ,, | සසඞ්ඛාරික | ,, |
| ,, | ,, | ඤාණ විප්පයුත්ත | අසඞ්ඛාරික | ,, |
| ,, | ,, | ,, | සසඞ්ඛාරික | ,, |
| උපෙක්ඛා | සහගත | ඤාණ සම්පයුත්ත | අසඞ්ඛාරික | ,, |
| ,, | ,, | ,, | සසඞ්ඛාරික | ,, |
| ,, | ,, | ඤාණ විප්පයුත්ත | අසඞ්ඛාරික | ,, |
| ,, | ,, | ,, | සසඞ්ඛාරික | ,, |

**රූපාවචර 5**

| | |
|---|---|
| විතක්ක-විචාර-පීති-සුඛෙකග්ගතා සහිතං පඨමජ්ඣානචිත්තං | |
| විචාර පීති සුඛෙකග්ගතා සහිතං දුතියජ්ඣාන | ,, |
| පීති සුඛෙකග්ගතා සහිතං තතියජ්ඣාන | ,, |
| සුඛෙකග්ගතා සහිතං චතුජ්ඣාන | ,, |
| උපෙක්ඛෙකග්ගතා සහිතං පඤ්චමජ්ඣාන | ,, |

**අරූපාවචර 4**

| | |
|---|---|
| ආකාසානඤ්චායතන | චිත්තං |
| විඤ්ඤාණඤ්චායතන | ,, |
| ආකිඤ්චඤ්ඤායතන | ,, |
| නෙවසඤ්ඤානාසඤ්ඤායතන | ,, |

**ලොකොත්තර 4**

| | |
|---|---|
| සොතාපත්ති මග්ග | චිත්තං |
| සකදාගාමි මග්ග | ,, |
| අනාගාමි මග්ග | ,, |
| අරහත්ත | ,, |

කාම තෘෂ්ණාව නම් සිතක හැසිරේද ඒ සිත කාමාවචරයි. නොහොත් එකොළොස් කාම භවයෙහි (දෙව්ලෝ+මිනිස්ලොව+සතර අපාය = 11) පවතිනා සිත කාමාවචර නම්වේ.

රූප තෘෂ්ණාව අරමුණු කිරීම් වශයෙන් හැසිරෙන; සොළොස් රූපභවයෙහි පවත්නා සිත රූපාවචර නම්වේ.

අරූප තෘෂ්ණාව අරමුණුකොට ඇති; අරූප භවයෙහි හැසිරෙන; සිත අරූපාවචර නම්වේ.

පඤ්චුපාදානස්කන්ධ ලෝකයෙන් එතරවන්නාවූද; එතරවූද සිත ලොකුත්තර නම්වේ.

---

## අකුසල් සිත් 12.

ලොභමූලික

සොමනස්සසහගතං දිට්ඨිගත සම්පයුත්තං අසඞ්ඛාරික චිත්තං
,, ,, ,, ,, සසඞ්ඛාරික ,,
,, ,, දිට්ඨිගත විප්පයුත්තං අසඞ්ඛාරික ,,
,, ,, ,, ,, සසඞ්ඛාරික ,,
උපෙක්ඛා ,, දිට්ඨිගත සම්පයුත්තං අසඞ්ඛාරික ,,
,, ,, ,, ,, සසඞ්ඛාරික ,,
,, ,, දිට්ඨිගත විප්පයුත්තං අසඞ්ඛාරික ,,
,, ,, ,, ,, සසඞ්ඛාරික ,,

දෙසමූලික 2

දොමනස්ස සහගතං පටිඝ සම්පයුත්තං අසඞ්ඛාරික චිත්තං
,, ,, ,, ,, සසඞ්ඛාරික ,,

මොහමූලික 2

උපෙක්ඛා සහගතං විචිකිච්ඡා සම්පයුත්ත චිත්තං
,, ,, උද්ධච්ච සම්පයුත්ත ,,

---

## අව්‍යාකෘත සිත් 56.

කුශලුත් නොවන, අකුසලුත් නොවන් සිත් අව්‍යාකෘතයෝ නම්වෙත්. එනම් විපාක හා ක්‍රියා චිත්තයෝයි. කුසලයක් හෝ අකුසලයක් සිද්ධකරන කල ඒ කුසල් සිත හෝ අකුසල් සිත සමග ඉපදෙන චෛතසික අනුව කුසලය හෝ අකුසලය සිද්ධකිරීම

සමගම විපාකදීමේ ශක්තියක් ඉතිරිවේ. ඒ ඇටයක් පැළකළ විට එයින් ගොයම් ගසක් පැළවේ. ඒ ඇටය දිරායාමෙන් අභාවයට පත්වන නමුත් අනාගතයේ ගොයම්ගසේ ඒ ඇට හටගැණීමේ ශක්තියක් ඉතිරිවෙයි. එමෙන්ම කුසලයක් හෝ අකුසලයක් සිදුකරන කල්හි එයින් විපාකදීමේ ශක්තියක් ඉතිරිවේ, එසේ විපාක ලබන අවස්ථාවේ ඇතිවන සිත්වලට විපාක සිත් යන නම ලැබේ. කුසල විපාක - අකුසල විපාක යනුවෙන් විපාක සිත් දෙආකාරයි. එයින් අකුසල විපාක අහේතුකයි. කුශල විපාක සහේතුකද වේ. ක්‍රියාසිත් යනු රහතුන් වහන්සේලාට ඇතිවන කුසල් සිත්ය. එහි විපාකදීමේ ශක්තියක් නැති හෙයින් ක්‍රියා නම්වේ. මෙකී කුසල විපාක - අකුසල විපාක - අහේතුක- ක්‍රියා යන ප්‍රභේද ගතවූ සියලුම සිත්වලට අව්‍යාකෘත යන නම ලැබේ. මේ අව්‍යාකෘත සිත් සියල්ල 56 ක් වේ. එය මෙහි දැක්වේ.

## කුසල විපාක සිත්

(අව්‍යාකෘත) කාමාවචර කුසල විපාක 16

(සහේතුක)

සෝමනස්ස සහගතං ඤාණ සම්පයුත්තං අසඞ්ඛාරක විපාකං<br>
,, ,, ,, ,, සසඞ්ඛාරික ,,<br>
,, ,, ඤාණ විප්පයුත්තං අසඞ්ඛාරික ,,<br>
,, ,, ,, ,, සසඞ්ඛාරික ,,<br>
උපෙක්ඛා සහගතං ඤාණ සම්පයුත්තං අසඞ්ඛාරික ,,<br>
,, ,, ,, ,, සසඞ්ඛාරික ,,<br>
,, ,, ඤාණ විප්පයුත්තං අසඞ්ඛාරික ,,<br>
,, ,, ,, ,, සසඞ්ඛාරික ,,

(අහේතුක)

උපෙක්ඛා සහගතං චක්ඛු විඤ්ඤාණං<br>
,, ,, සොත ,,<br>
ඝාණ ,,<br>
ජිව්හා ,,<br>
සුඛ සහගතං කාය ,,<br>
උපෙක්ඛා සහගතං සම්පටිච්ඡන ,,<br>
,, ,, සන්තීරණ ,,<br>
සෝමනස්ස සහගතං සන්තීරණ ,,

**(අව්‍යාකෘත) රූපාවචර විපාක 5**

විතක්ක විචාර සුඛෙකග්ගතා සහිතං පඨමජ්ඣාන චිත්තං
විචාර පීති සුඛෙකග්ගතා සහිතං දුතියජ්ඣාන ,,
පීති සුඛෙකග්ගතා සහිතං තතියජ්ඣාන ,,
සුඛෙකග්ගතා සහිතං චතුත්ථජ්ඣාන ,,
උපෙක්ඛෙකග්ගතා සහිතං පඤ්චමජ්ඣාන ,,

**(අව්‍යාකෘත) අරූපාවචර විපාක 4**

ආකාසානඤ්චායතන චිත්තං
විඤ්ඤාණඤ්චායතන ,,
ආකිඤ්චඤ්ඤායතන ,,
නෙවසඤ්ඤා නාසඤ්ඤායතන,,

**(අව්‍යාකෘත) ලොකුත්තර විපාක 4**

සොතාපත්ති ඵල චිත්තං
සකදාගාමි ඵල ,,
අනාගාමි ඵල ,,
අරහත්ත ඵල ,,

කාමාවචර කුසල් සිත් 8 ක්ද රූපාවචර කුසල් සිත් 5 ද අරූපාවචර කුසල් සිත් 4 ද රහතුන් වහන්සේලාට උපදිනාකල ක්‍රියා හෙවත් අව්‍යාකෘත යන නම ලබයි. එවිට 5+8+4 = 17 යි.

**අකුසල විපාක අහෙතුක 7 යි. (අව්‍යාකෘත)**

| | | | |
|---|---|---|---|
| උපෙක්ඛා | සහගතං | චක්ඛු | විඤ්ඤාණං |
| ,, | ,, | සොත | ,, |
| ,, | ,, | ඝාණ | ,, |
| ,, | ,, | ජිව්හා | ,, |
| දුක්ඛ | සහගතං | කාය | ,, |
| උපෙක්ඛා | සහගතං | සම්පටිච්ඡන | ,, |
| ,, | ,, | සන්තීරණ | ,, |

**අහෙතුක ක්‍රියා 3 (අව්‍යාකෘත)**

උපෙක්ඛා සහගතං පඤ්චද්වාරාවජ්ජන චිත්තං
,, ,, මනොද්වාරාවජ්ජන ,,
සොමනස්ස සහගතං හසිතුප්පාද (රහතුන්ට පමණයි)

**සිත ආත්මය ලෙස සලකන්නේ අවිද්‍යාව නිසයි.**

ඒකුප්පාද නිරෝධාච = ඒකාලම්බන වත්ථුකා
චේතොයුත්තා ද්විපඤ්ඤාස - ධම්මා චෙතසිකා මතා
(අභිධම්මත්ථ සංගහ)

**චෛතසික 52** යථොක්ත 89 ක් ප්‍රභේද ඇති සිත්වල යෙදෙමින් සිත අනුව පවත්නා චෛතසික හෙවත් සිතිවිලි සියල්ල දෙපණසක් (52) වේ. අරමුණු රස විඳීමේ ලක්‍ෂණයෙන් සිත එකක්ම වියුතු නමුදු; 89 ආකාර ප්‍රභේද නතවූයේ චෛතසික යන්ගේ විවිධත්වය නිසාය. සිතක් නැතිව චෛතසික නූපදී චෛතසික නැතිව සිත් නූපදී. එහෙයින් "සිත සමගම උපදින, සිත සමග එක අරමුණක පවතින; සිත සමඟ නිරුද්ධවන චෛතසික දෙපණසක් බව" ඉහත දැක්වූ ගාථාවෙහි අදහසවේ.

ඒකුප්පාද - සිත උපදිනවිට සිත සමගම ඉපදීම
ඒකනිරෝධ- සිත නිරුද්ධවනවිට ඒසමග නිරුද්ධවීම.
ඒකාලම්බන - සිත යම්අරමුණක් ගන්නේනම් එයම අරමුණු කිරීම
ඒකවත්ථුක සිත යම් චක්‍ෂුරාදි වස්තුවෙක පවතීනම් එහිමපැවතීම
චේතොයුත්ත -සිත සමගම යෙදීම (සිතක් නැතිව නූපදීම.)

යන මේ ලක්‍ෂණ චෛතසික සියල්ලට සාධාරණ ලක්‍ෂණය. "එසේ වුවද එක සිතක සියලුම චෛතසික නොයෙදෙන බව හා එක චෛතසිකයක සියලුම සිත් නොයෙදෙන බවද සැලැකිය යුතුය." සිතින් ගණු ලබන අරමුණුවලට සුදුසු පරිදි චෛතසික යන්ගේ සහයෝගය ලැබේ.

උපමා වශයෙන්; කසාරාගත් කෂායක ජලය සිත මෙන්ද බෙහෙත් රස චෛතසික මෙන්ද දක්වයි. බෙහෙත් වර්ග කීපයක් කසාරා ගත් ජලයෙන් බෙහෙත් රස වෙන් නොකළ හැකි බවද රස කීපයක් ජලයේ ඇති බවද ජලයත් හා බෙහෙතේ රස ඇදීගත බව හා ජලය නැත්නම් බෙහෙත් රසය නොමැති බවද සැලකිය යුතුයි. චිත්ත-චෛතසික සංයෝගයද එමෙනි.

චිත්ත-චෛතසිකයන්ගෙන් සිත ප්‍රධානය. චෛතසිකයෝ අප්‍රධානයහ. ඒ බව "මනො පුබ්බඞ්ගමා ධම්මා -මනොසෙට්ඨා මනොමයා" (කුශලං කුශල චෛතසික ධර්මයෝ සිත පෙරටු කොට ඇත්තාහුය. සිත ප්‍රධානකොට ඇතියහ. සිතින්ම උපදනාහ.) යනුවෙන් දේශනාකර ඇත.

අන්‍ය කිසිම ශාස්ත්‍රවරයකු හෝ විද්‍යාඥයකු නොදත් - නුදුටු ලෙසින් සිත පිළිබඳ නියම තත්වය දත් තථාගතයන් වහන්සේ චෛතසික ධර්ම පණස් දෙකක් ඇයි බව වදාළසේක. ඒවා සුදුසු පරිදි යටකී සිත් සමග යෙදෙන බවද සිත් හා චෛතසික අවුල් නොකර ගතයුතු බවද විශේෂයෙන් සැලකිය යුතුයි,

කිවයුත්තකි. මෙබඳු සුළු ධර්ම පුස්තකයකින් "චෛතසික තත්වය" විස්තර නොකළ හැකියි. මෙහි දක්වෙන්නේ නම් වශයෙන් හා සාමාන්‍ය ලක්ෂණ වශයෙන් පමණකි. "ධම්ම සඞ්ගණි" යෙහිද එහි අටුවාවෙහිද විස්තර ඇත.

## චෛතසික දෙපණස.

### 1 කොටස මෙහි චෛතසික 7 යි.

ඵස්සො (ඇඹුල් සහිත දෙයක් යමෙකු අනුභව කරණකල ඒ දුටු අනිකෙකුගේ මුඛයෙහි කෙළ ඉපදීමක් මෙන්ද; හදිසි විපතකට පැමිණියෙකු දකින දයාවන්ත වූවෙකුගේ සිරුර හිගැස්සීම මෙන්ද; හිරු රැසින් හික්හිය ස්පර්ශ කිරීමක් මෙන්ද අරමුණෙහි ගැටෙන ආකාරයෙන් උපදනා) ස්පර්ශය; වෙදනා (ප්‍රණීත භොජනයක් අනුභව කරණ රජකු සෙයින්) අරම්මණ රසය අනුභව කරන වෙදනාව සඤ්ඤා; වඩුවා දැලිහුලෙන් ලීයෙ ඉරන තැන හඳුන්වා දෙන්නාක්මෙන් අරමුණ හැඳිනීමේ ස්වභාවයවූ සංඥාව; චෙතනා (ප්‍රධාන ශිෂ්‍යයා තමන් ඉගෙණගන්නා අතරම සෙසු ශිෂ්‍යයන්ගේද ඉගෙණීමෙහි යොදවන්නාක් මෙන් පිරිසක් සමග කෙතට ගොයම් කපනු පිණිස ගිය කෙත් හිමියා අනුන්ද වැඩෙහි යොදවමින් තමාද උද්‍යොගිව ක්‍රියා කරන්නාක් මෙන්) සිත හා යෙදෙන සෙසු චෛතසික ධර්මයන් ස්වකීය අරමුණෙහි යොදවන චෙතනාව; ඒකාග්‍රතා (නානාප්‍රකාර අරමුණු කරා දුවන චිත්ත-චෛතසික ධර්මයන් එසේ විසිර යා නොදී ගත් ගත් අරමුණෙහිම තබන, සම්ප්‍රයුක්ත ධර්මයන්ගේ අවික්ෂිප්ත ලක්ෂණවූ) චිත්තෛකාග්‍රතාව; ජීවිතින්ද්‍රියං (නෙලුම් මහනෙල් ආදී ජලජ පුෂ්පයන්ට ආධාරවන ජලයමෙන් අරූප ධර්ම පාලනයෙහි අධිපති බවක් ඇති) ජීවිතින්ද්‍රිය; මනසිකාරො (ආයුතු මග අශ්වයන් මෙහෙයවන - අශ්වයන්ට මග පෙන්වන සාරථියක්හු මෙන් ඒ ඒ චිත්ත-චෛතසික ධර්මයන් අරමුණෙහි යොමුකරවීම් වශයෙන් උපදනා මනස්කාර;

## 2 කොටස මෙහි චෛතසික 6 යි.

විතක්කො; (නගරවාසීන් රජගෙට පමුණුවන රාජවල්ලභ යෙකු මෙන් සම්ප්‍රයුක්ත ධර්මයන් අරමුණට පමුණුවන-අරමුණට නන්වන) විතර්කය; විචාරො රජ හැඳිනගෙණ නගරවාසීන් රජ නෙහි හැසිරෙන්නාක්මෙන් විතර්කය විසින් අරමුණට නංවනලද චිත්ත-චෛතසික ධර්මයන් අරමුණෙහි හැසිරීම්ලක්ෂණවූ)විචාරය; අධිමොක්ඛො (ස්ථිරත්වයෙන් ඉන්ද්‍රඛීලයක් වැනිව; ආරම්මණයෙහි ස්ථිරත්වයෙන් හා නිශ්චයාකාරයෙන් උපදනා) අධිමොක්ෂය; විරියං (රථභාරය උසුලන වෘෂභයා මෙන්ද දිරායන ගෙයකට දෙන රුකු ලක් මෙන්ද සහජාත ධර්මයන් උත්සාහවත් කරන) වීර්‍ය්‍යය; පීති; (පිපාසිතයෙකුට මීහිරි පැනක් දැකීමක් මෙන්ද දුගියෙකුට ධන ලාභයෙහි මෙන්ද ආරම්මණයෙහි සහජාත ධර්මයන් පිණවන) ප්‍රීතිය; ඡන්දො; යමක් ගැණීමට අතදිගු කිරීමක් වැනිව ආරම්මණ යෙහි කත්තුකම්‍යතා ලක්ෂණ) ඡන්දය;- චෛතසිකා 6 යි.

## 3 කොටස මෙහි චෛතසික 14

මොහො (ආරම්මණයෙහි නියම තත්වය මුලාකරවන; ඇසෙහි දෘෂ්ටිය වලක්වන පටලය වැනි උපදනා) මොහය: (අවිජ්ජා පච්චයා සඞ්ඛාරා යන තන්හි වදාළ අවිද්‍යාව නම් මොහය බව දතයුතු) අහිරිකං; (අශුචියෙහි ඌරාමෙන් පාපයෙහි නොපිළිකුල් ආකාරයෙන් උපදනා) අහිරිකය; අනොත්තප්පං (ගින්නෙහි භය නොවන පලඟැටියා මෙන් පාපයෙහි භය නොවන ආකාරයෙන් පවත්නා) අනොත්තප්පය; උද්ධච්චං; (ගලක් වැටීමෙන් විසිරයන අළුගොඩක් වැනිව සිතේ නොසන්සුන් ගති ඇතිව උපදනා) ඖද්ධත්‍යය; ලොභො; (මක්කටාලෙපය මෙන්ද වස්ත්‍රයක වහා ඇලෙන තෙල් සහිත දූලියක් මෙන්ද ඉතා අරමුණෙහි ඇලෙන ගතිය ඇතිව උපදනා) ලොභයද; දිට්ඨි; (මිරිඟුවෙහි ජලය යන හැඟීම් මෙන් අරමුණ වරදවා දක්වන ස්වභාවයවූ) දෘෂ්ටිය; මානො; ("මම උසස්මි" ආදී වශයෙන සිතෙහි ඇතිවන) උඩඟු ස්වභාවය; දොසො; (දණ්ඩෙන් පහරලද සර්පයෙකු මෙන් අනිෂ්ටා-රම්මණයෙහි හැපෙන ස්වභාවයෙන් උපදනා) චණ්ඩික්ක නම්වූ ද්වෙෂය; ඉස්සා; (අනුන්ගේ සම්පත් නොඉවසන ස්වභාවයවූ) ඊර්ෂ්‍යාව; මච්ඡරියං; (ස්වකීය සම්පත් සැඟවීම ලක්ෂණවූ) මාත්ස-ර්‍ය්‍යය; කුක්කුච්චං; (කළ දුසිරිත් හා නොකළ සුසිරිත් ගැන පසු තැවිලිවන ස්වභාව ලක්ෂණකොට ඇති) කෞකෘත්‍යය; ථිනං; (හින්නට ලංකළ කුකුළු පිහාටුවක් මෙන් අරමුණෙහි චිත්තයාගේ

පසුබස්නා ස්වභාවයවන) දීනය; මිද්ධං; (වේදනා සඤ්ඤා සංස්කාර යන චෛතසිකයන්ගේ හැකිලීම ස්වභාවයවන) මිද්ධය; විචිකිච්ඡා; (දෙමං සන්ධියකට පැමිණියෙකු මෙන් බුද්ධාදී අටතැන්හි සැක කිරීම් ස්වභාවයවූ) විචිකිච්ඡාව;

4 කොටස මෙහි චෛතසික 19 කි.

සද්ධා; (සක්විති රජුගේ උදකප්‍රසාදක මැණිකමෙන් සහජාත ධර්මයන් ප්‍රසන්න කරවන ස්වභාවයවූ) ශ්‍රද්ධාව; සති; (රජු විසින් කළයුතු කටයුතු මේ මේ යයි වරින්වර සිහිකරවන ඇමතියාගේ අයුරින් සිතෙහි යෙදෙන සහජාත ධර්මයන් සිහිකරවන හෙවත් ප්‍රගුණකළ ග්‍රන්ථයක් මෙන්) අරමුණු කරවන ස්මෘතිය; හිරි; (දුසිරිතෙහි කුලකාන්තක් මෙන් පාපධර්මයන් කෙරෙහි ලජ්ජාවන ස්වභාවයෙන් උපදනා) හ්‍රිය; ඔත්තප්පං; (පාපධර්මයන්හි භයාකාර යෙන් උපදනා) ඔත්තප්පය; අලොභො; (පියුම්පතෙහි ජලයමෙන් අරමුණෙහි සිත නොලැගෙනන ස්වභාවයවන) අලොභය; අදොසො; (අනුකූල මිත්‍රයෙකු ලෙසින් ආරම්මණයෙහි අවිරොධ ලක්ෂණ යෙන් උපදනා) අද්වේෂය; ("මෛත්‍රී" යනුද මෙය වැසි) තත්‍ර-මජ්ඣත්තතා; (අසුන් සමව යන කල මධ්‍යස්ථවන සාරථියෙකු මෙන් සහජාත ධර්මයන් මධ්‍යස්ථ කරවන) තත්‍රමජ්ඣත්තතාව (උපෙක්ඛාව යනු මෙයයි) කායපස්සද්ධි; (චෛතසිකයන්ගේ දරථය - බරගතිය සන්සිඳුවන; ඖද්ධත්‍යයට ප්‍රතිපක්ෂ ලෙසින් උපදනා) කායප්‍රශ්‍රබ්ධිය; චිත්තපස්සද්ධි; සිතේ දරථගතිය - බර ගතිය සන්සිඳුවන චිත්තප්‍රශ්‍රබ්ධිය; කායලහුතා චෛතසිකයන්ගේ සැහැල්ලු ගතිය ඇතිකරවන කායලහුතාව; චිත්තලහුතා සිතේ සැහැල්ලු බව ඇතිකරවන චිත්තලහුතාව; කායමුදුතා චෛතසික යන්ගේ මෘදු බව ලක්ෂණ කොට ඇති කායමෘදුතාව, චිත්තමුදුතා සිතේ මෘදුබව නොහොත් මොලොක්බව ඇතිකරන චිත්තමෘදුතාව; කාය කම්මඤ්ඤතා චෛතසිකයන්ගේ කර්මන්‍යබව ඇතිකරන කායකර්මන්‍යතාව; චිත්තකම්මඤ්ඤතා සිතේ කර්මන්‍ය බව ඇති කරන චිත්ත කර්මන්‍යතාව; කායපාගුඤ්ඤතා චෛතසිකයන්ගේ ගිලන්බව සන්සිඳුවන කාය ප්‍රාගුණ්‍යතාව; චිත්තපාගුඤ්ඤතා සිතේ ගිලන්බව සන්සිඳුවන චිත්ත ප්‍රාගුණ්‍යතාව; කායුජ්ජුකතා චෛතසිකයන්ගේ ඍජුබව ඇතිකරන කායයාගේ ඍජුභාවය; චිත්තුජ්ජුකතා සිතේ ඍජුබව සිදුකරන චිත්තයාගේ ඍජුභාවය;

5 කොටස මෙහි චෛතසික 3 කි.

සම්මාවාචා මුසාවාදාදී සිවුවැදෑරුම් වාග් දුශ්චරිතයෙන් වැළකීමේදී ඇතිවන සම්‍යක්වචනය; සම්මාකම්මන්තො ප්‍රාණඝාතාදී

ත්‍රිවිධ කායදුශ්චරිතයෙන් වැළකීමේදී ඇතිවන සම්‍යක්කර්මාන්තය සම්මාආජීවෝ මිථ්‍යා ආජීවයන්ගෙන් වැළකීමේදී ඇතිවන සම්‍යග් ආජීවය;

6 කොටස මෙහි චෛතසික 3 යි.

කරුණා දුඃඛිතයෙකු දැක ඔහු දුකින් මිදවීමේ කැමැත්ත ලක්ෂණ කොට ඇති කරුණාව; මුදිතා සැප විඳින කෙනෙකු දැක සිතේ ඇතිවන සතුට; පඤ්ඤා ඉන්ද්‍රයාගේ වජ්‍රායුධයමෙන් තදඞ්ගාදි වශයෙන් ක්ලේශ ප්‍රහාණය කිරීමෙහි මූලිකව; ප්‍රධානත්වයෙහි පවත්නා ප්‍රඥාව (විද්‍යාව යනුද මෙයට නම්වේ.) යන මේ දෙපණස් චෛතසික ධර්මයෝ සුදුසු පරිදි පූර්වෝක්ත කාමාවචරාදී චාතුර් භූමික සිත්වල යෙදෙන බව දතයුතුයි. මේ චෛතසික පණස් දෙකෙන් වේදනා චෛතසිකය වේදනා ස්කන්ධය නමින්ද සඤ්ඤා චෛතසිකය සංඥස්කන්ධ නමින්ද සෙසු චෛතසික පණස සංස්කාරාස්කන්ධ නමින්ද වදාරා ඇත.

මෙහි දැක්වූ චෛතසික 52 අතුරෙන් පළමුවෙනි කොටසට අයත් චෛතසික සත (7) කාමවචරාදී භූමි වශයෙන් චතුර්විධ වූද කුශල - අකුශල - අව්‍යාකෘත වශයෙන් තෙවැදෑරුම්වූද සියලුම සිත්වල යෙදේ. එහෙයින් ප්‍රථම කොටස සබ්බචිත්ත සාධාරණ චෛතසික නම්වේ.

දෙවෙනි කොටසට අයත් චෛතසික සය (6) සොභන- අහේතුක යන සිත්වල ප්‍රකීර්ණක වශයෙන් - කලවම් ලෙස යෙදෙන හෙයින් ප්‍රකීර්ණක යන ලබයි. නැවත මේ සබ්බචිත්ත සාධාරණ - ප්‍රකීර්ණක යන චෛතසික 13 අන්‍යසමාන යන නමින් හඳුන්වනු ලැබේ.

තුන්වෙනි කොටසට අයත් මෝහය ආදිකොට විචිකිච්ඡාව අවසන් කොට ඇති චෛතසික තුදුස (14) අකුසල් සිත්වල පමණක් යෙදෙන බව දතයුතුයි. එහෙයින් ඒවාට අකුශල චෛතසික යනු නම්වේ.

සිවුවෙනි කොටසට අයත් චෛතසික (19) එකුන්විස්ස "සොභන" සිත්වල පමණක් යෙදෙයි. මේ නිසා මේ චෛතසික එකුන්විස්ස සොභන සාධාරණ නම්වේ. අකුසල් සිත් 12 ද අහේතුක සිත්ද හැර සෙසු සියලු සිත් "සොභන" නම්වෙති.

පස්වෙනි කොටසට අයත් චෛතසික තුන (3) විරති නමින්ද 6 වෙනි කොටස අප්පමඤ්ඤා - පඤ්ඤා යන නමින්ද හඳුන්වනු ලැබේ.

## විත්‍රය

චෛතසික 52

- අඤ්ඤසමාන 13
  - සබ්බචිත්ත සාධාරණ (7)
  - පකිණ්ණක (6)
- අකුසල 14
- සෝභන 25
  - සෝභන සාධාරණ 19
  - විරති 3
  - අප්පමඤ්ඤා 2
  - පඤ්ඤා 1

---

සර්වඥීය අප්‍රතිහත ප්‍රඥා ප්‍රභාවයෙන් සත්ත්ව–සංස්කාර–අවකාශ–යන ලෝකත්‍රය පිළිබඳ යථා තත්ත්වය අවබෝධ කළ තථාගතයන් වහන්සේ මෙකී රූපධාතු-නාමධාතු දෙදෙනාගේ "ක්‍රමානුකූල සංයෝගයක්" විනා "සත්ත්ව" ප්‍රඥප්තියෙහි ආත්මසාරයක් නැති බව වදාළසේක.

නාමරූප ධාතූන් ආත්මය ලෙස සලකන්නේ අවිද්‍යාව නිසයි.

සිත පවත්නේ කොහිද? චිත්ත සඞ්ඛ්‍යාත යටකී විඥානයෝ කොහි-කුමක් ඇසුරු කොට–පවත් නාහුදැයි දතයුතුවේ. ඉතා සියුම් වශයෙන් සලකන කල ස්පර්ශය නොදැනෙන කෙස් – ලොම් – නිය දත් ආදී හැන්හැර මුළු ශරීරයෙහිම සිත් ඇතිබව කිවයුතුයි. යටි පත්ලේ උවද කටුවක් ඇනෙනකල රිදුමක් දැනෙන්නේ එහිද සිත ඇති නිසාය. එහෙත් ප්‍රධාන වශයෙන් සිතට නිඃශ්‍රය වන්නේ හෘදය වස්තුවයි. අනතුරුව චක්ෂු-සෝත-ඝ්‍රාන-ජිව්හා කාය යන ප්‍රසාද රූපයෝ සිතට නිඃශ්‍රය වෙත්. ප්‍රධානවූ හෘදය වස්තුව ඇසුරු කොට චිත්ත පරම්පරාවක් නොමැතිනම් චක්ෂු රාදී වස්තු රූපයන්හිද සිත් ඇතිවිය නොහැකියි.

ලෙහන මැද: යටිකුරුකොට එල්වා තබන ලද පිටපොත්ත හල රත්පැහැති නෙලුම් කැකුලක සටහන් ඇති මාංස පිණ්ඩය හෘදය වස්තුව නම්වේ. මෙකී අඩපතක් පමණවූ ලෙය හෘදය වස්තුවේ පැවැත්මට අනුබල දෙයි

සත්ත්වයා මව් කුස උපදනා මවගේ ආමාශය-පක්වාශය අතර ගර්භාශය නම්වූ ඉතා අපවිත්‍ර ස්ථානයෙහි මේ භවයේ මුල් සිතවූ පටිසන්ධිය පහළවේ. ඒ සමගම කාය දසක-වත්ථු දසක-භාව දසක යන රූපකලාප තුනක්ද පහළවේ කලාප කියකින් යුත්

මේ ක්ෂුද්‍ර ජීවිතෙන්ද්‍රියට කලලරූප යයි කියනු ලැබේ, මඩ යන අර්ථවත්වූ මේ කලල රූපය උපන් සැටියේම එළුපැටියෙකුගේ සිහින් ලොම් ගසක් ගෙණ තලතෙල් පහනක ගලා ගසා දැමීමෙන් පසුව එකී ලොම්ගස අග එක්වූ ඉතා සියුම් තෙල් බිඳ පමණ වේ යයිද දක්වති.

(කර්ම බලයෙන් පහළවී චිත්ත-ඍතු-ආහාර, යන ප්‍රත්‍යයින් ගෙන් පොෂණය වෙමින්ද; පඨවි-ආපො-තෙජො-වායු යන මහා භූත සතරින් ආරක්‍ෂා වෙමින්ද; ජීවිතෙන්ද්‍රියයෙන් පාලනය වනු ලබන මේ හෘදය වස්තුව ඇසුරුකොට විශෙෂයෙන් සම්පටිච්ඡනද්වයහා පඤ්චද්වාරාවර්ජන සඞ්ඛ්‍යාත මනොධාතුවත් ද්විපඤ්ච විඤ්ඤාණ හැර සෙසුසිත් 76ක්වූ මනොවිඤ්ඤාණ ධාතුවක් උපදියි)

යථොක්ත කලල බීජය ක්‍රමයෙන් මේරීමෙන් අබ්බුද- පෙසි- ඝණ-යන අවස්ථාවන්ට පැමිණේ. මසක් පිරෙන කල ඝණවූ මස් කැටියක් බවට පත්වේ. ඉක්බිති පස්වෙනි සතිය තුළ දෑත-දෙපය හිස යන අඞ්ග පසට බෙදේ. මෙසේ බලනකල මුලින් ඇතිවූ හෘදය වස්තුව ඇසුරු කොට පසුව හිසද ඉන්පසු ඇස්, කන, නාසා ආදී ඉන්ද්‍රියයන්ද ඇතිවන බවද පෙනේ. මොළය හටගන්නේද පසුවයි.

අපරදිග පණ්ඩිතයින්ගේ මතය අනුව සිතපවත්නේ මොළය ඇසුරු කරගෙණයයි දක්වත්. සිතට දුකක් – කණගාටුවක් ඇතිවූවිට මොලයෙහි වේදනා ඇතිවන බවද, එහෙයින් සිතට නිශ්‍රයස්ථානය මොළය බවද ඔවුන්ගේ නිගමනයයි, එහෙත් දුකකදී මොලයෙහි වේදනාවක් ඇති නොවේ. වේදනාව ඇති වන්නේ සිත ඇසුරු කොටගෙන පවත්නා හෘදය වස්තුවෙහිය. සිතට කණගාටුවක් හෝ දුකක් හෝ ඇතිවූවිට හෘදය වස්තු කොශය තුළ පිහිටි සිත ඇසුරු කොට පවත්නා ලෙය කැළඹීමෙන් දුර්වර්ණ බවට පත්වේ. හෘදය කොශය තුළද නිතර පරණ ලෙය පිටවීම හා අලුත් ලේ පැමිණීමද සිදුවෙයි, මේ නිසා කෝපයක් හෝ ශෝකයක් ඇතිවූවිට මූහුන හා නෙත්‍රයන්ද දුර්වර්ණ බවට පත්වෙයි. හෘදයාශ්‍රිත ලේධාතුව නහරනත්ව දිවීමෙන් මුළු සිරුරම දුර්වර්ණ බවට පත්කරයි. 'ලේ ධාතුවේ සම්බන්ධය නිසා හෘදය වේදනාවට අනතුරුව මොලයෙහිද වේදනාවක් ඇතිවනු විනා හෘදය වස්තුවට පෙර මොලයෙහි වේදනාවක් සිදුනොවන බව දතයුතුයි.'' මේ බව එකතෙකුට බියක් හටගැණුනුකල හොඳින් දකට වෙයි. හදිසියෙන් තිගැස්සීමක් වූකල වහාම හෘදය ස්පන්ද

නය (හෘදයේ ගැසීම) සිදුවෙයි. හෘදය වස්තුවේ අධික ක්‍රියාකාරී බවක් ඇතිවෙයි. සත්ව ජීවිතයෙහි ප්‍රථමයෙන්ම ඇතිවන්නේ හෘදය වස්තුවයි, සත්වයා මිය යනවිට අවසාන චුති චිත්තය පහළ වන්නේද හෘදය වස්තුව ඇසුරු කරගෙණය. ජීවිතෙන්ද්‍රියද හෘදය වස්තුව ඇසුරු කොට පැවතී චුති චිත්තය සමගම එයද නැසෙයි. අවසාන ප්‍රාණවායුව නිරුද්ධ වන්නේද හෘදය වස්තු වෙහිය. තවද කියවුණතකි. "මොලයෙහි චින්තන බලයක් ඇතද සිත පවත්නේ හෘදය වස්තුව ප්‍රධාන නිඃශ්‍රයස්ථානය කර ගෙණ බව දතයුතුය."

මොලය වූකලී හෘදය වස්තුවෙහි උපදනා අදහස් බෙදාහරිණ මධ්‍යස්ථානයයි. මොලයට පීඩාවක් ඇතිවූවිට සත්වයා ක්‍රියා විරහිත වන බව අපි දනිමු. ක්‍රියා කාරීත්වයෙහි ලා බල පෑමක් මොලයෙහි විද්‍යමාන බවට මෙයම සාධකයෙකි. එපමණකින් සිත ඇසුරු කරණ තැන මොලය යයි ගැණීම නොමැනවි.

යන්ත්‍රානුසාරයෙන් උපදවා ගණු ලබන විදුලි බලය එක්තරා මධ්‍යස්ථානයකදී සුදුසු පරිදි බෙදාහැර ඒ ඒ කටයුතුවල යොදවනු ලැබේ. බෙදා හරිනු ලබන මධ්‍යස්ථානය විදුලි බලය නිපදවන තැන යයි ගැණීම මුලාවක් මෙන්ම ක්‍රියාකාරීත්වයෙහි බලපෑමක් ඇති මොලය චින්තනයාගේ නිඃශ්‍රයස්ථානයයි ගැණීමද මුලාවෙකි. මහත් විපතකදී හෘදය වස්තුවට තදින් දැනෙන පීඩාව අපට ප්‍රත්‍යක්ෂය. එකී පීඩා හෙවත් වේදනාව දැනෙනුයේ හෘදය වස්තු සඞ්ඛ්‍යාත මාංස පිණ්ඩයට නොව තදාශ්‍රිත චිත්තයටය. මොලයටද එක්තරා ප්‍රමාණයක පීඩාවක් දැනෙතත්, එපීඩා මොලයට වඩා කල් ඇතිවත්, තදිනුත් දැනෙන්නේ හෘදය වස්තුවටය. මෙයින්ම සිත හෘදයවස්තුව ආශ්‍රයකොට උපදනාබව නිගමනය කළහැකිය.

අහර සොයනු රිසි මකුලුවා නොයෙක් දිගට නූල්ඇද දැලක් සාදා එහි මැදටවී සිටී. දැලේ සතෙකු පැටලුන කල වහා දුවගොස් සතා ගොදුරු කරගෙණ ලේ උරා බොයි. වරෙවිට දැල් ඇදීමද ඒ දැල් එකිනෙක සම්බන්ධවීම පිණිස හරහට දැල් ඇදීමද දැල මැදටවී නිසසලව සිටීමද මකුලුවාගේ සිරිතයි.

හෘදය වස්තුව ඇසුරුකොට පවත්නා සිතද මකුලුවා මෙනි, චක්ඛු-සොත-ඝාණ-ජිව්හා-කාය යන ප්‍රසාදරූපයෝ නොහොත් ආයතනයෝ දැලමෙනි. රූපාදී ආරම්මණයන් චක්ඛුරාදී ආයතනයන්ට මූනගැසීමෙන් චක්ඛුර් විඥාණාදී චිත්ත පරම්පරා ඇතිවීම

මිකුලුවා අහර නොදුරු කරනැණීම මෙනි. චක්ඛුරාදි ආයතනාන්හි සිත පවත්නේ නොවේ. හෘදයාශ්‍රිතව පවත්නා භවඞ්ග චිත්ත පරම්පරාව සිඳීමෙන් චක්ඛුරාදි විඥානයන් පහලවනු විනා චක්ඛුරාදි ආයතනයන්හි පවත්නා චිත්ත පරම්පරාවක් නොමැතියි. "ඇසින් රූපය දකිය"යි කියන්නේ චක්ඛුර් විඥානයක් චක්ෂුඃප්‍රසාදය හා රූපායතනය නිසා ඇතිවූවිටය. ඒ චක්ඛුර් විඥානය ඇසේ පවත්නක් නොව රූපායතන චක්ෂුඃප්‍රසාදයේ හැපීමෙන් හෘදයාශ්‍රිත භවඞ්ග චිත්ත පරම්පරාව සිඳී යටකී රූපායතනය අනුව චක්ඛුර් විඥාන සිතක් චක්ෂුඃ ප්‍රසාදය ඇසුරුකොට ආගන්තුගව පහළ වන්නක් බව දතයුතුයි. එසේම මහා චිත්තක්ෂණ 17 කින් පසුව එකී රූපායතනය ඇසුරු කොට උපන් චිත්ත පරම්පරාවද සිඳී යනවා ඇත.

**සිත පිළිබඳ නියම තත්ත්වය නොවැටහෙන්නේ අවිද්‍යාව නිසයි.**

**අදහස් මොලයේ රැඳී තිබේද?** මිනිසා සිතන අදහස්-සිතුවිලි මොලයේ එක්තැනක රැඳී ඇතැයිද උඩුසිත හා යටිසිත යනුවෙන් සිතේ "තට්ටු" දෙකක් ඇතැයිද අපරදිග පඬුවන්ගේ මතාන්තරයක් වේ. කෙනෙක් අන්‍යයෙකුගේ අතේ රන්මුදුවක් තිබෙනු දකී. ඔහු මුදුවට ආශාකරයි. තමාට එබඳු මුදුවක් හෝ එම මුද්දම හෝ ලබාගැණීමේ ආශාවක් සිතේ ඇතිවෙයි. නමුත් ඔහුට ඒ මුදුව නොලැබිනැයි සිතමු. දෙදෙනා ඉවත්ව ගියහ. නැවත වර්ෂයකට පමණ පසු නැවත මේ දෙදෙනාම එක්වියයි සලකමු. එහිදී මුදුවට ආශාකල තැනැත්තාම නැවත යටකී මුදුව දුටු එයට නැවතත් ආශාකරයි නම් මේ ආශාව එයම වර්ෂයකට පෙර ඇතිවූ ආශාවමද නැතහොත් අනික් හැඟීමක්ද? අපරදිග පණ්ඩිතයන්ගේ පිළිගැණීමේ හැටියට නම් වර්ෂයකට පෙර ඇතිවූ ආශාව යටිසිතේ තැන්පත්ව තිබී නැවත මුදුව දැකීමෙන් පසු යටවී තිබූ "ආශාව" මතුවී ආ බවයි. තථාගත ධර්මය අනුව ඒ වර්ෂයකට පෙර ඇතිවූ 'ආශාව" නොව එයට සමාන ආශාවකි. ක්ෂණයක් පාසා ඇතිවෙමින්-පැවතී-නැතිවෙමින් සිත චිත්ත පරම්පරාවක් විනා කොහේවත් රැඳී පවත්නා සිතක් ලොව කිසිම සත්ත්වයෙකුට නැත. එසේ කොහේහරි රැඳී පවත්නා සිතක් වේ නම් ඒ සිත නිත්‍ය විය යුතුයි. එබඳු නිත්‍යවූ - සස්ථිරවූ සිතක් ලොව නොමැතියි.

උපදින ක්ෂණය; පවතින ක්ෂණය; බිඳෙන ක්ෂණය යි කුඩා ක්ෂණ තුනක් මහා ක්ෂණයයි. එබඳු මහා ක්ෂණයක් සිතක ආයු කාලයයි. ඒ මහා ක්ෂණය ගතවීමත් සමගම සිතද නැසෙයි. නැසෙන සිත නැසෙන්නේ ඊලඟට සිතක් ඇතිවීමට අවකාශ දෙමින්ය. ක්ෂණයක සිත් දෙකක් හෝ ක්ෂණ දෙකක එක සිතක් හෝ නොපවතී. මෙබඳු මහා චිත්තක්ෂණ 17 ක් රූපධර්මයක ආයුකාලය වේ. මහාචිත්තක්ෂණ සතලොසින් සතලොස රූප නැසී නැසී යාමද; නැසීමට අනතුරුව රූපයන්ගේ පහළවීමද ඒ පහළවූ රූප නවත් චිත්තක්ෂණ 17 කින් පසු නැසීමද නැසෙන විට නවත් රූපධර්ම ඉපදීමට උපකාරවීමද චිත්ත නියාමය බව දතයුතුයි.

> “මේ අනුව වර්ෂයකට පෙර ඇතිවූ ආශාව එසැදිම නිරුද්ධ විය. පසුව ඇතිවූයේ එයට සමාන ආශාවකි.”

මේ සිතේ “සංඥා” නම්වූ එක්තරා විශිෂ්ට බලයකින් යුත් චෛතසිකයක් ඇත්තේය. වරක් ඇසූ දුටු දෑයක් පැය ගණන් දින ගණන් සති ගණන් වර්ෂ ගණන් ගතවූ පසුද නැවත හැඳින ගන්නේ ඒ “සංඥාවේ” බලයෙනි. කිසිකලෙක දූනිමක් හෝ ඇඳිනීමක් නැති කෙනෙක් යමෙකුට මුණගැසුනායයි සිතමු. ඔහුගේ රූපච්ඡායාව චක්ෂුප්‍රසාදයෙහි වැදීමෙන් “චක්ෂුර්විඥානයක්” උපදී. මිනිසා දකින්නේ මේ චක්ෂුර් විඥානයෙනි. ඒ චක්ෂුර් විඥානයද සංඥාවද මහා චිත්තක්ෂණයකින් පසු බිඳෙයි. නැවත වර්ෂයකින් පසු ඔහු මුණගැසීමෙන් “හා! ඔබ මා මීට කලින් හොඳටම දැක තිබේ” යයි පවසයි. ඔහු වර්ෂයකට පෙර තමන් දුටු බවද ඔහු හොඳට හඳුනන බවද සලකාගන්නේ සංඥාවේ බලයෙනි. එහෙත් ඒ සංඥාව මුලින් ඇතිවූ සංඥාව නොව එයට සමානවූවකි.

**නවීන විද්‍යාඥයින්පවසන යම්කිසි හෙවත් උපවිඥානය**

ලෞකික ඥානයෙන් - ලෞකික විද්‍යාඥයින් විසින් නිපදවනු ලැබූ ‘නවීන විද්‍යාව’ ලෞකික ජීවිතයේ පැවැත්මට උපකාරී වූවද එම නවීන විද්‍යාව උපයෝගී කරගෙන තථාගත ධර්මය විසඳන්ට යාමෙන් මුලාවට පත්වන බව කිවයුතුය. එසිනුත් පරමාර්ථ ධර්ම විශයෙහි නවීන විද්‍යාව අන්ධය, අත්හදා බැලිය නොහැකි තර්කයට හෝ උපමාවට නොනැළපෙන-පියෙවි ඇසට යන්ත්‍රානුසාරි දෘෂ්ටියට ලක් නොවන-කිසිවක් නොපිළිගැනීමද විශ්වාස නොකිරීමද මූලික ප්‍රතිපත්තිය ලෙස පිළිගත් නවීනවිද්‍යාඥයා ගඞ්ගාවක් තරණය කරන්නට සුදුසු කුඩා ඔරුවකින් මුහුද තරණය

කරන්නට යත්න දරන්නාසේ රියන් කීපයක් දිග රිටකින් මහා පොළොව මනින්ට යත්න දරන්නාසේ මුහුදෙහි ගමන් කරවිය යුතු නැවක් මහවනයක් මැද දමා හබලක් ගෙණ පදවන්ට යත්න දරන්නාසේ, බුද්ධීන්ද්‍රිය දියුණුවීමෙන්ම ස්වයංදෘෂ්ටිකවූද අධ්‍යාත්මික දක්ෂිණ වාදයක්වූද; තථාගත ධර්මය අතක්කාවචරවූ අතිගම්භීර සියුම් ධර්මයක් බව නොසලකන්නේද අවිද්‍යාව නිසයි.

ලෝකය පිළිබඳ උපමාවකින් ලොකොත්තර ධර්මය තේරුම් ගත නොහැකියි. තථාගත ධර්මයේ උන් වහන්සේ විසින්ම වදාරණ ලද ඇතැම් ධර්ම පිළිබඳ සැක කරන බොහෝ දෙනා තමන් බෞද්ධ බවද අඟවයි. කර්මය-හා විපාකය-පුනරුත්පත්තියහා දෙව්ලොව-අපාය ආදී දෑ පිළිබඳවද සැක කරන්නෝ බෞද්ධයෝ නොවෙති. මේවා කිසිසේත් අත්හදා බැලීමට නොහැකි කරුණුය ආත්මකැමනය පුදපූජා රූවවිල්ල ආදී වශයෙන් නොයෙක් මතභේද ප්‍රකාශ කරන්නේද අධ්‍යාත්මිය මානසික තත්වය නවීන විද්‍යානුකූලව විසදන්ට යාමේ බලවත් අවිද්‍යාව නිසයි.

නිදහසේ තමා කැමති දෙයක් ලිවීමෙහිද කීමෙහිද අයිතිය මිනිසාට ඇතත් ක්ෂණයක් පාසා වෙනස්වන මේ අද්භූත විශාල ලෝකය පිළිබඳව නවීන විද්‍යාඥයින් කියන දෙය එසේම යයි ස්ථිරව පිළිගත හැකිද? මේ අද්භූත ලෝකයේ ඇසට පෙනෙන දෙයට වඩා නොපෙනෙන දෙය වැඩි බව නොසැලකිය යුතුද? තවම ඉතා ලපටි අවස්ථාවේ තිබෙන නවීන විද්‍යාව අනුව භූතයින් පිළිබඳවද සිහින පෙනීම පිළිබඳවද නියම ස්වභාවය සොයාගත නොහැකිව ඇත.

මෙකී නවීන විද්‍යාඥයින් විසින් "යටිසිත හෙවත් උපවිඥානය නමින් හඳුන්වනු ලබන්නක් ඇත. එය අනිකක් නොව තථාගතයන් වහන්සේ විසින් විභංගාදී දේශනාවන්හිදී වදාරා ඇත. 'මනොවිඤ්ඤාණ' නමින් හඳුන්වනු ලබන චිත්ත තත්වයයි.

භවාඞ්ග-මනොවිඤ්ඤාණ-: සැවිඤ්ඤාණ- යයි සිතේ අවස්ථා තුනක් වෙයි. මෙයින් චක්ඛු-සොත-ඝාණ-ජිව්හා-කාය යන පඤ්චද්වාරයෙන් අරමුණු ගැනීමේදී චක්ඛුවිඤ්ඤාණාදී පඤ්චද්වාරික විඤ්ඤාණයෝ පහළ වෙත්. ඇසින් දුටු රූපය නොපෙනී ගියවිටද නැවත නැවතත් ඒ රූප ඡායාව මනොද්වාරයෙන් මෙනෙහි කරමින් "ඒ රූපය හොඳයි! දකින්ට ඇත්නම් හොඳයි. එහි හැඩහුරුකම හොඳයි.' ආදි වශයෙන් සලකන කල දහස් ගණන් මනොවිඤ්ඤාණයෝ පහළ වෙත්. වර්තමානවූ කිසි අරමුණක් නොගෙණ, අතීතවූ කර්ම-කර්මනිමිති-ගතිනිමිති යන

අරමුණු තුනෙන් එකක එල්බ පවත්නා ප්‍රකෘති සිත 'භවඞ්ග' නමි. ''පභස්සරමිදං භික්ඛවෙ චිත්තං තඤ්චඛො ආගන්තුකෙහි උපක්කිලෙසෙහි උපක්කිලිට්ඨං''(අංගුත්තරනිකාය) මහණෙනි මේ සිත ඉතා ප්‍රභාස්වරය.නමුත් ආගන්තුග උපක්ලෙශයන්ගෙන් කෙළෙසෙයි.

යනුවෙන් වදාරා ඇත්තේද භවඞ්ග සිත පිළිබඳවයි. මෙයින් ''පටිසිත හෙවත් උපවිඤ්ඤාණය යනුවෙන් හඳුන්වන්නේ මනො විඤ්ඤාණය බවද ඇතැම් අය විසින් 'පඨම පටිසිත'' යනුවෙන් දක්වනු ලබන්නේ භවඞ්ග සිත් බවද දතයුතුයි.

සිත පිළිබඳ මෙබඳු තත්වය නොවැටහෙන්නේ අවිද්‍යාවනිසයි·

මනොධාතු--මනොවිඤ්ඤාණධාතු යන ප්‍රධාන
ආගන්තුක සිත් චිත්ත පරම්පරාව හෘදය වස්තුව ආශ්‍රය කර=
උපදින තැන් ගෙණ පවත්නා අතර සෙසු සිත් චක්ඛු--සොත
ආදී ස්ථාන ආශ්‍රය කර ගෙණ පහළ වන්නාහ.

හෘදය වස්තුව ආශ්‍රිත චිත්ත පරම්පරාවක් නොවේ නම් චක්ෂුරාදී ස්ථානවල සිත් පහළ නොවන බව සැලකිය යුතුය.

චක්ඛු–සොත–ඝාණ–ජිව්හා–කාය යන ප්‍රාසාද රූපයන් නිශ්‍රය කර ගෙණ චක්ඛුවිඤ්ඤාණ=සොතවිඤ්ඤාණ–ඝාණ විඤ්ඤාණ=ජිව්හා විඤ්ඤාණ–කාය විඤ්ඤාණ යන මේ සිත් පහළ වෙයි.

මේ භවයේ මුල් සිත වන ප්‍රතිසන්ධිසිත සමගම ඇතිවූ පඨවි–ආපො–තෙජො–වායො යන මහාභූතයින්ගේ සියුම් බව ඇති වීමෙන් ''පුළුන් ගොඩක් පොළන්ට පොළන්ට සියුම් වන්නාසේ චක්ඛු ආදී ස්ථාන පසක ප්‍රසාද ගති යෙදී ඇත්තේය. චක්ෂුර්ගොල මධ්‍යයෙහි එබඳු සියුම් ඔපයක් පවතී. සසම්භාර චක්ෂුස නමින් හඳුන්වන මස් ගුඩුව මධ්‍යයෙහි පිහිටි කාලමණ්ඩලය(කලු ඉංගිරියාව) මැද බාහිර රූපයන්හි සෙවනැල්ල දක්වන කන්නාඩිය මෙන් ඉතා පැහැදිලි ස්ථානය චක්ෂුඃ ප්‍රසාද නම්වේ. කපුපුළුන් තට්ටු සතක් එක පිට තැබුවාක් මෙන් එක පිට ඇති සිවි සතක් වෙයි. කපු පුළුන් තට්ටු සතට තලතෙල් වත්කළ කල්හි ඒ තට්ටු සත තෙමා ගලා යන්නාක් මෙන් ''අතීත ජන්මයෙහි රූප දකිනු

කැමැත්ත යයි කියනලද "රූප තණ්හාව" මූලික කොට ඇති කර්මයෙන් නිපන් මහාභූතයන්ගේ ඔපය යටිති සිව් පටල සතේම පැතිර පවතී. ධාරණ-ආබන්ධන-පරිපාචන-විත්ථම්භන යන කෘත්‍ය සතරකින් යුත් පඨවි-ආපෝ=තේජෝ=වායෝ යන භූත සතරින් ආරක්ෂා කරණු ලබන 'ඍතු-චිත්ත-ආහාර' යෙන් උප-කාර කරණු ලබන වර්ණ-ගන්ධ-රස-ඕජා වන් විසින් පිරිවරන ලද ජීවිතෙන්ද්‍රිය සමග බැඳී ඇති මේ චක්ෂුඃප්‍රසාදය 'උකුණුහිසක් පමණ යයි දක්වා ඇත්තේය.

කන්බිලය තුල-කන්අඩියේ රබන් ඇසක ආකාරයෙන් පිහිටි සිවියකට සම්බන්ධව සිහින් තඹවන් රෝමයෙන් - ගැවසුනු ඇඟිල් ලක ලන කුඩා මුදුවක ආකාරයෙන් ශෝත්‍ර ප්‍රසාදය පිහිටා ඇත් තේය. මහාභූතයින්ගේ උපකාරද වර්ණ-ගන්ධ--රස-ඕජාවන් ගේ පිරිවැරීම්ද චිත්ත-ඍතු-ආහාරයන්ගේ රැකුල්ද ලැබ ජීවි-තෙන්ද්‍රිය සමග බැඳී පවත්නා මේ ශ්‍රෝත්‍ර ප්‍රසාදය ගිය ජාතියේ ශබ්ද කාම තෘෂ්ණාව නිදාන කොට ඇති කුශල චේතනාවකින් උපන් බව දතයුතුයි.

ඝ්‍රාණ ප්‍රසාදය වනාහි: නාසිකාව මුල (ඝ්‍රාණ බිලය තුළ) එළු කුහරයකට බඳු සටහන් ඇති ඝ්‍රාණ විඤ්ඤාණයට ආධාර වෙමින් පවත්නා ගිය ජාතියේ ''ගන්ධ කාම තෘෂ්ණාව'' නිදාන කොට ඇති කාමාවචර කුශල බලයෙන් උපන් මහාභූතයන්ගේ ප්‍රසන්න තාවයයි.

"දිව" යයි හඳුන්වනු ලබන රූප ධාතුව මධ්‍යයෙහි නිලුපුල් පෙත්තක ආකාරයෙන් ඉතා මොලොක්ව පවත්නා ස්ථානය "ජිව්හා ප්‍රසාදය" වෙයි. සතර මහාභූත වර්ණ-ගන්ධ-රස-ඕජා චිත්ත-ඍතු-ආහාර ජීවිතෙන්ද්‍රිය යන මේවායින් සම්පූර්ණව පෙර ජාතියේ පැවති "රසකාම තෘෂ්ණාව" නිදාන කොට ඇති කර්මයෙන් ජිව්හා ප්‍රසාදය උපන්නේ වෙයි.

කාය ප්‍රසාදය වනාහි: බඩගින්න තිබෙන ස්ථානය නිය අග ලොම් අග; කෙස් අග; වියලි සිවිය ආදී ස්ථාන හැර සියලු ශරීර යෙහිම පැතිර පවතී. සම්, මස්, ඇට, නහර, ආදී අභ්‍යන්තර ශරීරගත ධාතුන්හිද මේ කාය ප්‍රසාදය පැතිර පවතී. කැපුම්-

කෙටුම්-විදුම් පිලිස්සීම් ආදී බාහිර උපක්‍රමයකින් තුවාල වූ ශරීරයේ රිදීමක් ඇතිවන්නේ සියලු තැන්හිම කාය ප්‍රසාදය ඇති හෙයිනි. පඨවි ආදී මහාභූතයන්ගෙන් සෑදුනු මේ ශරීරයෙහි ඇති මේ කාය ප්‍රසාදය නම් මහාභූතයන්ගේ ප්‍රසන්නතාවයි. යම් ජාතියේ ‘ස්පර්ශකාමි තෘෂ්ණාව’ නිදාන කොට ඇති කාමාවචර කුශලය-කින් ඇතිවූ කායප්‍රසාදය ‘‘කපු පුලුන් තට්ටු සමූහයක් මත වත් කළ තලතෙල දූලුන් තට්ටු හැම තැනම පැතිර යන්නාසේ’’ ශරීරයෙහි විහිදී ඇති බව දතයුතුයි.

卐

## චක්ෂුඃප්‍රසාදය ආශ්‍රය කර ගෙණ පහළවන සිත් 46 ක් වෙත්. ඒ මෙසේයි.

### අහෙතුක 10

| | | | | |
|---|---|---|---|---|
| උපෙක්ඛා | සහගත | කුසලවිපාක | චක්ඛුවිඤ්ඤාණං | |
| ,, | ,, | ,, | සම්පටිච්ඡනං | |
| ,, | ,, | ,, | සන්තීරණං | |
| සොමනස්ස | සහගත | ,, | සන්තීරණං | |
| උපෙක්ඛා | සහගත | අකුසලවිපාක | චක්ඛුවිඤ්ඤාණං | |
| ,, | ,, | ,, | සම්පටිච්ඡනං | |
| ,, | ,, | ,, | සන්තීරණං | |
| උපෙක්ඛා | සහගත | පඤ්චද්වාරාවජ්ජනං | | (ක්‍රියා) |
| ,, | ,, | මනොද්වාරාවජ්ජනං | | ,, |
| සොමනස්ස | සහගත | හසිතුප්පාදං | | ,, |

### සහෙතුක 36

| | | | |
|---|---|---|---|
| කාමාවචර | කුසල් සිත් | 8 | |
| එම | ක්‍රියා සිත් | 8 | |
| එම | විපාක සිත් | 8 | (තදාලම්බන) |
| එම | අකුසල්සිත් | 12 | |

චක්ෂුඃ ප්‍රසාදයෙහි රූපාරම්මණ හැපුනුකල මෙකී සිත් 46 පුද්ගල පරිදි යෙදෙන බව සැලකිය යුතුයි.

ශ්‍රොත්‍රප්‍රසාදය-ඝ්‍රාණප්‍රසාදය-ජිව්හාප්‍රසාදය කායප්‍රසාදය යන ප්‍රසාදයන් ඇසුරු කොටද මෙසේම සිත් 46 බැගින් පහළ වෙත්. චක්ෂුඃප්‍රසාදයෙහි මෙන්ද අහේතුක කුසල විපාක හා අකුසල විපාක චක්ඛුවිඤ්ඤාණ දෙක වෙනුවට සොත විඤ්ඤාණ-ඝාණ විඤ්ඤාණ ජිව්හාවිඤ්ඤාණ-කායවිඤ්ඤාණ යන මේ විඤ්ඤාණයෝ දෙදෙන බැගින් යොදාගතයුතු බව පමණක් මෙහි ඇති විශේෂය බවද දතයුතුයි

අනූනව වැදෑරුම් සිත් අතුරෙන් "අහේතුක කුසල විපාක හා අකුසල විපාක සම්පටිච්ඡන දෙකද පඤ්චද්වාරාවජ්ජන සිතද යන සිත් තුන මනොධාතු නම් වේ. මේ සිත් තුනද, ද්විපඤ්ච-විඤ්ඤාණ දශයද හැර ඉතිරි සිත් 76 මනොවිඤ්ඤාණ ධාතු නම්වේ. මේ මනොධාතු මනොවිඤ්ඤාණ ධාතූන්ගේ නිශ්‍රය ස්ථානය හෘදය වස්තුවයි.

### අවිද්‍යාව දුරුවීමට පරමාර්ථය දතයුතුය.

සිතින් කරණ වැඩ

කාමාවචර-රූපාවචරාදි භූමි ප්‍රභේදගත වූ යථොක්ත සිත් 89 න් වැඩ 14 ක් (කෘත්‍ය තුදුසක්) කරණ බව දතයුතුයි.

"පටිසන්ධි-භවඞ්ග-ආවජ්ජන දස්සන-සවන-ඝායන-සායන ඵුසන-සම්පටිච්ඡන-සන්තීරණ-වොට්ඨපන-ජවන-තදාලම්බන-චුති වසෙන චුද්දසවිධානි භවන්ති" යනුවෙන් එය විස්තර කොට ඇත.

කායශාලයක කම්කරුවන් 89 දෙනෙකු එක්ව කරණ කර්මාන්ත 14 ක් මෙන් කුශල-අකුශල=අව්‍යාකෘත වශයෙන් වූ සිත් 89 න් ප්‍රතිසන්ධිකෘත්‍ය-ආවර්ජන කෘත්‍ය ආදී වශයෙන් කෘත්‍ය තුදුසක් (14) ක් ඇති බව දතයුතුයි. 89 වැදෑරුම් සිත් අතුරෙන් "ප්‍රතිසන්ධිකෘත්‍ය" සිදුකරන සිත් 19 ක් වෙයි. මෙහි ප්‍රතිසන්ධිය නම් අතීත-වර්තමාන යන භවදෙකක අතරයි. අතීත භවයේ අවසාන සිත සමගම අතරක් නොමැතිලෙස වර්තමාන භවයේ මුලින් ඇතිවන සිත ප්‍රතිසන්ධි සිත නම්වේ. අතීත වර්තමාන භව දෙක එකට ගැළපීම් වශයෙන් උපදනා නිසා මේ සිත ප්‍රතිසන්ධි සිත යන නම ලබයි. මේ සිත නිසා 'සත්වයා උපන්නේ''ය. අලුත් භවයකට පැමිණියේය ආදී වශයෙන් ව්‍යවහාර කරණු ලැබේ.

මෙකී ප්‍රතිසන්ධි සිතට අනුකූලව-එනම් අනතුරුව අතරක් නොමැතිව "භවඞ්ග සිත" පහළවේ. භවඞ්ග චිත්ත පරම්පරාව ප්‍රතිසන්ධි සිතට අනතුරුව හෘදය වස්තු නොශය සම්පූර්ණ වනතුරු එනම්-තෙමසක් පමණ වනතුරු-පැවති ඉන්පසු ක්‍රමයෙන් මේ භවය පිළිබඳ "ආවර්ජනාදී චිත්ත පරම්පරා" ඇති වන්ට පටන්ගනී. චක්ෂුරාදී ප්‍රසාද රූපයන්හි රූපාදී අරමුණු නිසා චක්ෂුර්විඥානාදී "වීථි සිත්" ඇති නොවන සෑම අවස්ථාවකදීම සත්වයාට ඇතිවන්නේ භවඞ්ග සිත් ය. ප්‍රතිසන්ධියෙන් ආරම්භ වූ චිත්ත පරම්පරාව නොසිඳී පැවැත්මට විශේෂ ආධාර වන්නේ භවඞ්ග සිත් බවද භවඞ්ග චිත්ත පරම්පරාවක් නොමැති නම් වීථි සිත් නොපහළවන බවද සැලකිය යුතුය. ප්‍රතිසන්ධි කෘත්‍යය හා භවඞ්ග කෘත්‍යය සිදුවන්නේ යට චිත්ත ඛණ්ඩයෙහි දැක්වූ "අහේතුක අකුසල විපාක උපෙක්ඛා සහගත සන්තීරණය "කුසලවිපාක අහේතුක උපෙක්ඛා සහගත සන්තීරණය සහේතුක කාමාවචර විපාක සිත් අටය. රූපාවචර විපාකසිත් පසය; අරූපාවචර විපාක සිත් පසය" යන (1+1+8+5+4=19) එකුන්විසි සිත් වලින් බව දතයුතුයි.

එපමණක්ද නොවේ. ප්‍රතිසන්ධි චිත්තයෙන් පටන් ගත් නාම ජීවිත-රූප ජීවිත ඉන්ද්‍රිය පරම්පරාව භවඞ්ග චිත්ත පරම්පරාවෙන් පවත්වා නොනැසී අවසානයේ යෙදෙන චුති චිත්තයෙන් මේ භවය සිඳෙන බවද ඒ 'ච්‍යුති කෘත්‍යය සිදුවන්නේත් මේ සිත් 19න් බවද දතයුතුය."

ආවර්ජන කෘත්‍යය: කරන සිත් දෙකකි. එනම් පඤ්චද්වාරාවර්ජනය හා මනෝද්වාරාවර්ජනයයි. එය අහේතුක ක්‍රියා සිත් දෙකකි. මකුළුවා විසින් බඳිනලද දැලක සතෙකු පැටලුන කල දැල සෙලවෙයි. එවිට මකුළුවා "මේ සෙලවීම කොයි පැත්තකින් වීද"යි පරීක්ෂාකර බලයි. එමෙන්ම පඤ්චද්වාරයෙහි හෝ මනෝද්වාරයෙහි මුනගැසුනු අරමුණ කෙබඳු එකක්දැයි සලකා බලන්නේ මේ සිත් දෙකිනි.

දර්ශන කෘත්‍යය කරණ සිත් දෙකකි. එනම් අකුසලවිපාක කුසලවිපාක අහේතුක චක්ඛු විඤ්ඤාණ සිත් දෙකයි. "ඇසින් රූපය දැකීය. මම රූපය දුටිමි. ආදී වශයෙන් කියන්නේ මේ චක්ඛුවිඤ්ඤාණය උපන් විටය. රූප දකින සත්වයෙක් හෝ පුද්ගලයෙක් නැත. රූපය දකින්නේ චක්ඛුවිඤ්ඤාණයෙහි

කෙරෙති. මෙසේම අකුසල විපාක–කුසල විපාක අහේතුක සෝත විඤ්ඤාණ-ඝාණ විඤ්ඤාණ-ජිව්හා විඤ්ඤාණ–කාය විඤ්ඤාණ යන සතර ශ්‍රවණ කෘත්‍යය–ඝායන කෘත්‍යය – සායන කෘත්‍යය – ස්පර්ශ-න කෘත්‍යය යන කෘත්‍ය සතර සිදුකෙරෙයි.

රූපාදී අරමුණු පිළිගන්නක් මෙන් උපදින කුසල හා අකුසල විපාක අහේතුක සම්පටිච්ඡන සිත් දෙකෙන් සම්පටිච්ඡන කෘත්‍යය සිදුකෙරෙයි. එබඳුවූම සන්තීරණ සිත් තුනෙන් අරමුණ තීරණය කරන්නක් මෙන් සන්තීරණ කෘත්‍ය සිදුකෙරෙයි. මෙසේම අරමුණ ව්‍යවස්ථාපනය කරන්නක් වැනිව (වෙන් වෙන් කොට බලන්නක් වැනිව) උපදනා ''අහේතුක මනොද්වාරාවර්ජන ක්‍රියා සිතින් වොට්ඨපන කෘත්‍යය කරයි.

අකුසල සිත් දොළොස; කාමාවචර කුසල හා ක්‍රියා සිත් සොළස රූපාවචර කුසල හා ක්‍රියා සිත් දසය) අරූපාවචර කුසල හා ක්‍රියා සිත් අට; ලොකොත්තර සිත් අට; සොමනස්සසහගත හසිතුප්පාද යන සිත් පණස්පහ 'ජවනකෘත්‍යය' සිදුකරයි.

卐

කාමාවචර මහා විපාක අට; සන්තීරණ තුන යන සිත්
එකොළසින් තදාලම්බන කෘත්‍ය සිදුවෙයි.

අවිද්‍යාව නිසා මෙකී චිත්ත වාරය නොවැටහෙයි.

**සිතේ විචිත්‍රතම** ලොව ඉතාම ආශ්චර්‍ය්‍ය වස්තුව නම් 'සිත' ය ලෝකය විචිත්‍ර වන්නේද සිතේ විචිත්‍රකම නිසාය. සවිඤ්ඤාණක සත්ත්වයන් පිළිබඳව සිත ඇතත් ස්වකීය හෝ පරකීය (අනුන් පිළිබඳ) සිත දකිනු නො හැකි නිසා සිතේ ආශ්චර්‍ය්‍යකම තව තවත් ප්‍රකට වෙයි. තමාගේ මුහුණ තමාට නොපෙනෙන්නාසේ සිතද කිසිවෙකුට නොදක්ක හැකිය. ප්‍රත්‍යක්ෂ වශයෙන් දැකියහැකි දෙයම ඇතැයිද අප්‍රත්‍යක්ෂ දෙය පිළිබඳ විශ්වාසය නොතැබිය හැකැයිද පවසන නවීන විද්‍යාඥයෝද අප්‍රත්‍යක්ෂ 'සිත' ඇති බව පිළිගණිති. එහෙත් ආත්ම වඤ්චනය. පුද පූජා ඩවිල්ල ආදී වශයෙන් සිත පිළිබඳ අද්භූත විවරණද කරති. ආකාශයේ හැසිරෙන ග්‍රහනක්ෂත්‍රාදීන්ගේද ප්‍රතිරූප පවා ගැණීමට හැකි යන්ත්‍රද; හැතැප්ම් දහස් ගණින් ඈත තිබෙන දෙය දැකීමේ ශක්තිය ඇති 'දුරේක්ෂ' වැනි ඡායාරූප

යන්ත්‍රද නිපදවා ඇතත් සිත පිළිබඳ ප්‍රතිරූප ගැණීමට හැකි කිසිම යන්ත්‍රාදියක් නිපදවා නැත. එබඳු දෙයක් කිසිකලෙක නිපදවනු නොහැකියි. තිරිසනා-මිනිසා-දෙවියා-බ්‍රහ්මයා ආදී සත්ත්ව නිකාය යන් ලොව ඇත්තේද සිතේ ඇති විචිත්‍රකම නිසාය.

ලොව්තුරා බුදුබව; පසේබුදුබව; රහත්බව ආදී තත්ත්වයට පත්වූ උතුමෝද මනුෂ්‍යත්වයෙන්ම ඉපදී චිත්තබලය දියුණුකර ගත්තාහු වෙති. සියල්ල දත් තථාගත සම්‍යක් සම්බුද්ධ සර්වඥ රාජෝත්තමයාණන් වහන්සේ විසින් වදාළ දෙසාලිස් දහසක් පමණ ධර්මස්කන්ධයන්ගෙන් යුත් අභිධර්ම පිටකයේ, ඇත්තේ "මෙබඳු විචිත්‍රතම සිතේ" ඇති තත්ත්වයයි. මෙබඳු සුළු දහම් පොතකින් එය කෙසේ පවසමුද? ලොව කිසිම පඬුවෙකුට අවිෂය වූ මනෝවිද්‍යාව පිළිබඳව නියම තත්වය අවබෝධ කළ තථාගත යන් වහන්සේ "වීථිචිත්ත" ක්‍රමයෙන් සත්වයන්ගේ චිත්ත පරම්පරාවක් ඇතිවන අයුරු වදාරා ඇත.

මේ භවයේ මුල්සිත ප්‍රතිසන්ධි නම්වේ. භවයේ අවසාන සිත "චුති" නම්වේ. ඒ සිත් දෙක ඒ අවස්ථා දෙකේදී පමණක් පහළවේ. ඒ අතර පවත්නා චිත්ත පරම්පරාව 'භවඞ්ග' නමි. එහෙත් භවඞ්ග නමින් දක්වන්නේ අරමුණ නොගන්නා චිත්ත පරම්පරාවයි. එහිදී අරමුණු අතීතවූ කර්ම-කර්මනිමිති-ගතිනිමිති යන මෙයින් සකස්වේ. සිතක් ඇතිවන්නේ අරමුණක් අනුවයි. අරමුණ නම් සිතට හමුවන සිතක් ඉපදීමට හේතුවන දෙයයි. පටිසන්ධි-චුති යන සිත්වල අරමුණුද භවඞ්ග සිතේ අරමුණම සමාන වූවක් වෙයි.

**සිත් උපදනා ක්‍රමය**

චක්ඛු-සෝත-ඝාණ-ජිව්හා-කාය- යන ප්‍රසාද රූපයන් ආශ්‍රය කොට ගෙණ විඤ්ඤාණ පරම්පරා උපදින බව මුලින් දක්වා ඇත. මේ ප්‍රසාද රූපයන්ට රූප- සද්ද-ගන්ධ- රස පොට්ඨබ්බ යන 'අරමුණු' ලැබීමෙන් චක්ඛුවිඤ්ඤාණ-සෝත විඤ්ඤාණ-ඝාණවිඤ්ඤාණ- ජිව්හාවිඤ්ඤාණ-කාය විඤ්ඤාණ යන විඤ්ඤාණයන් (සිත්) පහළ වන බව දතයුතුයි (චක්ෂුරාදී යටකී පඤ්චේන්ද්‍රියයන් ඇසුරු කොට චක්ඛුවිඤ්ඤාදී පඤ්චවිඤ්ඤාණ සිත් පහළ වීමටපෙර මනෝධාතූන් පහළවන බවද දතයුතුයි) එසේම පඤ්චද්වාරයන් ගෙන් ගත් අරමුණු නැවත නැවත මනෝද්වාර යෙන් ගැණීමේදීද මනෝවිඤ්ඤාණ උපදනා බව දතයුතුයි.

ඇසට රූපයක් මුණගැසුනායයි සලකමු. මෙහි ඇස නම් චක්ෂුඃ ප්‍රසාදයයි. රූපය නම් රූපායතනය හෙවත් රූපච්ඡායාවයි. ඇසට හමුවන්නේ රූපය මිස ශබ්ද-ගන්ධ ආදියක් නොවේ, එහිදී භවඞ්ග සිත සැලෙයි. වර්තමානික අරමුණක් නොමැතිව අතීතවූ කර්මාදියක එල්බ සිටි භවඞ්ගසිත සැලීමේදී අතීතභවඞ්ග-භවඞ්ග චලන භවංගුපච්ඡේද නමින් සිත් තුනක් පහළව නිරුද්ධවෙයි. ඉක්බිති පඤ්චද්වාරාවර්ජන සිත ඉපදී නිරුද්ධවෙයි. භවඞ්ග සිත බිඳීමට හේතුවූ අරමුණ කුමක්දැයි මෙනෙහි කරමින් උපදනා මේ සිතින් භවඞ්ග සිත් අරමුණ වෙනස් කොට වර්තමාන භවය පිළිබඳ චිත්ත පරම්පරාවකට සිත ආවර්තනය කරයි.(කරකවයි.)මේ සිත අහේතුක වූ ක්‍රියා සිතක් බව දතයුතුයි. අනතුරුව එම රූපාරම්මණයම ඇසුරු කොට චක්ඛුවිඤ්ඤාණ සිත ඉපද නිරුද්ධවෙයි. මෙය අහේතුක විපාක සිතක්ය. අරමුණු ඉෂ්ටවූවක් නම් අහේතුක කුසල විපාක ''චක්ඛුවිඤ්ඤාණයද'' අනිෂ්ට අරමුණක් නම් අකුසල විපාක අහේතුක '' චක්ඛුවිඤ්ඤාණයද'' ඉපදී නිරුද්ධ වෙයි. චක්ඛුවිඤ්ඤාණ යනු ඇස නිසා, ඇසෙහි හටගත් විඤ්ඤාණය යන අර්ථ සහිතයි.

''රූපය දකිමි'' යයි සම්මුති ව්‍යවහාරයෙහි යෙදෙන්නේ මේ චක්ඛුවිඤ්ඤාණයටය. මිථ්‍යාදෘෂ්ටිහු මෙයට ආත්ම යයි කියත්, තෝ ඇසින් රූපය දකුව, රූපය තෝ ඇසෙහි හැපෙව! ආදි වශයෙන් කිසිවෙකුගේ නියමයක් හෝ මෙහෙයවීමක් මෙහිදී සිදු නොවෙයි. ඇසෙහි ප්‍රසාද රූපයත්, බාහර රූපයේ වර්ණයත්, ආලෝකයත් යන ප්‍රත්‍යයන්ගේ සංයෝගයද, පඤ්චද්වාරවර්ජන සිතින් යෙදෙන අනන්තර ප්‍රත්‍යයද නිසා ඇතිවන චක්ඛුවිඤ්ඤාණය විනා මෙහි රූප දකින සත්වයෙක් හෝ පුද්ගලයෙක් නැත. එසේම සිරුර තුළ පවත්නා අභ්‍යන්තර බල විශේෂයකින් රූපය දකිනවා නොවේ.

> ''බෙර ඇසකට කෝටුවකින් ගැසීමේදී ශබ්දයක් නැගෙයි මේ ශබ්දය බෙර ඇසේ තිබී පැන නගින්නක්ද? කෝටුවෙන් නගින ශබ්දයක්ද? නැතහොත් සංඝාතය තුළින් එන ශබ්දයක්ද? මේ සියල්ලට නැත යනු පිළිතුර වෙයි.''

මේ තිදෙනාගේම සංයෝගයෙන් ශබ්දය උපදී යනු විවරණය කළයුතු. එමෙන්ම චක්ෂුඃප්‍රසාද-වර්ණායතන දෙදෙනාගේ සංයෝගය නිසා චක්ඛුවිඤ්ඤාණය පහළ වනු විනා හුදු ප්‍රසාද රූපය හෝ වර්ණායතනය නිසා හෝ චක්ඛුවිඤ්ඤාණය පහළ නොවන බව දතයුතුයි.

එකවරම රූපායතනය දක්ක යුත්තේ චක්ඛුවිඤ්ඤාණයෙන් වුවද හදවත ඇසුරු කොට පවත්නා භවඞ්ග-ආවජ්ජන යන සිත් මුලින් ඇතිවූයේ හෘදයවස්තුවේද චක්ෂුඃ ප්‍රසාදයේද ඇති ඒකාබද්ධභාවය නිසයි. එයට උපමා වශයෙන් "එක බෙර ඇසක ඇති සකුරු පිඩක මැස්සෙකු රස විඳිනකල අනික් බෙර ඇසට යමකින් ගැසුවොත් මැස්සාට ගැසූ පහරක් මෙන් සලකා ඌ ඉගිල යන්නාක් මෙනැ"යි දක්වා ඇත. රූපායතනයේ වර්ණය පමණක් නොව සතරැස්-දිගටි-වටකුරු ආදි සටහන්ද චක්ඛුවිඤ්ඤාණයෙන් දකින බව දතයුතුයි එසේම බොහොමයක් රූප එකවිට දකින්ට හැකිවීමද, රූපායතනය ප්‍රසාදය කරා නො පැමිණම (සිටි තැන සිටිය දීම, දුර තිබෙන දෙය දුර තිබියදීම;) අරමුණු වන බව දක්වත්. ශබ්දයද එසේ සොතද්වාරය කරා නොපැමිණ ඇත තිබියදීම අරමුණු වන බවද ගන්ධ-රස-ඵොට්ඨබ්බ යන ආයතනයන් ප්‍රසාදයන් කරා පැමිණම අරමුණුවන බව ද වැඩිදුරටත් සඳහන්ව ඇත.

චක්ඛුවිඤ්ඤාණය ඉපදී නිරුද්ධවත්ම සම්පටිච්ඡන චිත්තය ඉපදී චක්ඛුවිඤ්ඤාණයෙන් ගත් අරමුණ පිළිගනියි. මෙයද කුශල විපාකවූ හෝ අකුසල විපාකවූ හෝ අහේතුක සිතකි. අරමුණ ඉෂ්ට නම් කුශල විපාකවූද, අනිෂ්ට නම් අකුශල විපාකවූද සම්පටිච්ඡනය පහළ වන බව දතයුතුයි. එය නිරුද්ධ වනකල අරමුණ විමසන්නාක් මෙන් උපදනා සන්තීරණ සිත ඉපදී නිරුද්ධ වෙයි. මෙයින් අරමුණ නිසිසේ විමසා දතගණී ඉෂ්ට අරමුණක් නම් කුශලවිපාකවූද අනිෂ්ට අරමුණක් නම් අකුසල විපාකවූද සන්තීරණය පහළවෙයි. එපමණකින් රූපාරම්මණයේ චිත්තපරම්පරාව නිරුද්ධ නොවේ. අනතුරුව රූපාරම්මණය ලොකු-කුඩා-දුර-ලඟ-හීන-ප්‍රණීත ආදී ප්‍රභේද වශයෙන් නිශ්චයට පැමිණෙන වොට්ඨපන සිත ඉපදී නිරුද්ධවෙයි. මේ වොට්ඨපනය නම් අරමුණ යොනිසොමනසිකාර වශයෙන් හෝ අයොනිසොමනසිකාර වශයෙන් හෝ ගන්නා මනොද්වාරාවර්ජන සිතය. මෙසේ අතීත භවඞ්ග-භවඞ්ග චලන-භවංගුපච්ඡේද පඤ්චද්වාරාවජ්ජන-චක්ඛුවිඤ්ඤාණ- සම්පටිච්ඡන=සන්තීරණ-වොට්ඨපන යන විථි සිත් අට පිළිවෙළින් ඉපද නිරුද්ධවීමත් සමගම කාමාවචර ජවන් සිත් 29 න් එකක් සත් වරක් ජවන

නමින් ඉපද රූපාරම්මණයේ රස අනුභව කරයි. මේ ජවනයද වොට්ඨපන සඞ්ඛ්‍යාත මනොද්වාරාවජ්ජන සිතට අනුව උපදින්නේය. අයොනිසොමනසිකාරයෙන් ව්‍යවස්ථාපනය කළ අරමුණකට අනතුරුව අකුසල ජවනයක්ද; නුවණින් ව්‍යවස්ථාපන කළේ නම් කුසල ජවනයක්ද; රහතුන් වහන්සේලාට නම් ක්‍රියා ජවනයක්ද ඉපදී නිරුද්ධවනවා ඇත. ජවනයෙන් පසු තදාලම්බන සිත් එකොළසින් එකක් සුදුසු පරිදි ඉපදී ජවනයෙන් ගත් අරමුණෙහි රසය අස්වාදනය කොට සිත භවඞ්ගවනවා ඇත. (මේ එක එක සිතක් පාසා යෙදෙන චෛතසික ගණනක්ද වෙයි. ඒවාද සුදුසු පරිදි යෙදෙන බව දතයුතුයි.)

මේ ක්‍රමයෙන් දක්වූයේ ඉතා ප්‍රකට රූපාරම්මණයක් පිළිබඳව යෙදෙන අතිමහන්තාලම්බන චිත්ත වීථිය පිළිබඳ චිත්ත නියාමයයි. මෙසේ චක්ඛු ප්‍රසාදය ඇසුරු කොට වීථි චිත්ත 15 ක්ද සොත-ඝාණ-ජිව්හා-කාය යන ද්වාරයන් ඇසුරු කොට 15 බැගින්ද පඤ්චද්වාරික චිත්ත වීථි 75 ක් දක්වා තිබේ. පරිත්ත-අප්පණා යනුවෙන් මනොද්වාරික චිත්ත වීථිද දක්වා ඇත. චිත්ත වීථි පිළිබඳ මෙබඳු සුළු ග්‍රන්ථයකින් නියම විස්තරය නොකට හැකිය.

උපදින ක්ෂණය-පවත්නා ක්ෂණය-බිඳෙන ක්ෂණය යනුවෙන් කුඩා චිත්තක්ෂණ තුනක් මහා චිත්තක්ෂණයකි. ඒ මහාචිත්ත ක්ෂණ 17 ක් චිත්ත වීථියක ආයු කාලයයි. මෙසේ චිත්තක්ෂණ 17 කින් පසුව සිත භවඞ්ග බවද, මහා චිත්තක්ෂණ 17 ට වඩා චිත්ත වීථියක ආයු නැති බවද චිත්ත නියාමයයි, තවද අසුරු සණක් ගසන කාලයක් තුළ මහා චිත්තක්ෂණ 17 කින් යුත් චිත්ත වීථි ලක්ෂගණනක් ඉපද නිරුද්ධවිය හැකි බවද ධර්මයෙහි දක්වේ.

සට දැක්වූ ආකාරයෙන් චක්‍ෂුඃ ප්‍රසාදයෙහි රූපාරම්මණයක් නිසා යෙදෙන අතිමහන්තාලම්බන චිත්ත වීථිය පිළිබඳ චිත්ත නියාමය මෙසේය.

| | 1 | 2 | 3 | 4 | 5 | 6 | 7 | 8 | 9 | 10 | 11 | 12 | 13 | 14 | 15 | 16 | 17 | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | ත | ල | ඡෙ | පං | ච | සං | සං | වො | ජ | ජ | ජ | ජ | ජ | ජ | ජ | ත | ත | භවඞ්ග |
| භවඞ්ග | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | |

අතීත කර්ම-
කර්ම නිමිති
ගති නිමිති
අතුරෙන්
එකක්
අරමුණු
කරයි.

කාම ජවන් 29 න් එකක්
සත් වරක් උපදී.

ප්‍රත්‍යුත්පන්න රූපායතනයේ එල්බ ගෙණ සිටී.

භ-අතීත භවඞ්ග; න භවඞ්ග චලන; ද-භවංගුපච්ඡේද; ච-චක්ඛු විඤ්ඤාණ, සං-සම්පටිච්ඡන; සං-සන්තීරණ; වො-වොත්ථපන, ජ-ජවන; ත-තදාලම්බන භ-නැවත භවඞ්ග යන ක්‍රමයෙන් චිත්ත වීථිය සෑදෙන්නේය. මේ චිත්තප්‍රවෘත්ති ක්‍රමය මනාසේ ප්‍රකට වීම පිණිස අම්බොපමාවක් දක්වනු ලැබේ.

යම්කිසි පුරුෂයෙක් අඹ ගසක් මුල හිස වසා නිදා ගෙණ සිටිනකල්හි අඹ ගසෙන් ඉදුනු අඹයක් බිම වැටෙයි. ඔහු අඹ නෙටිය බිමහුනු ශබ්දයෙන් පිබිදෙයි. කුමක්දැයි වට පිට බලා අඹය දැක අතින් ගෙණ ඉදුනු බව දැන නැවත නාසයට ලං කොට නිශ්චය වශයෙන්ම ඉදුනු බව තීරණය කොට අඹය අනුභව කෙරෙයි. නැවත තලුනසා කෙළත් සමග ගිල නැවත පෙර පරිද්දෙන්ම හිස වසා නිදා ගණී. මෙහි අඹ ගස කාම සුගතිය මෙන්ද නිද්‍රේ පනත පුරුෂයා කාමාවචර සත්වයා මෙන්ද නිදා ගැණීම මෙන් භවඞ්ග සිතද, ගෙඩිය වැටීම මෙන් පඤ්චද්වාර යට අරමුණක් ලැබීමද, වැටුනේ කුමක්දැයි සැලකීම මෙන් ආවර්ජන සිතද, අඹය දැකීම්මෙන් රූපාරම්මණය චක්ෂුර්විඥාන-යෙන් දැකීමද; අඹය අතින් ගැණීම මෙන් සම්පටිච්ඡන සිතද;. අඹය මිරිකා බැලීමමෙන් සන්තීරණ සිතද; නාසයට සිඹ ඉදුනු බව නිශ්චය කිරීම මෙන් වොත්ථපන සිතද; අඹය අනුභව කිරීම මෙන් ජවන සිත්ද අවසානයේ තලු මරා රස විඳීම මෙන් තදාලම්බනයද; ඉන්පසු නැවතත් හිස වසා නිදා ගැනීම මෙන් භවඞ්ග පාතනයද දතයුතුයි.

**සිතේ චමත්කාර ජනක බව නොපෙනෙන්නේ අවිද්‍යාව නිසයි.**

පූර්වෝක්ත ආකාරයෙන් ඛන්ධ; ධාතු; ආයතන; නාමරූප චිත්ත චෛතසික ආදීන් පිළිබඳ නියම තත්වය නොවැටහීම අවිද්‍යාව බව දතයුතුයි. පරමාර්ථ වශයෙන් අවිද්‍යාව යනු මොහ චෛතසිකයයි. සියලුම අකුසල් සිත්වල යෙදෙන මේ මොහය අන්ධකාරයක් බඳුය අරමුණෙහි නියම තත්වය වසාලයි. රහත් නොවූ සියලුම සත්වයන්ට අනුශය වශයෙන් අවිද්‍යාව පවත්නා බවද දතයුතුයි. එහෙත් සෝවාන් ආදී ආර්ය ශ්‍රාවකයින් කෙරෙහි එක්තරා තත්වයකින් අවිද්‍යාව අඩුබවද පෘථග්ජනයින් කෙරෙහි බහල අන්ධකාරයක් මෙන් අවිද්‍යාව පවත්නා බවද දතයුතුයි.

අවිද්‍යාව විස්තර කරන තථාගතයන් වහන්සේ ධම්මසඞ්ගණී පෙළෙහි මෙසේ වදාරා ඇත.

තත්ථ කතමං අවිජ්ජා සංයොජනං. දුක්ඛෙ අඤ්ඤාණං දුක්ඛ සමුදයෙ අඤ්ඤාණං දුක්ඛ නිරොධෙ අඤ්ඤාණං දුක්ඛ නිරොධගාමිනී පටිපදාය අඤ්ඤාණං පුබ්බන්තෙ අඤ්ඤාණං අපරන්තෙ අඤ්ඤාණං පුබ්බන්තාපරන්තෙ අඤ්ඤාණං ඉදප්පච්ච

යා පටිච්ච සමුප්පන්නෙසු ධම්මෙසු අඤ්ඤාණං යං එවරූපං අඤ්ඤාණං අදස්සනං අනභිසමයො අනනුබොධො අසම්බොධො අප්පටිවෙධො – පෙ – මොහො අකුසල මූලං අයං වුච්චති අවිජ්ජා සඤ්ඤොජනං.

(එහි අවිද්‍යා සංයොජනය කවරේද යත්! දුඃඛ සත්‍යය නොදැනීමය; සමුදය සත්‍යය නොදැනීමය; නිරොධ සත්‍යය නොදැනීමය, මාර්ග සත්‍යය නොදැනීමය; පූර්වාන්ත සඞ්ඛ්‍යාත අතීත ස්කන්ධපස නොදැනීමය; අපරාන්ත සඞ්ඛ්‍යාත අනාගත ස්කන්ධපස නොදැනීමය; පූර්වාන්ත-අපරාන්ත සඞ්ඛ්‍යාත අතීත – අනාගත ස්කන්ධපස නොදැනීම; ඉදප්‍රත්‍යයතාවය හා ප්‍රතීත්‍ය සමුත්පන්න ධර්මයන් නොදැනීමය යන මෙබඳු අඥාන කවක්වේද’ නොදැනීමක්වේද? අවබොධයක් නොවේද; ප්‍රතිවෙධයක් නොවේද; පෙ – මොහ සඞ්ඛ්‍යාත අකුසල මූලයක්වේද; මෝ අවිද්‍යාවයයි කියනු ලැබේ.)

සංස්කාරයන් පිළිබඳ අනිත්‍ය – දුඃඛ – අනාත්ම සඞ්ඛ්‍යාතවූ ත්‍රිලක්ෂණය නිසිසේ නොවැටහෙන්නේද චතුරාර්‍ය සත්‍යය අව-බොධ නොවන්නේද අවිද්‍යාව නිසාය.

සමථ-විපස්සනා යන දෙයාකාර භාවනා බලයෙන් අවිද්‍යාව යටපත්කොට විද්‍යාව උපදවා සොතාපත්ති-සකෘදාගාමි-අනාගාමි යන මාර්ග සිත්වලදී ඇතිවන චතුසත්‍යාවබොධයෙන් විද්‍යාසඞ්ඛ්‍යාත ආලොකය උපදවා අර්හත් මාර්ගඥානයෙන් නිරවශෙෂ වශයෙන් අවිද්‍යාව දුරුකළ යුතු බව දතයුතුයි.

අන්ධාවිය අවිජ්ජා

අවිද්‍යා තොමෝ අන්ධයෙකු වැනිවේ.

අවිද්‍යාව ඇසෙහි පටලයක්ද වැනිය.



ii කොටස

# අවිද්‍යාව ප්‍රත්‍යයවීමෙන් සංස්කාරයෝ පහළවෙත්

ප්‍රථම කොටසෙහි අවිද්‍යාව යනු කුමක්දැයි පැහැදිලි කෙළෙමු. දැන් උගතයුත්තේ "ප්‍රත්‍යය යනු කුමක්ද? එය කි ආකාරද? අවිද්‍යාව සංස්කාරයන්ට ප්‍රත්‍යය වන්නේ කෙසේද?" යන්නයි.

ලොව සියලු දෙයක්ම ඇතිවන්නේ හේතුවකින් බව මුලින් සඳහන් කර ඇත. ප්‍රත්‍යය යන්නෙහි හේතුව; කාරණය; නිදානය යන අර්ථ ඇත්තේය. "අවිද්‍යාව ප්‍රත්‍යය වීමෙන්" යන්නෙහි අවිද්‍යාව උපකාරවීමෙන් යන අර්ථය ඇතුළත්වෙයි. ගොයමක් පැලවීමට ජලය හා පොළොවද පොළොවෙහි ධාතු රසයද ප්‍රත්‍යය වෙයි. උපකාර වෙයි. එමෙන්ම සංස්කාරයන්ගේ පහළවීමට අවිද්‍යාව උපකාරීවෙයි. අවිද්‍යාව කී ආකාරයකින් සංස්කාරයන්ගේ පහළ වීමට හේතුවේද යන්න දතයුතුයි. එය දැනගැණීමට ප්‍රත්‍යය විස්තරය සංක්ෂේපයෙන් වත් උගත යුතුවේ. තථාගතයන් වහන්සේ විසින් "පට්ඨානප්පකරණයෙහි" සුවිසි (24) ප්‍රත්‍යයකතෙක් දේශනා කරණ ලදහ. ඒ මෙසේයි.

"හෙතු පච්චයො; ආරම්මණ පච්චයො; අධිපති පච්චයො; අනන්තර පච්චයො; සමනන්තර පච්චයො; සහජාත පච්චයො; අඤ්ඤමඤ්ඤ පච්චයො; නිස්සය පච්චයො; උපනිස්සය පච්චයො; පුරෙජාත පච්චයො; පච්ඡාජාත පච්චයො; ආසෙවන පච්චයො; කම්ම පච්චයො; විපාක පච්චයො; ආහාර පච්චයො; ඉන්ද්‍රිය පච්චයො; ඣාන පච්චයො; මග්ග පච්චයො; සම්පයුත්ත පච්චයො; විප්පයුත්ත පච්චයො; අත්ථි පච්චයො; නත්ථි පච්චයො; විගත පච්චයො; අවිගත පච්චයො ති."

1 හෙතු පච්චයො: "හේතු" වශ යමකට ප්‍රත්‍යය වේනම් උපකාර වේනම් හේතු ප්‍රත්‍යයයි. හේතු නම් ලොභ - ද්වේෂ - මොහ - අලොභ - අද්වේෂ අමොහ යන සයයි. ලොභ-ද්වේෂ-මොහ හේතු යුක්ත අකුශලයන්ටද අලොභ-අද්වේෂ-අමොහ යන හේතු යුත කුශලයන්ටද "හේතු ප්‍රත්‍යයෙන්" ප්‍රත්‍යයවෙයි. උපකාරවෙයි. ගසක මුල් ගසේ පැවැත්මටද; බීජය ගසක් හටගැණීමටද හේතු වෙයි. එමෙන්ම යම්කිසි දෙයක සථිර පැවැත්මට හා හටගැන්මට මූලික වන දෙය "හේතු" වෙයි.

**2 ආරම්මණ පච්චයො;** දුබල පුරුෂයෙකුට නැගිටීමට හා නොවැටී සිටීමට දණ්ඩක් උපකාර වන්නාසේ චිත්ත – චෛතසික ධර්‍ම යන් ඉපදීමට හා "විථිගත" චිත්ත පරම්පරා පැවතීමටද ආධාර වන රූප–ශබ්ද–ගන්ධ–රස–පොට්ඨබ්බ–ධම්ම යන මේ ආරම්මණ යෝ සදෙන ආරම්මණ ප්‍රත්‍යයෝ නම් වෙති.

**3 අධිපති පච්චයො:** චිත්ත – චෛතසිකයන් කෙරෙහි යම් කිසි ධර්‍මයක් අධිපති භාවයෙන් ක්‍රියා කරයි නම් එය "අධිපති ප්‍රත්‍ය"නම් වේ. ඡන්ද-චිත්ත-විරිය-විමංසා යන ඍද්ධිපාද සතර අධිපති ප්‍රත්‍යයෝ වෙත්. සහජාත–ආරම්මණ යන ක්‍රමයෙන් අධිපත්‍ය ප්‍රත්‍යයන්ගේ ප්‍රභේද දෙකක් වේ.

**4 අනන්තර පච්චයො**
**5 සමනන්තර පච්චයො** චිත්තවිථි ක්‍රමයෙහි පඤ්චද්වාරාවජ්ජනය චක්ඛුවිඤ්ඤාණයටද; චක්ඛු-විඤ්ඤාණය සම්පටිච්ඡනයටද සම්පටිච්ඡනය වොට්ඨපනයටද ආදී වශයෙන් මුලින් මුලින් ඇතිවන සිත් පසුව පසුව ඇතිවන සිත්වලට උපකාර වෙයි. මුල් සිත නිරුද්ධවීම ඊළඟ සිතක් පහළ වීමට ප්‍රත්‍යය වෙයි. රජෙකුගේ අභාවය ඔහුගේ පුත්‍රයාට රාජ්‍යය ලැබීමට හේතුවන්නාක් මෙනි. මෙසේ මුලින් මුලින් නිරුද්ධවන සිත් පසුව පසුව පහළවන සිත්වලට අනන්තර-සමනන්තර යන ප්‍රත්‍යයන්ගෙන් ප්‍රත්‍ය වේ.

**6 සහජාත පච්චයො**
**7 අඤ්ඤමඤ්ඤ පච්චයො** යම් ධර්‍ම කීපයකින් එකක් උපදින කල අනිත් ධර්‍ම ඉපදීමද; නූපදිනොත් නූපදීමද එක්වර ඉපදීමද සිදුවේනම් ඒ ධර්‍ම සහජාත ප්‍රත්‍යයෝ වෙත්. වෙදනා – සඤ්ඤා – සංඛාර – විඤ්ඤාණ යන ධර්‍මයන් එකක් උපදින කල සෙසු තුනද උපදියි. මෙසේවන නාමස්කන්ධ සතරද; මහාභූත සතරද සහජාත ප්‍රත්‍යයෝ වෙත්. මේ සහජාත ප්‍රත්‍යයෝම ඔවුනොවුන්ගේ ඉපැත්මට හා පැවැත්මට ප්‍රත්‍යයවන හෙයින් අඤ්ඤමඤ්ඤ ප්‍රත්‍යයෝද වෙත්.

**8 නිස්සය පච්චයො**
**9 උපනිස්සය පච්චයො** යම් ධර්‍මයක් තවත් ධර්‍මයක පැවැත්මට ආධාර වේනම් ඒ ධර්‍මයෝ උපනිස්සය ප්‍රත්‍යයෝ වෙත්. වෘක්ෂ ලතාවන්ගේ පැවැත්මට පෘථිවිය ආධාර වන්නාසේ අරූපස්කන්ධ – මහාභූත– ආයතන–වස්තුරූප යන මේ ධර්‍මයෝ තත් සම්ප්‍රයුක්ත ධර්‍මයන්ගේ පැවැත්මට නිශ්‍රය වන හෙයින් නිශ්‍රය ප්‍රත්‍යයෝ වෙත්. අතිශ

සින් උපකාරවන ධර්මයෝ උපනිශ්‍රය ප්‍රත්‍යයෝ වෙත්. දානය සීලයට ද; සීලය භාවනාවට ද; භාවනාව විමුක්තියට ද ආදී වශයෙන් මුලින් මුලින් යෙදෙන කුශල ධර්ම හෝ අකුශල ධර්මයෝ පසුව පසුව යෙදෙන කුශලාකුශල ධර්මයන්ට ද විශේෂයෙන් උපකාර වන්නාහ.

**10 පුරෙජාත පච්චයො**
**11 පච්ඡාජාත පච්චයො** චක්ඛු-සොත-ඝාණ-ජිව්හා-කාය යන ආයතනයෝ රූප - සද්ද - ගන්ධ - රස - පොට්ඨබ්බ යන ආරම්මණයන්ද හදය වස්තුව මනොධාතු මනොවිඤ්ඤාණ ධාතූන්ද උපදවන හෙයින් හා මුලින් ඇතිවන චක්ඛායතනාදිය පසුව ඇතිවන චක්ඛුවිඤ්ඤාණාදියට ප්‍රත්‍යයවන හෙයින් ඔව්හු පුරෙජාත ප්‍රත්‍යයෝ වෙත්.

මෙසේම පසුව ඇතිවන චක්ඛුවිඤ්ඤාණාදියට මුලින් ඇති රූපායතනාදිය ආධාර වන හෙයින් පුරෙජාත ප්‍රත්‍යයෝම පච්ඡාජාත ප්‍රත්‍යයෝද වෙත්. නැතහොත් පසුව හටගන්නා චිත්ත චෛතසිකයන්ම පච්ඡාජාත ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යවෙත්.

**12 ආසෙවන පච්චයො:** වරක් පාඩම්කළ දෙය නැවත නැවත පාඩම් කිරීමෙන් බලවත්වේ. එමෙන් මුලින් මුලින් ඇතිවන ජවනයෝ පසුව පසුව ඇතිවන ජවනයන්ට ආසෙවන ප්‍රත්‍යයෙන් උපකාර වෙත්. කුශල - විපාක - ක්‍රියා වශයෙන් තෙවදෑරුම්වූ ජවනයන් ගෙන් මුල් මුල් ජවනයෝ ආසෙවන ප්‍රත්‍යයෝ වෙත්.

**13 කම්ම පච්චයො:**
(කුශල) කුශලා-කුශල සඞ්ඛ්‍යාත කර්මයෝ කර්ම ප්‍රත්‍යයෝ නම්වෙත්. එසිතුදු කුසලා කුසල චිත්තයන්හි ඇතිවන චෙතනාව කර්ම ප්‍රත්‍යයයි. ඒ චෙතනා තොමෝ සම්ප්‍රයුක්ත සිතටද එයින් උපදනා රූපයන්ටද ප්‍රත්‍යය වෙයි. එසේම එකී චෙතනාව මතු භවයන්හි ඇතිවන ප්‍රතිසන්ධි විපාක-ප්‍රවෘත්ති විපාකයන්ටද කර්මජ රූපයන්ටද ප්‍රත්‍යය වෙයි.

**14 විපාක පච්චයො**
(විපාක) කර්මප්‍රත්‍ය සඞ්ඛ්‍යාත කුශලා කුශල චෙතනා හා තත් සම්ප්‍රයුක්ත ධර්මයන් නිසා උපදවන විපාකයෝ විපාක ප්‍රත්‍යයෝ වෙත්.

**15 ආහාර පච්චයො:** කබලීකාර - ඵස්ස - මනො සඤ්චෙතනා විඤ්ඤාණ යන මොව්හු; ඵස්ස චෛතසිකය චෙතනා; චිත්ත යන මේ ධර්මද තත් සම්ප්‍රයුක්ත ධර්මද ඇතිවීමට උපකාර වන හෙයින් ආහාර ප්‍රත්‍යයෝ වෙත්.

**16 ඉන්ද්‍රිය පච්චයො:** ඉත්ථින්ද්‍රිය හා පුරිසින්ද්‍රිය හැර ඉතිරි ඉන්ද්‍රිය ධර්ම විස්ස ඉන්ද්‍රිය ප්‍රත්‍යය නම් වේ. චක්ඛුන්ද්‍රියාදීහු චක්ඛුවිඤ්ඤාණාදීන්ටද රූප ජීවිතින්ද්‍රිය කර්මජ රූපයන්ටද අරූපින්ද්‍රිය තත් සම්ප්‍රයුක්තයන්ටද අධිපති භාවයෙන් ක්‍රියාකරන හෙයින් ඉන්ද්‍රිය ප්‍රත්‍යයෝ නම්වෙත්.

**17 ඣාන පච්චයො:** චිත්ත - චෛතසිකයන් එක් අරමුණක පිහිටුවන්නා පිණිස උපකාරවන විතක්ක - විචාර - පීති - එකග්ගතා - සොමනස්ස - දොමනස්ස - උපෙක්ඛා යන ධ්‍යානාංගයෝ තත් සම්ප්‍රයුක්ත ධර්මයන්ට ධ්‍යාන ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වෙත්.

**18 මග්ග පච්චයො:** සුගති - දුගති - නිබ්බාණ - යන ත්‍රිවිධ ස්ථානයන්ට පත්කරවීමට හේතුවන සම්මාදිට්ඨි ආදී මාර්ගාංග අටද, මිච්ඡාදිට්ඨි - මිච්ඡා සඞ්කප්ප - මිච්ඡාවායාම - මිච්ඡාසමාධි යන දුර්ගති මාර්ගාංග සතරද, තත් සම්ප්‍රයුක්ත ධර්මයන්ට මාර්ගප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වේ. සමුද්‍ර තරණයට නැව ආධාර වන්නාක් මෙනි.

**19 සම්පයුත්ත පච්චයො:** එකුප්පාද - එක නිරොධ - එකාලම්බන එකවත්ථුක වශයෙන්වූ වෙදනා - සඤ්ඤා - සඞ්ඛාර - විඤ්ඤාණ යන නාම ධර්මයෝ සම්ප්‍රයුක්ත ප්‍රත්‍යයෝ වෙත්

**20 විප්පයුත්ත පච්චයො:** රූපි ධර්ම අරූපීන් සමගද අරූපි ධර්ම රූපීන් සමගද එකට පැවතීමක් නැත. එහෙයින් නාම-රූප ධර්මයෝ ඔවුනොවුන්ගෙන් විප්‍රයුක්ත ප්‍රත්‍යයෝ වෙත්.

**21 අත්ථි පච්චයො:** හෙතු - ආරම්මණ - නිස්සය ආදි ප්‍රත්‍යයන්ගේ ඇති බව; විද්‍යමාන බව අස්ති ප්‍රත්‍යය නම් වේ. සතර අරූපස්කන්ධ; මහාභූත; ආයතන; හදයවත්ථු ආදී ධර්මයන් ඇති හෙයින්ම තත් සම්ප්‍රයුක්ත ධර්මයන් උපදින හෙයින් මහාභූතාදීහු අස්ති ප්‍රත්‍යයෝ වෙත්.

**22 නත්ථි පච්චයො:** අනතුරුව උපදින අරූපි ධර්මයන් උපදින්නේ මුලින් මුලින් ඉපදී නිරුද්ධවියන චිත්ත චෛතසිකයන් නිසාය මුලින් නිරුද්ධ වන චිත්ත චෛතසිකයන්ගේ නිරුද්ධිය පසුව උපදින චිත්ත චෛතසිකයන්ට නාස්ති ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වේ.

23 විගත පච්චයො-නත්‍ථි පච්චය මෙනි } විශේෂයෙන්
24 අවිගත පච්චයො-අත්‍ථි පච්චය මෙනි } කිවයුත්තක් නැත.

මේ දක්වූයේ සුවිසි ප්‍රත්‍යයන්ගේ ඉතා ලුහුඬු අදහසකි. "අවිජ්ජා පච්චයා සඞ්ඛාරා" යන්නෙහි අවිද්‍යාව සංස්කාරයන්ට ප්‍රත්‍යයවන්නේ කෙසේද? කී ආකාරයකින්දැයි දතයුතුය. එය නිරවුල්ව දැනගැණීමට "සංස්කාරයෝ" නම් කවරහුදැයි උගතයුතුය.

iii කොටස

## සංස්කාරයෝ නම් කවරහුද?

සංස්කාර යන්නෙහි සංස්කරණයවීම්– එකතුවීම යන අර්ථ දෙකක්ද විද්‍යමානවේ. හේතු ප්‍රත්‍යයන්ගෙන් සංස්කරණයවූ සංඛත ධර්මයන්ටද සංස්කාර යයි කියති. "අද්ධුවා භික්ඛවෙ සඞ්ඛාරා සබ්බෙ සඞ්ඛාරා අනිච්චා" යනාදි තැන්හි සංස්කාර ශබ්දය හේතු ප්‍රත්‍යදෙකින් හටගත් සවිඤ්ඤාණක අවිඤ්ඤාණක සියලුම සංඛත ධර්මයන් සඳහා වදාරණ ලදී. "අවිජ්ජා පච්චයා සඞ්ඛාරා" යන මෙහි සංඛාර (සංස්කාර) ශබ්දය කුශලා'කුශල සඞ්ඛ්‍යාත "කර්මයන්" සඳහා දෙශනා කාරණ ලදි.

සංස්කාරයන්ගේ ප්‍රභෙදවශයෙන් පුණ්‍යාභි සංස්කාර; අපුණ්‍යාභි සංස්කාර; අනෙඤ්ජාභි සංස්කාර; යනුවෙන් ප්‍රධානභෙද තුනක්ද එයම කායසඞ්ඛාර; වචී සඞ්ඛාර; චිත්ත සඞ්ඛාර; සඞ්ඛත සංඛාර; අභිසංඛත සඞ්ඛාර; අභිසඞ්ඛරණක සඞ්ඛාර; පයොගාභි සංඛාර යනුවෙන් අප්‍රධාන ප්‍රභෙදද විභඞ්ගයෙහි දක්වා ඇත්තේය.

එහි පුණ්‍යාභි සංස්කාරයෝ නම් (කුශල කර්ම) කාමාවචර මහා කුසල් සිත් අටේ යෙදෙන කුසල චෙතනාවෝද රූපාවචර කුසල් සිත් පසේ යෙදෙන චෙතනාවෝද යන තෙළෙස්වැදෑරුම් කුසල චෙතනාවෝ වෙති.

අපුණ්‍යාභි සංස්කාරයෝ නම් (අකුසල කර්ම) "සොමනස්ස සහගත දිට්ඨිගත සම්පයුත්ත" ආදී වශයෙන් දක්වන ලද දොළොස් අකුසල් සිත්වල යෙදෙන චෙතනාවෝ වෙති.

ආනෙඤ්ජාභි සංස්කාරයෝ නම් (කුශලකර්ම) අරූපාවචර කුසල් සිත්වල භාවනා වශයෙන් පැවති අරූපාවචර කුසල චෙතනාවෝ වෙති.

අටකී කාමාවචර කුසලචේතනාවෝද; දොළොස් අකුසල චේතනාවෝද (කායද්වාරයෙහි කායික විඥප්තීන්-කාය විඥප්තියෙන් සිදුවන හෙයින්) "කාය සංඛාර" නම් වෙත්. මේ සමවිසි චේතනාවෝම වාග් විඥප්තිය උපදවා වාග්ද්වාරයෙහිද පවතිනා හෙයින් "වචී සංඛාර" නම් වෙයි. අටවැදෑරුම් කුසල චේතනාවෝද දොළොස් අකුසල චේතනාවෝද පස්වැදෑරුම් රූපාවචර කුසල චේතනාවෝද සිවුවැදෑරුම් අරූපාවචර කුසල චේතනාවෝද යන එකුන්තිස් චේතනාවෝ මනොද්වාරයෙහිද පවත්නා හෙයින් "චිත්ත සංඛාර" නම්ද වෙත්.

'අනිච්චා වත සංඛාර – සබ්බෙ සංඛාරා අනිච්චා" ආදී වශයෙන් දක්වන ලද ප්‍රකාරයෙන් සංස්කාරණය වනු ලබන ධර්මයෝ "සඞ්ඛත සංඛාර" නම් වෙත්.

කාම-රූප අරූප-සංඛ්‍යාත වූ ත්‍රෛභූමික රූපාරූප ධර්මයෝ කර්මයෙන් නිපදවනු ලබන හෙයින් ඔව්හු "අභිසංඛත සංඛාර" නම්වෙත්. ත්‍රෛභූමික කුසලා'කුසල චේතනාවෝ අභිසංඛරණක සංඛාරයෝ වෙත්. කායික – චෛතසික වීර්‍ය්‍යය "ප්‍රයෝගාභි සංස්කාර" නම් වේ.

කුසලා'කුසල–ආනෙඤ්ජ සංඛ්‍යාත වූ මේ ත්‍රිවිධ සංස්කාරයන්ගේ පැවැත්ම අවිද්‍යාව නිසා සිදුවේයයි කෙසේ දතයුතුද?

ඛන්ධ – ධාතු – ආයතන – ඉන්ද්‍රිය – බල–බොජ්ඣඞ්ග–නාමරූප ආදීන් නොදත් ලෞකික ජනතෙමේ උත්පත්ති – ජරා – මරණ සංඛ්‍යාත දුඃඛයන්ගෙන් හා රාගාදී ගින්නගේ පිරුණු පඤ්චස්කන්ධය හා කාම-රූප-අරූප සංඛ්‍යාත භවත්‍රයද දුකක් බව නොසලකයි. අවිද්‍යාවෙන් යුක්තවූ ඔහුට ආධ්‍යාත්මක වූද බාහිර වූද ලෝකය සැපයක්–සැප ඇතිතැනක් – ලෙසට වැටහෙයි. "එබඳු සැපය" ලබනු පිණිසද තහවුරු කරගැනීම පිණිසද නොයෙක් ලෙසින් ප්‍රයත්න දරයි. අනුන් තසා හෝ අනුන්ගේ දෙය සොරාගෙණ හෝ අසත්‍ය–වංචාකාර ප්‍රයෝගයන්ගෙන් හෝ "තමාගේ සැපය" දියුණුකර ගැණීමට වෙහෙසෙයි. අන්‍යයන් රෝගීවන සැටිද–අන්‍යයන් ජරාවට පත්වන සැටිද – අනුන් මැරෙන සැටිද දුක දැකත් තමාට එබඳු විපතක් වන බව නොසලකා වස්තුකාම-ක්ලේශ කාම සංඛ්‍යාත තෘෂ්ණාවෙන්ද හරිතව ඉන්ද්‍රියයන් පිණවමින් නානාප්‍රකාර පාපකර්මද කරමින් කල්යවයි. දුකට හේතුව තෘෂ්ණාව බවත් එය මෙහිදීම නිරුද්ධකොට නැවත තූපදනා

පරිදි මේ භවයේදීම නිරෝධය ලැබිය යුතු බවත් නොසලකමින් මතු භවයන්හිදී මෙයටත් වඩා හොඳින් පස්කම්සුව විඳිමේ අභිලාෂයෙන් "භාවනාමී කුශලයන්ද" සිදුකරයි. මේ සියල්ලටම හේතුව අවිද්‍යාවයි.

අවිද්‍යාවෙන් යුක්තවූවෝ මිනිස්ලෝ-දෙව්ලෝ-බඹලෝ ආදී තැන්හි ඇති "විපරිණාම දුඃඛය" නොවැටහීමෙන් සැප ලබන අටියෙන් පින්කරති. ඔහුගේ පින්කිරීම "දෙවඟනන් ලබන අටියෙන් මරු ප්‍රපාතයකට පැනීම මෙනි." පලගැටියාගේ ගින්නට පැනීම මෙනි. කඩුමුවතෙහි ඇති මීපැණි ලෙවීම මෙනි. කාමයන්ගේ අල්පාස්වාදයද පාපවිපාකයද නොසලකමින් අවිද්‍යාවෙන් යුක්තවූවෝ "අසුචි ඇත තවරා කෙළින ළදරුවන් මෙන්; මැරෙන අටියෙන් විෂ කන්නවුන්මෙන්" නානාප්‍රකාර පාපකර්මද කරති. මං මුළාවී යක්‍ෂපුරය කරා යන්නවුන් මෙන් රූපී අරූපී ලෝකයන් සදාකාලිකයයි සලකමින් එහි උපදිනු පිණිස ආනෙඤ්ජාභිසඞ්ඛාර සඞ්ඛ්‍යාත කුසලයන්ද කරයි.

මේ සියල්ලටම හේතුව අවිද්‍යාවයි.

iv කොටස

## අවිද්‍යාව කි ආකාරයකින් සංස්කාරයන්ට ප්‍රත්‍යය වේද?

පච්චයො හොති පුඤ්ඤානං – දුවිධානෙකධා පන
පරෙසං පච්ඡිමානං සො – එකධා පච්චයො මතො

(විභඞ්ගට්ඨකථා)

යට දැක්වූ සුවිසි (24) ප්‍රත්‍යයන් අතුරෙන් ආරම්මණ ප්‍රත්‍යය-උපනිශ්‍රය ප්‍රත්‍යය යන දෙයාකාරයෙන් අවිද්‍යාතොමෝ පුණ්‍යාභි සඞ්ඛාර සංඛ්‍යාත කාමාවචර හා රූපාවචර කුශලයන්ට ප්‍රත්‍යය වන්නීය. ඒ එසේමැයි!

යමෙක් අවිද්‍යාව අනිත්‍ය වශයෙන් මෙනෙහි කරන්නේ නම් ඕහට ඒ අවස්ථාවේ අවිද්‍යාව නිමිති කරගෙණ කාමාවචර කුශල චිත්තවීථියක් උපදී. ඒ චිත්තවීථිය ඉපදීමට අරමුණුවූයේ අවිද්‍යාවයි. එහෙයින් එහිදී ආරම්මණ ප්‍රත්‍යයෙන් කුශලයට ප්‍රත්‍යය වේ.

මෙසේම යම්කිසි අභිඥලාභියෙකු විසින් ලබනලද අභිඥ ඥාණකින් (චෙතොපරිය ඥාණ-දිබ්බ චක්ඛුඥාණ-පුබ්බෙනිවාස ඥාණ ආදී ඥාණයකින්) අනුන්ගේ මොහ සහගත සිතක් හෝ තමාගේ පෙර ජාතියක පැවති මොහ සහගත සිතක් හෝ පරීක්ෂා කරණු ලබන කල එහිදී ඒ පිළිබඳව ඇතිවන "රූපාවචර අභිඥ වීථියට අවිද්‍යාව ආරම්මණ ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යයවේ,"

තවද සියලුම අකුසලයන්ට හා දුකට මුල අවිද්‍යාවයයි සලකා අවිද්‍යාවගේ දෝස් දකින යමෙකු ඒ අවිද්‍යාව නසනු පිණිස දන සීලාදී කුශලයන් සිදුකරණ කල්හිද, රූපාවචර ධ්‍යාන උපදවන කල්හිද; ඒ පිළිබඳ කාමාවචර රූපාවචර කුසල් සිත්වල (කුසල චිත්තවීථිවලට) අවිද්‍යාව උපනිශ්‍රය ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යයවේ.

---

අකුසල සඞ්ඛ්‍යාතවූ අපුඤ්ඤාභිසංඛාරයන්ට සතළොස් ආකාරයකින් (17) අවිද්‍යාව ප්‍රත්‍යය වේ. ඒ මෙසේයි.

> එසාහි අවිජ්ජං ආරබ්භ රාගාදීනං උප්පජ්ජන කාලෙ ආරම්මණ පච්චයෙන; ගරුං කත්වා අස්සා දනකාලෙ ආරම්මණාධිපති ආරම්මණූපනිස්සයෙහි; අවිජ්ජා සම්මූළ්හස්ස අනාදීනව දස්සාවිනො පාණාති පාතාදිනි කරොන්තස්ස උප නිස්සය පච්චයෙන; දුතිය ජවනාදීනං අනන්තර සමනන්තර අනන්තරූප නිස්සය - ආසෙවන- නත්ථි- විගත පච්චයෙහි; යංකිඤ්චි අකුසලං කරොන්තස්ස හෙතු- සහජාත අඤ්ඤ මඤ්ඤ නිස්සය-සම්පයුත්ත – අත්ථි- අවිගත – පච්චයෙහී'ති අනෙකධා පච්චයො හොති.

(විභඞ්ගට්ඨ කථා)

අවිද්‍යාව අරමුණු කොට රාගාදී සිතුවිලි හටගන්නාකල ඒ පිළිබඳ වීථිසිත්වල අවිද්‍යාව ආරම්මණ ප්‍රත්‍ය වශයෙන්ද; එම වීථි සිත්වලම අවිද්‍යාව ගරුකොට සලකා උපදනාකල අරම්මණාධිපති හා ආරම්මණෝපනිස්සය ප්‍රත්‍ය වශයෙන්ද; ප්‍රත්‍යයවේ. තවද විපාකය නොවැටහීමෙන් හා ආදීනව නොසැලකීමෙන් – පස් පව් දස අකුසල් සිදුකරන කල සියලු අකුසල චිත්ත වීථිවලට අවිද්‍යාව උපනිශ්‍රය ප්‍රත්‍ය වශයෙන් උපකාරවේ. එසේම සියලුම අකුසල චිත්ත වීථිවල මුල් ජවන් සිත හැර ඉතිරි ජවන් සිත් සයටම අවිද්‍යාව අනන්තර- සමනන්තර- අනන්තරෝප නිස්සය-ආසෙවන- නත්ථි-විගත- යන ප්‍රත්‍යයන්ගෙන් උපකාරවේ. (මුල් ජවනයට මේ ප්‍රත්‍යයෝ සයදෙන ප්‍රත්‍යය නොවෙති. මේ ප්‍රත්‍යයෝ සයදෙන මුල් ජවනයෙන් පසුවම උපදින ජවනයන්ට ප්‍රත්‍යයවන නිසායි.)

ප්‍රථම ජවනයේ සිට ආදී සිත්වලට අවිද්‍යාව ප්‍රත්‍යයවන්නේ හෙතු-සහජාත- අඤ්ඤමඤ්ඤ- නිශ්‍රය- සම්ප්‍රයුක්ත- අත්ථි- අවිගත යන ප්‍රත්‍යයන්ගෙනි. මෙසේ බලනකල සියලු අකුසල් සිත්වලට අවිද්‍යාව සතළොස් (17) ආකාරයකින් ප්‍රත්‍යය වන බව දක්වයි.

ආනෙඤ්ජාභි සඞ්ඛාර සඞ්ඛ්‍යාත අරූපාවචර කුශලයන්ට අවිද්‍යාව එක් ආකාරයකින් ප්‍රත්‍යයවේ. අවිද්‍යාව නැසීම් යන චේතනා වෙන් අරූපධ්‍යාන උපදවන්නහු පිළිබඳ යෙදෙන චිත්ත වීථියෙහි අවිද්‍යාව උපනිශ්‍රය ප්‍රත්‍ය වශයෙන් උපකාර කරන බව දක්වා ඇත්තේය.

මේ ආකාරයෙන් කුසල්-අකුසල් දෙකටම අවිද්‍යාව ප්‍රත්‍යවන බව අවිජ්ජා පච්චයා සඞ්ඛාරා යන්නෙන් වදාළ බව දතයුතුයි,

මෙහිදී ප්‍රශ්නයක් ඇතිවෙ. එනම්! කුශල් අකුශල් දෙපක්ෂයටම අවිද්‍යාව මුල්වෙයි නම් කුශලා 'කුශල දෙකම අවිද්‍යා සංගතනාම් සාතනබ්බං කුසලං බහුං ආදී වශයෙන් තථාගතයන් වහන්සේ විසින්ම වදාරණ ලද පරිදි කුශල් කිරීම නිෂ්ඵල සහිත නොවේද? අවිද්‍යාවෙන් චතුස්සත්‍යාව බොධය නොවන බවද පින් කිරීමේදීත් අවිද්‍යාව උපනිශ්‍රය වන බවද එහෙයින් පින්කිරීමත් අවිද්‍යාව දියුණු කිරීමක් නොවේද? යන්නයි.

-එය එසේ නොවේය යනු පිළිතුරවේ. අවිද්‍යාව නසා කවදා සංසාර විමුක්තිය ලැබිය හැකිද්දැයි නිශ්චයක් නැත. අවිද්‍යාව නසනතුරු සත්ත්වයා සසර සැරි සැරියයුතුය. එහිදී දුගතිගාමී නොවීමට කුශල් කළ යුතුය යම්දිනක අවිද්‍යාදීන්ගේ නිරවශෙෂ ප්‍රහාණය අතින් මාර්ගඥානයෙන් සිදුවේද ඒතාක් දුගතියෙන් වැළකීමට පින්කළ යුතුය. බුද්ධාගමේ පරමාර්ථය නම් මේ භවයේදීම කෙලශ පරිනිර්වාණය හා ඛන්ධ පරිනිර්වාණය සිදුකළ යුතු බවයි. ඛීණා ජාති වුසිතං බ්‍රහ්ම චරියං කතං කරණීයං නාපරං ඉත්ථත්තාය ආදීන් වදාළ පරිදි මතු භවයක් සඳහා තෘෂ්ණා ප්‍රණිධියක් ඇතිකරවීමට බුදුවරයෝ අනුශාසනා නොකරති. එහෙත් ඒ අනුපාදා පරිනිබ්බාණයද තම තමන්ගේ බුද්ධිවඩින යෙන්ම ලැබිය යුත්තකි.

තවද කිවයුත්තකි. අකුසල් කිරීමේදී අවිද්‍යාව ඒකාන්තයෙන් එයට හේතු වෙයි. වඩුවෙකු තමාටම ගෙයක් සාදා ගන්නාක්මෙනි. කුසල් කිරීමේදී අවිද්‍යාව උපකාරවන්නේ “වඩුවා අන්‍යයෙකුගේ නියමයක් පිට ගෙයක් සාදනකල ගෘහ ස්වාමියා එහි අධිපතියා වීම හා වඩුවා අප්‍රධානවීම” මෙන් උපනිශ්‍රය වශයෙනි.

ඒකාන්ත දුක්විපාකදායකවූ – අනිෂ්ටවූ-මහා සාවද්‍ය කෙලශ මූලයක්වූ මේ අවිද්‍යාව ප්‍රත්‍යයවීමෙන් සුඛ විපාකදායක කාමාවචර-රූපාවචර-අරූපාවචර කුශලයන් හටගැණීම යුක්ති යුක්තද? කෙසේ වන්නේද? යනු තවත් ප්‍රශ්නයෙක් වේ "කොසඹ ඇටය කින් කොසඹ ගසක් විනා උක්ගසක් පැලකරවා ගත හැකිද" යනු වෙන් පරවාදීන් විසින් චෝදනා කරණු ලැබිය හැකිය. එහිදී දියයුතු පිළිතුර මෙය! ඵලය හේතුවටම සමානවිය යුතුය යන ලොක නියමයක් නැත. හේතුවට සමානවූද අසමානවූද ඵල ලෝකයෙහි සම්මුතියෙහිද විද්‍යමානවෙත්.

ගෝ ලෝමයෙන් කුසතණ හටගැණීමද; වී–හාල්–බත්– මිදි තල්මල් –කිතුල්මල් ආදී ද්‍රව්‍යයන්ගේ උපකාරයෙන් මද්‍යපාන සඞ්ඛ්‍යාතවූ අරක්කු-ජින්–බ්‍රැන්ඩි ආදිය උපදවා ගැණීමද;රසවත් කිරෙන් ඇඹුල් රසැති දිකිරි උපදවා ගැණීමද; ගෙරි අං කුඩු දමා සිටීමෙන් සියින් බටනළ වර්ගයක් උපදවා ගැණීමද; සවිඥාණක වස්තූන් අතර කොමලු දෙනක කුසින් ජවසම්පන්න අශවයන් උපදවා ගැණීමද යනාදී වශයෙන් හේතුවට විරුද්ධ ඵලයන්ගේ සම්භවය ලෝකයෙහි සම්මුතිය තුළද විද්‍යමානවන බව දතයුතුය. පරමාර්ථය තුළද මෙබඳු විපරීතතාවයන් ඇති බව දක්වා තිබේ. එනම් මුලින් හටගන්නා සිත දෙවෙනි සිතට සථාන වශයෙන් විරුද්ධවූ අනන්තර ප්‍රත්‍යය වන බවද; කර්ම–රූප දෙදෙනා අතුරෙන් කර්මය නාමයක්ව එයට හාත්පසින් විරුද්ධ රූපයන්ගේ හටගැණීමට විරුද්ධ සවභාවයෙන් ප්‍රත්‍යයවන බවද ඍතු–ආහාර රූපයෝ කෘත්‍යවිරුද්ධවූ ශුද්ධාෂ්ටකයන්ගේ ඉපදීමට ප්‍රත්‍යයවන බවද ආදී කරුණු වෙති. ඒබව

විරුද්ධො චා විරුද්ධො ච–සදිසා'සදිසො තථා
ධම්මානං පච්චයො සිද්ධො–විපාකා එව තෙචන
(විසුද්ධිමග්ග)

(විරුද්ධවූද; අවිරුද්ධවූද; එසේම සදෘශවූද අසදෘශවූද; ධර්මයන්ට ප්‍රත්‍යය සිද්ධවේ. ඒ ප්‍රත්‍යය සමුත්පන්න ධර්මයෝ එම විපාකම නොවෙත්) යනුවෙන් දක්වා ඇත්තේය.

ප්‍රශ්නය: කිම අවිද්‍යාවෙන් පමණක් සංස්කාරයෝ වෙද්ද; සංස්කාරයන්ගේ පැවැත්මට තවත් ප්‍රත්‍යයෝ වෙද්ද?

උත්තරය: "අවිජ්ජා සමුදයා ආසව සමුදයො – තණ්හා සමුදයා ආසව සමුදයො" ආදීන් විභඞ්ගයෙහි ප්‍රත්‍ය සමූහයක් වදාරා ඇත්තේය.

ප්‍ර: එසේනම් මෙහි එක ප්‍රත්‍යයක්ම වදාළේ ඇයි?

උ: තථාගතයන් වහන්සේගේ දෙශනා විලාසය හා වෛනෙය පුද්ගලයන්ගේද අධ්‍යාශය වශයෙනි ගසක් හටගැණීමට ජලය-සෘතු ගුණය-භූමිය-ගොවියා බීජය යන ප්‍රත්‍ය සමූහයක්ම අවශ්‍ය වුවත් "බීජයෙන් ගස හටගණී" යයි කීමමෙනි

මෙසේ හෙයින් ප්‍රධාන හේතුව වන අවිද්‍යාව මුල්කොට ගෙණ සංස්කාරයන් සිදුවන බවද, කුශලා'කුශල සඞ්ඛ්‍යාත සංස්කාරයන් නිසා සසර සැරිසරන බවද දතයුතුය.

1 චුතූපපාතෙ සංසාරෙ-සඞ්ඛාරානඤ්ච ලක්ඛණෙ
යො පටිච්චසමුප්පන්න-ධම්මෙ සුච විමුය්හති

2 අභිසඞ්ඛරොති යො එතෙ-සංඛාරෙ තිවිධෙ යතො
අවිජ්ජා පච්චයො තෙසං-තිවිධානං අයං තතො

3 ඛන්ධානං පටිපාටි-ධාතු ආයතනානිච
අබ්බොච්ඡින්නං වත්තමානං-සංසාරොති පවුච්චති

4 යථාපි නාම ජච්චන්ධො-නරො අපරිනායකො
එකදා යාති මග්ගෙන-උම්මග්ගෙනාපි එකදා

5 සංසාරෙ සංසරං බාලො-තථා අපරිනායකො
කරොති එකදා පුඤ්ඤං -අපුඤ්ඤම්පිච එකදා

6 යදා ච ඤත්වා යො ධම්මං-සච්චානි අභිසමෙස්සති
තදා අවිජ්ජු පසමා-උපසන්තො චරිස්ස ති

(විසුද්ධිමග්ග)

1 යමෙක් චුති උත්පත්ති සඞ්ඛ්‍යාත සංසාරයෙහිද සංස්කාරයන්ගේ ලක්ෂණ කෙරෙහිද ප්‍රතීත්‍ය සමුත්පන්න ධර්මයෙහිද විශෙෂයෙන් මුළාවේද;

2 හෙතෙම ත්‍රිවිධ ස ස්කාරයන් යම් හෙයකින් රැස්කෙරේසි නම් අවිද්‍යා තොමෝ ඔවුනට ප්‍රත්‍යය වන්නීය.

3 ස්කන්ධ-ධාතු-ආයතනයන්ගේ පිළිවෙළද නොසිඳී පැවැත්ම සංසාරයයි කියනු ලැබේ.

4 යම්සේ කනවැල් අල්ලන්නකු නැති ජාත්‍යන්ධයා හුදකලාව මහමඟ යන්නේ සමහර විටක නිසිමඟද සමහර විටක නොමඟද යන්නේය.

එමෙන් සසර සැරි සරන අඥ තෙමේද කල්‍යාණ මිත්‍රයෙකු නොමැත්තේ සම්හර කලක කුසල්ද සම්හර කලක අකුසල්ද කරන්නේය.

6 යම්කලක කල්‍යාණ මිත්‍ර සේවනය ලැබ චතුස්සත්‍ය ප්‍රකාශක ත්‍රිපිටක ධර්මය දැන චතුස්සත්‍යයන් අවබොධ කෙරේද; එකල නසනලද අවිද්‍යාවගේ උපසමයෙන් (සංසිඳීමෙන්) ශාන්තව හැසිරෙන්නේය.

අන්ධස්ස උපක්ඛලනං විය අවිජ්ජා පච්චයා සඞ්ඛාරා අවිද්‍යාවෙන් හටගන්නා සංස්කාරයෝ දුක්ම හේතුවෙන් අන්ධයාගේ පය පැකිලිම මෙනි.

'සංස්කාරයෝ කොෂ්ඨප්‍රදෙශයවෙළන කොෂ්ඨකාර කෘමිහු මෙන්ද වෙත්."



"අවිජ්ජා පච්චයා සඞ්ඛාරා" යන දෙශනා පාඨයෙහි සංක්ෂෙප විභාගයයි.

# 20 පරිච්ඡේදය

# සංඛාර පච්චයා විඤ්ඤාණං

## (1 කොටස)

### සංස්කාර ප්‍රත්‍යයෙන් විඥානය වේ.

කාමාවචර-රූපාවචර-අරූපාවචර යන කුසල් සිත්වලද දොළොස් අකුසල් සිත්වලද යෙදෙන "චෙතනාව" සංසකාර නමැයි යට පරිච්ඡේදයෙහි දක්වනලදී. "චෙතනාහං භික්ඛවෙ කම්මං වදාමි" යනුවෙන් තථාගතයන් වහන්සේ විසින් වදාරන ලද්දේ සංසකාර සඞ්ඛ්‍යාත මේ චෙතනාව ම "කර්‍ම" යන නමද ලබන බවයි. "විඤ්ඤාණං" යන්නෙන් වදාරන ලද්දේ සංසකාර සඞ්ඛ්‍යාත කර්‍ම යෙන් ඵල සඞ්ඛ්‍යාත ප්‍රතිසන්ධිවිඥාන ප්‍රවෘත්ති විඥාන යන විපාකයන් ඇතිවන බවය.

අවිද්‍යා ප්‍රත්‍යයෙන් කුශලා කුශලයන් සිදුවීමද කුශලා කුශල යන්නෙන් විපාක ලැබීමද යන ඉගැන්වීම මෙහිදී දත යුතුය. සංස්කාරයෝ නම් කර්‍මයෝය. විඤ්ඤාණ නම් විපාකයෝය. මෙහි අවිද්‍යා සංස්කාර දෙක අතීතයෙහිය. විඤ්ඤාණය වර්‍ත මාන යෙහිය. වර්‍ෂා ජලය – සෘතු ගුණය ආදී අප්‍රධාන කරුණුද ප්‍රත්‍යය වෙතත් ගසක් හට ගැනීමට ප්‍රධාන ප්‍රත්‍යය වන්නේ "බීජය"යි බීජයෙන් ගස නිපදවන අතර ජලය සෘතුගුණය ආදියෙන් ගස ආරක්ෂා කරයි. එසේම ඇතැම් ප්‍රත්‍යයෝ නාම රූප ධර්‍මයන්ගේ පැවැත්මටද ඇතැම් ප්‍රත්‍යයෝ නාම රූපයන් ගේ සම්භවයටද ආධාර කරත්. එසේම සංස්කාරයෝද විඥා නයාගේ සම්භවයට (හටගැණීමට) ප්‍රත්‍යයවෙති. ගිය ජාතියේ සංස්කාර සංඛ්‍යාත කර්‍ම බීජය ප්‍රත්‍යය කොට මේ ජාති යේ ප්‍රතිසන්ධි හා ප්‍රවෘත්ති "විපාක සංඛ්‍යාත අංකුරයද" කොළ මල් ගෙඩිද හට ගන්නා බව සැළකිය යුතුය.

මේ ලෝකයේ සියලුම සත්වයෝ නිරතුරුවම කවර නමුදු කර්‍ම රැස්කරන්නෝ වෙති. සිත භවාඞ්ගව පවත්නා කාලය හැර ෂඩ්ද්වාරික අරමුණු වලින් යුක්ත සෑම වේලාවකදීම කුශලයක් හෝ අකුශලයක් කරත්. රාග-ද්වේෂ-මෝහාදී සිතු විලි සහිත සිත් "අකුසල් සිත්" යයිද, ශ්‍රද්ධා-මෛත්‍රී කරුණා ආදී චෛතසිකයන් ගෙන් යුක්තවූ සිත් "කුසල් සිත්" යයිද

දත යුතුය. (19 වෙනි පරිච්ඡේදයේ මේ පිළිබඳ විස්තර ඇත.) ලොභ ද්වේෂ ආදී අකුසල චෛතසිකයක් සිතක යෙදුන පමණින්මත් ඒ සිත අකුසල් වන නමුත් එයින් ප්‍රතිසන්ධි විපාකයක් දීමට තරම් බලවත් නොවේ. චේතනා චෛතසිකය සහිතව කායද්වාර-වාග්ද්වාර යන්හි ක්‍රියාත්මකවූ විටම ප්‍රතිසන්ධි හා ප්‍රවෘත්ති විපාක දීමෙහි පොහොසත්ය. යමෙකුගේ අතෙහි රැදි මුදුවක් දක තවෙකෙක් එයට ලොභ උපදවයි. ඔහු මුදුව බලෙන් හෝ සොරෙන් ගත්තේනම් "අකුශල කර්මය" සිදුවේ.

එහෙත් මුදුව දක ලොභ ඉපදවූ පමණින් ප්‍රතිසන්ධි විපාක දීමේ ශක්තියක් ඇති නොවේ. කුශලයක් ගැණද මෙසේ මැයි. ලොභ ද්වේෂ ආදී චෛතසික වලින් සිත තවන-දවන-උණුවන ගතියක් ඇත්තේය. කරුණා-මෛත්‍රී-ශ්‍රද්ධා චෛතසික වලින් සිත ලිහිල් කරයි. සන්සුන් වෙයි. දවන ගති ඇති සිත් අකුසල් නම්ද, සිහිල් ගති ඇති සිත් කුසල් නම්ද වේ. කායද්වාර-වාග්ද්වාර දෙක්හි සිදුවන සෑම කර්මයක් පිළිබඳවම බොහෝ සෙයින් "චේතනාව" යෙදෙයි. චේතනාව සහිත වීනම් එයින් ප්‍රතිසන්ධි හා ප්‍රවෘත්ති විපාක දෙයි. කුසල විපාක - අකුසල විපාක යන නමින් හඳුන්වන්නේ ඒ ශක්තියටය. එහෙත් මේ විපාකය දෙන්නේ මෙහිදී නොවේ. එයට කලක් ගතවිය යුතුය. සංඛාර පච්චයා විඤ්ඤාණං යනුවෙන් වදාලේ චේතනාවෙන් යුක්තවූ ඒ කර්මය හා කලකින් පසුව ලැබෙන විපාකය පිළිබඳ වයි.

කර්මය කළ විගසම විපාක නොදෙයි. ආසේවන ප්‍රත්‍යය-පුරෙජාත ප්‍රත්‍යය-පච්ඡාජාත ප්‍රත්‍යය ආදී ප්‍රත්‍යයන්ගෙන් උපකාර ලැබීමෙන් "පාක"යට (බේරීමට) ගියාවූ කර්මයම විපාක දෙයි. ධාන්‍ය වර්ගයක් වැපිරීමට පෙර එය පොළා බොල් හැර ශුද්ධ කොට පැලවීමේ ශක්තිය ඇති කරවා ඉන්පසු වපුරති. මෙසේම ආසේවන ප්‍රත්‍ය ආදියෙන් උපකාර ලැබූ කුසලාකුසලයෝ විපාක දීමේ ශක්තියෙන් යුක්තවෙති. බොල්විය හෝ පැලවීමේ ශක්තිය නැති විය නොපැලවෙන්නාසේ ප්‍රත්‍යයන්ගේ සහයෝගය නොලැබූ කර්මයන්ගේද විපාකදීමේ ශක්තිය නැත. කිරි මිදීමට දවසක් වත් ගත යුතුය. ධාන්‍ය වර්ගයකින් අස්වැන්නක් ලැබීමට මාස කීපයක් ගත විය යුතුය. බීජයකින්, ගසක් හට ගැනීමට අවුරුදු ගණන් පසුවිය හැකිය. එමෙන් බොහෝ කර්මයන්ගේ විපාකය ලැබෙන්නේද කලකින් පසුවයි.

නහි පාපං කතං කම්මං-සජ්ජුඛීරංව මුච්චති
ඩහන්තං බාල මන්වෙති -භස්මච්ඡන්නොව පාවකො
(ධම්මපදය

(යමෙකු විසින්) කළ පාපකර්ම එකෙණෙහිම විපාක නොදෙයි. අළුයෙන් වැසුණු ගිනි පුපුරු මෙන් එය බාලයා අනුව යයි." යනුවෙන් භාග්‍යවතුන් වහන්සේ විසින් වදාරණ ලද්දේද කළ කර්ම විපාක දීමට තරම් ශක්තියක් ඇති වීමට කර්මය පැසිය යුතු බවය.

බීජයක් රෝපණය කළ විට ඒ බීජය ක්‍රමයෙන් දිරාපත් වෙයි. අභාවයට යයි. එහෙත් කලකදී එයින් ගසක් ඇති කරවා තිබවූ බීජයට සමාන බීජ නැවත ගසෙහි හටගැනීමේ ශක්තියක් බීජය දිරා යාමේදී ඉතිරිවේ. එමෙන්ම කුශලයක් හෝ අකුශලයක් කෙනෙකු සිදුකළ විට කර්මය මොහොතකින් සිදුවී අවසන් වෙයි. එහෙත් කලකින් පසු ඒ කළ කර්මයට සමාන විපාකයක් දීමේ ශක්තිය කර්මය කරණ විටම ඇතිවේ. "කර්මය සිදුවන්නේද විපාකය සිදුවන්නේද චිත්ත චෛතසික-යන් නිසාය. ඉන් පිටත් කර්මයක් හෝ විපාකයක් නැත."

කම්මස්ස කාරකො නත්ථි - විපාකස්ස ච වෙදකො
සුද්ධධම්මා පවත්තන්ති - එවෙතං සම්මදස්සනං

යනුවෙන් දක්වා ඇත්තේද එයයි.

කර්මය අතීත භවයේය. විපාකය මේ භවයේය. එසේනම් අතීත භවයෙන් කිසිවක් මෙහි විපාක දීම සඳහා ආයේ දැයි ප්‍රශ්නයක් වෙයි. නැත යනු පිළිතුර වේ. එසේ නම් මෙහිදී ලබන විපාකය අනිකක්දැයි ප්‍රශ්නයකි එයටද පිළිතුරු නැත යනුවේ. කිරි මිදී දී කිරි වීය. දීකිරි යනු පෙර තිබුණු කිරිමද අනිකක්ද? නැත.

පහනකින් පහනක් දල්වයි. මුල් පහනට සමාන ආලෝකයක් දෙවෙනි පහනේද වෙයි. මුල් පහනේ ආලෝකය දෙවෙනි පහනට ආවේද? නැතහොත් දෙවෙනි පහනේ ආලෝකය අනිකක්ද?

බෙරයක් ගසන කල දෙංකාරයක් නැගෙයි. ඒ දෙංකාරය බෙර ශබ්දයමද-අනිකක්ද? බෙර ශබ්දය නිසා ඇති වූවක්ද?

ගුරුවරයෙකු ඇසුරු කොට ශිෂ්‍යයා ඉගෙණ ගණී. කලකදී ගුරුවරයා දත් සියල්ලම ශිෂ්‍යයාද ඉගෙණ ගණී. ගුරුවරයාගේ උගත්කම ශිෂ්‍යයාට ආවේද? ශිෂ්‍යයාගේ උගත්කම ගුරුවරයා ඉගැන්වූ දේ අනුව ඇති වූවක්ද? අනිකක්ද?

තවද කර්මය සිදු කරන්නේ කෙනෙකි. විපාකය ලබන්නේ අනිකෙකි. කර්මය සිදු කළ චිත්ත සන්තතිය නොව විපාක ලබන්නේ අනික් චිත්ත සන්තතියකි. මෙය යුක්ති යුක්තද? අඹ ගෙඩියක් සිටවූ කල ඉන් අඹ ගසක් පැලවෙයි. එහි අඹ ගෙඩි හටගණියි. දෙවෙනි අඹගෙඩි වලට මුල් අඹ ගෙඩියෙන් යමක් ශේෂව ආවේද? නැතහොත් දෙවෙනි අඹගෙඩි වල සම්බන්ධයක් මුල් අඹ ගෙඩියට ලැබේද?

ඉහත සඳහන් කරුණු විමසිල්ලෙන් සලකන්නෙකුට කර්මයත් විපාකයත් පිළිබඳව ඇති "අද්භූත බලය" වටහා ගණු හැකිවෙයි. "ඉද්ධිමතුන්ගෙන්" අගතැන්පත් "මහමුගලන්" රහතුන් වහන්සේගේ අචින්ත්‍යවූ ඍද්ධි බලයද යට වීමෙන් කර්ම බලය මුල්වීමෙන් ඇතිවූ විපාක තත්වයද සැලකිය යුතුය.

සත්වයා කළ කර්ම කොතැනක හෝ රැඳී තිබී විපාක දෙන්නේද? එසේ රැඳී පවත්නා තැනක් නැත. ගසක ගෙඩි හට ගැණීමේ ශක්තිය ගසේ කොතැනක තිබේදැයි සොයනු නොහැකිවීම මෙනි. දෙදෙනෙකු අතර නය ගණු දෙනුවක් වෙයි. ගණුදෙනුව මොහොතකින් අවසන් වෙයි. නමුත් "වර්ෂ සිය ගණනකින් පසුව වුවද නය හිමියාට නය ගැතියා නය මුදල ආපසු දිය යුතුය." නය ආපසු ගෙවිය යුත්තේ ගණුදෙනුව කළ නිසයි. එමෙන්ම කම්මස්ස කතත්තා උපචිතත්තා උප්පන්නං හොති චක්ඛුවිඤ්ඤාණං ආදි වශයෙන් වදාරා ඇත්තේද කර්මය සිදුකළ නිසා විපාකය ලැබියයුතු බවයි.

"සඞ්ඛාර පච්චයා විඤ්ඤාණං" යනුවෙන් තථාගතයන් වහන්සේ විසින් වදාරණ ලද්දේද සංස්කාර සඞ්ඛ්‍යාත කර්ම ප්‍රත්‍යය නිසා ප්‍රතිසන්ධි-විපාක; ප්‍රවෘත්ති විපාක සඞ්ඛ්‍යාත විඤ්ඤාණයන් හටගන්නා බවයි.

**පුනරුත්පත්තිය පිළිබඳ සාධක**

භවතො භවස්ස පටිසන්ධානං පටිසන්ධි යනුවෙන් දක්වා ඇති පරිදි අතීත-වර්තමාන යන භව දෙක අතරක් නැතිසේ එකිනෙක ගැලපීම් වශයෙන් උපදනා සිත

"පටිසන්ධි" නම් වේ. යම් කිසි භවයක ප්‍රතිසන්ධිය ලැබීමෙන් පසුව ජීවිතය පවත්නා කාලයේ ඇතිවන සිත් "ප්‍රවෘත්ති" නමි. ඇතැම් සිත් වලින් ප්‍රතිසන්ධිය පමණක් දෙයි. ඇතැම් සිත් වලින් ප්‍රතිසන්ධියද ප්‍රවෘත්තියද දෙයි.

මේ ප්‍රතිසන්ධිය යනුවෙන් දක්වා ඇත්තේ පුනරුත්පත්තිය පිළිබඳවයි. පරලෝකාම-නැවත ඉපදීම ආදී සාමාන්‍ය ව්‍යවහාර යන්නෙන් ප්‍රකාශ කරණු ලබන මේ ප්‍රතිසන්ධිය සිදුවන්නේ සංස්කාර සඞ්ඛ්‍යාත කර්මයෙන් බවද ඉපදීමෙන් පසු යෙදෙන සැප දුක් දෙකද වැඩි වශයෙන් යෙදන්නේ කර්ම විපාක වශයෙන් බවද දක්වා ඇත.

මේ පුනරුත්පත්තිය වනාහි පියවි ඇසට හෝ යන්ත්‍රානුසාර දෘෂ්ටියට දැකිය හැක්කක් නොවේ. අදෘශ්‍යමාන වූ චිත්ත පරම්පරාව අනුවම සිදුවන පුනරුත්පත්තියද එසේම අදෘශ්‍යමාන බව දත යුතුයි. අප්‍රත්‍යක්ෂ දෙය නොපිළි ගන්නා සමහර විද්‍යාඥයෝද අනුමාන බුද්ධියෙන් දතයුතු වූ පුනරුත්පත්තිය නැතැයි කියති. ජාතිස්මරණ ඥානය නැති කිසිවෙකුට මෙය ප්‍රත්‍යක්ෂයෙන් දත නොහැකිය.

ලොවුතුරා බුදුවරු-පසේබුදුවරු-රහත්හු ආදි උතුමෝ එබඳු තත්‍වයට පැමිණියෝ පුනරුත්පත්තිය නිසාය. අනන්ත ජාතිවල පුරුදු කරණ ලද කුශල බලයෙන් උන්වහන්සේලාගේ බුද්ධිය වැඩුනු හෙයිනි. එකම ගුරුවරයෙකුගේ ඇසුරෙන් අතැවැසියන් දස දෙනෙකු ඉගෙණ ගන්නා දෙය දස ආකාරයකට වටහා ගන්නේ දස දෙනා කෙරෙහි පවත්නා ජන්මබුද්ධියේ තත්‍වය අනුවයි. දෙමව්පියන් කෙරෙහි නැති අමුතුගති අමතර බුද්ධිබල ඇතිවන්නේ පරිසරය අනුව හෝ අධ්‍යාපනය අනුවම නොවේ. කොපමණ හොඳ පරිසරයක වුවද හැදුනු අය ඒ පරිසරයට අයත් ගුණයන්හි වැඩි වශයෙන් නොපිහිටන බවද සහජයෙන්ම ඇතැම් අය කුඩා කල සිටම සංගීතය, ගණිතය, යාන්ත්‍රික වැඩ නිෂ්පාදක කවියුතු ආදියෙහි දක්ෂ බවද ඇලුම් කරණු බවද සසර පුරුද්ද නිසා ඇති වන්නකි.

කිසිකලෙක ආශ්‍රයක් හෝ දැකීමක් නැති අය මුනගැසුන කල ඔවුනොවුන් කෙරෙහි අතිමාත්‍ර හිතවත්කම හෝ අතිමාත්‍ර වෛරය හෝ යෙදෙන්නේ පෙර ජන්මයක ඇතිවූ සහවාසය

නිසයි. අකාරණයේ-නිෂ්කාරණයේ යම් යම් අයට අභූත-ආඛ්‍යාන චෝදනා යෙදෙන්නේද. කිසිවෙකුට වරදක් හෝ හතුරුකමක් නොකරණ අයටද හතුරුකාරදර හා අලාභහානි යෙදෙන්නේද පෙර භවයකදී කළ කර්මයන්හි විපාක වශයෙනි.

"කුණ්ඩධාන" නම් තෙරුන් වහන්සේ පැවිදිවූ දා සිටම පසුපස්සෙහි ස්ත්‍රියෙකු යන විලාසයක් අන්‍යයන්ට දකින්ට ලැබුනේ පෙර කලෙක සිල්වත් භික්ෂුනමකට ස්ත්‍රීයක් පිළිබඳව අභූත චොදනාවක් කළ නිසයි.

නිර්දෝෂීවූද, ඍද්ධිබලයෙන් අගපත්වූද මහමුගලන් රහතුන් වහන්සේට සොරුන්ගෙන් පහර ලැබුනේද පෙර අකුසල විපාක යකිනි.

අංගුලිමාල තෙරුන් වහන්සේ රහත්වීමට පෙර මහමඟ ගමන් කරන කල අකාරණයේ ගල් මුල් පහරවලට ලක්වූයේද ගිහිකල කරණලද ප්‍රාණඝාත කර්මය අන්භවයකදී විපාක නොදෙන හෙයින් ඉහාත්මයේ දියයුතු විපාකයක් වශයෙනි.

මෙබඳු සිද්ධි සමාජයේද බොහෝ දෙනාට සිදුවන බව පෙනේ. එයද පුනරුත්පත්තියක් ඇති බවට සාමාන්‍ය සාධක වෙයි. භූතයින් පිළිබඳව මහජනයා අතර පවත්නා අදහස්ද පුනරුත්පත්තියක් පිළිබඳ හැඟීම් ස්ථිර කරයි. කුඩා කලද යම් යම් අයගේ අද්භූත ගති ඇතිවන්නේද යම් යම් අයට කෙබඳු පරිසරයකින් උවද වෙනස් නොවන තත්වයේ ගතිගුණ පවත්නේද සසර පුරුද්ද අනුවයි.

**පරලොව හා පුනරුත්පත්තිය.**

පරලොව කියා අමුතු ලොවක් නැත. මිනිස්ලොවින් චුතවූවෙක් නැවත මෙහිම උපන්නේ නම් ඔහු පිළිබඳ පරලොව කියා දෙයක් ඇතිවිය හැකිද? මැරි මැරී ඉපදී ඉපදී යන සත්වයන් පිළිබඳ ඔවුනොවුන් පිළිබඳව විනා පොදු ලෝකයේ පර ලොව කියා දෙයක් නැත. කෙනෙකු මිය ගිය කල පරලොව ගියා යනුවෙන් කරණ සම්මත ව්‍යවහාරය විනා අමුතු ලොවක් කොහේ ඇත්තේද, ක්ෂණයක් පාසා ඉපදී ඉපදී නැසී නැසී යන චිත්ත පරම්පරාවක් සත්වයා පිළිබඳව ඇති බව නවීන විද්‍යාඥයෝද පිළිගණියි. ඒ එසේ නම් ඒ චිත්ත පරම්පරාවේම විකෘතියකට පුනරුත්පත්තියයි කියනු විනා, ඇතැම් නවීන භාෂා උගතුන්ට "මහා ගැටලුවක්" මෙන්ද, මහා ආශ්චර්යයක් මෙන්ද වැටහෙන තත්වයේ "මායාවක්" පුනරුත්පත්තිය

පිළිබඳව නොමැති බව දත යුතුය. තථාගතයන් වහන්සේ වදාළ "චිත්තධර්ම ශාස්ත්‍රය" උගත් අයට පුනරුත්පත්තියක් පිළිබඳ ප්‍රශ්නයක් ඇති නොවේ.

සත්වයා යනු අනාදිමත් කාලයක සිට පැවත එන නාම-රූප ධර්ම පරම්පරාවක් පිළිබඳ එක්තරා තත්වයකි, ක්ෂණයක් පාසා ඉපදී ඉපදී නැසි නැසී යන චිත්ත පරම්පරාවක්ද එයට අනුරූපව හටගන්නා රූප ධර්ම පරම්පරාවද මේ භවය පිළිබඳව පවතිමින් තිබී මේ භවයේ අවසානයේ ඇතිවන චුති සිත නිරුද්ධවීමත් සමගම රූප පරම්පරාව නිරුද්ධවීමෙන් මේ භවයේ රූපස්කන්ධයද බිඳීයයි. එහෙත් එකී චුති සිත විසින් ගණු ලබන අරමුණ අනුව ඊලඟ සිතද පහළ වන්නේය. ඒ පහළවන සිතට නිශ්‍රයස්ථානයක්ද අවශ්‍යය. එහෙත් මේ භවය පිළිබඳ ශරීරය සිත නිරුද්ධවීමට පෙර බිඳී යන හෙයින්ද චිත්ත පරම්-පරාව නොබිඳුන හෙයින්ද අවසාන චිත්ත වීථියේ චුති සිත නිරුද්ධ වීමත් සමගම සුදුසු තැනක සිත පහළ වෙයි. ඒ සිතට පටිසන්ධි යයි නමක් ලැබේ.

මේ භවයේ ජීවත්ව සිටියදීද එක සිතක් ලඟට තව සිතක් පහළවීම නියමයයි. එමෙන්ම මැරෙන මොහොතේදීද බිඳුන සිත ලඟට තව සිතක් පහළවීම විනා චිත්ත පරම්පරාව කඩ නොවේ. මෙහිම ජීවත්ව සිටින්නෙකුගේ සිත නම් මෙහිම පහළවන බවද මෙහි පහළ වියයුතු සිත අන්තැනක පහළවන බවද මෙහි ඇති විශෙෂයයි චිත්ත පරම්පරාව කඩවන්නේ නොවේ. අන්තැනක මේ සිත පහළවීමේදී මේ භවයේ අවසාන චුති සිතට යෙදෙන අරමුණු අනුව කර්ම ශක්තියෙන් ඒ ප්‍රති-සන්ධි සිත සමගම රූපයක්ද ඇතිවේ. සම්මුති වශයෙන් බලන කල ඒ සිතත් රූපයත් අනිකෙකුගේද? මේ භවයෙහි කිසි-වෙක් අනිත් භවයට ගියේද? ඒ භවයේ ඇතිවූයේ අනිකෙක්ද? ඒහෙයින් උපදින සත්වයා මොහු නොවනබවද අනිකෙකු නොවන බවද නුවණැත්තවුනට වැටහෙනවා ඇත. "සඞ්ඛාර පච්චයා විඤ්ඤාණං" යනුවෙන් තථාගතයන් වහන්සේ වදාළේ සත්වයා "ගිය ජාතියේ කරණලද කුශලාකුශලයන්ට අනුව මේ භවයේ ප්‍රතිසන්ධි විඤ්ඤාණ හා ප්‍රවෘත්ති විඤ්ඤාණ ඇතිවන බවයි,

සඞ්ඛාරපච්චයා විඤ්ඤාණං - කාමාවචර කුසල් සිත් අට; රූපාවචර කුසල් සිත් පස; අරූපාවචර කුසල් සිත් සතර; අකුසල් සිත් දොළොස යන සිත් විසිනවය සංස්කාර නම්වේ.

සහෙතුක කාමාවචර මහා විපාක සිත් අට හා අහෙතුක විපාක සිත් අට; රූපාවචර විපාක සිත් පස; අරූපාවචර විපාක සිත් සතර; අකුසල විපාක සත; යන දෙතිස් විපාක සිත් මෙහි විඤ්ඤාණං යනුවෙන් දක්වා ඇත්තේය. මෙසේ කර්මප්‍රත්‍යය, උප නිශ්‍රය ප්‍රත්‍යය, යන දෙයාකාර ප්‍රත්‍යයන්ගෙන් සංස්කාරයෝ විඥානයන්ට උපකාර වන බව විශෙෂයෙන් දතයුතුයි. මේ දෙතිස් වැදෑරුම් ලෞකික විපාක විඥානයන්ගෙන් ඇතැම් විඥානයෝ අනන්තර භවයෙහි "ප්‍රතිසන්ධි විපාකය පමණක්" ද ඇතැම් විඥානයෝ අනන්තර භවයෙහි ප්‍රතිසන්ධිය හා ප්‍රවෘත්තියද යන දෙකම දක්වා ඇත. (ප්‍රවෘත්තිය නම් ජීවත්වන භවයේ සුඛ-දුක්ඛ-උපෙක්ඛා-සංඛ්‍යාත විපාකයෝය.)

---

# සංඛාරපච්චයා විඤ්ඤාණං

## (ii කොටස)

"අනාතුරුව කවර කවර සංස්කාරයන්ගෙන් කවර කවර විඥානයෝ පහළ වෙද්ද?" යනු දතයුතු වේ.

අලුත් භවයෙක ප්‍රතිසන්ධිය ලබන්නේ විඥානයකින් බව මුලින් දැනගතිමු. ඒ විඥානයද සංස්කාර ප්‍රත්‍යයෙන් හටගන්නා බවද ඉගෙණ ගතිමු. විඥානයෝද චක්ඛු-සොත-ඝාණ-ජිව්හා-කාය-මනො යන ආකාරයෙන් සය වැදෑරුම් වෙත්. කුශල විපාක අකුශල විපාක වශ යන් දෙයාකාරවූ ඒ විඥානයෝ නම් යටකී දෙතිස් වැදෑරුම් ලෞකික විපාකයෝය.

"කාමාවචර පුණ්‍යාභිසංස්කාරය හෙතුකොටගෙණ" කුසල විපාකවූ චක්ෂු; ශ්‍රොත; ඝ්‍රාණ; ජිහ්වා; කාය; යන මේ පඤ්ච විඤ්ඤාණ සිත්ද; මනො ධාතු සංඛ්‍යාත සම්පටිච්ඡන සිතද; සොමනස්ස-උපෙක්ඛා යන වෙදනා භේදයෙන් දෙවැදෑරුම්වූ සන්තීරණ සිත් දෙකද; යන අහෙතුක විපාක සිත් අට හා සහෙතුක කාමාවචර මහා විපාක අටද යන විපාක සිත් සොළසක් ඇති වන්නේය.

"රූපාවචර පුඤ්ඤාභි සංඛාරය" ප්‍රත්‍යය වීමෙන් ප්‍රථම, ද්විතීය, තෘතීය, චතුර්ථ පඤ්චම යන විපාක සිත් පසද;

"ආනෙඤ්ජාභිසංඛාර" සඞ්ඛ්‍යාත සතර අරූපාවචර කුශලයන් ප්‍රත්‍යය වීමෙන් අරූපාවචර විපාක සිත්වන ආකාසානඤ්චායතන විඤ්ඤාණඤ්චායතන, ආකිඤ්චඤ්ඤායතන නෙවසඤ්ඤානාසඤ්ඤායතන යන විපාකයන් හටගන්නා බව දත යුතුයි. (මේ සිත් පිළිබඳ විස්තර යට දක්වා ඇත )

"අපුඤ්ඤාභිසඞ්ඛාර" සංඛ්‍යාත අකුසලයන් ප්‍රත්‍යය වීමෙන් සත්වැදෑරුම්වූ අහේතුක අකුසල විපාකයන් හටගන්නා බවද දත යුතුයි.

මෙසේ බලනකල අතීත භවයේ සිදුකරන ලද කුශලා'කුශල සංඛ්‍යාත සංස්කාරයන් ප්‍රත්‍යයවීමෙන් මේ භවයේ ප්‍රතිසන්ධිය හා ප්‍රවෘත්තිය සේදෙන බව දත යුතුයි.

## කාමාවචර ප්‍රතිසන්ධි හා ප්‍රවෘත්ති

යටකී අකුසල විපාකවූද- කුසල විපාකවූද උපෙක්ඛා සහගත අහේතුක සිත් දෙක සහ සහේතුක කාමාවචර මහා විපාක අට යන "සිත් දශය කාමාවචර ප්‍රතිසන්ධි" නම්වේ. මෙයින් අකුසල විපාක–අහේතුක සන්තීරණ සිතින් අපායෙහිද; කුසල විපාක අහේතුක සිතින් මිනිස් ලොව ජාත්‍යන්ධ-ජාති බධිර–ජාති මූක ආදීන් සහ භූමාටු දෙවියන් අසුරයන් විනිපාතිකයන් යන මොවුන්ගේ වශයෙන් දුහේතුකවූ සුගතියෙහි ද; ප්‍රතිසන්ධිය සේදයි.

"ඤාණ සම්පයුත්ත" ත්‍රිහේතුක කුශලයෙන් ත්‍රිහේතුක ප්‍රතිසන්ධිය ඇතිකොට විපාක වශයෙන් අහේතුක-සහේතුක යන දෙවැදෑරුම්වූ "සොළොස් විපාකයෝ" උපදවත්. ත්‍රිහේතුක ඕමක කුශලය ද්විහේතුක ප්‍රතිසන්ධිය දී "ඤාණවිප්පයුත්ත" විපාක සතර හා අහේතුක විපාක අටයන දොළොස් විපාකයෝ උපදවත්. ත්‍රිහේතුක උත්කෘෂ්ට කුශලයෙන් සදෙව් ලොවද මිනිස් ලොවද ප්‍රතිසන්ධිය හා ප්‍රවෘත්තිය උත්කෘෂ්ට ලෙස දෙයි.

ලොභ-ද්වේෂ-මෝහ යන අකුසල හේතූන් මූලික කොට ඇති අකුසල් සිත් දොළසේ ද්වේෂමූලික උද්ධච්චය හැර සෙසු සිත් එකොළසින් දුගතියෙහි ප්‍රතිසන්ධිය ලබයි. එහිදී අකුසල විපාක අහේතුක සන්තීරණ සිත ප්‍රතිසන්ධි වශයෙන් යෙදෙයි. විපාක වශයෙන් අහේතුක අකුශල විපාක සප්තවිඥානයෝ යෙදෙත්.

එහෙත් විශේෂයක් වෙයි. ප්‍රවෘත්ති විපාක වශයෙන් යෙදෙන අහේතුක කුශල විපාක අට සප්ත කාම සුගතීන්හි මෙන්ම සතර අපායන්හිද රූපාවචරයෙහිද ලැබෙන බව දක්වයි. නිරා දුක් විඳින්නවුන්ට මහ මුගලන් මහතෙර ආදීන් දැකීමෙන්ද; නාග ගරුඬ සුපර්ණාදීන්ට හදිසි සැප සම්පත් ලැබීමෙන්ද බලු බලල් ඇත් අස් ආදීන්ට ප්‍රිය මධුර ආහාර පානාදිය ලැබීමෙන්ද උපදනා විපාක විඥානයෝ කුශල විපාකයෝය. රූපී බ්‍රහ්මයින්ට යෙදෙන චක්ඛු-සොත-සම්පටිච්ඡන-සන්තීරණ යන විපාකයෝ කාමාවචරයෝ වෙති.

ත්‍රිහේතුක කුශලයට පිළිබඳ පූර්ව-මුඤ්චන-අපර යන චේතනාවෝ ඥානසම්ප්‍රයුක්තවූ නම් ඒ කුශලය උත්කෘෂ්ටයි. තෘෂ්ණා මාන-දෘෂ්ටි නීවරණාදීයෙන් කිලිටු වී නම් "ඔමක"යි. එක කර්මයකට ප්‍රතිසන්ධි විපාකයක් දෙන නමුත් දහස් ගණන් ප්‍රවෘත්ති විපාකයෝ උපදවත්.

"ඤාණ විප්පයුත්ත" කුශලයෝ ද්විහේතුකයෝය. විපාකද අහේතුකයි. නීවරණයන්ගෙන් යුක්තවූ ද්විහේතුකයෝ "ද්විහේතුක ඔමක" යෝය. විපාකද එසේමැයි.

**රූපාවචර හා අරූපාවචර ප්‍රතිසන්ධි-ප්‍රවෘත්ති**

ප්‍රණීත-මධ්‍යම-හීන යන තෙවැදෑරුම් ලෙසින් වඩනා ලද ධ්‍යාන කුශල චිත්තයෙන් රූපාවචර භූමීන්හි ප්‍රතිසංධිය හා ප්‍රවෘත්තියත් රූපාවචර විපාකයෝය.

සඤ්ඤාවිරාගව වැඩූ පඤ්චමධ්‍යාන කුශලයෙන් අසඥතලයෙහි ප්‍රතිසන්ධිය හා ප්‍රවෘත්තිය දෙයි. එහිදී යෙදෙන විපාකයද පඤ්චම ධ්‍යාන විපාකයයි.

ආකාසානඤ්චායතනාදි සතර අරූපාවචර කුසල් සිත්වලින් අරූප භූමියෙහි ප්‍රතිසන්ධිය හා ප්‍රවෘත්තිය යෙදෙයි. එහිදී යෙදෙන ඒ විපාකයෝද අරූපාවචර විපාකයෝය.

# සංඛාර පච්චයා විඤ්ඤාණං

(iii කොටස)

## සංස්කාර ප්‍රත්‍යයෙන් විඥානය වේ.

සිතක් උපදින්නේ අරමුණක් ඇතිවසි. අරමුණ අනුව සිතේ තත්වය වෙනස්වන බවද දැනගෙණ ඇත. යෙදෙන අරමුණද අතීත හෝ වර්තමාන හෝ අනාගත හෝ වෙයි. කසිණාදි ප්‍රඥප්තියක් අරමුණු කරගෙන පහළවන විඥාණයෝ කාලභෙදයකට අයත් නොවෙති.

ලොව ඇති සියල්ල නැසේ. සදාකාලිකවූ සත්වයෙක් හෝ ද්‍රව්‍යයක් ලොව කොතැනකවත් නැත සම්භවය හා විනාශයද ඒ අතර විපරිණාමයද ලොක ස්වභාවයයි. මේ ස්වභාව රීතිය දත් තථාගතයන් වහන්සේ සබ්බෙ සඞ්ඛාරා අනිච්චා යනුවෙන් වදාළ සේක. එය නොදත් අඥානයෝ "සදාකාලික අපාය, සදාකාලික ස්වර්ග, වෙනස් නොවන සුද්ධාත්මය" ලොව හැම තැනම වෙසෙන "සර්වබලධාරී සදාකාලික දෙවියා;" ආදී මනඃකල්පිත මිථ්‍යා ප්‍රඥප්ති ඇතිකරගත්හ. තථාගත ධර්මයෙහි දක්වෙන "නිවන" වුවද අතීතාදි "කාල" භෙදයකට අයත් නොවේ. එ සැපය ස්ථිර වූවකි.

තවද " අසුවල් දෙය මෙනැයි උපමා වශයෙන් දක්විය නොහැකිවූද; ආකාශයසේ අනන්තවූද; වාතයසේ මනාවිඥනිතවූද, ගින්දර මෙන් උපක්‍රමයෙන් උපදවා නතනුතුවූද; නාම–රූප දෙකේ නිරවශෙෂ නිරුද්ධියවූද; ප්‍රතිසන්ධි විඥනයාගේ නිරුද්ධියෙන් ඇතිවන තත්වයක් ලෙසද; දක්වා ඇති නිර්වාණ ධාතුව අතීතාදි කාල විශෙෂයකට අයත් නොවන බවද" දතයුතුයි.

"උපන් සියල්ල නැසේ" යන මූලික ඉගැන්වීම අනුව උපන් සත්වයාගේද නැසීමක්, බිඳීමක්, මැරීමක් ඇතිවෙයි. එයට චුත වීම, මරණය, කළුරියකිරීම යනාදී නම් ව්‍යවහාර කරති. "එක භව පරියාපන්නස්ස ජීවිතින්ද්‍රියස්ස උපච්ඡෙදො මරණං" යනුවෙන් එක භවයකින් වෙන්කරණ ලද ජීවිතෙන්ද්‍රියයාගේ සිඳීම මරණය නමැයි විශුද්ධිමාර්ගයෙහිද දක්වා ඇත.

කර්ම සෘතු ආහාර යන ප්‍රත්‍යයන්ගේ දුබලවීමෙන්ද හදිසි උපක්‍රමයන්ගෙන්ද සත්‍වයා පිළිබඳ ජීවිතෙන්ද්‍රියාගේ බිඳීම සිදු වෙයි. භවයේ අවසාන සිත වන චුති සිතින් ජීවිතෙන්ද්‍රිය බිඳෙනත් ඒ සමගම අනන්තර භවයේ මුල් සිත වන පටිසන්ධි සිත උපදින නිසා නාම ධර්ම සන්තතියෙහි බිඳීමක් නැත. මේ චුති පටිසන්ධි දෙසිත අතර කිසිදු අතරක් නැත්තේය. මිනිස් ලොවදී යෙදෙන චුති සිතට අනතුරුව ලැබෙන පටිසන්ධි සිත නැවත මිනිස් ලොව ඇතිවුවත් දෙව්ලොව-බඹලොව ආදී තැනක ඇති වුවත් ඒ දෙසිත අතර මඳකුදු අතරක් නොමැති බව සැලකිය යුතුයි. මේ චුති-පටිසන්ධි දෙක පිළිබඳ යථා තත්‍වය අවබොධ නොකළ මිථ්‍යා දෘෂ්ටිහු චුතිපටිසන්ධි අතර අනතර භවයක් ඇතැයි කියති. සංඛාර පච්චයා විඤ්ඤාණං යනුවෙන් තථාගතයන් වහන්සේ වදාළෙද එබඳු අනතර භවයක් නැති බවයි.

**චුතිය හා පටිසන්ධිය යෙදෙන අයුරු**

“සච්චං සන්තා පටිසන්ධි - පච්චයාකාර මෙවච” ආදීන් දක්වූ පරිදි සත්‍වයාගේ ප්‍රතිසන්ධිය තේරුම් කරනැණීම එතරම් පහසු දෙයක් නොවේ. බුද්ධාගමේ උගන්වන පරමාර්ථයන් අතර ප්‍රතිසන්ධිය ඉතාම සියුම් ඉගැන්වීමකි. මැරෙන සත්‍වයා මෙසින් ඉවරවේයයිද, අභාවයට යන්නේ යයිද විශ්වාස කළ ඇතැම් මිථ්‍යාදෘෂ්ටීහු උච්ඡෙද වාදය ලොව ඇතිකළහ. දෙවියන් විසින් මවනු ලැබූ සත්‍වයා දෙවියන්ගේම කැමැත්ත අනුව සුගතියට හෝ දුගතියට පත්කරණු ලැබේයයිද එහිදී සදාකාලික බවට පත්වන්නේයයිද සැලකූ ඇතැම් “මුග්ධයෝ” මනඃකල්පිත ඊශ්වර නිර්මාණවාදය හා සම්බන්ධ ශාස්වතවාදය ලොව ඇතිකළහ. ඔවුන්ගේ මොටවූ බුද්ධියට ප්‍රතිසන්ධිය අඳුරක්ම විය. පිරූ පාරමිතා බලයෙන් මෝරූ බුද්ධීන්ද්‍රිය ඇතිව සර්වධර්මයන් ප්‍රත්‍යක්ෂ ඥානයෙන් අවබොධකළ තථාගතයන් වහන්සේ ප්‍රකෘතික වූද යන්ත්‍රානුසාරවූද දෘෂ්ටියකට කිසිසේත් හසුනොවන ප්‍රතිසන්ධි සංඛ්‍යාත අන්ධකාරය විධ්වංසනය පිළිබඳ දිවාකරයාණන්වූසේක. එහෙයින් මැරෙන සත්‍වයා කෙලෙස් සහිත නම් මෙසින් මතු උපදින බවද එහෙත් සදාකාලික නොවන බවද උපදින සත්‍වයා මොහුම හෝ අනිකෙකු නොවන බවද දක්වූසේක. “ජාත්‍යන්ධයට ඉර සඳ නොපෙනෙන හෙයින් ඔහු ඉර සඳ නැතැයි කීවත් චක්ෂුඃ ප්‍රසාදය ඇත්තවුන්ටම ඉර සඳ ප්‍රකටව පෙනෙන්නාසේ” බුදු නුවණින් ප්‍රතිසන්ධිය දත් තථාගතයන් වහන්සේ අර්හත්මාර්ග ඥානයෙන් ක්ලේශොත්පත්තිය නසනතුරු භවයක් පාසා ගමන්

කරණ නාමරූපධර්ම සන්තතියක් ඇති බව වදාරා තිබෙද්දී; මොහාතිසාකාරයෙන් තුවණැති වැසුනු කෙලෙස් මඩවලුමර් එරුණු අඥනයන්ගේ කියුම් වලට තුවණැතියෝ අනුකම්පා කරත්.

සත්වයාගේ ප්‍රතිසන්ධිය සිදුවන්නේ නානාක්ෂණික-සහජාත යන කර්ම ප්‍රත්‍ය දෙදෙනාගේ ප්‍රත්‍යය ශක්තිය නිසයි. පැලකරවිය යුතු යම්කිසි බීජයක් පැලකිරීමට පෙර වේලීම්, අව්ගැස්වීම්, දුම් ගැස්වීම් ආදියෙන් පැලවීමේ ශක්තිය ඇතිකරවිය යුතු වෙයි. කාලයක් අවශ්‍ය සංස්කාර විධි නොකළ බීජය හෝ ධාන්‍ය වර්ගය පැල වුවත් නිසි පල නොදෙයි. එසේම ආසෙවන ප්‍රත්‍යය-අනන්තර ප්‍රත්‍යය ආදී උපකාරක සංස්කාර වලින් සකස්කොට විපාක දීමේ ශක්තිය ඇති කර්මය නානාක්ෂණික කර්ම ප්‍රත්‍යය නම් වෙයි.

යම්කිසි භවයක චිත්ත පරම්පරාවේ අවසාන සිත චුති නම් වේ. චුති සිත උපදින්නේද අරමුණක් අනුවයි. මරණාසන්නවූ සත්වයාගේ චුති සිතට අතීතවූ කර්මයක් හෝ කර්ම නිමිත්තක් අරමුණු වශයෙන් ඇතිවෙයි. කර්ම නම් කරණලද යම්කිසි කුශලයක් හෝ අකුශලයක්ය. කර්ම නිමිත්ත නම් කුශලය හෝ අකුශලය සිදුකිරීමට උපයෝගිවූ ආවුධ හෝ මල් පහන් චෛත්‍ය ආදී පූජා ද්‍රව්‍යයෝය. කුශලය හෝ අකුශලය බොහෝ කලකට පෙර කළ දෙයක් වුවද "යමෙකුගෙන් ගනු ලැබූ නය නෙවීමට සුදුසු විටකදී ඉදිරිපත්ව නෙවන්නාක්" මෙන් නානාක්ෂණික කර්ම ප්‍රත්‍ය බලයෙන් මරණාසන්න මොහොතෙහි කර්ම-කර්ම නිමිති යන අරමුණු දෙකෙන් එකක් චුති සිත කරා එළඹ සිටී. එයද මනොද්වාරයට හමුවන බව දත යුතුයි.

සවස් භානයෙහි පෘථිවියට වැටෙන පර්වතයක සෙවනැල්ලක් මෙන්ද සිහිනයක් දකින්නාක් මෙන්ද යටකී පරිදි චුති සිතට යෙදෙන කර්ම-කර්මනිමිති අනුව මනොද්වාරික චිත්තවීථියක් ජවන් පසකින් යුක්තව පහළ වෙයි. ජවන් සතක් නියතයෙන් පහළවිය යුතු නමුදු මරණාසන්නයේ චිත්තවේගය දුබල හෙයින් ජවන් පසකට වඩා නූපදින බව දක්වා ඇත්තේය. මෙසේ චුති සිතට අරමුණද එයට පෙර යෙදෙන කුසල හෝ අකුසල ජවන්ද උපදවා පටිසන්ධි සිතට අනුබල දෙන්නේ නානා ක්ෂණික කර්ම ප්‍රත්‍ය බලයෙන්ය. ඉක්බිති සහජාත කර්ම ප්‍රත්‍ය බලයෙන් අනන්තර භවයෙහි යෙදෙන පටිසන්ධි විඥ්ඥාණ සංඛ්‍යාත අංකුරය උපදවන්නේය.

චුති සිතේ අරමුණ අතීතවූ කර්ම හෝ කර්ම නිමිත්තය වෙයි. පටිසන්ධි සිතේ අරමුණ අතීත භවයේ මරණාසන්න චිත්තවීථියට අරමුණුවූ අතීත- කර්ම කර්මනිමිති-ගතිනිමිති යන තුනෙන් එකක් වන බවද දක්වා ඇත. තවද මනොද්වාරයට අරමුණුවූ කර්මය කුශලයක් නම් එයට අනතුරුව*කර්මනිමිති හා ගති නිමිති පහළ වෙයි. අනුශය වශයෙන් සත්වයා තුළ පවත්නා තෘෂ්ණාව නිසා සුගතියෙහි පවත්නා විපරිනාමය නොසලකා එහි ඇල්ම ඇති කොට කාමාවචර කුසල් සිත් අටින් එකක් පස්වරක් ජවන් වශයෙන් ඉපිද එයට අනතුරුව එයට සුදුසු පරිදි යෙදෙන තදාලම්බනයෙන් පසු චුතියද ඉක්බිති සුගති පටිසන්ධියද යෙදෙයි. මනොද්වාරයට ආපාථ ගතවූයේ අකුශල කර්මයක් නම්+ කර්ම නිමිතිද ඉක්බිති ගතිනිමිති වශයෙන් නරකාග්නි-යමපල්ලන් ආදීයද සිහින දකින්නාක් මෙන් ඉදිරිපත්ව සිටී. එසේවූවිට අවිද්‍යාවගේ බලය නිසා අපා දුකේ ආදීනව සැලකිය නොහැකිව ගතිනිමිත් තෙහි සිත නැඹුරු වෙයි. "ඇලකින් එගොඩට පනිනු කැමැති කෙනෙක් මෙතෙර ගසක ගැටගනලද ලනුවක උපකාරයෙන් එම රැහැනේ එල්ලී එගොඩට පනින්නාක්" මෙන් කර්මාදි අරමුණු වල ආධාරයෙන් අනන්තර භවයේ ප්‍රතිසන්ධිය ලැබෙන බව සැලකිය යුතුයි. (* කුශල්වූ +අකුශල්වූ)

මෙය මනාසේ දැනගැණීමට චිත්තවීථි කීපයක්ද දක්වනු ලැබේ.

1. කාම ස්වර්ගයෙහි සිට පව්කළ කෙනෙකුගේ මරණාසන්න කාලයේ ඔහු විසින් රැස්කරණලද පාප කර්ම නිමිත්තක් හෝ ඔහුගේ මනොද්වාරයට හමුවෙයි. ඒ අරමුණුකොට මනොද්වාරාවර්ජන සිත ආදිකොට ඇති තදාලම්බනය කෙළවරකොට ඇති ජවන් පසකින් යුත් චිත්තවීථියක් ඉපිද ඒ තදාලම්බන සිතට අනතුරුව භවඞ්ග සිතින් ගන්නාලද අරමුණම ගෙණ චුතිචිත්තය ඉපිද නිරුද්ධවී ගියකල යටකී කර්ම-කර්මනිමිති-ගතිනිමිති යන ත්‍රිවිධ නිමිතිවලින් එකක් අරමුණු කාරගෙණ ජවන චිත්තය සම්බන්ධවූ අවිද්‍යා තෘෂ්ණාවන්ගේ බලයෙන් ජවන චිත්තයෙහි යෙදුනු චේතනාවන්ගේද ප්‍රත්‍යය ලැබීමෙන් අපාය ප්‍රතිසන්ධිචිත්තය (අහෙතුක අකුසල විපාක සන්තිරණ සිත) උපදී.

මේ අනිටාලම්බන චුතියට අනතුරුව යෙදෙන අනිටාලම්බන ප්‍රතිසන්ධියයි.

එහි වින්‍යාසය

| භ | න | ද | ම | ජ | ජ | ජ | ජ | ජ | ත | ත | චු | ප්‍ර | භ | භ | භ | භ |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 |
| අකුසලය නිමිත්ත ගතිනිමිත්ත යන තුනින් එකක් අරමුණු කරයි. | | | | දෙලොස් අකුසල් සිත්වලින් එකක් ජවන කෘත්‍යය සිදුකරයි. | | | | | තදාලම්බන හෝ නැති | | පූර්ව භවයෙහි චිත්ත වීථියට අරමුණුවූ අතීතකර්ම නිමිත්ත අරමුණු කරයි. | | | | | |

මේ සටහනෙහි එකට යාව බිංදු තුනකින් පෙන්වන්නේ උත්පාද-ස්ථිති-භඞ්ග සංඛ්‍යාත ක්‍ෂණ ත්‍රයක් ඇති මහාචිත්තක්‍ෂණයකි භ-අතීත භවඞ්ග; න-භවඞ්ග චලන; ද-භවංගුපච්ඡේද; ම-මනොද්වාරාවජ්ජන ජ-ජවන; ත-තදාලම්බන; චු-චුතිය; ප්‍ර-පටිසන්ධි; යනාදීන් හැඳිනිය යුතුය.

2 නවත් පව්කළ කෙනෙකුගේ මරණාසන්නයෙහි දුගති නිමිත්තක් මනොද්වාරයට මුනගැසෙයි. එහිදී පහත පරිදි චිත්ත වීථියක් ඇතිවී අතීතාලම්බන චුතියට අනතුරුව වර්තමානාලම්බන ගතිනිමිත්ත අරමුණු කොට ප්‍රතිසන්ධි චිත්තය පහළ වෙයි.

එහි සටහන මෙසේය.

| භ | න | ද | ම | ජ | ජ | ජ | ජ | ජ | ත | ත | චු |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 |

| ප්‍ර | භ | භ | භ | භ |
|---|---|---|---|---|
| 000 | 000 | 000 | 000 | 000 |

මේ වීථියේ මරණාසන්න ජවනය විසින් ගත් අරමුණම අල්වා ගෙණ අලුත් භවයෙහි ප්‍රතිසන්ධිය යෙදුන බවද භවාංග සිත් හා චුතිය පෙර ජාතියේ කළ කර්මය අරමුණු කළ බවද ගතිනිමිත්ත නානාක්ෂණික කර්ම ප්‍රත්‍යයෙන් එළඹි සිටි බවද පෙනේ.

---

3 මෙසේම පව්කළ ඇතැම් අයගේ මරණාසන්නයේදී චක්ඛු සොතාදී පඤ්චද්වාරයෙන් එකභව කෙලෙශොත්පත්තියට හේතුවන අරමුණක් හමුවූ කල (දිවස්හුල උන් මරණාසන්න පුද්ගලයා අහර නෙණ ගිය ස්ත්‍රියගේ හිසකේ රාගයෙන් මත්ව ගත්තාසේ) භවාංග චලනාදියෙන් මතු පඤ්චද්වාරාවජ්ජනාදි විථිචිත්තයන් ඉපිද භවාංගාරම්මණයම ගෙණ චුති චිත්තය හා එම අරමුණම ගෙණ ප්‍රතිසන්ධිය පහළවන බවද එය "අතීතාලම්බන චුතියට අනතුරුව යෙදෙන වර්තමානාලම්බන ප්‍රතිසන්ධිය බවද දක්වා ඇත.

එහි සටහන මෙසේයි.

| භ | න | ද | පං | ච | සං | සං | වො |
|---|---|---|---|---|---|---|---|
| 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 |

| ජ | ජ | ජ | ජ | ජ | ත | ත | චු | ප |
|---|---|---|---|---|---|---|---|---|
| 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 |

මෙහි පං–පඤ්චද්වාරාවජ්ජනය, ච–චක්ඛුවිඤ්ඤාණය. සං–සම්පටිච්ඡනය; සං- සන්තීරණය; වො–වොත්ථපනය, යනාදිය දතයුතුය.

4 සුගතියෙහි සිට පින් රැස්කළහුගේ සුගතියෙහි ප්‍රතිසන්ධිය හටගන්නා ක්‍රමය මෙසේය. (කාමාවචර ප්‍රතිසන්ධි දශයේ අරමුණු අතීතවූ හෝ වර්තමානවූ හෝ යමක් අරමුණු කරගෙණ ඇතිවන බවද රූපාවචර අරූපාවචර ප්‍රතිසන්ධි චිත්තයේ අතීතාදි වශයෙන් කාල නියමයක් නැති කසිණ ප්‍රඥප්තියක් අරමුණුකොට ගෙණ හටගන්නා බවද දතයුතුයි.)

සුගතියෙහි විසූ යම් කිසි කෙනෙකු මිය යන කල්හි කාමාවචර සත්වයන්ට නම් කුසල කර්ම හෝ කර්ම නිමිත්ත හෝ රූපාවචර සත්වයන්ට නම් කර්ම නිමිත්ත හෝ මනොද්වාරයට හමුවෙයි. එය අරමුණු කොට තදාලම්බනය කෙළවර කොට ඇති, ජවනවීථිය ඉපද ඊට අනතුරුව භවාංගය විසින් අල්වා ගන්නලද අරමුණම ගෙණ චුති සිත උපදී. ඉන්පසු මරණාසන්න ජවනය විසින් ගන්නාලද අරමුණ ගෙණ එම ජවන වීථිය සම්බන්ධ අවිද්‍යා-තෘෂ්ණාදි කෙලෙශයන්ගේ | බලයෙන් සුගතිය වට නැමී එම වීථි චිත්තයන් විසින් අලුත් භවයෙහි ප්‍රතිසන්ධි චිත්තය පහළ කරවනු ලබන බව දතයුතුයි. මේ වනාහි අතීතාලම්බන චුතියට අනතුරුව අතීතාලම්බන වූ හෝ කසිණාදි නවත්තබ්බාලම්බනවූ ප්‍රතිසන්ධිය ඇතිවන ක්‍රමයයි. එහි වීථි සිත 1 වෙනි වීථි සිතියම මෙනි.

5 තවද කාම සුගතියෙහි සිට පින් කළ ඇතැම් කෙනෙකුගේ මරණාසන්න අවස්ථාවේ කාමාවචර කුශලයන්ට සුදුසු පරිදි මිනිස්ලොව උපදින්නේ නම් මවුකුස ආදි රූපාරම්මණයක් හෝ දෙව්ලොව උපදින්නේ නම් උද්‍යාන විමාන කල්ප වෘක්ෂාදි රූපාරම්මණයක් හෝ ගතිනිමිති වශයෙන් මනොද්වාරයට හමුවෙයි. එකල 1 වෙනි වීථි සටහනේ ආකාර චිත්ත වීථියක් උපදී අනන්තර භවයේ ප්‍රතිසන්ධිය පහළවෙයි. මෙය අතීතාලම්බන චුතියට අනතුරුව යෙදෙන වර්තමානාලම්බන ප්‍රතිසන්ධියයි. එහිදී මුල් භවාංග හා චුති සිතට පූර්ව කර්මයද ප්‍රතිසන්ධිය හා අවසාන භවාංගයන්ට වර්තමාන ගතිනිමිත්තයද අරමුණු වන බව දතයුතුයි.

6 තවත් ඇතැමෙකුගේ මරණාසන්න කාලයේ ඔහුට පින් පිණිස ඥාතීන් විසින් බුද්ධ පූජාදිය සඳහා එලවනලද මල් පහන් ආදි පූජා භාණ්ඩ සම්බන්ධ රූපාරම්මණ හෝ බණ ඇස්වීම් ශබ්ද පූජා පැවැත්වීම් ආදි සද්දාරම්මණයක්හෝ සුවඳ දුම්-ආහාරපාන-වස්ත්‍ර ආදීන් පිළිබඳ ගන්ධ-රස-පොට්ඨබ්බ ආදී

ආරම්මණයක් හෝ චක්ඛුරාදී පඤ්චද්වාරයන්හි අරමුණුවූ කල අතීත භවඞ්ග-භවඞ්ග චලන-භවඞ්ගුපච්ඡේද-පඤ්චද්වාරාවජ්ජන චක්ඛුවිඤ්ඤාණ (සුදුසු පරිදි සෝත විඤ්ඤාණ ආදිහුද ගත යුතුයි.) සම්පටිච්ඡන-සන්තීරණ-වොට්ඨපන ආදී වීථි සිත්ද කුසල් ජවන් සිත් පසක්ද තදාලම්බන දෙකක්ද පහළ වෙයි. අවසාන චිත්තක්ෂණ දෙක චුති හා ප්‍රතිසන්ධි වෙයි. එහි චුති සිත හා මුල් භවඞ්ගයෝ පෙර කුසල කර්මයද සෙසු වීථි සිත් හා පච්චක්ඛය වර්තමානවූ රූපාදී අරමුණුද අල්වා ගෙණ පහළ වන බව දක්වා ඇත්තේය. එහි චිත්ත වීථිය නො: 3 දරණ වීථිය මෙනි.

7 රූපාවචර බ්‍රහ්මයෙකුගේ මරණාසන්නයේදී කාමාවචර කුසලයක් හෝ කුශල කර්ම නිමිත්තක් හෝ ගති නිමිත්තක් හෝ පඨවි කසිණාදි ප්‍රඥප්ති නිමිත්තක් හෝ ධ්‍යාන සිතක් හෝ මනොද්වාරයට වැටහෙයි. නැතහොත් චක්ඛු-සෝත යන ද්වාර දෙකින් එකකට කුසලොත්පත්තියට හේතුවන රූපාදී අරමුණක් හමුවෙයි. එහිදී ජවන වීථිය ඉපිද රූපාවචර බැවින් තදාලම්බනනොඉපද ජවනයට අනතුරුව භවඞ්ගයාගේම අරමුණ අල්වා ගෙණ මරණ සිත පහළවෙයි. එයට අනතුරුවමරණාසන්න ජවන වීථිය විසින් ගන්නාලද ආරම්මණයාගේ ආයුෂය තව ඉතිරිව ඇති හෙයින් ඒ අරමුණම අල්වාගෙණ දෙවෙනි භවයෙහි ප්‍රතිසන්ධි සිත පහළවෙයි. එහි මනොද්වාරික-චක්ඛු ද්වාරික චිත්ත වීථි දෙක මෙසේය;

(මනොද්වාරික)

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| භ | න | ද | ම | ජ | ජ | ජ | ජ | ජ | චු |
| 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| භ | න | ද | ප්‍ර | භ | භ | භ |
| 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 |

(චක්ඛුද්වාරික)

| | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| භ | න | ද | පං | චි | සං | සං | වෝ | ජ |
| 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | -000 | 000 |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| ජ | ජ | ජ | ජ | චු | ප්‍ර | භ | භ |
| 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 |

මෙසේ කාමාවචර කුශලකර්මාදී අරමුණු තුන ලැබෙන්නේ බඹලොවින් සැව කාමලෝකයෙහිම උපදිනවුන්ටය. කසිණ ප්‍රඥප්තිය අරමුණු වන්නේ රූපී බ්‍රහ්මලොකයෙන් සැව රූපී බ්‍රහ්මලොකයෙහිම උපදිනවුන්ටය. ධ්‍යාන සිත අරමුණුවන්නේ රූප ලෝකයෙන් චුතව අරූප ලෝකයෙහි උපදිනවුන්ටය.

"බඹ ලොවින් සැව සතර අපායෙහිත්; අහෙතුක ජාත්‍යන්ධාදී මිනිසත් බැවෙහිත්; නූපදී. එහෙයින් බඹලොවින් චුත වන්නාට අකුශල කර්ම නිමිත්තාදිය නොවැටහේමය."

8 තවද සතර අපායෙහි සිට පවු කළ අයෙකුගේ මරණාසන්න කාලයෙහි ඒ පාපකර්මය හෝ කර්ම නිමිත්ත හෝ දුගති නිමිත්ත මනොද්වාරයට ආපාථගතවෙයි. නැතහොත් චක්‍ෂුරාදී පඤ්චද්වාරයන්ගෙන් එකද්වාරයකට හමුවෙයි. එය අරමුණු කොට මනොද්වාරික හෝ පඤ්චද්වාරික චිත්තවීථියක් ඉපිද අනතුරුව මරණ සිත (චුති සිත) පහළවී ජවනය විසින් ගත් අරමුණෙහිම එල්බ සතර අපායට ඇතුළත් ප්‍රතිසන්ධි චිත්තය පහලවෙයි. එහිදී භවඞ්ග චලන-භවංගුපච්ඡේද මනොද්වාරාවර්ජන සහ ජවන පසද; තදාලම්බන දෙකද, ඉක්බිති චුති හා ප්‍රතිසන්ධිද අනතුරුව භවඞ්ගද, යන සිත් පිළිවෙළින් උපදී. පඤ්චද්වාරික චිත්ත වීථියෙහිදී භවඞ්ගයන්ට අනතුරුව පඤ්චවිඥානයෝද සම්පටිච්ඡන සන්තීරණ වොත්ථපන හා පඤ්චජවනයෝද තදාලම්බන දෙකද අවසානයේ චුතිය හා පටිසන්ධිද සෙදීමෙන් චිත්ත වීථිය අවසන් වෙයි.

9 සප්ත කාමස්වර්ගයෙන් චුතව අසංඥතලයෙහි උපදනා පුද්ගලයාගේ චුති පටිසන්ධිය ඇතිවන්නේ වායෝ කසිණය හෝ ආකාශ කසිණය වඩා පඤ්චමධ්‍යානය උපදවා ගත්තහුගේ එම කසිණ නිමිත්තය. එය අරමුණුකොට ගෙණ මනොද්වාරික ජවන චිත්ත වීථිය ඉපිද ඊට අනතුරුව භවඞ්ගයාගේ අරමුණ ගෙණ චුති චිත්තය ඉපිද ඉක්බිති තමා ලබාගත් රූපාවචර පඤ්චමධ්‍යාන චෙතනා සංඛ්‍යාත කර්මප්‍රත්‍යයෙන් අසංඥතලයෙහි රූපකලාපයක් පහළ වෙයි. එය "ජීවිත නවක" නමින් හඳුන්වනු ලැබේ.

ඒ රූප කලාපයාගේ "ස්ථිති" ක්‍ෂණයෙහි පටන් ප්‍රවෘත්ති කාලයයි කියනු ලබන "මහා කල්ප පන්සියයක්" මුළුල්ලෙහි ජීවිත නවක සෘතු නවක රූප කලාප දෙක පමණක් පහළවී නිරුද්ධවෙමින් පවත්නේය. අසංඥතලයෙහි උපදින්වුන්ගේ ප්‍රතිසන්ධි ක්‍රමය සම්බන්ධ චිත්තවීථි සටහන මෙසේය.

භ ත ද ම ජ ජ ජ ජ ජ
000 000 000 000 000 000 000 000 000

චු ප්‍ර ජී ජී ජී ජී ජී ජී
000 000 000 000 000 000 000 000

10 අසංඥ තලයෙන් චුතවන්නහුගේ චුතිය හා පටිසන්ධිය කෙසේවේද? ඒ මෙසේයි. අසඥතලයෙහි උපන්නහුගේ ආයුෂය මහාකල්ප පන්සියයකි. මෙම කාලය තුළ ජීවිත නවක රූප කලාපය (ශුද්ධාෂ්ටක සහ ජීවිතින්ද්‍රිය) අවිච්ඡින්නව පැවති චුතවනකල එම රූප කලාපයම චුති කෘත්‍යයද කෙරෙයි. එසේ චුතවූ කල එයට අනතුරුව ප්‍රතිසන්ධි දීමට සුදුසු කාමාවචර මහා විපාක අටින් එකක් ප්‍රතිසන්ධි වශයෙන් පහළ වෙයි. මේ අසඥ තලයෙහි ප්‍රතිසන්ධියට පෙර එනම් කල්ප පන්සියයකට පෙර කරණලද යම්කිසි කුශල කර්මයක් හෝ කුශල කර්ම නිමිත්තක් හෝ මෙකී ප්‍රතිසන්ධි සිතට අරමුණු වන බවද දක්වා ඇත්තේය. මෙකී ප්‍රතිසන්ධි සිතට කර්මාදිය ඉදිරිපත් කරන්නේ අසඥතලයට පැමිණීමට පෙර උපදවනලද ධ්‍යාන චේතනා බලයෙන් බවද දතයුතුයි.)

මෙකී ප්‍රතිසන්ධිය පිළිබඳ චිත්ත වීථි සටහණ:

ජී ජී ජී ජී ජී චු ප්‍ර භ
000 000 000 000 000 000 000 000

භ භ භ භ භ භ භ භ භ
000 000 000 000 000 005 000 000 000

11 ක්ෂීණාශ්‍රව රහතුන් වහන්සේගේ මරණාසන්න චිත්ත වීථිද මෙහිම දැක්විය යුතුය. එබඳු (බුදු පසේබුදු-රහත් යන ක්ෂීණාශ්‍රවයන් වහන්සේලාගේ චුතියෙන් පසු පටිසන්ධියක් නොයෙදෙන්නේය. "නත්ථිදානි පුනබ්භවො" "ඛීණාජාති" "භවනෙත්ති සමූහතා" ආදී තථාගත දෙශනා පාඨවලින් දක්වෙන්නේද එයමය. අග්‍රමාර්ගඥානයෙන් අවිද්‍යා-තෘෂ්ණා සමුච්ඡේද වශයෙන් නැසූ ක්ෂීණාශ්‍රවයන් වහන්සේගේ සිත "පැලවීමේ ශක්තිය නැති බීජයක් මෙනි.

දුම් ගැස්වීම් අව් ගැස්වීම් තැම්බීම් ආදී කෙබඳු සංස්කාර යෙදූවත් බොල්විය නොපැලවෙන්නාසේ ක්ෂීණාශ්‍රවයන්වහන්සේ විසින්ද සිදුකරණු ලබන බුද්ධොපස්ථාන ධර්මශ්‍රවණ ආදී සංස්-කාරයෝ හුදු ක්‍රියා මාත්‍ර වෙති. වැලක් උදුරා දමූවද එහි 'තෙත්' ගතිය කීප දිනක් පැවතී පසුව වියළී යන්නාසේ ක්ෂීණාශ්‍රව-යන් වහන්සේගේද ප්‍රතිසන්ධිජනක කර්ම වේගය ඇතිනාක් ජීවිතෙන්ද්‍රියය පැවත චුති චිත්තයෙන් පසු ජීවිතෙන්ද්‍රියයද චිත්ත

පරම්පරාවද සර්වප්‍රකාරයෙන් නිරුද්ධ වන්නේය. ක්ෂීණාශ්‍රවයන් වහන්සේගේ පිරිනිවන් සමයෙහි කර්මනිමිත්තාදී විශයෙන් ව්‍යවහාර නොකරන්නාවූ අරමුණු කිරීමට සුදුසු ත්‍රෛභූමික සංස්කාර ධර්මයන් අරමුණු කොට ගෙණ මනොද්වාරා වර්ජන සිත ඉපිද කාමාවචර 'මහාක්‍රියා' සිත් අට අතුරෙන් යම් සිතක් පරිනිර්වාණ ජවන කෘත්‍ය වශයෙන් ඉපිද නිරුද්ධවේ. එම අරමුණ අල්වාගෙණ තදාලම්බන සිත් දෙකක් ඉපිද අනතුරුව භවඞ්ගයන්ගේම අරමුණ අල්වාගෙණ (තවත් භවයෙක ප්‍රතිසන්ධියකට අනන්තර ප්‍රත්‍යයක් නොමැති හෙයින්) 'ච්‍යුති' කෘත්‍යය වශයෙන් එක් වරක් ඉපිද අනාදිමත් කාලයක සිට පැවත ආ චිත්ත පරම්පරාව නිරුද්ධවන බවද වැඩිදුරටත් දක්වෙයි.
ක්ෂීණාශ්‍රවයන්ගේ පරිනිර්වාණ චිත්තවීථි සටහණ.

| | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ත | න | ද | ම | ක්‍රි | ක්‍රි | ක්‍රි | ක්‍රි | ක්‍රි |
| 000 | 000 | 060 | 000 | 000 | 000 | 009 | 000 | 000 |

| | | |
|---|---|---|
| ත | ත | චු |
| 000 | 000 | 000 |

## පුනරුත්පත්තිය පිළිබඳ සාමාන්‍ය පිළිවෙළ

පුනරුත්පත්තියක් නැතැයි කියන්නෝද ඇතැයි කියන්නෝද ලොව සදාකාලිකයයි හෝ මෙයින් ,උච්ඡේද වේයයි හෝ කියන්නෝද තම තමන්ගේම නොකැමැත්තෙන් හෝ කැමැත්තෙන්ම චුතියට හා පටිසන්ධියට පත්වෙයි.

දිබ්බෙන චක්ඛුනා විසුද්ධෙන අතික්කන්ත මානුසකෙන සත්තෙ පස්සාමි චවමානෙ උපපජ්ජමානෙ හීනෙ පණීතෙ සුවණ්ණෙ දුබ්බණ්ණෙ යථා කම්මූපගෙ සත්තෙ පජානාමි. (දෙවදූත සූත්‍රය) යනුවෙන් තථාගතයන් වහන්සේ වදාළේ මැරෙන උපදින සුගති දුගතියෙහි ප්‍රණීතව හා හීනව කර්මානුරූපව සැපදුක් ලබන සත්ත්වයන් තමන් වහන්සේගේ අසාධාරණ දිවැසින් දකින බවයි.

සත්වයෙකු මිය යන කල සත්වයාගේ ශරීරය දුබලවීමෙන් "අව්වේ බහාලන ලද තල්පතක නිල් පැහැය ක්‍රමයෙන් වියැලී යන්නාසේ පංචේන්ද්‍රියයෝ දුබල බවට පත්වෙත්. කායෙන්ද්‍රියය; මනෝන්ද්‍රියය; ජීවිතෙන්ද්‍රියය; යන ඉන්ද්‍රියයෝ පිහිටන හෘදය වස්තුව පිහිටා තිබෙන තැන එක්වෙත්. එයට අනතුරුව හෘදය වස්තුව පමණක් ඇසුරු කොට පවත්නා විඥානය ඉතිරි වෙයි. එකල ඔහු විසින් කරණලද ගරුකර්මයක් හෝ නිතර පුරුදු කරණලද "ආචිණ්ණ කර්මයක්" හෝ මරණාසන්නයේ කරණලද "ආසන්න කර්මයක් හෝ කල්ප ලක්ෂ කෝටි ගණනකට පෙර උවද කරණලද "අපරාපර්‍යවේද්‍ය" කර්මයක් හෝ (කුශල හෝ, අකුශල වියහැක.) සිතට වැටහෙයි. නානාක්ෂණිකකර්මප්‍රත්‍යබලයෙන් එය ඉදිරිපත් වෙයි. ඒ සමගම කුශලය හෝ අකුශලය කිරීමට ආධාර වූ කර්මනිමිත්ත එළඹෙයි. නැතහොත් ගතිනිමිත්ත වශයෙන් උද්‍යාන විමාන නරකාග්නි ජ්වලිත ආදියක් සුදුසු පරිදි එළඹ සිටී. එකල්හි යටකී පරිදි මරණාසන්න චිත්තවීථියක් ඉපදී කර්මනිමිත්ත කුශලයට අයත් වුවක් නම් කුශල් ජවන වීථියකින් පසු සුගතියෙහිද අකුශලයට අයත් කර්මාදියක් වැටහුනේ නම් අකුශල ජවන වීථියකින් පසු දුගතියෙහිද පටිසන්ධිය යෙදෙයි.

පටිසන්ධිය ලබන භවයේ ආදීනව නොපෙනෙන්නේ මරණාසන්න චිත්තවීථියේ යෙදෙන අවිද්‍යාව නිසාය. කර්මනිමිති; ගති නිමිති කෙරෙහි සිත නැමී පවත්නේ තෘෂ්ණාව නිසාය. මෙසේ යෙදුන මරණාසන්න ජවන වීථිය සමග උපන් චේතනා-සංස්කාරයන් විසින් ප්‍රතිසන්ධි ස්ථානයට විඥානය ගෙණවුත් බහාලන්නාක් මෙන් අලුත් භවයේ ප්‍රතිසන්ධිය ඇතිවෙයි. කිණිසිරයෙහි සිට කුලුගෙඩි පහරක් වැදීමෙන් මරණයට පත්වෙන මැස්සාටද ගතිනිමිති පහළවීමෙන් යටකී චිත්තවීථියක් ඉපිදම මැස්සා මැරෙන බවද දක්වා තිබේ. (කොතරම් හදිසි මරණය කාදී උවද ගතිනිමිති පහළවී මැරෙන බව දතයුතුයි. චිත්ත වේගයේ ඇති බලය නිසා එබඳු සිදුවීමක් වන බවද සැලකිය යුතුයි.) මෙසේ මේ චුතිපටිසන්ධි දෙකේ අතරක් කිසිසේත් නොමැති නිසා උපදින්නේ මේ සත්වයාමයි ප්‍රකාශ කරති. එහෙත් මේ සත්වයාගෙන් කිසිවක් අනන්තර භවයට යන්නේද නැත. අනන්තර භවයේ ප්‍රතිසන්ධිය ලබන්නේ අන්කෙනෙකුද නොවේ. ශබ්දයෙන් ප්‍රතිශබ්දය; ප්‍රදීපයෙන් ප්‍රතිප්‍රදීපය-කැඩ

පහනෙහි පිළිබිඹුව ඡායාරූපය ආදියෙහි මෙන් මේ සත්වයාගේ චිත්තපරම්පරාව අනුව ඉපදෙන පටිසන්ධිය මෙයමද අනිකක්ද නොවන බව දක්වා ඇත. එසේම චිත්ත පරම්පරාවේ ඇති සම්බන්ධය නිසා කල්පලක්ෂයකට පෙර වුවද කරණලද කර්ම-යක විපාක මෙහිදී ලැබෙන බවද දක්වයි,



“සඞ්ඛාර පච්චයා විඤ්ඤාණං” යන්නෙහි සංක්ෂේප විස්තර යයි.

උපක්ඛලිතස්ස පතනං’විය සඞ්ඛාර පච්චයා විඤ්ඤාණං

(සංස්කාර ප්‍රත්‍යයෙන් සිදුවන විඥානය භවාන්තරයට පමුණුවන හෙයින් පය පැකිළුනාවූ අන්ධයාගේ වැටීමක් වැනිවේ.)

සඞ්ඛාර පරිග්ගහිතං විඤ්ඤාණං ගබ්භෙ පතිට්ඨං ලභති පරිණායක පරිග්ගහිතො රාජකුමාරොවිය රජ්ජෙ; (සංස්කාරයන් විසින් ගන්නාලද විඥානය ගර්භයෙහි පිහිටීම ලැබේ. පරිණායකයන්හු විසින් පරිග්‍රහිත රාජකුමාරයෙක්හු රාජ්‍යයෙහි මෙනි,

## 21 පරිච්ඡේදය

# විඤ්ඤාණ පච්චයා නාම රූපං

**විඥාණ ප්‍රත්‍යයෙන් "නාමරූපය" වේ.**

මෙහි "විඥාන" යනු කුමක්දැයි යම පරිච්ඡේදයෙන් විස්තර කරණලදී. විඥාන ප්‍රත්‍යයෙන් යෙදෙන නාම රූපයෝ කවරහුද? ඔවුන් උපදින්නේ කෙසේද? යනු දතයුතුවේ. "විඥානය" යනුද නාමයෙකි. එසේ නම් නාම රූපං යන්නෙහි සඳහන් නාමය හා රූපය කුමක්දැයි ප්‍රශ්නයෙක් පැනනගී

"නාම රූපංති එත්ථ නාමංති ආරම්මණාභිමුඛං නමනතො වෙදනාදයො තයො ඛන්ධා රූපන්ති චත්තාරි මහාභූතානි චතුන්නඤ්ච මහාභූතානං උපාදාය රූපං" (විභඞ්ගට්ඨකථා) යනුවෙන් දක්වා ඇති පරිදි "රූපාදි ආරම්මණයනට අභිමුඛව නැමෙන හෙයින් වෙදනා සඤ්ඤා සංඛාර යන සකන්ධත්‍රයය නාම" නම්වේ. පඨවි ආපො තෙජො වායු යන සතර මහා භූත යෝද ඒ මහාභූතයන් නිසා පවත්නා උපාදාය රූපයෝද රූප" නම් වෙත්.

අසංඥසත්ත්වය හැර සෙසු සියලු භව-යෝනි-ගති-විඥානස්ථිති යන සත්වාවාසයන්හි නාමය පවතී. කාම-රූප යන භව දෙක්හිද; අණ්ඩජ-ජලාබුජ-සංසෙදජ-ඕපපාතික යන සිව් යොනියෙහිද; දිව්‍ය-බ්‍රහ්ම-මනුෂ්‍ය-නිරය-තිරච්ඡාන-ප්‍රෙත යන ගතිවලද; අරූපලය හැර සෙසු සත්වාවාසයන්හිද රූපය පවත්නේය. (භූත රූප-උපාදාය රූප යන දෙයාකාර රූප කලාප විස්තර ලෙස 97 වෙනි පිටුවෙහි දක්වා ඇත.)

සඞ්ඛාර පච්චයා විඤ්ඤාණං යනුවෙන් වදාළේ ප්‍රතිසන්ධි හා ප්‍රවෘත්ති වශයෙන් දෙයාකාරවූ විපාක විඥානය සඳහාය. විඤ්ඤාණ පච්චයා නාමරූපං යන්නෙන් වදාළේ ප්‍රතිසන්ධි විඥානය සමගම යෙදෙන ඵස්ස-වෙදනා ආදී චෛතසික සඳහාය. සිතක් යෙදෙන්නේ චෛතසිකද සමගය. ප්‍රධානවූ ප්‍රතිසන්ධි සිත සමග යෙදෙන වෙදනාදි චෛතසික මේ නාමරූපං යන්නෙහි සඳහන් නාමයට ඇතුළත්වන බව දතයුතුයි. ප්‍රධානවූ ප්‍රතිසන්ධි සිත නොමැතිනම් චෛතසිකද නූපදී. චිත්ත චෛතසික දෙදෙනාගෙන් සිත ප්‍රධානය. "මනොපුබ්බඞ්ගමා ධම්මා මනොසෙට්ඨා මනොමයා" (ධම්මපදය) යනුවෙන් වදාළේද චෛතසික ධර්ම සිත පෙරටුකොට-සිතින්ම උපදනා බවයි.

විඤ්ඤාණ පච්චයා නාම රූපං යන්නෙහි ප්‍රභෙද තුනක් යෙදෙන අයුරු දක්වා ඇත. එනම්:-

1 විඥාන ප්‍රත්‍යයෙන් නාමය වේ.

2 විඥාන ප්‍රත්‍යයෙන් රූපය වේ.

3 විඥාන ප්‍රත්‍යයෙන් නාමරූප වේ යනුවෙනි.

එසින් විඥාන ප්‍රත්‍යයෙන් නාමය පමණක් වන්නේ අරූපාවචර භූමියෙහිය. එහි චිත්ත චෛතසික ස්කන්ධය පමණක් ඇත්තේය.

විඥාන ප්‍රත්‍යයෙන් රූපය වන්නේ අසඥ තලයෙහිය. එහි ජීවිත නවක ප්‍රතිසන්ධිය ලබන සැටිද චුතිය යෙදෙන සැටිද යට දක්වා ඇත.

සෙසු කාමාවචර රූපාවචර භූමින්හි විඥාන ප්‍රත්‍යයෙන් නාම රූප දෙකම හටගන්නා බව සැලකියයුතුයි.

අරූතල සතර හැර සෙසු සියලු තන්හි ප්‍රතිසන්ධි සිත සමගම රූපයන්ගේද පහළවීම සිදුවේ. රූපී බ්‍රහ්ම ලොකවල ස්ත්‍රීභාව පුරුෂභාව යන භාවරූප දෙක නැත. කාමලෝකයේ වුවද පණ්ඩකයන්ටද ප්‍රථම කල්පිකයන්ටද ඒ භාවරූප දෙක නැත. නරකයෙහිද ආකාසට්ඨ, දෙව යොනිවලද (සදෙව් ලොවත් සමග) සම්පූර්ණ අඞ්ග සහිතව (සොළසැවිරිදි වයස ඇතිව මෙන්) පහළවෙයි. ප්‍රෙතලොක අතුරෙහි නිජ්ඣාමතණ්හා ප්‍රේතලොකයෙහි ඕපපාතිකව පහළවෙති. සංසෙදජ වශයෙන් උපදනා සත්වයන්ගේ ශරීර පළමුවෙන් ඉතා කුඩාව සැදී ක්‍රමයෙන් දියුණුවෙයි. පක්ෂි සර්ප ආදීහු බිජුවටින් උපදියි. (පොක්ඛර සාදී-පද්මාවත් ආදීහු පියුම් ගැබෙහි සංසෙදජ වූහ. ප්‍රථම කල්පික මනුෂ්‍යයෝද ඕපපාතික වූහ.)

ඕපපාතික බ්‍රහ්මයන්ට ප්‍රතිසන්ධිඥානය සමගම "චක්ඛුදසක, සොතදසක; වත්ථුදසක" යන රූප කලාප තිස සමගම "ජීවිතනවක" යන රූප කලාප නවයද යන රූප (39) පහළවෙයි. ප්‍රවෘත්තියෙහිදී "චිත්තසමුට්ඨාන; උතුසමුට්ඨාන රූපකලාපයෝ වෙති. (එහි ආහාරජ රූපයෝ නැත.)

කාමවිරාග භාවනාබලයෙන් බඹලොව උපන් බ්‍රහ්මයින්ට භාවරූප නැත. තථාගත දර්ශනයත් ධර්මශ්‍රවණයත් පිණිස චක්ඛු-සොත ආයතනයෝ පහළවෙති.

මෙකී බ්‍රහ්මයන් හැර කාමලොකය පිළිබඳවූ සෙසු සම්පූර්ණ අභ්‍යාසන ඇති දෙව-අසුර-නරක-නාගාදී සංස්වේදජවූද, ඕප-වූද සත්ත්වයන්ගේ ප්‍රතිසන්ධි විඥානය සමගම "චක්ඛුදසක-සොත දසක-ඝාණදසක-ජිව්හාදසක-කායදසක-භාවදසක වත්ථුදසක' යන දසක රූප කලාප 7 ක් හෙවත් රූප 70 ක් පහළවෙයි ප්‍රවෘත්ති වශයෙන් සියලුම රූප සුදුසු පරිදි යෙදෙයි. (ස්ත්‍රීන්ට පුරුෂ භාවද, පුරුෂයින්ට ස්ත්‍රී භාවද, නපුංසකයන්ට ඒ භාවරූප දෙකමද, අන්ධයන්ට චක්ඛුප්පසාදයද, බධිරයින්ට සොතප්පසාදයද ආදී ක්‍රමයෙන් නොයෙදෙන නිසාය. සුදුසු පරිදි කියා කීවේ )

අණ්ඩජ ජලාබුජ සත්වයන්ගේ ප්‍රතිසන්ධිය සමගම කායදසක. භාවදසක-වත්ථුදසක යන රූප කලාප තුනක්(තිසක්) පහළවේ ප්‍රවෘත්තියෙහි යටකී අයුරු මෙනි.

අසඤ්ඤතලවාසී සත්වයන්ට ප්‍රතිසන්ධියෙහිදී "ජීවිතනවකය ලැබෙයි. ප්‍රවෘත්තියෙහිදී ශබ්දය හැර උතුසමුට්ඨාන රූප පමණක් ලැබෙයි.

අට්ඨවීසති කාමෙසු – හොන්ති තෙවීස රූපිසු
සත්තරසෙවා සඤ්ඤීනං– අරූපෙ නත්ථි කිඤ්චිපි

සද්දො විකාරො ජරතා – මරණඤ්චොපපත්තියං
නලබ්භන්ති පවත්තෙතු– න කිඤ්චිපි නලබ්භති.

(අභිධම්මත්ථසඞ්ගහ)

කාම භූමියෙහි රූප අටවිස්සම ලැබෙයි. රූප භූමියෙහි තෙවිස්සකි. (ඝාණ-ජිව්හා-කාය-භාව-එකී නැති) අසඤ්ඤයින්ට (චක්ඛු-සොත--ඝාණ-ජිව්හා-කාය-භාව-හදය-විඤ්ඤත්ති-සද්ද හැර) සතළොසකි. අරූපයෙහි කිසිදු රූප නැත.

සද්ද-විකාර-ජරතා-අනිච්චතා යන රූප ප්‍රතිසන්ධියෙහි නොලැබේ. ප්‍රවෘත්තියෙහි සියල්ල ලැබේ." යනු භාවයි.

# විඤ්ඤාණපච්චයා නාමරූපං

(ii කොටස)

## විඥාන ප්‍රත්‍යයෙන් නාමරූප වේ.

යට දක්වූයේ ප්‍රතිසන්ධි විඥානය සමගම ලැබෙන නාමරූපයන්ගේ සංකීර්ණ (කලවම්) විස්තරයකි. අනතුරුව කාමලෝකයෙහි මනුෂ්‍යයාගේ ප්‍රතිසන්ධිය හා නාම රූපයන්ගේ වැඩීම දක්වනු ලැබේ.

මවුපියන්ගේ සඞ්ගමය; මවුගේ මල්වර කාලයෙන් දින සතක් තුළ කාලය; උත්පත්තියට යොග්‍යවූ සත්ත්වයෙකුගේ එළඹ සිටීම, යන කරුණු තුන එක්වීමෙන් මනුෂ්‍යයාගේ ප්‍රතිසන්ධිය වන බව තථාගත ධර්මයෙහි ඇත්තේය. ("තිණ්ණං ඛො පන භික්ඛවෙ සන්නිපාතා ගබ්භස්ස අවක්කන්ති හොති" යනුවෙන් මැදුම් සඟියෙහි මහා තණ්හා සඞ්ඛය සූත්‍රයෙහි වදාළහ.) මේ සාමාන්‍ය පිළිවෙල වුවද "සාමපණ්ඩිත; මණ්ඩව්‍ය කුමාර" ආදීන්ගේ ප්‍රතිසන්ධිය නාභිපරාමර්ශනයෙන්ද, "ඉසිසිඞ්ග" තාපසයන්ගේ ප්‍රතිසන්ධිය මුවදෙනක විසින් ඇදුරු තවුසාණන් මුත්‍ර කළ තැනවූ ශුක්‍ර සහිත මූත්‍ර පානය කිරීමෙන්ද; කතකොකුන්ගේ ප්‍රතිසන්ධිය පුරුෂ සංයෝගයක් නොමැතිව මේඝ ගර්ජනා නාදය ඇසීමෙන්දැයි අස්වාභාවික ප්‍රතිසන්ධිද ඇතිබව දක්වා තිබේ. තවද ස්ත්‍රීන්ට සිහිනෙන් මෙවුන්දම් සෙවුනා බව පෙනේද; ඇ සෘතු ස්නානය කළ තැනැත්තියක ප මි යටකී සෘතුශ්‍රොණිතය වාතය මගින් දරුගැබෙහි පතිත වීමෙන් දරු ප්‍රතිසන්ධි යෙදෙන බව වෙදයෙහි ඇතැයි කියත්.

මෙසේ පුරුෂ සංසර්ගය නැතිවම රාග චේතනාව හටගැණීමට ශක්තිය ඇති යම්කිසි හේතුවක් ඇතිවූ විටද ප්‍රතිසන්ධිය යෙදෙන බව පෙනේ. ඒ වනාහි විශේෂ සිද්ධිය. හටගන්නා ප්‍රතිසන්ධි බීජය නමුදු ජනක කර්මයේ දුබලකම; ගර්භාෂයේ දුබල වාතය හෝ ප්‍රතිසන්ධි බීජ නැසීමේ තරම් දුෂ්ට උෂ්ණය, ගර්භාෂය ආශ්‍රිත පණුවන් විසින් කා දැමීම, යනාදී කරුණු නිසා විනාශ වී යන බවද කියති. මෙකී-විකල්පහේතුන්ගෙන් වෙන්වූ ස්වභාවික ප්‍රතිසන්ධිය මව්පිය දෙදෙනාගේ ශ්‍රොණිත-ශුක්‍ර ධාතු දෙක ඇසුරු කොට පූර්ව කර්මබලයෙන් මව්කුස සිදුවේ. "සඞ්ඛාර පච්චයා විඤ්ඤාණං" යනුවෙන් වදාළේ මෙබඳු ප්‍රතිසන්ධිජනක කර්මය හා ප්‍රති

සන්ධි චිත්තය සඳහාය. මෙකී ප්‍රතිසන්ධි චිත්තය සමගම ඵස්ස වේදනා චේතනා ආදී චෛතසික සමූහයක්ද කායදසක-වත්ථු දසක හා පිරිමියෙකු නම් පුම්භාව දසක හෝ ස්ත්‍රියකු නම් ඉත්ථිභාවදසක යන රූපකලාප (මිටි) තුනක් පහළවේ. විඤ්ඤාණපච්චයා නාමරූපං යයි වදාළේ ප්‍රතිසන්ධි චිත්තය සමගම පෙර පසු නොවී පහළවන යටකී ඵස්සාදී චෛතසික ධර්මයන් හා මෙකී රූප කලාපයන් පිළිබඳවයි. නපුංසකයෙකු නම් භාවදසක නො මැතිව පහළවෙයි.

(මෙකී කලාප-දසක ප්‍රතිසන්ධි සිත සමග යෙදෙන චෛතසික ආදිය අභිධර්මාර්ථ සංග්‍රහය බලා දතයුතුයි. ග්‍රන්ථ බාහුල්‍ය භීතිය නිසා ප්‍රකාශව නොවෙමු.) මෙසේ පිළිසිඳ ගන්නා ප්‍රතිසන්ධි බීජයට ත්‍රිවිධ රූප කලාප සංයෝගයට "කලල බීජය" යයි කියනු ලැබේ. මෙය ප්‍රමාණයෙන් අලුත උපන් එළු වස්සෙකුගේ ලොම් ගසක් තිතෙලක බහා යටිකුරු කොට ඇල්ලූකල ගලා වැතිරෙන තෙල් බිඳ පමණ" යයි දක්වා ඇත.

ජාත්‍යන්ධ-ජාතිබධිර-ජාතිමූග ආදීන්ගේ උපත යටකී අයුරු ප්‍රතිසන්ධි චිත්තය අනුවම සිදුවන බවද කිසිම දෙවියෙකු යකෙකු විසින් එකී අඞ්ගහීනත්වය නොකරනු ලබන බවද දත යුතුයි. මනඃකල්පිත මිථ්‍යාවාදීහු දෙව බලයෙන් ඇස් අන්ධ වෙතැයි කියත්.

මෙසේ ඉතා දක්වූ රූප කලාප තුන ඔවුනොවුන්ගේ පැවැත්මට උදව් වෙමින් ආපෝ ධාතුව විසින් එකට බඳනා ලදුව වටිකුරුව වායෝ ධාතුව විසින් එහා මෙහා යා නොදී ආරක්ෂා කරණ ලදුව කර්මජ තෙජෝ ධාතුවෙන් කුණුවී යා නොදී උෂ්ණවත් වෙමින් උත්පාද-ස්ථිති-භඞ්ග යන ක්ෂණත්‍රයකින් යුක්තව ඉපදී ඉපදී බිඳී බිඳී පවත්නා බව දතයුතුය.

**චතුබ්බිධ රූප සමුට්ඨාන**

"විඤ්ඤාණපච්චයා නාමරූපං" යනු වෙන් වදාළේ විඤ්ඤාණය නිසා රූපයන් ඇතිවන බවය, එහෙත් රූප හට ගැණීමට ප්‍රත්‍යවන කාරුණු සතරක් ඇත්තේය. එනම් කර්ම චිත්ත උතු-ආහාර යන සතරයි. රූප උපදවන කර්ම නම් අකුසල් සිත් දොළොස; කාමාවචර කුසල් අට; රූපාවචර කුසල් පස යන මොව්හු වෙති. මොව්හු මතු විපාක ලැබෙන අයුරින් සංස්කරණය වූවාහු ප්‍රතිසන්ධි චිත්තයාගේ උත්පාදක්ෂණයෙහි පටන් ක්ෂණයක් පාසා දිවිතිම් කොට කර්මජරූප උපදවන්නාහුවෙත්.

කායදසක-භාවදසක-වත්ථුදසක යන රූපයෝ කර්මජයෝ වෙත්. විස්තර වශයෙන් දක්වතොත් පඨවි-ආපො-තෙජො-වායු-වර්ණ-ගන්ධ-රස-ඕජා-ආකාශ-චක්ඛු-සොත-ඝාණ-ජිව්හා-කාය-ඉත්ථින්ද්‍රිය-පුරිසින්ද්‍රිය-ජීවිතින්ද්‍රිය-හදය වත්ථු''යන අටළොස "කර්මජ රූපයෝ" වෙත්

**රූප උපදවන චිත්ත** ද්විපඤ්චවිඤ්ඤාණ; අරූප විපාක යනසිත් තුදුස හැර සෙසු පන්සැත්තෑ සිත් රූපජ චිත්තයෝ වෙත්. මොවුහු ප්‍රතිසන්ධිය සමගම යෙදෙන භවාඞ්ග චිත්තයාගේ උත්පාදක්ෂණයෙහි පටන් රූප උපදවත්. (ගමනට අභිනවයෙන් ගිය අමුත්තෙක් එකෙනෙහිම යම්කිසි ක්‍රියාවක් අමුතුවෙන් කරන්ට අපොහොසත් වන්නාක් මෙන් අලුත් භවයෙහි අලුතින් ඇතිවූ ප්‍රතිසන්ධි සිතට රූප උපදවීමට නොහැකි හෙයින් ප්‍රතිසන්ධි චිත්තය රූප නූපදවනා බව දක්වා ඇත.) ශුද්ධාෂ්ටකය සමග. ආකාශ-කායවිඤ්ඤත්ති-වචීවිඤ්ඤත්ති-සද්ද-ලහුතා=මුදුතා-කම්මඤ්ඤතා යන රූප පසළොස "චිත්තජ රූපයෝ" වෙත්.

**රූප උපදවන ඍතු** ශීත-උෂ්ණ සඞ්ඛ්‍යාත තෙජෝ ධාතුව ඍතු නම්වේ. උෂ්ණය අඩුතැන සීතලයයි කියනවා විනා සීතල කියා දෙයක් නැත ආලෝකය නැති තැන අන්ධකාරය කියනුවිනා අන්ධකාරය කියා දෙයක් නැත. එසේම තෙජො ධාතුව අඩුවීමෙන් ඇතිවන අඩු උෂ්ණයට සීතලයයි යෙති. මෙබඳු ශීත-උෂ්ණ ගුණයෙන්ද ශරීරයේ රූපකලාප පහළවෙත්. ශීතකලාපීය රටවල සත්වයින්ගේ ශරීරයේ කර පැහැයද කාශබවද මද්ධ්‍යාහ්නයේ සූර්‍ය්‍යරශ්මියෙහි කර්මාන්ත කරන්නවුන්ගේ ශරීරයේ සිවියෙහි අධික වියලි ගතියද ඍතුජ රූප පිළිබඳ සාක්ෂිවේ ප්‍රතිසන්ධිචිත්තයාගේ උත්පාද-ස්ථිති-භඞ්ග යන ක්ෂණත්‍රයෙන් "ස්ථිති" ක්ෂණයෙහි පටන් ඍතුජ රූප උපදිත්. ශුද්ධාෂ්ටකය-සද්ද-ලහුතා-මුදුතා-කම්මඤ්ඤතා-ආකාශ යන තෙළෙස් රූපයෝ ඍතුජ රූපයෝ වෙත්.

**රූප උපදනා ආහාර** රූප ධාතූන් ගේ සම්භවයට ආහාරය විශෙෂයෙන් ප්‍රත්‍යයවේ. මෙහි ආහාරය නම් අසිත (ඔදනාදී ප්‍රධාන කෑම) "පීත" (පානවර්ග, "ඛායිත" (කඩාගෙණ කන පලතුරු රසකැවිලි ආදිය) "සායිත" (මීපැණි ගිතෙල් සකුරු ආදි රසවිඳිනු ලබන දෙය)

යන චතුර්විධ ඕජාවය. ආහාරයක් අනුභව කළවිට තැන්පත්වූ ආහාරයෙන් රූප කලාප උපදී. ආහාර අඩුවූවිට ශරීර දුබල වන්නේද දුර්වර්ණ වන්නේද ආහාරජ රූප නූපදින නිසයි. බඩසා යෙන් පෙළෙන්නෙකුගේ මුහුනෙහි පවත්නා මලානික බව ආහාරජ රූපයන්ගේ හීන බව ප්‍රකටව පෙන්වයි. මව්කුස ඇතිවූ ප්‍රතිසන්ධි චිත්තසංඛ්‍යාත කලල බීජය කරා මව අනුභව කරන ආහාරයාගේ ඕජාව මවගේ රස නහර අනුව ගොස් ආහාරජ රූපයෝ ප්‍රතිසන්ධි චිත්තයේ "ස්ථිති" අවස්ථාවෙහි පටන් පහළවෙත්. මේ නිසා කලල බීජය ක්‍රමයෙන් මෝරන්ට පටන්ගනී. ශුද්ධාෂ්ටක ආකාශ–ලහුතා–මුදුතා–කම්මඤ්ඤතා යන රූපයෝ "ආහාරජ රූපයෝ" වෙත්.

අට්ඨාරස පණ්ණරස – තෙරස ද්වාදසානිච
කම්මචිත්තොතුකාහාර– ජානි හොන්ති යථාක්කමං

(අභිධම්මත්ථසඞ්ගහ)

කර්ම–චිත්ත–ඍතු–ආහාර යන ප්‍රත්‍යයන්ගෙන් පිළිවෙළින් අටලොස්, පසළොස්, තෙළෙස්, දොළොස් යන රූපයන් උපදනා බව එහි අදහසයි.

(මෙසේ කිසිම දෙවියෙකුගේ හෝ අනෙකුගේ මැවීමක් නැතුව ඉබේ හටගැණීමකුත් නැතිව, හේතු–ප්‍රත්‍යයන්ගෙන් මේ සත්ත්ව සංඛ්‍යාත නාමරූප ධර්ම සන්තතිය හටගන්නා බවද දතයුතුයි ස්වකීය අප්‍රතිහත ප්‍රඥා ප්‍රභාවයෙන් තථාගතයන් වහන්සේ එදාළ මේ හේතුඵල වාදය නවීන විද්‍යාවාද වලටද අනුකූලය. මිනිසා දීනයෙකු කරණ විචාර බුද්ධිය මොටකරණ මනඃකල්පිත නිසරු දෙවවාදයන් වර්තමාන විද්‍යාඥයා පිළිකුල් කරන්නේද එහෙයිනි. විද්‍යාඥයන්ගේ නවීන විද්‍යා ඇසට හේතුඵල වාදයේ ආලෝකය ලැබේවා.)



පතිතස්ස ගණ්ඩපාතුභාවො විය
විඤ්ඤාණ පච්චයා නාමරූපං

**විඥාන ප්‍රත්‍යයෙන් වන නාම රූපය පය පැකිලී වැටුනු අන්ධයාගේ ගඩ පහළවීම මෙනි.**

ලොකු කුඩා; උස්-මිටි; රතු-කළු ආදි නානාප්‍රකාර නාමරූපයන් පටිසන්ධි විඤ්ඤාණය නිසා උපදවන හෙයින් ප්‍රතිසන්ධියෙන් නාමරූපයන් හටගැන්මී මායාකාරයෙකු දක්වන මායා රූපයන් මෙනැයිද දක්වත්.

නාමස්සපාක විඤ්ඤාණං - නවධා හොති පච්චයො
වත්ථුරූපස්ස නවධා - සෙස රූපස්ස අට්ඨධා

අභිසංඛාරවිඤ්ඤාණං = හොති රූපස්ස එකධා
තදඤ්ඤං පන විඤ්ඤාණං - තස්ස තස්ස යථාරහං

රූප මිශ්‍රවූ හෝ අමිශ්‍රවූ නාමයට ප්‍රතිසන්ධි ප්‍රවෘත්ති සඞ්ඛ්‍යාත විපාක විඥානයෝ සහජාත-අඤ්ඤමඤ්ඤ-නිස්සය-ප්‍රතිසන්ධි-විපාක ආහාර-ඉන්ද්‍රිය-අත්ථි-අවිගත යන නව ආකාරයෙන් උපකාර වෙත්. හෘදය සඞ්ඛ්‍යාත වස්තු රූපයට විපාක විඥානයෝ සහජාත අඤ්ඤමඤ්ඤ-නිස්සය-විපාක-ආහාර-ඉන්ද්‍රිය - විප්‍රයුක්ත-අත්ථි-අවිගත යන නවවිධ ප්‍රත්‍යයන්ගේ වශයෙන් උපකාර කරති, වස්තු රූපයෙන්.වෙන්වූ අනික් රූපයන්ට විපාක විඥානයෝ මේ නවවිධ ප්‍රත්‍ය අතුරෙන් අඤ්ඤමඤ්ඤ ප්‍රත්‍යය හැර සෙසු අටවැදෑරුම් ප්‍රත්‍යයෙන් උපකාර වෙති. ප්‍රතිසන්ධියෙහිද ප්‍රවෘත්තියෙහිද මේ ප්‍රවෘත්තියෝම උපකාර භාවයෙන් ක්‍රියා කරත්. කම්ම සහගත විඥානය අසඥ සත්ත්වරූපයටද; පඤ්චවොකාර භවයෙහි කර්මජ රූපයන්ටද උපනිඃශ්‍රය ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යයවේ,

## 22 පරිච්ඡේදය

# නාමරූපපච්චයා සළායතනං

## නාමරූප ප්‍රත්‍යයෙන් ෂඩායතනයෝ වෙත්.

මෙහි ආයතනයෝ නම් චක්ඛු-සෝත ඝාණ-ජිව්හා-කාය-මනෝ යන ඉන්ද්‍රියෝය රූප-සද්ද-ගන්ධ-රස-ඵොට්ඨබ්බ-ධම්ම යන අරමුණු කරා ඇදී යාමෙන්ද, ඒ අරමුණු චක්‍ෂුරාදි ඉන්ද්‍රියයන් කරා ඇදී ඒමෙන්ද සසර දිගු කිරීමට හේතුවන හෙයින් චක්‍ෂුරාදීහු ආයතන නම ලබත්.

වී ඇටයක් රෝපනය කළ කල ඉන් ගසක් සැදී එහි වී ඇට සැදේ. දහඹියා පොතු-කුඩු ආදියෙන්ද යුක්තවෙයි. කොස් පොල් ආදී බීජ සිටුවූ කල එයින් ගස් හට ගණිත්. කොස්ගෙඩියේ පිට කටුව හා ඇතුලේ මදද, පොල්ගෙඩියේ ලෙල්ල හා පිට කටුවද මදයද යනාදීය ක්‍රමයෙන් ඇතිවේ. එමෙන්ම ප්‍රතිසන්ධි බීජ සංඛ්‍යාත කලල රූපය ක්‍රමයෙන් වැඩෙන කල්හි චක්‍ෂුරාදි ඉන්ද්‍රියයෝද ක්‍රමයෙන් වැඩෙන්ට පටන් ගණියි. එයද ප්‍රතිසන්ධි ජනක කර්මය අනුව සිදුවන බව දතයුතුයි. ජාත්‍යන්ධ-ජාතිබධිර ජාතිමූකාදීන්ගේ ප්‍රතිසන්ධි චිත්තයද එබඳු ප්‍රතිසන්ධිජනක කර්මය කින් හටගන්නා බවද ඇස් නොපෙනීම අත්පා කොරවීම, ගොලු වීම ආදී දුබල ඉන්ද්‍රියයන්ගෙන් යුක්ත උත්පත්ති පිළිබඳ වන හීන ප්‍රතිසන්ධි සිතටම අයත් බවද දතයුතුයි. මේ බව නොදත් අඥානයෝ "සර්වබලධාරී දෙවියෙකු විසින් ඔහුට අකීකරු මිනිසා දුකට පත්කොට මවන ලදැයි" යනාදී ප්‍රතිෂ්ඨා විරහිත මිථ්‍යා ප්‍රලාපයන්ගෙන් ලොව මුලා කරත් "නාමරූප පච්චයා සළා, යතනං" යනුවෙන් තථාගතයන් වහන්සේ විසින් වදාරණ ලද්දේ ප්‍රතිසන්ධි විඥානයට අනුව හටගත් නාමරූප සංඛ්‍යාත කලල බීජය මුහුකුරායාමෙන් චක්ඛු-සෝත-ඝාණ-ජිව්හා-කාය-මනෝ යන ඉන්ද්‍රියයන් ඇතිවන බවයි.

මෙහි "චක්ඛායතන" යනු චක්‍ෂුඃප්‍රසාදයයි. සෝත-ඝාණ ජිව්හා-කාය යන ප්‍රසාදයෝ සෝතායතන-ඝාණායතන-ජිව්හා යතන කායායතනයෝ වෙත්. ප්‍රතිසන්ධිවිඥානය ,නොමැතිනම් නාමරූපද; නාමරූප නොමැති නම් ආයතනද ඇතිනොවෙත්. මෙහි මනායතන යන නමින් දක්වූයේ අනූනව වැදෑරුම් චිත්තයෝය. මෙහිදී ප්‍රශ්නයක් උපදී.

"සඞ්ඛාර පච්චයා විඤ්ඤාණං" යනුවෙන් වදළේද විඥානයයි. 'විඤ්ඤාණ පච්චයා නාමරූපං' යනුවෙන් වදළේ චෛතසික හා රූපයෝය. එමෙහි 'නාමරූප පච්චයා සළායතනං' යන්නෙන් වදළ මනායතනයද විඥානයයි. මෙහි ඇති ක්‍රමය කුමක්ද යනු ඒ ප්‍රශ්නයයි. එයට පිළිතුරු වශයෙන් කිවයුත්තේ "ගෙඩියෙන් ගසත් නැවත ඒ ගසේ ගෙඩිත් හටගන්නාසේ" විඤ්ඤාණයෙන් නාමරූපත්-නාමරූපයෙන් නැවත විඥානයත් ඇතිවන බවයි. අනතුරුව දතයුත්තේ සළායතනයන්ගේ පහළ වීමේ ක්‍රමයයි.

**නාමරූපයෙන් සළායතනයෝ කෙසේ හටගනිද්ද?**

යට පරිච්ඡේදයෙහි දක්වූ ආකාරයෙන් මවු කුස උපන් කලල බිජය එලු ලොම් අග ඇති තෙල් බිඳක ආකාරයෙන් හට ගන්නා බව නැවත සිහිකළ යුතුයි. ඉක්බිති කර්ම-චිත්ත-ඍතු-ආහාර යන ප්‍රත්‍යයන්ගෙන් පෝෂනය වෙමින්, මහාචිත්තක්ෂණ සතොළොසක (17) ට ම වරක් රූපකලාප බිඳෙමින්, එහෙත් නැවත නැවතත් රූප ඇති වෙමින් ක්‍රමයෙන් මහත්ව සතියක් තුළ 'කලලබීජ' නමින් පවත්නේය. අනුභව කරණ ආහාරයේ ඕජාව මවගේ රසනහර අනුව නොස් කලලරූප සඞ්ඛ්‍යාත ශරීරයෙහි වැදී-මෙන් ආහාරජ රූප කලාපයෝ දෙවෙනි සතියෙහි පටන් බොහෝ සෙයින් හටගණිති. එයින් කලලබිජය මස්සේදූ දියත්තක් වැනිවෙයි. එය අර්බුද නමින් හඳුන්වයි.

ඉක්බිති තුන්වෙනි සතියෙහි ඉතා පිරිසිදු කළර්යම් ජලයක් බඳු තත්වයකට පත්වෙයි, ඇතිවන රූපයෝ බිඳෙත්. නැවත හට ගණිත්. බිඳෙන රූපයන්ට වඩා හටගන්නා රූපයෝ බොහෝ වෙත්. තුන්වෙනි සතියෙහි මෙකී රූප කලාපයට පෙශි යන නම ලැබෙයි. ඉක්බිති සිවුවෙනි සතියෙහි කිකිළි බිත්තරයකට බඳු සටහන් ඇති වටවූ තද ඝණ සහිත මස්කැටියක් වෙයි පස්වෙනි සතිය තුළ ඒ මස් කැටියෙන් දෑත්-දෙපා-හිස යන අවයවයන්ගේ පහළවීම පිණිස ගැටපසක් (පඤ්චපිලක) පහළවෙයි. මේ පඤ්චපිලකාවෝ ඔවුනොවුන්ට සමානව ලොකු=කුඩා නොවී පහළවන බවද දක්වේ

පඨමං කලලං හොති - කලලා හොති අබ්බුදං
අබ්බුදා ජායතෙ පෙසි - පෙසි නිබ්බත්තතෙ ඝනො
ඝනා පසාඛා ජායන්ති - කෙසා ලොමා නඛා පිච
යඤ්චස්ස භුඤ්ජති මාතා - අන්නං පානංච භොජනං
තෙන සො තත්ථ යාපෙති - මාතු කුච්ඡිගතො නරො
(සංයුත්තනිකාය)

(මෙසින් වදාළේ ප්‍රතිසන්ධිජ ක්‍රමයෙන් මුහුකුරායන සැටියි. මවගේ රසනහර දිගේ යන ඕජාවෙන් දරුවාගේ ආහාර කෘත්‍යයද සිදුවන බවයි.)

මෙසේ ක්‍රමයෙන් මුහුකුරා යන නාමරූපකලාප නිසා සත්ත්වයා වැඩෙන්නේයයිද කියනුලැබේ ප්‍රතිසන්ධියෙන් 11 වෙනි සතියෙහි එනම් ප්‍රතිසන්ධියෙන් සැත්තෑ සත්වෙනි දිනයෙහි චක්ඛායතන-සොතායතන - ඝාණායතන - ජිව්හායතන යන ආයතනයෝ පහළවෙති. ඔව්හු ශුද්ධාෂ්ටකය හා ජීවිතෙන්ද්‍රියද සමග බැඳී (අවිනිර්භෝගව) චක්ඛුදසක-සොතදසක-ඝාණදසක ජිව්හාදසක නමින් පහළවන්නාහුය. කායායතනය හා මනායතන යෝ ප්‍රතිසන්ධි චිත්තය සමගම පහළවෙති. චක්ඛායතනාදීන්ගේ පහළවීමට කාය-මනො යන ආයතනයෝ ආධාර වූහ. එසේනම් නාමරූපපච්චයා චතුරායතනං යනුවෙන් නොවදාරා සළායතනං යනුවෙන් වදාළේ ඇයිද? යනු ප්‍රශ්නයක්වේ. "ප්‍රතිසන්ධි අවස්ථාවේ පහළවූ ආයතන දෙකක්හා පසුව ඇතිවූ ආයතනසතරත් එක්කොට ගෙන වදාළ බව සැලකිය යුතුය. මේ චනාඩි ජල-බුජ (මව්කුස උපදනා) සත්ත්වයන් පිළිබඳවය. ඕපපාතික සත්ත්වයන් පිළිබඳ ආයතනයෝ එකවිටම පහළවෙත් රූපාවචර බ්‍රහ්මයන්ට ඝාණ-ජිව්හා-කාය යන ආයතනයෝ නොවෙත්. මේ සියල්ල එක්කොට සලකා නාමරූප හේතුවෙන් සළායතන වෙතැයි වදාළ බව සැලකිය යුතුය.

දැන් ගර්භයෙහි වෙසෙන සත්ත්වයාට සද්ද නවක කලාපය හැර සෙසු සියලු රූපකලාපයෝ සම්පූර්ණයෙන් ඇත්තාහ. ළමයාට ශබ්ද කරන්ට හැකි කාලයෙහි සද්දනවකය පහළවන බව දක්වා තිබේ. ඉක්බිති ප්‍රතිසන්ධියෙන් සත්වෙනි මාසයෙහි අත් පා-ඇඟිලි-නිය-කෙස්-ලොම් ආදී මව්කුස්තුළ පහළවියයුතු ද්‍රව්‍ය සියල්ල පහළවන බව දත්යුතුයි. ඇතැම් දරුවන් ප්‍රතිසන්ධියෙන් සත්වෙනි මාසයේ ප්‍රසූත වන්නේද එහෙයිනි.

නාමරූපයෝ සළායතනයන්ට කෙසේ ප්‍රත්‍ය වෙත්ද? යනු මෙසේ දතයුතුයි.

නාමමෙවහි ආරුප්පෙ - පටිසන්ධිපවත්තිසු
පච්චයො සත්තධා ඡද්ධා - හොති තං අවකංසතො
(විසුද්ධිමග්ග)

අරූප භවයෙහි ප්‍රතිසන්ධි ප්‍රවෘත්ති දෙක්හි සහජාත-අඤ්ඤමඤ්ඤ-නිස්සය-සම්ප්‍රයුක්ත-විපාක-අත්ථි-අවිගතයන් සත්ආකාරයෙන්ද ප්‍රත්‍යය වේ. විපාකවිජ්ජිත සය ආකාරයෙන්ද ප්‍රත්‍යය වේ.

අඤ්ඤස්මිම්පි භවෙ නාමං - තථෙව පටිසන්ධියං
ඡට්ඨස්ස ඉතරෙසං තං - ඡහාකාරෙහි පච්චයො

පඤ්චවොකාර භවයෙහිදී විපාකනාමය මනායතනයට යටකී සත්වැදෑරුම් ප්‍රත්‍යයන්ගෙන් උපකාරවන අතර ඉතිරි පඤ්චායතනයට සහජාත-නිස්සය-විපාක-සම්ප්‍රයුක්ත-අත්ථි-අවිගත යන ආකාරයෙන් ප්‍රත්‍යයවන්නේය. විසුද්ධිමාර්ගයෙහි මේ පිළිබඳ විස්තර බොහෝ ඇත්තේය. ග්‍රන්ථබාහුල්‍ය භියය නිසා මෙතෙකින් නවතිමු.

(මෙසේ තමනත් සත්වයා ඒ ඒ යොනිවලට සුදුසු පරිදි සුදුසු ආකාරයට ශරීරයද; ආයුබලයද, වර්ණයද ඇතිව කල් යවන බව දතයුතුයි. හෝ මිනිස්වම, හෝ ගොන්වව, හෝ ධනපති වව; හෝ දුක්පත්වව, හෝ උගතෙක්වව, හෝ මෝඩයෙකු වෙව, ආදී වශයෙන් "කිසිම දෙවියකු හෝ බ්‍රහ්මයෙකු හෝ යක්ෂයෙකු හෝ විසින් කරණු ලබන නියමයක් නැතිව' හෙතු ඵල අනුව උපන් සත්වයා තම තමන්ගේ ප්‍රතිසන්ධි ජනක ශක්තිය අනුව සැපදුක් විඳිමින් කල්යවනබව දතයුතුයි. මෙතරම් තර්කානුකූල ලෙසින් විචාරාක්ෂියට යොමුවන අයුරින් තථාගතයන් වහන්සේ විදූරණලද පරම ගම්භීර මේ හෙතුඵල වාදය පිළිබඳ ඉගණීමක් නොමැති අවිද්‍යාවෙන් අන්ධවූ අඥානයෝ කිසිකලක සසර දුකින් නොමිදෙන්නේය.)

(තැණැයියෙනි හෙතු ඵල වාදය උගනිත්වා සසර දුක් නසත්වා.)



ගණ්ඩභෙද පිළකාවිය
නාමරූපපච්චයා සළායතනං

නාමරූප ප්‍රත්‍යයෙන් වන
ෂඩායතනය අඬයාගේ
ගඩයෙන් නැඟි බිබිලි
සඟක් වැනිවේ.

නාමරූපයෙහි හටගත්
ෂඩායතනයෝ වෑඹීමට
පත්වූවාහු සරුබිමක
හටගත් වෘක්ෂඳුරක් මෙන්
වෙත්.

卐 卐

## 23 පරිච්ඡේදය

# සළායතනපච්චයා ඵස්සො

## ෂඩායතන ප්‍රත්‍යයෙන් ස්පර්ශය වේ.

මෙහි “ඵස්ස” යනු දෙපණස් චෛතසික අතුරෙන් එකකි. සෑම සිතකම යෙදෙන මේ “ඵස්ස” චෛතසිකය අරමුණ වැලඳ ගනියි. ආයතනයන් නිසා ඵස්සය ඇතිවන බවද ආයතනයන් නැතිනම් ඵස්සය නැති බවද දතයුතුයි. චක්ඛුසම්ඵස්ස-සොත සම්ඵස්ස-ඝාණසම්ඵස්ස-ජිව්හා සම්ඵස්ස-කාය සම්ඵස්ස-මනො-සම්ඵස්ස යයි ඵස්සය සවැදෑරුම් වේ. “චක්ඛුඤ්ච රූපෙ ච පටිච්ච උප්පජ්ජති චක්ඛුවිඤ්ඤාණං තිණ්ණං සඞ්ගති ඵස්සො” චක්ඛායතනයත් රූපාරම්මණයත් නිසා චක්ඛුවිඤ්ඤාණය උපදී, ඒ තිදෙනාගේ එක්වීම ස්පර්ශයයි මෙයින් දක්වා ඇත. සොත-ශබ්ද සොතවිඤ්ඤාණ තිදෙනාගේ එක්වීම සොතසම්ඵස්සයයි. මේ ආදී

ක්‍රමයෙන් ආයතන-ආරම්මණ-විඤ්ඤාණ යන තිදෙනාගේ එක්-වීම නිසා හටගන්නා ඵස්ස චෛතසිකය මෙහි "සළායතනපච්චයා ඵස්සො" යනුවෙන් විදාරණ ලදී. මේ ස්පර්ශය "හිරුරැස් බිත්ති යන වැදීම" මෙනැයි දක්වා ඇත. එහෙත් චෛතසික අතුරෙන් මෙයද දුරවබොධ චෛතසිකයෙකි. ස්පර්ශයක් නැතිනම් කිසිම අරමුණක් ආයතනයකට වැද්ද ගැණීමක් නැත.

විපරීත ග්‍රහණයෙන් බලනකල චක්ඛායතනය නොමැති නම් රූපාරම්මණ ඇසෙහි වැදීම හෝ චක්ඛුවිඤ්ඤාණ හෝ චක්ඛු-සම්ඵස්ස හෝ ඇතිනොවේ. සොත ප්‍රසාදීන් පිළිබඳවද එසේමැයි. එහෙයින් ප්‍රසාද-ආරම්මණ-විඤ්ඤාණ තිදෙනා එක් කොට වැළඳ ගැණීම ස්පර්ශයේ විශෙෂ කෘත්‍යයයි. ඇසින් රූපය දුටුවෙමි. කණින් ශබ්දය ඇසුවෙමි. ආදීන් කියන්නේ යටකී ප්‍රසාද-ආරම්මණ-විඤ්ඤාණ තිදෙනාගේ එක්වීම නිසා ඇතිවූ ස්පර්ශ චෛතසිකයටයි. මේ නිසා ස්පර්ශය නොමැතිනම් කිසිකලක චිත්ත චෛතසිකයන්ට ඉපදීමට අවකාශයක් නැත. එහෙයින් ස්පර්ශය සිත නැමැති ප්‍රසාදයේ යතුර මෙනැයි කිවද දොසක් නැත. ස්පර්ශයට අනතුරුව යෙදෙන සඤ්ඤා චෙතනා ආදී චෛතසිකයෝ ස්පර්ශය අනුව යෙදෙන බවද 'සැලකියයුතුය. විස්තර වශයෙන් බලනකල සිත්වල ප්‍රභෙද තරමටම ස්පර්ශයා ගේද ප්‍රභෙදයවෙයි. හැම සිතක් පාසාම මේ ස්පර්ශය යෙදෙන හෙයිනි. එහෙයින් ස්පර්ශය අනූනව වැදෑරුම්වෙයි. එහෙත් විසුද්ධිමාර්ගයෙහි "විත්ථාරෙන පන චක්ඛුසම්ඵස්සාදයො පඤ්ච කුසලවිපාකා-පෙ-එවංසබ්බෙපි සඞ්ඛාරපච්චයා විඤ්ඤාණම්ව ද්වත්තිංස හොන්ති" යනුවෙන් සංස්කාර ප්‍රත්‍යයෙන් වන විඥාන යන් මෙන් ස්පර්ශයද දෙතිස් ආකාරයයි දක්වාඇත එසේ දක්වන ලද්දේ විපාක සිත්හි පමණක් ලැබෙන ස්පර්ශය ගැණ සලකාමිනි. (භවනාමී සත්ත්වයන්ගේ චුති පටිසන්ධි පිළිවෙළ 'වදාළ මේ "සංසාර චක්‍ර" දෙශනාවෙහි ප්‍රතිසන්ධිය නැතිකළ රහතුන් වහන්සේ පිළිබඳවූ ලොකොත්තර සිත්වල යෙදෙන "ස්පර්ශය" බුද්ධඝොෂ හිමියන් විසින් අදහස් නොකළ බව දතයුතුයි.

මෙකී ස්පර්ශයට ෂඩායතනයන් කෙසේ ප්‍රත්‍ය වේද්දැයි දත යුතුයි.

ඡධා ඵස්සො තතො එකං – නවධා බාහිරානිච
ඡධා සම්භව මෙතස්ස – පච්චයතෙන විභාවයෙ

(විසුද්ධිමග්ග)

චක්ඛායතනාදි පස්දෙන චක්ඛුසම්ඵස්සාදි පඤ්ච විඤ්ඤාණිත ඵස්සයට නිඃශ්‍රය-පුරේජාත-ඉන්ද්‍රිය විප්‍රයුක්ත අස්ති අවිගත යන සයාකාරයෙන් ප්‍රත්‍යය වේ. අනතුරුව වෙන වෙනම එක ආයතනයෙක් නව ආකාරයකින් ප්‍රත්‍යය වේ. නැවත නැවත සතර සතර ආකාරයකින්ද ආයතනයෝ ස්පර්ශයට ආධාර කරත්. මනොඵස්සයට ශබ්දායතන- හා ධර්මාරම්මණයද ආරම්මණ ප්‍රත්‍යයෙන් පමණක් ප්‍රත්‍යයවේ. (වැඩිවිස්තර විසුද්ධි-මාර්ගයෙන් දතයුතුයි.)



ගණ්ඩ පිළකානං ඡවි ඝට්ටනං
විය සළායතන පච්චයා
ඵස්සො

ෂඩ්විධ ආයතන
ප්‍රත්‍යයෙන් වන
ස්පර්ශය
අන්ධයාගේ ගඬෙහි
හටගත් බිබිලිවල
ගැටීමක් මෙනි.

(ස්පර්ශය ගිණිදඹු සහශ්‍ර
ගැටීමෙන් වන ගින්න මෙනි)

## 24 පරිච්ඡේදය

# ඵස්සපච්චයා වේදනා

## ස්පර්ශ ප්‍රත්‍යයෙන් වේදනාව සිදුවේ.

"වේදනාව" යනු විඳීමයි. කුමක් විඳීද? අරමුණු රසයයි. ඵස්ස චෛතසිකයෙන් අරමුණ වැලඳ ගැණීමත් සමගම එයට අනතුරුව උපදනා මේ වේදනා චෛතසිකයෙන් ආරම්මණ රසය විඳියි. අරමුණෙහි ආකාරයෙන් වේදනාවද ප්‍රභේද වශයෙන් තෙවැදෑරුම් වෙයි. ඉෂ්ට අරමුණ නිසා සුඛ වේදනාවද අනිෂ්ට අරමුණ නිසා දුක්ඛ වේදනාවද ඉෂ්ට මධ්‍යස්ථ අරමුණ නිසා උපෙක්ෂා වේදනාවදැයි යනුවෙන් ත්‍රිවිධ වේදනා හඳුනාගන්නා බව දක්වයි. ස්පර්ශය යෙදෙන සෑම සිතක් පාසාම මේ වේදනාවද යෙදෙයි. දෙපණස් චෛතසික අතුරෙන් එකක්වන වේදනාව "වේදනාක්ඛන්ධ" නමින්ද දේශනාකර ඇත්තේ සියලුම සිත් වල යෙදෙමින් ආරම්මණරසය විඳින හෙයිනි. චක්ඛුසම්ඵස්සජා වේදනා, සෝත සම්ඵස්සජා වේදනා; ඝාණ සම්ඵස්සජා වේදනා, ජිව්හා සම්ඵස්සජා වේදනා, මනොසම්ඵස්සජා වේදනා යනුවෙන් වේදනා ප්‍රභේදය ස්ථානවශයෙන් සය ආකාරයි. රූපය ලක්ෂණයි. ශබ්දය ප්‍රියයි. මේ ආහාරය රසයි ආදි වශයෙන් ලෞකික ව්‍යවහාර කරන්නේ වේදනා චෛතසිකය උපන් විටය ස්පර්ශය නොමැතිව කිසිකලෙක වේදනාව නූපදනා හෙයින් ඵස්සපච්චයා වේදනා යනුවෙන් විදාරණලදී.

ස්පර්ශය නැමැති අරක්කැමියා විසින් එලවකලද ආරම්මණය නැමති ආහාරයෙහි රස විඳින්නේ වේදනාව නැමති රජ විසිනැයි දතයුතුයි. ඇතැම් පරවාදීහු මේ වේදනාව ආත්මය කොට ගත්හ. වේදනාව හැර රූප දකිනා හෝ ශබ්ද අසන ආහාර සන්හි රස විඳින අන් කෙනෙකු නැයි බවද දතයුතුයි. මට රිදුමක් දුනා. මගේ අප්පා රිදේ. ආදීන් පවසන්නේ දුක්ඛ වේදනාව පිළිබඳව පමණකි, එහෙත් සුඛ-දුක්ඛ-උපෙක්ඛා වශයෙන් ඇතිවන සියලුම විඳීම් වලට "වේදනා" යයි වදාරාඇත

පඤ්චද්වාරයෙහි චක්ඛායතනය වස්තුකොට ඇති පඤ්ච වේදනාවන්ට චක්ෂුඃස්පර්ශාදී ස්පර්ශය, සහජාත-අඤ්ඤමඤ්ඤ-නිස්සය-විපාක-ආහාර-සම්පයුත්ත අත්ථි-අවිගත යන අට ආකාරයෙකින් ප්‍රත්‍යය වේ. පටිසන්ධි-භවඞ්ග-චුති වශයෙන්වූ තෛභූමික විපාක වේදනාවන්ට මනොසම්ඵස්සයද මෙකී අට ආකාරයෙන් ප්‍රත්‍යය වේ. සම්පටිච්ඡන සන්තීරණ

තදාරම්මණ වශයෙන් පවත්නා කාමාවචර විපාක වේදනාවන්ට චක්ඛාදි සම්ඵස්සය "උපනිස්සය වශයෙන් ප්‍රත්‍යය වේ. මනො-ද්වාරයේ තදාරම්මණ වශයෙන් පවත්නා කාමාවචර විපාක වේදනාවට 'මනොද්වාරාවජ්ජන' සඞ්ඛ්‍යාත මනොසම්ඵස්සය උපනිස්සය ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වේ.

පටිසන්ධි භවඞ්ග චුතිවසෙනච-පෙ-පවත්තියා හොති . යනුවෙන් විසුද්ධිමාර්ගයෙහි මේ පිළිබඳ විශේෂ විස්තර දක්වා ඇත්තේය.



ඝට්ටන දුක්ඛං විය ඵස්ස
පච්චයා වෙදනා

ස්පර්ශ ප්‍රත්‍යයෙන් වන
වේදනාව
අන්ධයාගේ බිබිලි
සහිත ගෙඩිය
ගැටීමෙන් (හැපී-
මෙන්) ඇතිවූ
වෙදනාව මෙනි.

ඵස්සෙන දුක්ඛස්ස වෙදනා
පාතුභවති අග්ගිනා
ඵුට්ඨස්ස දුහොවිය

ස්පර්ශයෙන් ඇතිවන
වෙදනාව ගිනි දඬු දෙකක්
එකට ගැටීමෙන්
හටගන්නා දහය මෙනි.

## 25 පරිච්ඡේදය

# වේදනා පච්චයා තණ්හා

## වේදනා ප්‍රත්‍යයෙන් තෘෂ්ණාව වේ.

"තෘෂ්ණාව" යනු ආශාවයි. ඕනෑකම, කැමැත්ත, ලොභය ආදරය, ප්‍රේමය ආදි නම් වලින් කියවෙන්නේද එකම තෘෂ්ණාවේ අවස්ථා භේදය සලකා ගෙණයි. සංසාර චක්‍රයේ අනාගත භවයේ මූලසැටියට භාග්‍යවතුන් වහන්සේ වදාළාදු (යායං තණ්හා පොනොභවිකා) මේ තෘෂ්ණාව යටකී වේදනාව නිසා ඇතිවන බවද දක්වූ සේක. චක්ඛු-සොත-ඝාණ-ජිව්හා-කාය-මනෝ යන ද්වාරයන්ට අරමුණුවන රූප-සද්ද-ගන්ධ-රස පොට්ඨබ්බ ධම්ම යන ආරම්මණයන් නිසා චක්ඛු=සොත-ඝාණ-ජිව්හා කාය-මනො යන විඤ්ඤාණයන් ඇතිවූ කල ඒ සමගම ඵස්ස-වේදනා යන චෛතසික යෙදෙන බව දක්වීමු. ඒ සමගම ඉෂ්ටවූ ආරම්මණයන්හි මෙය හොඳයි. මට ඇත්නම් හොඳයි. මමත් සොයාගන්ට ඕනෑ. ආදී වශයෙන් ව්‍යවහාරකරණු ලබන්නේ මේ තෘෂ්ණාව නිසයි. සැප ලැබීමේ අදහසද; දුක් නො විඳීමේ ඕනෑකමද; නොලැබූ සැපය ලැබීමට හා ලැබූ සැපය තහවුරු කර ගැණීමට ඇති කැමැත්තද ඇතිවන්නේ මේ තෘෂ්ණාව නිසයි චක්ෂුරාදි පඤ්චවිඤ්ඤාණයන්හි ඇතිවූ තෘෂ්ණාවම නැවත නැවත මෙනෙහි කිරීමේදී "ධම්ම තණ්හාව" උපදී.

රූප තණ්හාදි භෙදෙන - ඡ තණ්හා ඉධදීපිතා
එකෙකා තිවිධා තත්‍ථ - පවත්තා කාරතො මතා

රූප සද්ද-ගන්ධ-රස-පොට්ඨබ්බ-ධම්ම යනුවෙන් ඇතිවන ආරම්මණ පිළිබඳ රූප තණ්හාදි වශයෙන් තෘෂ්ණාවසය ආකාරයි. නැවත ඒ සයාකාර තෘෂ්ණාව කාමතණ්හා-භවතණ්හා-විභවතණ්හා යන තුනතත් වැඩිකලවිට අටළොසක්වේ. (රූපාදි ආරම්මණයන් කාමාස්වාද වශයෙන් ගත්කල කාමතෘෂ්ණාවද ශාස්වතය සදාකාලිකයයි ගත්කල භව තෘෂ්ණාවද මෙයින් මතු අභාවයටයේයයි උච්ඡේද වශයෙන් ගත්කල විභව තෘෂ්ණාවද ඇතිවේ.

(කාම-රූප-අරූප යන භවත්‍රය පිළිබඳ තෘෂ්ණාව කාම-භව-විභව යන තෘෂ්ණාවෝ යයිද මතයකි.)

මෙසේ අටළොස් ආකාර තෘෂ්ණාව නැවත අජ්ඣත්ත-බාහිර යන භේදයාකාරයෙන් දෙගුණකල සතිසෙක් වේ. නැවත අතීත වර්තමාන-අනාගත යන කාලත්‍රයෙන් තිගුණකල අටෝරාශිය (108) කී.

යස්මා පනමෙ සත්තා -පෙ- තස්මා සබ්බාපෙසා වෙදනා තණ්හා හොන්ති වෙදිතබ්බා (විසුද්ධිමග්ග)

යම් හෙයකින් මේ ලොව සත්වයෝ පුත්‍රයා ආස්වාද කොට ගෙණ පුත්‍රයා කෙරෙහි ඇති ආදරයෙන්ම කිරිමව්ට සත්කාර කරන්නාක්මෙන්" රූපාදි ආරම්මණයන් නිසා උපදින වෙදනා වම ආස්වාද කොට ගෙණ රූපාදි අරමුණු සපයා දෙන සිතුයම් කාරයෝය; ගී කියන්නෝය; සුවඳ සපයන්නෝය; රස අහර දෙන්නෝය; රෙදි වියන්නෝය; රසායනාදි බෙහෙත් වශී දෙන වෛද්‍යාචාර්යයෝය; යන මේ ආදීන්ට සත්කාර කරත්. එහෙයින් සියලුම තෘෂ්ණා වෙදනාව නිසා ඇතිවන බව දතයුතුයි.

සුඛ වෙදනාව තෘෂ්ණාවට උපනිඃශ්‍රය ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යයවේ

දුකට පත් තැනැත්තේ සැපයක්ම ප්‍රාර්ථනා කරයි. අනුන් විඳින සැප දැක තමාද එම සැපම ලැබිය යුතුයයි සිතන්නේය. අනාගත සැපය ගැණද සිතන්නේය. එහෙයින් දුක්ඛ වේදනාවද තෘෂ්ණාවට උපනිඃශ්‍රය ප්‍රත්‍යයෙන් උපකාර වේ.

උපෙක්ෂාවද වනාහි ශාන්ත හෙයින් තෘෂ්ණාවට උපනිඃශ්‍රයවේ.



දුක්ඛස්ස පතිකාරාභිලාසො
එස වෙදනා පච්චයා තණ්හා

වෙදනාව නිසා හටගත්
තෘෂ්ණාව
අබියාගේ රිදුමට
පිළියම් කරණු
කැමැත්ත මෙනි.

වෙදියමානස්ස තණ්හා
පවඩ්ඪති ලොණූදකං
පිපාසාවිය.

වෙදනාවෙන් තෘෂ්ණාව වැඩීම
එය පිපාසිත වූවහුගේ
ලුණුදිය පානය මෙනි.

26 පරිච්ඡේදය.

# තණ්හා පච්චයා උපාදානං

## තෘෂ්ණා ප්‍රත්‍යයෙන් උපාදානය වේ.

අරමුණ දැඩිසේ අල්වා ගැනීම (සිතින් ග්‍රහණය කිරීම) උපාදාන නම්. "මණ්ඩූකං පන්නගො දල්හං ආදියතීති උපාදියතීති උපාදානං" යනුවෙන් "නාගයෙකු විසින් මැඩියෙකු දැඩිලෙස අල්වා ගැනීම" මෙන් චක්ඛුරාදී ඉන්ද්‍රියයන්ට හමුවන රූපාදි අරමුණු පිළිබඳ දැඩි ආශාව මෙහි උපාදාන නමින් දක්වා ඇත, පුරුෂයෙකුගේ ඇසට හමුවූ ස්ත්‍රී රූපය ඉෂ්ටාරම්මණ වශයෙන් "හොඳයි; ලස්සනයි! ආදීන් සලකමින් තෘෂ්ණාව උපදවයි. නැවත නැවතත් ඒ පිළිබඳව මනොද්වාරයෙන් අරමුණු කරමින් එය ලබාගැනීමේදී හෝ ලැබීමට කරන බලවත් පරිශ්‍රමයේදී -යටකී රූපාරම්මණය මනසින් දැඩිකොට ගණියි. මේ දැඩි ආශාව බලවත් තෘෂ්ණාව උපාදාන නම්වේ. කුශලා කුශල සඞ්ඛ්‍යාත භවනාම් කර්මයන් රැස්කිරීමේදී මේ උපාදානයද නියතයෙන්ම යෙදෙන හෙයින් 'තෘෂ්ණා ප්‍රත්‍යයෙන් උපාදානය' වේ යයි වදාරණ ලදී.

මේ උපාදානය සිවු වැදෑරුම් වේ.

"කාමූපාදාන-දිට්ඨුපාදාන-සීලබ්බතුපාදාන- අත්තවාදූපාදාන යනු" වෙන්:

පඤ්චකාමවස්තූන් පිළිබඳ ඇතිවන ක්ලේශකාමය කාමූපාදාන නම්වේ. විස්තර වශයෙන් 108 ප්‍රභෙද වූ තෘෂ්ණාවම "කාමූපාදාන" ය යයි දතයුතුයි. දශවස්තුක මිථ්‍යාදෘෂ්ටිය "දිට්ඨුපාදාන' නම්වේ. ගොසීල අජසීල ගොවෘත අ වෘත වග්ගුලී වෘත ආදි "සීලබ්බත" යන්නෙන් ආත්ම සුද්ධිය ලබනු හැකියි. । සැලකීම "සීලබ්බතුපාදාන" නම්වේ. රූප-වෙදනා-සඤ්ඤා-සඞ්ඛාර විඤ්ඤාණ යන පඤ්චස්කන්ධය පිළිබඳ පවත්නා විසිවැදෑරුම් සත්කායදෘෂ්ටිය "අත්තවාදූපදාන" නම්වේ ප්‍රත්‍යයවන ආකාරය:-

තණ්හාච පුරිමස්සෙව – එකධා හොති පච්චයො
සත්තධා අට්ඨධාවාපි – හොති සෙසත්තයස්ස තු

(විසුද්ධිමග්ග)

කාමූපාදානයට කාම තෘෂ්ණා තොමෝ උපනිශ්‍රය ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යයවේ. දිට්ඨිසීලබ්බත අත්තවාද යන උපාදාන තුනට කාම තෘෂ්ණාව සහජාත අඤ්ඤමඤ්ඤ-නිස්සය-සම්පයුත්ත-අත්ථි-අවිගත-හෙතු වශයෙන් සත් ආකාරයකින් ප්‍රත්‍ය වේ. උපනිශ්‍රය ප්‍රත්‍යය සමග යෙදෙන කල අට ආකාරයකින් ප්‍රත්‍යය වේ. කාමූපාදානයට ප්‍රත්‍යයවන කල උපනිශ්‍රය ප්‍රත්‍යයෙන් උපකාර වන බවද එහිදී සහජාත ප්‍රත්‍යය හැර උපනිස්සය ප්‍රත්‍යය යෙදෙන බවද දතයුතුයි.



පටිකාරාභිලාසෙන අසප්පාය
ගණ්හං විය තණ්හා පච්චයා
උපාදානං

තෘෂ්ණා ප්‍රත්‍යයෙන් වන
උපාදානය

අබියාගේ රිදුමට
අසත්ප්‍රාය ඖෂධයක්
ගැනීම මෙනි.

තණ්හාවෙන් වන උපාදානය
පිපාසිතයෙකු පැනෙකි
ආසාකරන්නාක් මෙනි.

## 27 පරිච්ඡේදය

# උපාදාන පච්චයා භවො

## උපාදාන ප්‍රත්‍යයෙන් (කර්ම භවය හා උත්පත්ති) භවය වේ.

මෙහි "භව" යනු වැඩීමයි. දියුණුවීමයි. කුමක් වැඩෙන්නේද? කර්මය හා උත්පත්තියයි. කාම-දිට්ඨි-සීලබ්බත අත්තවාද යන උපාදාන සහිත සත්වයා පඤ්චස්කන්ධයෙහි ආත්ම දෘෂ්ටි සහිතව එය මතුවටත් ලබන අදහසින් නානා ප්‍රකාර සීලබ්බතයන්හි යෙදෙමින් භවගාමි කුශලයන් සිදුකරයි. තිබෙන කාමය දියුණුකර ගැණීමටද නැති කාමය උපදවා ගැණීමටද නානාප්‍රකාර කුසල් කරයි. එපමණක්ද නැත. දශවස්තුක මිථ්‍යාදෘෂ්ටි ආදියෙන් යුක්තවූවෝ කර්මය හා කර්ම ඵලය නොඅදහමින් ඓහලෞකික සැපය පමණක් ලබනු රිසියෙන් සත්ව ඝාතන, අදත්තාදාන, ස්ත්‍රීදූෂණ ආදී අකුශලයන් සිදුකරයි. මේ සියල්ල "භව" නමින් මෙහි දේශනා කරණ ලදී. "සබ්බම්පි භවගාමි කම්මං භවොනාම (විසුද්ධිමග්ග) යනුවෙන් සියලුම භවගාමි කුශලාකුශලයන් භව නමැයි දක්වී. එයට කම්ම භව යයිද නමකි. මේ කම්මභවයන්ගේ රැස්කිරීමෙන් ලැබෙන උත්පත්ති භවයද "භවය" යන්නෙන් දෙසිතයි. කුශලා කුශල කර්මයන්ගෙන් නිපදවනු ලබන සියලුම "නවසත්වාවාසයෝ උත්පත්ති භව නමින් දතයුතුයි. උපාදානය වැඩිවශයෙන් ප්‍රත්‍යවන්නේ කර්මභවයට බවද සැලකිය යුතුයි.

> "කාම-රූප-අරූප-සඤ්ඤි-අසඤ්ඤි – නෙවසඤ්ඤිනාසඤ්ඤි ඒකවොකාරභව-චතුවොකාරභව-පඤ්චවොකාර භව" යන මොව්හු නව සත්වාවාසයෝ වෙත්.

**මේ කර්ම භව-උත්පත්ති භව සියල්ලම උපාදානයන් නිසා හටගණීයි.**

කාමාවචර කුශල කර්මයන්ටද එයින් සිදුවන (සුගති) උත්පත්ති භවයන්ටද චතුර්විධ උපාදානය උපනිඃශ්‍රය ප්‍රත්‍යයෙන් උපකාරවේ. අකුශල කර්මයන්ට හා දුගති භවයටද උපාදානයෝ සහජාත-අඤ්ඤමඤ්ඤ-නිඃශ්‍රය-සම්ප්‍රයුක්ත- අත්ථි-අවිගත-හේතු යන ප්‍රත්‍යයන්ගෙන් ප්‍රත්‍යවෙත්. රූපාරූප භවයන්ට උපදානයෝ උපනිඃශ්‍රය ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යවෙත්.

උපාදින්න අසප්පායාලෙපනං විය උපාදාන පච්චයා භවො.



උපාදාන ප්‍රත්‍යයෙන් වන භවය දුකට හේතු බැවින්
**අන්ධයා විසින් ගන්නාලද අපථ්‍ය බෙහෙත ආලෙප කිරීම මෙනි.**

තවද උපාදාන ප්‍රත්‍යයෙන් වන භවය මත්ස්‍යයා ආහාර තෘෂ්ණාවෙන් ගණු ලබන බිලියම (බිලිකොක්ක)මෙනි.

卐 卐

## 28 පරිච්ඡේදය.

# භව පච්චයා ජාති

## (කර්ම) භව ප්‍රත්‍යයෙන් ජාතිය වේ.

මෙහි 'භව' යනු කර්ම භවය මැයි. උත්පත්ති භවය 'ජාති' යට ප්‍රත්‍යය නොවේ. මෙහි දැක්වූ "ජාතිය" අනාගතයේය. සඞ්ඛාර පච්චයා විඤ්ඤාණං යනුවෙන් වදාළ ප්‍රතිසන්ධිවිඤ්ඤාණය මේ භවයේය ඒ පිළිබඳ විස්තර 72, 73 යන පිටුවල සඳහන්කර ඇත. සත්ත්වයා විසින් කරණු ලබන කර්මයන්ට අනුරූපව ඔවුන්ගේ නොකැමැත්තෙන්ම උපද උත්පත්තියද සිදුවෙයි. කරණු

ලබන කර්මද නානාප්‍රකාරවන අතර ලබන උත්පත්තිද එකී කර්මානුරූපවම ලැබියයුතු හෙයින් සත්ත්වයින් අතරද නානාප්‍රකාර උස්-පහත්-ප්‍රබල-දුබල-හීන-ප්‍රණීත ආදි ප්‍රභේද දක්නා ලැබේ. "කර්මනානත්වය නිසා විපාක නානත්වයද වේයයි දතයුතුයි."

තවද ආශ්‍රව සහිත සියලුම සත්ත්වයන්ගේ උපත සිදුවන්නේ ආශ්‍රවයන් නිසාමය. උපතින් පසු ජරා මරණාදී දුක් සිදුවෙයි.

මෙසේ දක්වූ නානාප්‍රකාර හීන-ප්‍රණීතාදි උත්පත්තීන්ට යද්ගරුක-යද්බහුල-කෘතත්වාදි නානාප්‍රකාර කර්මයෝ ප්‍රත්‍යය වෙත්. තථාගතයන් වහන්සේ භව පච්චයා ජාති යනුවෙන් වදාළේ මේ භවයෙහි සිදුකරණු ලබන ඒ නානාප්‍රකාර කර්මයන් නිසා අනාගතයේදීද උත්පත්තිය සිදුවන බව හා උත්පත්තියට කර්මය ප්‍රත්‍යයවන බවත්ය.

"ජාතියට ප්‍රත්‍යය වන්නේ කර්මභවයයි. කර්මප්‍රත්‍යය-උපනිඃශ්‍රය ප්‍රත්‍යය යන ප්‍රත්‍යදෙකින් භවය ජාතියට උපකාරවෙයි."

අසප්පායාලෙපනෙන
ගණ්ඩ විකාර පාතුභාවොවිය
භව පච්චයා ජාති

භව ප්‍රත්‍යයෙන් වන ජාතිය

**අසත්ප්‍රාය බෙහෙත ආලෙප කිරීමෙන් අබියාගේ ගඩයෙහි විකාර පහළවීමමෙනි.**

භවය ජාතියට ප්‍රත්‍යයවේ.
බීජය අංකුරයට මෙනි.



## 28 පරිච්ඡේදය

# ජාති පච්චයා ජරා

## මරණං සොක පරිදෙව දුක්ඛදෝමනස්සුපායාසා සම්භවන්ති

ජාති ප්‍රත්‍යයෙන් ජරා–මරණ–ශොක–පරිදෙව–දුඃඛ–දෞර්මනස්‍ය–උපායාශ යන මොව්හු හටගනිත්. මෙය අමුතුවෙන් විස්තර කළ යුත්තක් නොවේ. උපන් සත්ත්වයා ක්ෂණයක් පාසා ජරාවට පත්වන සැටිද අවසානයේ මරණයෙන් ජීවිතෙන්ද්‍රිය බිඳෙන සැටිද ඒ අතර නානාප්‍රකාර කායික–චෛතසික දුඃඛයන් හටගන්නා සැටිද ප්‍රත්‍යක්ෂය. පුදුමය නම් ප්‍රත්‍යක්ෂයෙන් මේ දුක දැක දැකත් දුකෙහිම ගැලී සිටීමයි. (ජරා මරණාදීන්ගේ අර්ථ සුගමයි.)

අයම්පි ජරා මරණාදීනං උපනිස්සය කොටියා එකධාව පච්චයො හොතීති වෙදිතබ්බං යනුවෙන් ජාතිය ජරා මරණාදීන්ට උපනිඃශ්‍රය ප්‍රත්‍යයෙන් උපකාරවන බව දක්වා ඇත.



ගණ්ඩ විකාරතො ගණ්ඩ භෙදො විය ජාති පච්චයා ජරා මරණං

**ජාති ප්‍රත්‍යයෙන් වන ජරාව හා මරණය අඬියාගේ ගඬයෙහි හටගත් විකාරයෙන් ගඬය බිඳීයාම මෙනි.**

ජාතස්ස අවස්සං ජරාමරණං උප්පන්නස්ස රුක්ඛස්ස පතනං විය.
ඉපදීම නිසා නියතයෙන්ම ජරා මරණයෝද වෙත්.
එය උපන් වෘක්ෂයාගේ වැටීම මෙනි.

මේ හේතු-ඵල වාදයේ අඞ්ග දොළොසකි. සන්ධි තුනකි. එමෙන්ම ත්‍රිවෘත්ත; ත්‍රිකාල ආදීන්ගේද වශයෙන් විස්තර මුලින් යොදා ඇත්තේය.

අත්ථ-ධම්ම-දෙශනා-ප්‍රතිවෙධ යන සතරාකාරයකින්ම පරම ගම්භීරවූ මේ හේතු-ඵල වාදය භවචක්‍රය නමින්ද හඳුන්වනු ලැබේ. මේ ධර්මය නොදන්නා තියම බෝධයෙකු නොවන අතර සම්‍යක්දෘෂ්ටියෙකු නොවන බවද විචිකිච්ඡාව බහුල කොට ඇති ඔහු සංසාර සඞ්ඛ්‍යාත අද්ධාන මාර්ගයෙහි සන්ස්ථානයකට පැමිණ මහ සොයාගත නොහැකිව හැසිරෙන මංමුළාවූවෙකු විලසින් තල්ලවන අඥානයෙකු බවද දක්වා ඇත්තේය.

සංසාර චක්‍රය සිඳියයුතු බව:-

"භවචක්කමපදාලෙත්වා-අසනිච්චක්කම්ව නිච්ච නිම්මථනං
සංසාරභයමතීතො -න කොචි සුපිනන්තරොපත්ති.

"එක්තැනක පිහිටීමක් නැති; ඉතා වේගයෙන් කැරකෙන දුක් උපදවන, සෙන චක්‍රයක් වැනි; මේ භවචක්‍රය; සමාධි නැමැති ගලෙහි මනාකොට මුවහත් කරගත් විදර්ශනාඥාන නැමැති කඩු වෙන් කැපියයුතු බවද එසේ නොකපා කිසිකලක සසරින් එතර නොවන බවද" එහි අදහසයි.

බුදුරජාණන් වහන්සේම මෙසේ වදාරණසේක:-

ගම්භිරොචායං ආනන්ද! පටිච්ච සමුප්පාදො ගම්භීරාවභාසොච එතස්සචානන්ද ධම්මස්ස අනනුබොධා අප්පටිවෙධා එවමයං පජා තන්තාකුලකජාතා ගුලාගුණ්ඨිකජාතා මුඤ්ජබබ්බජ භූතා අපායං දුග්ගතිං විනිපාතං සංසාරං නාතිවත්තති.

(මහනිධාන සූත්‍ර)

"ආනන්දය! මේ ප්‍රතීත්‍ය සමුත්පාද ධර්මය ඉතා ගැඹුරැය. ඉතා ගැඹුරැසේම වැටහෙන්නේය මෙය අවබොධ ප්‍රතිවෙධ නොකිරීම් හේතුවෙන් මේ සත්ත්වසමූහයා අවුල්වනිය නූලක්සේ, කැදැහුයක්ගේ, මුදුතණ බබුස්තණසේ, ප්‍රත්‍යයාකාර ධර්මය අවබොධ ගත නොහැකිවූයේ මිථ්‍යාදෘෂ්ටියෙන් බැඳී කැටනැසී අවුල්ව ගොස් අපායදුක-සසරදුක ඉක්මවිය නොහැකිව එහි රැඳේය" යනු එහි භාවයයි.

## නිබ්බාණ පච්චයො හොතු!

卐 卐 卐

බොධිසත්ව චරිතාත්මක

ශ්‍රී

# සම්බුද්ධාභි වන්දනා

(ධර්මදෙශක වි. පී. ධර්මසිරි අප්පුහාමි මහතා විසිනි.)

සාධු! සාධු!! සාධු!!!

දෙවාතිදෙවවූ, බ්‍රහ්මාතිබ්‍රහ්මවූ, වන්දනීයාභිවන්දනීයවූ, පූජනීයාභිපූජනීයවූ, දසබලධාරිවූ, කරුණානිධානවූ, සමන්තභද්‍රවූ, ශාක්‍ය සිංහවූ, ශාක්‍යකුල තිලකවූ, ගෞතමගොත්‍රවූ, සූර්‍ය්‍යවංසොද්භූතවූ, ගුණරත්නමන්දිරායමානවූ, ධර්මාධිපතිවූ, ධර්මස්වාමිවූ, ධර්මද්වජවූ, ධර්මරාජන්වූ, ලොකාලොකදිවාකරවූ, ලොකොත්තමවූ, ලොක ස්වාමිවූ, තුන්ලොකාග්‍රවූ තුන්ලොවට අමාමෑණි වූ, අනධිවර නම්වූ අනන්තජින නම්වූ, කීර්ති ඝොෂා පතළාවූ, අනිකෙකූටසමනෙෘවූ, බුදුවර සින්ටම සමවූ, දෙතිස්මහාපුරුෂ ලක්‍ෂණ අසීත්‍යනුව්‍යඤ්ජනව්‍යාමප්‍රභා කෙතුමාලාලංකාරයන්ගෙන් බබලන්නාවූ, රූපකාය සම්පත්තියකින්ද සීල-සමාධි-ප්‍රඥා-විමුක්ති- විමුක්ති ඥාන-දර්ශනාදි අනන්තවූ ධර්මකාය සම්පත්තියකින්ද සම්පූර්ණවූ, මුනීන්ද්‍රනම්වූ, සනරාමර ලොකශිවංකරවූ, අප තථාගත-අර්හත්-සම්‍යක් සම්බුද්ධ සර්වඥරාජොත්තමයාණන් වහන්සේ:-

මෙයට සාරාසංඛ්‍ය කල්ප ලක්‍ෂයකට ඔබ්බෙහි සත වෙත පතළ මහා කුළුණින් දීවකුරු බුදුරදුන් හමුවෙහි අතටපත් නිවන් සුව හැර දමා "මා වැනි වීර පුරුෂයක්හට මෙ සසර සයුරෙන් හුදෙකලාව එතරවනු තරම් නොවේ. සව්නේදත් ලොව්තුරුබුදු බවට පැමිණ දෙව් බඹුන් සහිත ලෝසතුන් සසර සයුරින් ගොඩ නගාලන්නෙමැ" යි සිතා දෑඑතර වීයතීයෙන් දනාදී සමතිස් පැරුම්දම් සපුරා, සියලු බුදුකුරු දහමුන් කුළුගන්වා, තුසිතපුර ඉපද, බුදුවන්ට කලැයි දසදහසක් සක්වළ දෙවියන් විසින් කරණලද ආරාධනය පිළිගෙණ:-

කාලය-දෙශය-ද්වීපය-කුලය-මවය යන පස්මහ බැලුම් බලා එයින් චුතවැ, කලියුගවෂී දෙදහස් සිවුසිය සත් සැත්තෑ (2477)වැන්නෙහි ඇසළ පුර පසළොස්වක් ලත් ගුරුදින දඹදිව කිඹුල්වත්පුර සුදෙවුන් මහරජුන් නිසා මහාමායා බිසවුන් කුස පිළිසිඳ දසමස් ඇවෑමෙන් කලියුග වෂී දෙදහස් සිවුසිය අට සැත්තෑ (2478) වැන්නෙහි වෙසක් මස පුරපසළොස්වක් ලත් කිවි දින මහබඹුන් අතට මවුකුසින් බිහිවැ, සත්පියවරක් වැඩ, "අග්ගොහමස්මි ලොකස්ස" ආදීන් අභීත සිංහනාද පවත්වා එතැන් පටන් පිළිවෙළින් වැඩෙමින් එකුන්තිස් (29) විය පැමිණිසඳ:-

ජරා–ව්‍යාධි–මරණ පැවිදි යන සතර පූර්ව නිමිති දැක ගිහිගෙයි කලකිරි පැවිද්දෙහි තුටු වී සොළසැවිරිදි කල පටන් විදි රජ සැපද අග මෙහෙසුන්වූ යශොධරාවද එදා උපන් රාහුල පුත් රුවනද අලුයම ලූ කෙළ පිඩක්සේ හැරදමා කලියුග වර්‍ෂයෙන් දෙදහස් පන්සිය සත්වැන්නෙහි (2507) ඇසළ මස පුරපසළොස්වක් ලත් සඳුදින මහබිනික්මන් කොට, අනෝමා නම් ගං තෙරට පැමිණ, ඝටීකාර නම් මහබඹුන් දුන් අටපිරිකර පිළිගෙණ, කෙශ කලාපය කපා බඹුන්ගේ පුද පිණිසද සලුපිලි ගලවා දෙවියන් ගේ පුද පිණිසද අහසට දමා පැවිදිවැ;

උරුවෙල් දනව්වෙහි සාවුරුද්දක් දුෂ්කර ක්‍රියාකොට එය නොමග බැව් දැන; මැදුම් පිළිවෙතට බැස එය පුරණුවෝ කලියුග වර්‍ෂ දෙදහස් පන්සිය තෙළෙස් (2513) වැන්නෙහි වෙසක් මස පුරපසළොස්වක්ලත් බුද දින දවල් සුජාතා නම් සිටුදුව පිදූ කිරිපිඬු පිළිගෙණ එකුන්පණස් පිඩක් කොට වළඳා, රන්තලිය උඩුගං බලා යවා; බුදුවන බව දැන, සල්වනයෙහිදී දිවා විහාරණය කොට "පඤ්චාභිඤ්ඤා අට්ඨසමාපත්තීන්ද උපදවා, සවස්වේලෙහි නේරඤ්ජරා නම් නදීතීරයෙහි පිහිටි ඇසතු බොධිද්‍රුම මූලයට වැඩ, සොත්ථිය නම් බමුණු දුන් තුසතණ අට මිට සළා, වගුරුවා, පොළොව පලා පැන නැගී තුදුස්රියන් වජ්‍රාසනයෙහි වැඩහිඳ, පෙරයම්

දසපැයේ දසබිම්බරක් මරසෙන් පරදවා පළවා හැර; පූර්වේනිවාසානුස්මෘතිඥානය උපදවා, මැදියම් දසපැයේ දිව්‍යචක්ෂුරභිඥානය උපදවා, අළුයම දසපැයේ අශ්‍රවක්ෂයකරඥානය උපදවා, සවාසනා සකලක්ලේශයන් ප්‍රහීණ කොට, අනෙකගුණගණාභරණ විභූෂිත සර්වඥතාඥානාලොකයෙන් සකල ලොකධාතුව ඒකාලෝක කෙරෙමින් සම්‍යක් සම්බුද්ධ රාජ්‍යශ්‍රියට පැමිණ වදාළසේක.-

මෙසේ සර්වඥතාඥානයට පැමිණ වදාළ මානේ බුදුපියාණන් වහන්සේ උදානවශයෙන් "අනෙකජාතිසංසාරං" යනාදී ප්‍රථම බුද්ධ වචනයද දෙශනාකොට, අනුක්‍රමයෙන් සත්සතියවා පණස්වන දිනට පහන්වූ කල්හි දෙදෙව් ලොවට අධිපති සක්දෙව් රජුන් විසින් පිළිගන්වනලද බෙහෙත් අරළු හා නාළිය දැහැටි වළඳා අනොතත්ත ජලයෙන් මුව දෙවනයකොට, ඥාති දෙවතාවෙකු විසින් මෙහෙයවනලද තපස්සු භල්ලික යන වෙළඳ දෙබෑයන් විසින් පිළිගන්වනලද විළඳ හා මීපිඩු වළඳා, ඔවුන් ද්වෙවාචික සරණාගමණයෙන් සරණගත කොට ඔවුන්ට පුද පිණිස ජීවකෙශධාතු අටමිට කින්ද සංග්‍රහ කර වදාළසේක:-

ඉක්බිති සහම්පතී මහාබ්‍රහ්මරාජයා විසින් දම් දෙසනු පිණිස කරණලද ආරාධනය පිළි-

ගෙණ වදාරා සකල සත්වයා වෙත පතළ මහා කරුණාවෙන් කලියුග වෂී දෙදහස් පන්සිය තෙළෙස් (2513) වැන්නෙහි ඇසළ මස පුරපස ළොස්වක් ලත් ශනිදින සන්ධ්‍යා සමයෙහි සූය්‍ර්‍යයා පශ්චිම ලොකධාතුවට බැස යමින් චන්ද්‍රයා පූව්ලොකධාතුවෙන් උදාවෙමින් පැවති වේලෙහි බරණැස ඉසිපතනාරාමයෙහිදී පස්වග භික්ෂූන් ප්‍රධාන අටළොස් කෙළක් බ්‍රහ්මයන්ටද අනන්ත දෙවියන්ටද "ද්වෙමෙ භික්ඛවෙ අන්තා පබ්බජිතෙන නසෙවිතබ්බා" ආදීන් දම්සක් පවත්වා වදාළසේක:-

එතැන් පටන් පන්සාළිස් වසක් මුළුල්ලෙහි දහම් නැමති අමාවැසි වස්වා සියලු බුදුවරයන් ගේ ධම්තාවයක්වූ පරමායුෂය පසකට බෙදා සිවුවන කොටස කෙළවර දක්වා දිනපතා පස් වැදෑරුම් බුදුකිස පවත්වමින් සූවිසි අසංඛ්‍යයක් සත්වයන් අමාමහ නිවන්පුර පමුණුවා අවසාන යෙහි කලියුග වෂී දෙදහස් පන්සිය අටපණස් (2558) වැන්නෙහි වෙසක් මස පුරපසළොස් වක් ලත් කුජදින කුසිනාරානුවර මල්ල රජ දරුවන්ගේ සල්වනයෙහිදී පිරිනිවන් මඤ්චක-යෙහී සැතපි "අප්පමාදෙන සම්පාදෙථ" යනා දීන් අන්තිම බුද්ධ වචනයද වදාරා අනුපාදි-ශෙෂ පරිනිවාණ ධාතුවෙන් පිරිනිවන්පා වදාළ සේක. එම අවපක්ෂයෙහ්ම රිවිදින ඒ තථාගත-

යන් වහන්සේගේ ශ්‍රී ශරීරය චන්දනචිතකා
රොපනය කොට ආදාහන මඞ්ගල්‍යය කරන
ලද්දේය.

මෙසේ ලෝකසම්මතවූ රිවි-සඳු-කුජ-බුධ
ගුරු-කිවි-ශනි යන සත්දිනයන්හිම මව්කුස
පිළිසිඳ ගැණීම ආදී ඒ ඒ කෘත්‍යයන් පවත්වා
නිවන්පුර පැමිණ වදාළාවූ; මොහඳුරට ලහිරු
මඬලක්වූ; සසර සයුරට මහනැවක්වූ; දුක්ගිනි
කඳට මහමේකුලක්වූ, තමන්වහන්සේගේ නම
සිහිකළවුන්ට පවා අභය සලසන්නාවූ, දෙපා
වැන්දවුන්ට පවා සගමොක්සුව ගෙණ දෙන්-
නාවූ, අසරණ සරණවූ,මහා පෘථිවියසේ භාරවූ
ගුණ ඇති, මහාසාගරසේ ගැඹුරුවූ ගුණ ඇති,
මහාමේරු පර්වතයසේ උස්වූ ගුණ ඇති, ආකා-
ශයසේ අනන්තවූ ගුණ ඇති, හිරුට වඩා
තේජස් ඇත්තාවූ, සඳුට වඩා සොම්ගුණ ඇත්-
තාවූ, අචින්ත්‍යවූ, අප්‍රමෙයවූ, නවඅරහාදී ගුණ-
ස්කන්ධයෙන් භවාග්‍රය දක්වා උස්ව පැන නැං-
ගාවූ ගුණපිණ්ඩායමානවූ; ත්‍රෛලොක්‍යප්‍රදීපාය
මානවූ, විමුක්තිනායකවූ, නීල-පීත-ලොහිත-
ඕදාත-මාංජේෂ්ට ප්‍රභාස්වර සඞ්ඛ්‍යාත ෂඩ්වර්ණ
ඝණ බුද්ධරශ්මි මාලාවන්ගෙන් බබලන්නාවූ,
අංගිරස විරාජමානවූ, භාග්‍යවතුන් වහන්ස!

සීලවිසුද්ධි-චිත්තවිසුද්ධි-දිට්ඨිවිසුද්ධි-කංඛා
විතරණවිසුද්ධි- මග්ගාමග්ගඤාණදස්සණවිසුඬි
පටිපදාඤාණදස්සණවිසුද්ධි ඤාණදස්සනවිසුද්ධි
සංඛ්‍යාත සප්ත විසුද්ධි ධර්මයන්ගෙන් අත්‍යන්ත
පරිසුද්ධ භාවයට පැමිණ වදාළාවූ;

විසුද්ධි දෙවයන් වහන්ස! සම්මසන උදයබ්බය-භඞ්ග භය ආදීනව-නිබ්බිද - මුඤ්චිතුකම්‍යතා- පටිසංඛාන- සංඛාරුපෙක්ඛා- අනුලොම යන දශවිධ විදර්ශනා ඥානයන්ගේ පර තෙරට පැමිණ වදාළ තථාගතයන් වහන්ස!

සතර සතිපට්ඨාන, සතර සම්‍යක් ප්‍රධාන, පඤ්චෙන්ද්‍රිය, පංචබල, සප්තබොද්ධ්‍යාඞ්ග, ආර්‍ය්‍ය අෂ්ටාංගිකමාර්ග සංඛ්‍යාත සත්තිස්බොධිපාක්ෂික ධර්මයන්ගෙන් සම්පූර්ණවූ හෙයින් ධර්මරාජන්වූ බුද්ධරත්නයද;

ඔබ වහන්සේ විසින් ගොචර-භාවනා වශයෙන් නිතර සෙවිනාලද සපර්‍ය්‍යාප්තික නව ලොකොත්තර ශ්‍රී සද්ධර්මයද;

එසේම ලෝකයාගේ පුණ්‍යක්ෂෙත්‍රවූ කල්‍යාණ පෘථග්ජනයා සහිත අෂ්ටාර්‍ය්‍ය පුද්ගල මහා සංඝ රත්නයද,

සියලු සංසාර දුඃඛයන්ගෙන් මිදී ලබන්නාවූ නිර්වාණ ප්‍රතිලාභය පිණිස මම ඉතා ආදර ගෞරව බහුමාන පුරස්සරව දෙහොත් මුදුන්දී වැඳ නමස්කාර කරමි.

ඉදං මෙ පුඤ්ඤං ආසවක්ඛයාවහං හොතු!

සාධු! සාධු!! සාධු!!!

卐 卐

(මෙය දෙහිවල අත්තිඩියේ ධර්මදෙශක වී. පී. ධර්මසිරි අප්පුහාමි මහතාගෙන් අප වෙත ප්‍රචාරය කරවීම සඳහා ලැබුණු වන්දනාවකි. මෙය කටපාඩම් කර ගෙණ උදේ සවස තෙරුවන් වැඳීමේදී භාවිතා කරන්න සම්බුද්ධජයන්ති පින්කම් මාලාවන්ට මෙය ඉතා ප්‍රයෝජනවත්ය. මේ ලිපිය කොටස් වශයෙන් හෝ සම්පූර්ණයෙන් හෝ උපුටා පළකරවීම තහනම්ය. නැවත මුද්‍රණය කරවීමේ අයිතිය ධර්මසිරි මහත්මයා සතුබවද දතයුතුයි.)

# ප්‍රාර්ථනාව

බුද්ධෝහං බොධයිස්සාමි - මුත්තොහං මොචයෙ පරෙ
තිණ්ණෝහං තාරයිස්සාමි - සංසාරොඝා මහබ්භයා

මම චතුස්සත්‍යය අවබෝධ කරම්වා! අන්‍යයන්ටද අවබෝධ කරවම්වා! මගේ සිත පවෙන් මිදේවා! අන්‍යයන්ගේ සිත්ද පවෙන් මුදවම්වා! මහා බියකරු සංසාර සාගරයෙන් මම එතර වෙම්වා අන්‍යයන්ද එතර කරවම්වා!

සාධු! සාධු!! සාධු!!!

සියලු සත්වයෝ සුවපත් වෙත්වා! නිදුක්වෙත්වා! නීරෝගී වෙත්වා! සැපයට පත්වෙත්වා! කිසිවෙක් කිසිවෙකුට වෛර නොකෙරේවා! කිසිවෙක් කිසිවෙකුට හිංසා නොකෙරේවා! සියල් ලෝම සියලු දෙනාගේම සැප කැමැත්තෝ වෙත්වා!

සබ්බෙසත්තා භවන්තු සුඛිතත්තා.

සබ්බෙ සඞ්ඛාරා අනිච්චා.
සබ්බෙ සඞ්ඛාරා දුක්ඛා.
සබ්බෙ ධම්මා අනත්තා.

සියලුම සංස්කාරයෝ ඇතිව නැතිවන හෙයින් අනිත්‍යයහ, විපතට ගොදුරුවන හෙයින් දුක්යහ. සංඛත-අසංඛත සියලුම ධර්මයෝ අනාත්මයහ.

ඉමාය ධම්මානුධම්ම පටිපත්තියා බුද්ධං පූජෙමි,
ඉමාය ධම්මානුධම්ම පටිපත්තියා ධම්මං පූජෙමි.
ඉමාය ධම්මානුධම්ම පටිපත්තියා සඞ්ඝං පූජෙමි.

මේ ධර්මානු ධර්ම ප්‍රතිපත්තියෙන් තථාගත බුදුරජාණන් වහන්සේ පුදමි. ශ්‍රී සද්ධර්මය පුදමි. මහාසඞ්ඝයා වහන්සේ පුදමි,

මේ වන්දන-මානන-අභිවාදන-අඤ්ජලිකර්ම-සාමීචිකර්ම-නමස්කාර-සරණාගමණ-ධර්මශ්‍රවණ ආදී ප්‍රතිපත්තියෙන් ජනිත කුශල බලය හේතු කොට ගෙණ මම උපනුපන් ජාතිවලදී ඥාණවන්තව ගුණවන්තව උපදිම්වා. පඤ්චානන්තර්‍යාදී භයානක

අපරාධයක් සිදුනොකරම්වා! සඤ්ජීවාදි අටමහා නරකොත්පත්ති යකට පත් නොවෙම්වා! නියත මිථ්‍යාදෘෂ්ටි නොවෙම්වා. කල්‍යාණ මිත්‍ර සේවනය සිදුවේවා. පාප මිත්‍ර සේවනය නොවේවා! ඥානය හා ගුණය සම්පූර්ණවූද අනිත්‍ය-දුක්ඛ-අනාත්ම යන ලක්ෂණය නිරවශෙෂයෙන් වැටහේවා! අවිද්‍යා-තෘෂ්ණා ප්‍රහීණ වේවා! ප්‍රඥාලෝකය පහළවේවා! සත්‍යය අවබෝධ වේවා! අවේදයිත සුඛ ලක්ෂණ ශාන්ත නිර්වාණ ධාතුව මට සාක්ෂාත් වේවා!

ඉදං මෙ පුඤ්ඤං ආසවක්ඛයා වහංහොතු

(මෙය කටපාඩම් කරගෙණ නිත්‍ය ප්‍රාර්ථනාව ලෙස පුරුදු කරන්න.)

卐 卐 卐

## ලෝකයාට පින්දීම

1. දුක්ඛප්පත්තාච නිද්දුක්ඛා-භයප්පත්තාච නිබ්භයා
සොකප්පත්තාච නිස්සොකා-හොන්තු සබ්බෙපි පාණිනො

2. සබ්බෙ සත්තාච භූතාච -හිතාච අහිතාච මෙ
අනුමොදිත්වා ඉමං පුඤ්ඤං -බොධයන්තු සිවං පදං

3. පුඤ්ඤත්ථිකා කාලකතා -යෙච මෙ හොන්ති ඤාතයො
සබ්බෙපි සුඛිතා හොන්තු- බොධෙන්තු අමතං පදං

4. මාතා පිතා උපජ්ඣායා -ආචෙරා සොදරා පිච
සබ්බෙති සුඛිතා හොන්තු- ලභන්තු අමතං පදං

5. ආකාස-සින්ධු-වන-පාදප-පබ්බතට්ඨා
භූමී-සිනෙරු ගිරි-කන්දර-සාගරට්ඨා
ඉච්චෙව මාදිසු නිවාසිත භූත සෙට්ඨා
පුඤ්ඤානු මොදථ සදෙව ගණා පහට්ඨා

6. අස්මිං විහාර ඝර පබ්බත රුක්ඛ ධාමෙ
සබ්බෙසු දීපනගරේ සුපි වාසකාලෙ
දේවා සුරා ගරුඩ රක්ඛස නාගයක්ඛා
රක්ඛන්තු මං සකනුභාව බලෙන නිච්චං

7 භවග්ගුපාදාය අවීචි හෙට්ඨතො
එත්ථන්තරෙ සත්තකායුප්පන්නා
රූපී අරූපීච අසඤ්ඤී සඤ්ඤිනො
දුක්ඛා පමුඤ්චන්තු ඵුසන්තු නිබ්බුතිං

8 දෙවො වස්සතු කාලෙන - සස්ස සම්පත්ති හෙතුච
ඵීතො භවතු ලොකොච රාජා භවතු ධම්මිකො

භාවාර්ථ:-

1 දුකට පත්වූවෝ නිදුක් වෙත්වා! භයට පත්වූවෝ අභය ලබත්වා! ශොකයට පැමිණියෝ නිශ්ශොකී වෙත්වා!

2 සියලුම සත්වයෝද භූතයෝද හිතාහිත ජනයෝද මේ පින් අනුමෝදන් වූවාහු නිවන ශාක්ෂාත් කරත්වා!

3 නෑසී ගිය, පින්නැණීමට බලාපොරොත්තුවන සියලුම (මගේ) ඥාතීහු මේ පින් අනුමෝදන් වෙත්වා! නිවන ලබත්වා!

4 මගේ මව්පිය ආචාර්ය උපාධ්‍යාය සහෝදර ආදී සියලු දෙනාම සුවපත් වෙත්වා! නිවන් ලබත්වා!

5 ආකාශ, සමුද්‍ර; වන, පර්වත වෘක්ෂලතා ආදී සියලුම තැන් වල සත්වයෝද මේ පින් අනුමෝදන් වෙත්වා!

6 මේ විහාර ගම් පර්වත ද්වීප නගර චක්‍රවාල ආදීන්හි වසන සියලුම භූතයෝ මේ පින් අනුමෝදන් වෙත්වා!

7 භවාග්‍රය ආදී කොට ඇති අවීචිය අවසන්කොට ඇති සියලුම සත්ව නිකායන්හි වසන සියලුම සත්වයෝ දුකින් මිදෙත්වා! නිවන ලබත්වා!

8 නිසිකලට වසීවා! ශස්‍යයෝ වැඩෙත්වා! ලෝකයා ප්‍රීතියෙන් වෙසේවා! රජවරු දැහැමි වෙත්වා!

卐 卐

# සම්පාදකගේ ප්‍රාර්ථනාව

''ලොකනිස්සරණං'' නාම – සබ්බ ලොකස්ස සාධකං
''වීරකෝන්නිති'' නාමෙන – ගන්ථායං පූරිතොමයා

ඉමං ලිඛිත පුඤ්ඤෙන – යාව නිබ්බාණ පත්තියා
මිච්ඡාදිට්ඨිං නසෙවෙය්‍යං – නහොතු බාල සඞ්ගමො

අවීචිම්හි නුප්පජ්ජෙය්‍යං – තථා ලොකන්තරෙසුච
නිජ්ඣාම තණ්හා ඛුප්පිපාසා – නභෙස්සං ජාති ජාතියං

දෙවෙසුච මනුස්සෙසු – සංසරෙය්‍යාමහං යදි
ඤාණෙනග්ගො භවිස්සෙය්‍යං – සද්ද සත්තන්තරෙසුච

ලොභාදී පාපකම්මෙහි – විමුච්චිත්වාන සබ්බසො
තණ්හක්ඛයං සුපවරං – ලභෙය්‍යං අමතං පදං

බුද්ධොහං බොධයිස්සාමි – මුත්තොහං මොචයෙ පරෙ
තිණ්ණොහං තාරයිස්සාමි – සංසාරොඝා මහබ්භයා

මාතා පිතා උපජ්ඣායා – අවෙරා සොදරා පිච
සබ්බෙපි සුඛිතා හොන්තු – බොධෙන්තු අමතං පදං

卐 卐 卐

අමෘතවාහිණී; ලොකතත්වය; ලොකවිජය යන ග්‍රන්ථයන් සම්පාදනය කළ මුනිදාස වීරකෝන් වන මා විසින් නිවන්සුවපතා ලියූ ලොකනිස්සරණය ප්‍රථම භාගය මෙයින් නිමියේය.

දසබලසෙලප්පභවා – නිබ්බාණ මහාසමුද්ද පරියන්තා
අට්ඨඞ්ගමග්ගසලිලං – ජිනවචන නදී චිරං වහතු.

– නිමි. –

# පින්රැස්කිරිම සැපයට හේතුයි.

එක්කලෙක ආයුෂ්මත් මහාකාශ්‍යපස්ථවිරයන් වහන්සේ රජගහපුර "පිප්ඵලී" ගුහාසෙහි වැඩවසනසේක් ධ්‍යානයට සමවැදී සත්වනදා ඉන් නැගී එදින ලැබියයුතු භික්‍ෂාව පිළිබඳ ආවර්ජනා කළසේක. එක්තරා හැල්කෙතක් රකින ස්ත්‍රියක් එදින කෙතට වී දිවා භොජනය සඳහා හැල්වී ගෙණ විලඳ කරමින් සිටියාය. ඇගේ දුප්පත්කමද ශ්‍රද්ධාසම්පත්තියද බලා වදාළ මහතෙරුන් වහන්සේ පාසිවුරු ගෙණ පිඬු සිඟා වඩනා අයුරින් හැල්කෙත අසලට වැඩ ඇයට පෙනෙනසේ වැඩ සිටිසේක. කුලඟන තොමෝද තෙරුන් වහන්සේ දකිමින්ම ප්‍රීතිය හා ශ්‍රද්ධාව උපදවා "ස්වාමීනි! මදක් වැඩසිටිය මැනවැ" යි පවසා පිළියෙළ වී තිබූ විලඳ සියල්ල ගෙණවුත් තෙරුන් වහන්සේට පූජාකළාය. "ස්වාමීනි ඔබ දුන වදාළ විමුක්ති සැපය මමද ලබම්වා" යි ප්‍රාර්ථනාද කළාය. එසේම වේවායි! වදාළ තෙරුන්වහන්සේද ඇයට අනුමෝදන් කොට විලඳ ආහාරද ගෙණ අපසු වැඩි සේක. කුලඟනද තමා කළ පින් ආවර්ජනා කරමින් නියරක් මුදුනේ ගමන් කරන්නී බිලයක සිටි විෂඝොර සර්පයෙකු විසින් දෂ්ට කරණු ලැබුවාය. මහතෙරුන් වහන්සේ කෙරෙහි ප්‍රසන්නවූ සිතින් කළුරිය කළ ඕ තොමෝ දානපරිත්‍යාග කුශලයේද බලය නිසා නිදා පිබිදියාක් මෙන් තව්තිසා භවනයෙහි උපන්නාය. තමාට ලැබුනු විමානයද දිවසැපද බැලූ දෙවතාදූ මා කළ කවර කුශලයක් නිසා මෙබඳු උදාර දිවසැප ලැබුනේදැයි ආවර්ජනා කරන්නී මහසුප් මහතෙරුන් වහන්සේ නිසා මේ සා උදාර දිව සැප ලද බව දැනගත්තාය.

ලබනලද දිවසැප දියුණුකර ගැණීමේද මහතෙරුන් වහන්සේට කළගුණ සැළකීමේද අදහස ඇතිකරගත් දේවතාදූ පසුදා උදේ මනුස් තෙරුන් වහන්සේ වෙසෙන ආරාමය වෙත ස්වර්ණවර්ණ මුස්නක් හා කසල ඉවතලන පැසක්ද ගෙණ පැමිණ අවට හැමද පැන් පෙරා තබා අනවැසියෙකු සේසින් සියලු වත් පිළිවෙත් කොට ගියාය. අවදිවූ මහතෙරුන් වහන්සේද ආවර්ජනා නොකළසේක් "යම්කිසි දහර භික්‍ෂුවක් විසින් කරණලද්දේ වනැයි" සිතූසේක.

පසු දිනද දෙව්දූ තොමෝ පළමු පරිද්දෙන් වතාවත් කොට ගියාය. තෙරණුවෝ එදිනද පළමු ලෙසින්ම සිටියහ. තෙවෙනි දින අලුයම හමදිනා හඬ අසා අවදිවූසේක් කෙසී සිදුරෙන් ආරම තුළට වන් ආලෝකය දැක දොර හැර මේ හමදින්නේ කවරෙක්ද? යි ප්‍රශ්න කළසේක.

දෙවඟනා:- සවාමිනි ඔබගේ උපසථායිකාවක්වූ විලද දෙව්දූ වෙමි.

තෙරණුවෝ:- මගේ එනමින් උපසථායිකාවක් නැත. තී කවරෙක් වෙයි.

දෙවඟනා:- සවාමිනි හැල්කෙතක් රකිමින් සිටි මම ඔබට පූජා කළ විලද දානයක අනුසසින් (එදිනම සර්පයෙකු විසින් දෂ්ට කරණ ලදුයෙමි කලුරියකොට) දෙව්ලොව උපනිමි. ඔබ නිසාය මට මේ සැප ලැබුනේ එහෙයින් ඔබට වැඩිවශයෙන් උපචාර වතාවත් කොට වැඩියක් පින්පල ලබනු රිසියෙමි මෙසේ කරමි.

තෙරණුවෝ:- ඊයේ හා පෙරෙයිදා මලුව හැමදියේත් පැන් පෙරා තැබුවේත් තීමද?

දෙවඟනා:- එසේය, සවාමීනි!

තෙරණුවෝ:- එම්බා දෙව්දූ! වහා ඉවත්ව යව! මින්මතු මෙ තැනට නොඑව!

දෙවඟනා:- සවාමීනි! මා නොනසනු මැන, මට ලැබෙන පූණ්‍ය ලාභයම බාධා නොකළ මැන,

තෙරණුවෝ:- දෙව්දූ! අනාගතයේ ධර්මාසනාරූඪවන ධර්මකථික සින්ගේ මුවින් "මහසුප් තෙර දෙවඟනකගෙන් උවටැන් ලැබී" යයි නොකියව! මින්මතු මෙහි නොඑව! තෙරුන් වහන්සේ මෙසේ වදාළ කල දෙව්දූ තොමෝ නැවත නැවතත් ඇඬිලි කළාය. අන්තිමේදී මහතෙරුන් වහන්සේ "තිගේ තරම තී දනුව! ඉවත්ව යව! යනු වෙන් අසුරු ගසා තර්ජනය කළසේක.

දෙව්දූ තොමෝ සිටි තැන සිටින්ම නොහැකිවූවා අහසම නැඟී "ස්වාමීනි! මා නොනසනු මැනව. මා ලද සැපත තහවුරු කරගැනීමට අවකාශ දුන මැනවැ"යි හඬමින් වැලපෙමින් සිටියාය.

තථාගත භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ දෙව්රම් වෙහෙර ආවර්ජනා සහිතව වැඩ සිටි සේක්, දෙවඟනගේ විලාප හඬ අසා ඈ ඉදිරිපිට වැඩ සිට වදාරණ අයුරින් "අම්බා දෙව් දුව! මා පුත් මහසුප් තෙර නමන්ගේ සංවරය පිණිස එසේ වළකයි, නමුත් පින් කැමතියන් විසින් මෙයින් මට වැඩ ඇතැයි සලකමින් පින් කළයුතුයි. පින් කිරීම මෙලොව හා පරලොව සැප පිණිස පවතී. යනුවෙන් වදාරා පහත දක්වන ගාථාව දෙශනා කළසේක.

> පුඤ්ඤං චෙ පුරිසො කයිරා–කයිරාථෙනං පුනප්පුනං
> තම්හි ඡන්දං කයිරාථ–සුඛො පුඤ්ඤස්ස උච්චයො

(ධම්මපදය)

(ඉදින් පුරුෂ තෙමේ පින් කෙරේද; එකවරක් හෝ එක පිණක් මා විසින් කරණ ලදැයි එපමණකින්ම තෘප්තියට පත් නොවී නැවත නැවතත් පින් කරන්නේය පින් නොකරණ වේලාවක ඊටද පිණෙහි රුචිය ඇති කරන්නේය. කුමක් නිසාද? පින් රැස්වීම දෙලොව සැප ලැබීමට හේතුවන නිසයි) ගාථා දේශනාව අවසානයේදී දෙවදූ සොවාන් ඵලයට පත්වූවාය.



